සාධු දැක්ම

The Excellent View

8

උත්තරීතර භූමිකාව

Utmost plot of life

(Based on Visuddhi Magga & Singalovada Sutta)

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

සාධු දැක්ම The Excellent View 8 කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

සාධු දැක්ම

{The Excellent View}

⑧

උත්තරීතර භූමිකාව

Utmost plot of life

(Based on Visuddhi Magga & Singalovada Sutta)

IN

PALI

SINHALA

&

ENGLISH

LANGUAGES

BY

Kiriwattuduwage Seetha Nandanie Goonetilleke

(Director of Parents Memorial Scholarship Foundation)

011 2 877950

ප්‍රථම මුද්‍රණය - 2022
බුද්ධ වර්ෂ - 2566
(දුරුතු පුර පසළොස්වක නිමිත්තෙනි)

සාධු දැක්ම - The Excellent View - ⑧

උත්තරීතර භූමිකාව - **Based on 10 decades of human life**

(Visuddhi Magga and Gihi Vinaya - Singalovada Sutta)

කර්තෘගේ වෙනත් පොත්

1. මා පිය ගුණ සමර
2. සාධු දැක්ම - The Excellent View ①
3. දරිද්‍රතාව හඹා යයි
4. සුවදායක මාවතක් - A Blissful Path
5. ප්‍රීතිමත් ජීවිතයකට මඟ
6. තුදුස් වසරක සහන් එළියක් - A Moon light of 14 years
7. සාධු දැක්ම - The Excellent View ② කරණීය මෙත්ත සූත්‍රය ඇසුරෙනි
8. සාධු දැක්ම - The Excellent View ③ රතන සූත්‍රය ඇසුරෙනි
9. සාධු දැක්ම - The Excellent View ④ ජිනපඤ්ජරය ඇසුරෙනි
10. සාධු දැක්ම - The Excellent View ⑤ මහා මංගල සූත්‍රය ඇසුරෙනි
11. සාධු දැක්ම - The Excellent View ⑥ සංහිඳියාවට මඟක්
12. සාධු දැක්ම - The Excellent View ⑦ ගිරිමානන්ද සූත්‍රය ඇසුරෙනි

පටුන

- උත්තම පූජා..v
- බුද්ධංගල භික්ඛු ආනන්ද අභිවන්දනා..vi
- පිදුම...vii
- DEDICATION...viii
- පූජනීය දීඝවාපියේ සුසීම හිමිපාණන් ගෙන්.................................ix
- පෙරවදන...xi
- FORWARD...xiii
- උත්තරීතර භූමිකාව...xv
- AUTHOR’S PREFACE...xvi
- ACKNOWLEDGEMENT..xx

1.	මිනිසත් භවය - Life span of human	23
2.	මිනිස් දිවියේ දශක දහය - (10 Decades of aging)	27
	• Figurative 10 Decades and Description	32
3.	මන්ද දශකය (1) - The Tender decade	35
4.	ක්‍රීඩා දශකය (2) - The Playful decade	38
5.	වණ්ණ දශකය (3) - The Beautiful decade	43
6.	බල දශකය (4) - The Strong decade	56
	• බල දශකයේ යුග දිවිය	63
7.	ප්‍රඥා දශකය (5) - The Wise decade (Pannna Dasaka)	77
8.	හානි දශකය (6) - The Declining decade	88
9.	වර්ණ ප්‍රස්ත (වංක) දශකය (7) - The stooping decade	101
10.	පබ්භාර (ප්‍රවංක) දශකය (8) - The Bent decade	112
11.	මෝහමූල දශකය (9) - The Silly Decade	123
12.	සයන දශකය (10) - Bed ridden/prone decade	134
	• විශේෂ පුණ්‍යානුමෝදනාව	148
	• MOTHER'S LOVE	149
	• පුණ්‍යානුමෝදනාව	151
	• ආශ්‍රිත මුද්‍රිත ග්‍රන්ථ සහ විද්‍යුත් නාලිකා	152

චක්ඛුං උදපාදි

උත්තම පූජා

සාරාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පුරා පාරමී දම් පුරමින්,
නියත විවරණ ලබා ගනිමින්, බුද්ධ රාජ්‍යයේ කිරුළ පැළඳීමේ
ඒකායන අධිෂ්ඨානයෙන් යුතුව,
සියලු රජ සැප සම්පත් අත හැර දා වනගතව,
පුරා සය වසරක් අත්තකිලමථානු යෝගයෙන් විර්යය වඩවා ගනිමින්
ආර්ය පර්යේෂණයක නිරත වූ සිද්ධාර්ථ ගෞතම බෝසතාණෝ
මැදුම් පිළිවෙතට පිවිස,
ස්ව ශක්තියෙන් පහළ කොට ගත් මහා ප්‍රඥාවෙන් යුතුව,
මීට වසර **2606** කට පෙරදී දඹදිව් තලයේ බුද්ධගයාවේ දී
උත්තරීතර සම්මා සම්බුදු පදවියට පත් වීමෙන් අනතුරුව..........
සංසාර සාගරයේ අතරමං වී දුක් විඳිනා ලෝ සතුන් කෙරෙහි
පහළ වූ මහා කරුණාවෙන් යුතුව,
තමන් වහන්සේ විසින් අවබෝධ කරගත්,
පරම රමණීය අමෘත මහා නිර්වාණ සුවය සාක්‍ෂාත් කරන්නා වූ,
නිර්මල ශ්‍රී සද්ධර්මය ඉතාමත් පැහැදිලිව දේශනා කර වදාරා..........
එම ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිථිය පිණිස
සැරියුත් මුගලන් හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය බිහි කළ
තුන්ලෝකාග්‍ර වූ අසම සම වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ
ශ්‍රී නාමයට
මාගේ මෙම වෑයම ආලෝකෝපහාරයක්ම වේවා ! ! !
ඔබවහන්සේ නොවන්නට අදත් අපි භව අඳුරේ ගමන් කරන්නෝ වෙමු.
බුද්ධ රත්නය,
ධම්ම රත්නය,
සංඝ රත්නය,
නම් වූ අති උතුම් රත්නත්‍රය හැර උපන් සත්ත්වයාට
අන් සරණක් නැත්තේම ය.
මාගේ ස්වාමි වූ, ත්‍රෛ ලෝක නාථ, ලොව්තුරු ගෞතම බුදු පියාණෙනි !
ගෞරව භක්ත්‍යාදරය පෙරදැරිව, ශීර්ෂප්‍රණාමයෙන් යුතුව
බුද්ධාලම්බන ප්‍රීතියෙන්
ඔබ වහන්සේට මෙම පොත පුදමි.

බුද්ධංගල

භික්ඛු ආනන්ද

අභිවන්දනා

දරණා සිල් ලොවට බෙදා - කරනා කල සිත් සුවපත්
දෙසනා බණ නිරතුරුවම - සවනට මිහිරිය හරවත්
කරනා කියනා හැම දෙය - රට, දැය, සමයට යහපත්

බලනා විට යන මඟ දෙස
නියතයි අර්හත් ඵලයත් ●

සංසාරේ අතරමංව - සිටිනා දනහට පින්වත්
මං පාදා පා නගන්න - හෙළි කර දෙයි මංමාවත්
පංසලකින් හඳුනාගත් - කළණ මිතුරු දම බලවත්

ලංකර දෙයි අමාරසය
කරමින් හදවත් දිරිමත් ●

පෙන්වා ලොවටම සදහම් - පිපාසයට දිය දහරක්
රචනා කර ලියා තබා - සකසාගත් පොත් පිංචක්
දුන්නා කල් යල් බලලා - සැමහට එය නව ජවයක්

බැස්සා සදහම් මඟට ම
නොහැරම සුළු හෝ අතරක් ●

යුගයේ පිනකට පහළව - බැබළී දිදුලන තරුවක්
බාධක අභියෝග මැදින් - යන්නේ අභිමන් ගමනක්
ඉදිරියටම තබන දෙපා - පසුපස එයි තව පිරිසක්

මඟ පෙන්වන සමිඳුන්හට
මේ පිදෙන්නෙ පුන් කළසක් ●

පිදුම

සංසාර භව කතරේ අතරමංව සිටි මා විසින්
රැස්කර ගත්තා වූ පුණ්‍ය බල මහිමයෙන්,
මෙවන් බුද්ධෝත්පාද කාලයක
මිනිස් භවයක් ලැබීම පිණිස
මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට
අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් මහද තුළ ජනිත කරවමින්,
මෙලොව ඉපදීමට
මා ලද භාග්‍ය සුරක්ෂිත කර දී
ලේ කිරි කර පොවා මා හදා වඩා
ගුණනැණ බෙලෙන් ද පෝෂණය කළ
දයාබර මෑණියන් වූ විශ්‍රාමලත් විදුහල්පතිනි
ලෝරා හෙට්ටිආරච්චි මැතිනියට
සහ පංචශීල ප්‍රතිපත්තීන් දිවිහිමියෙන් සුරකිමින්
ආදර්ශයෙන්ම යායුතු මග පෙන්වා දී
නිර්භයව එම නිසි මාවත ඔස්සේ
පා නැගීමට හැකි පෞරුෂයක්
මහද තුළ වර්ධනය කරමින්
උපන් බිමට ණය නැති
මිනිස් රත්නයක් ලෙසින්
සමාජයට ඵලදායි සේවාවක්
සාර්ථකව ඉටු කිරීමට හැකි ස්ථාවරයකට
මා ඔසවා තැබූ
දයාබර පියාණන් වූ විශ්‍රාමලත් විදුහල්පති
විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට
බැතිබර සෙනෙහසින් පිදේ.

To my beloved parents in everlasting gratitude

DEDICATION

THE WORK

"සාධු දැක්ම :THE EXCELLENT VIEW -8)"

WHICH PRESENTS

" UTMOST PLOT OF LIFE"

is dedicated with love and compassion
to all parents and all children
in various decades of life span.

As almost every person is either a parent or a child,
this dedication serves everyone on earth
in common irrespective of race & creed.

This is dedicated in the earnest hope that everyone reading this will discover the key to Happiness, fulfilling the Duties & Responsibilities, based on Love and affection of their parents and children mutually, as the Buddha had preached in Sigalovada, Parabhava and Wasala Suttas

K.S.N.Goonetilleke

පූජනීය දීඝවාපියේ සුසීම හිමිපාණන් ගෙන්...

සමාජයක යහ පැවැත්ම උදෙසා සාධු (යහපත්) දැක්මක් අත්‍යවශ්‍ය ය. දැක්මකින් තොර සමාජය අයාලේ යන වල්මත් මී ගොනෙකු සේ හැසිරෙයි. ඒ ඔවුනට කිසිදු දැක්මක් නොමැති නිසාය. එවැනි ජන සමූහයට නිවැරදි දැක්මක් (සම්මා දිට්ඨිය) පසක් කර දීම මෙම මානව ඉතිහාසයෙහි සිදු වූ අපූර්වතම සංසිද්ධියකි.

"නා චින්තයන්තු පුරිසො - විසේසංන මධි ගච්ඡති"

සිතන්න බැරි පුද්ගලයෙකු හට කිසිදු විශේෂත්වයකට පත්විය නොහැකි බව මෙයින් කියැවේ. ඒ සඳහා නිවැරදි දැක්මක් සරලවත්, සුගමවත් ඉදිරිපත් වීම අත්‍යවශ්‍යය. ක්‍රි.පූ. 02 වන ශත වර්ෂයෙහි එදා ගයා ශීර්ෂයෙන් විශ්වයට මුදාහළ එකී ශ්‍රී මුඛ දේශනාව වර්තමානය දක්වා පමණක් නොව මතු මතුත් එහි ආශිර්වාද ගලා යනු ඇත. එකී තෙවළා දහම නිකායාන්තරගත ධර්ම පර්යාය සුපැහැදිලි ලෙස විවරණය කෙරෙමින්, භදන්තාචාර්ය බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ විසින් සංගහිත ග්‍රන්ථය විසුද්ධි මග්ගය නම් වේය. එහි **සීල, සමාධි, ප්‍රඥා** යන ත්‍රි ශික්ෂා පූරණය තුළින් ස්වකීය විශුද්ධිය පිණිස ගත යුතු ප්‍රතිපදාව ගෙන හැර දක්වා ඇත. තවද (ගිහි විනය) සිඟාලෝවාද සූත්‍රගත සය දිසා වන්දනය සමඟ සුසංදනය කෙරෙමින්, මිනිස් දිවියේ මන්ද දශකයේ සිට සයන දශකය දක්වා වන කාල පරිච්ඡේදයන්හිදී ගිහි විනය පවත්වා ගතයුතු ආකාරය ද පැහැදිලි කෙරෙන විවරණය මහඟු ප්‍රයත්නයක විපුල ඵලයකි.

01. සීල විශුද්ධි
02. චිත්ත විශුද්ධි
03. සමාධි විශුද්ධි
04. දිට්ඨි විශුද්ධි
05. කංඛා විතරණ විශුද්ධි
06. මග්ගා මග්ග ඥාණ දස්සන විශුද්ධි
07. පටිපදා ඥාණ දස්සන විශුද්ධි

සිඟාලෝවාද සූත්‍රයේ අන්තර්ගත...

01.	නැගෙනහිර දිසාව	-	මව් පිය
02.	දකුණු දිසාව	-	ගුරුවරු
03.	බටහිර දිසාව	-	අඹුදරුවන්
04.	උතුරු දිසාව	-	හිත මිතුරන්
05.	උඩ දිසාව	-	පැවිදි උතුමන්
06.	යට දිසාව	-	දාසි දස්සන්

යන සය දිශාවන් සහ ගිහි විනයට අදාළ යුතුකම් ද විශ්ලේෂණය කෙරෙමින් නූතන සමාජයට **සාධු දෑක්ම (08)** තුළින් මහඟු ධර්ම මාර්ගෙ ්පදේශයක් සපයනු ලැබේ. ගත් කතුවරියගේ අභිමතාර්ථය සුපැහැදිලිය. "**සාධු දෑක්ම**" යටතේ විවිධ ගාම්භීර ධර්ම කරුණු සරල සුගම අයුරින් ගෙන හැර පෑම තුළින් ඇයගේ කෘතහස්ත ග්‍රන්ථකරණය අප හට පැහැදිලිය. චිර කාල අභ්‍යාස වෑයමකි. ග්‍රන්ථකරණය කෘතහස්ත විශාල ධර්ම විග්‍රහයකි. සමාජයට යා යුතු මඟ පෙන්වන මාර්ගෝපදේශයකි.

සාධු දෑක්ම (08) දක්වා පැමිණි ගමන තුළ ඇයගේ සැදැහැ සිත ද, බුද්ධිය ද ප්‍රකටය. ඇතැම් ලේඛකයින්ට බුද්ධිය තිබුණද සැදැහැ සිතින් තොරය. ඇතැමෙක් සැදැහැවත්ය. එහෙත් බුද්ධියෙන් තොරය. මෙම කරුණු දෙකින් පිරිපුන් ගත් කතුවරියගේ උත්සාහය අති සාර්ථකය. තව තවත් ග්‍රන්ථකරණයන් සමාජයට අවැසිය.

ඒ සඳහා කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක කතුවරියට මෙම සමාජ මෙහෙවර සාර්ථකව ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය ශක්තිය, නිදුක් නිරෝගී සුව, ධෛර්යය, ධර්ම ඥානය දියුණු වේවා! දහම් ඇස (ධම්ම චක්ඛු) පහල වේවා! යි පතන අතර, මෙම සසර ගමන ගෙවන් කර ගනිමින් උතුම් නිර්වාණාවබෝධය වේවා! යි ප්‍රාර්ථනා කරමි.

"සතං සමාගමෝ හෝතු යාව නිබ්බාන පත්තියා"

බුද්ධංගල ආරණ්‍ය සේනාසනාධිපති
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති දීඝවාපියේ සුසීම ස්ථවිර
සේනාසනය - බුද්ධංගල, අම්පාර

පෙරවදන

ප්‍රවීණ ලේඛිකා කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය විසින් රචිත මෙම "**සාධු දූක්ම** - 8" ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර ඇත්තේ ආගමික වශයෙන් පමණක් නොව, මිනිසාගේ ආධ්‍යාත්මික, සමාජයීය සහ සෞඛ්‍යමය පැතිකඩවලට අදාළ වන කරුණු සමූහයකි. කායික, මානසික නිවැරදි පැවැත්ම, ජීවිතයේ මරණය දක්වා පවත්වා ගැනීමෙන් සාර්ථක ජීවිතයකට අවශ්‍ය භූමිකාව කතුවරිය විසින් නිර්මාණය කර ඇත.

පොදුවේ වත්මන් ශ්‍රී ලංකා වාසීන් මෙන්ම, විශේෂයෙන්ම තරුණ පරම්පරාව විසින් අවබෝධ කටයුතු කරුණු රාශියක් අඩංගු කෘතියකි. මෙහි අන්තර්ගත විෂය කරුණු පිළිබඳව නිසි අවධානය යොමුකර නිවැරදි අවබෝධයක් ලබා ගන්නේ නම්, ස්ථිරවම සමාජයේ හා රටේ යහපත්, සුවපත් පරම්පරාවක් බිහිවනු ඇත. එමගින් වර්තමානයේ අත් විඳීමට සිදු වී ඇති බොහෝ කඩා වැටීම්, මානසික පීඩාවන් සහ කායික, මානසික රෝගී තත්ත්වයන් සැහෙන දුරකට පාලනය කර ගැනීමට හැකි පසුබිමක් සැකසෙයි.

බෞද්ධ ධර්මය තුළ පෙන්නුම් කෙරෙන, මිනිස් ජීවිතයට අදාළ කාල පරිච්ඡේද, සත්‍ය මෙන්ම ප්‍රායෝගික අදියරයන් ය. එබැවින් එයට අදාළ කරුණු පිළිබඳව අනවබෝධයෙන් ගත කරන ජීවන රටාව, ප්‍රායෝගිකත්වයෙන් තොර වීම නිසා පුද්ගලයාගේ මෙන්ම, රටේ සමාජයේ අස්ථාවරත්වයට හෙවත් පිරිහීමට මහත් සේ ඉවහල් වෙයි.

එබැවින් උගත් කතුවරිය මෙම ග්‍රන්ථය මගින් ඉදිරිපත් කරන සාධනීය කරුණු සියල්ල අප රටේ ඉහළ, පහළ, උගත්, නූගත්, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, සියලු දෙනාටම ප්‍රයෝජනයට ගත හැකි දැනුම් සම්භාරයකි. ධර්මයේ සඳහන් මනුෂ්‍යයාගේ ඉපදීමේ සිට ස්වාභාවික මරණය දක්වා, ජීවිතය දශක 10 ක් ඔස්සේ පවත්නා බව අප නාමිකව අසා ඇතිමුත්, ඒ පිළිබඳව ගැඹුරින් ප්‍රායෝගිකව කථා කරන කතුවරිය එමගින් සමාජයට දී ඇති පණිවිඩය අති විශිෂ්ඨය. ජීවිතයේ මන්ද දශකය, දෙමාපිය, වැඩිහිටි අවවාද උපදෙස් අනුව ගෙවී ගියද, වසර 10 සිට එළඹෙන ක්‍රීඩා දශකය ඉතා වැදගත්ය. ශරීරයේ ද්වීතික ලිංගික ලක්ෂණ පහළ වීමත් සමඟ ඇතිවන කුතුහලය හා ඒ අනුව යායුතු නිවැරදි මාර්ගය පෙන්වා දීම මෙම කාලයේ අතිශයින්ම වැදගත්ය. කාන්තාවකට තම ජීවිතයේ පසු කිරීමට සිදුවන විවිධ සන්ධිස්ථාන අතරින් වැඩි වියට පත්වීම හා නිරෝගී යුවතියක ලෙස තමන්හට අනුගමනය කළයුතු වත් පිළිවෙත්, ආහාර විහරණ ඇතුළු බොහෝ දෑ ඔවුනට ඉගෙනීමට ලැබෙන්නේ මේ කාලයේදීය. සුශික්ෂිත දරුවකු සමාජයට ආභරණයකි. එය පැළඳවීම වැඩිහිටියන්ගේ වගකීම මෙන්ම යුතුකමයි.

මේ සියලු දේ පිළිබඳව දීර්ඝ ලෙස කරුණු දක්වමින් නිරෝගී සුශික්ෂිත සමාජයක් නිර්මාණය කිරීමට, කතුවරිය විසින් ගෙන ඇති වෙහෙස අති මහත්ය. මෙය සෑම නිවසකම තිබිය යුතු පොත් පිංචක් බව හඳුන්වා දෙන්නේ හද පිරි සතුටකිනි.

ආචාර්ය වෛද්‍ය දයානි සිරිවර්ධන

ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී 1,

M D බරණැස විශ්ව විද්‍යාලය, ph.D ගුජරාට්, ඉන්දියා

ප්‍රසව හා නාරිවේද පිළිබඳ විශේෂඥ වෛද්‍ය

ජ්‍යෙෂ්ඨ උපදේශක වෛද්‍ය ආයුර්වේද ශික්ෂණ රෝහල, කොළඹ

කොළඹ විශ්ව විද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යාලය - රාජගිරිය.

FORWARD

In the series of Dhamma Books Authored by Mrs. Kiriwattuduwage Seetha Nandanie Goonetilleke in the name of **"Saadhu Dekma"**, this book which is named **"Uttareethara Bhumikawa"** is the 8th book authored by her, in the series.

The contents of this book **"Uttareethara Bhumikawa"** is based on materials that had been found in the following suttas preached by the Lord Buddha namely, "Singalowada Sutta", "Parabhawa Sutta" and "Wasala Stta"

The good values that are necessary for building a just society had been very well analyzed by the author in her book.

The life of a person had been divided into ten decades from the **"Tender Decade"** to the **"Bed ridden Decade"** Which had been analyzed by Reverend Buddhagosha in one of his encyclopedia of the 'Visuddhi Magga". The author had explained very well the said TEN decades in a comprehensive manner to be easily understood by any lay reader.

The author had explained that one shall lead a virtues life in whatever decade one may be in, by emphasizing appropriate portions in her said book.

The author had shown her skill and experience by writing this book in her usual skillful manner so that it's contents are easily comprehended by any person in any stratum of the society.

Mrs. Seetha Goonetilleke is an experience and skillful English teacher, who had retired from D.S Senanayaka Vidyalaya - Colombo 7 where she had worked last.

By reading her series of Dhamma books authored by her she had become well known as a good author among her readers.

My wife and I wish Mrs. Goonetilleke's said effort at building a peaceful and just society by using her vast knowledge of the Buddhist religion, her advanced knowledge of the English Language and her attractive way of writing skills in a successful manner.

We wish her all success in her said endeavor.

Justice N. E. Dissanayake
Retired Judge of the
Supreme Court

11-11-2021

උත්තරීතර භූමිකාව

"මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි" යන්න සුපතල සුභාෂිතයකි. මනුෂ්‍ය වර්ගයාගේ යහ පැවැත්ම වෙනුවෙන් කටයුතු කිරීම බෝධි චර්යාවක් බව ශාන්ති දේව පාදයන්ගේ **"බෝධි චර්යාවතාරයෙහි"** සාරයයි. මේ උතුම් සුභාෂිතය ස්වකීය ජීවිතයෙහි පරමාදර්ශය කරගත් උදාර උවැසියකි; පින්වත් කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිණිය.

ඇය කලක සිට පිටිසර ප්‍රත්‍යන්ත ගම්මානවල, මහත් දුෂ්කරතා මැද ඉගෙන ගන්නා දූයේ දූ පුතුනට උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දුන්නාය. එමෙන්ම වරින්වර දහම් පොත් පත් ලියමින්, තිලිණ කරමින්, බාල, තරුණ, වැඩිහිටි සැමගේ නැණ, ගුණ දියුණු කිරීමට කටයුතු කළාය.

මේ වන විටත් ඇය **"සාධු දැක්ම"** නමින් දහම් පොත් පෙළක් ලියමින් තව දුරටත් දූයේ දූ පුතුන්ගේ මෙන්ම, වැඩි හිටියන්ගේද, නැණ නුවණ දල්වීමට කටයුතු කරමින් සිටියි.

"උත්තරීතර භූමිකාව" නම් වූ මෙම කෘතිය, **"සාධු දැක්ම"** සදහම් ග්‍රන්ථ මාලාවේ අට වැන්නයි. පුරාතන පඬිවරුන් විසින් පෙන්වා ඇති මිනිස් ජීවිතය පිළිබඳ අදියර 10 වන **"දශක දහය"**, සූත්‍ර දේශනා අනුව යමින් ප්‍රායෝගිකව මෙහි පැහැදිලි කර ඇත.

සීතා නන්දනී ගුණතිලක මහත්මියගේ අවශේෂ කෘති සේම මෙයද සැදැහැවතුන්ගේ අධ්‍යාත්මයන් සුපෝෂණය කරමින්, ඔවුන්ගේ ප්‍රඥාවේ නිම්වළලු ප්‍රසාරණය කරනු ඇතැයි විශ්වාස කරමි.

මෙසේ සමාජ, ශාසනික මෙහෙවරෙහි යෙදීමට ඇයට **ආයු ආරෝග්‍ය ශ්‍රී සම්පත් සැළසේවා!** යන්න අපගේ ප්‍රාර්ථනයයි.

ගෝනදෙණියේ විමලජෝති හිමි
කුකුළුවා විහාරය
කුකුරම්පොල, ඌව පැල්වත්ත.
2021-11-01

AUTHOR'S PREFACE

The series of books "සාධු දැක්ම –-**The Excellent View**" written on Dhamma is specially for the young generation all over the world who eager to follow the path of Dhamma. Anyone can get into the previous book "සාධු දැක්ම –-**The Excellent View-7**" through the web site **< issuhub . com → category → religion and spirituality >** and read at leisure.

This edition "සාධු දැක්ම - **The Excellent View - 8"** also mainly based on the teaching of Buddha which is directly influenced to the life of layman serves all, irrespective of the decades of human life as categorized in the **"Visuddhi Magga", by Ven Buddhaghosha Thero. The utmost plot** of each decade plays a vital role in each individual.

From the Cradle to the Coffin people suffer a lot. After the death another birth follows. It's the Universal phenomenon. Stopping this chain is the Supreme Happiness. The Buddha had revealed the correct and direct path to follow and achieve the goal. It is to be realized individually according to the degree of intelligence. That is a feature of Dhamma.

This book is mainly based on **Singalowada Sutta,** which belongs to the **"Deegha Nikaya in Sutta Pitaka"**. It reveals **'GIHI VINAYA'**: the code of disciplines for layman, to be able to lead a happy, peaceful and progressive life. **Maha mangala** Sutta, **Parabhava, Vyaggha Pajja** Sutta also prove that the Buddha's teachings are not only for the welfare of the present world but for the next world too. To achieve this goal people have to maintain a righteous livelihood on moral virtues, paying good attention to own duties and responsibilities. It shows vividly, considering the modern characteristic of the human lives in this fast moving current society which is modified with advanced technology.

Singalovada sutta mainly shows the genuine satisfaction as ***Atthi Sukha*** (sufficient income), ***Bhoga Sukha*** (Enjoyment of materials), ***Anana Sukha*** (freedom of debt), and ***Anavajja Sukha*** (Harmless life). The Buddha was that much of concern about the material welfare of layman and also guided how to achieve it.

Although the Buddha had preached this code of disciplines for the layman before 2600 years ago, they are still fresh, visible and modern. It is applicable to any advanced and civilized human society, irrespective of cast, creed, colour, race or sex. If the guidance are strictly followed, it will be beneficial, not only for the personal welfare but for the creation of good citizens, men of integrity, and also for the brother hood and kingship of all beings.

The main points of Singalovada Sutta are categorized into Seven parts. All of them can be directly understood by the layman who tries to quench the thirst of Dhamma.

1. Four evil conducts.

(Killing, stealing , sexual misconducts, Telling lies)

2. Four causes of Committing evils.

(Desire, Hatred, Fear, Ignorance)

3. Six channels of dissipation of wealth.

(Indulgence in intoxication, wandering in Streets, Frequenting theatrical shows, indulgence in gambling, Association with evil friends, habit of idleness ***(For each of this, there are 6 evil consequences in the sutta.)***

4. Four kinds of enemies in the Guise of Friends.

(***Annadaththuhara:*** who associate for gain, ***Vaciparama:*** who render lip service, ***Anuppiyabhani:*** who flatters, ***Apaya Sahaya:*** who brings ruins) ***(For these four types of friends there are 4 identification in the sutta).***

5. Four kinds of real friends.

(***Upakaraka Mitta:*** A friend who helps, ***Samana Sukkha Dukkha Mitta:*** A friend who shares the same weal and woe, ***Atthakkayi Mitta:*** A friend who gives good counsel, ***Anukampaka Mitta:*** A friend who sympathises. ***(These four types of friends also have been described in the sutta)***

6. Four ways of managing one's wealth.

(**1st portion** for day to day expenses, **2nd portion** for business, **3rd portion** also for business, **4th portion** for safe keeping)
(The ways of managing have been described in the sutta)

7. Six sectors of people

i. *East* – Parents, **ii *South*-** Teachers, **iii *West*-** wife/Husband and children **iv. *North*** – Friends and associates **v. *Nadir*** – Employers **vi. *Zenith*** – Monks and Brahmins. ***(The duties of each other of these SIX sets are also clearly describe in the sutta)***

In the above six quarters, there are 5 duties to accomplish by each other. According to the **'Singalovada Sutta'** ***parents*** have to guide their children, dissuading from evil and persuading to do

good, educate them and hand over their inheritance. ***Children*** also in return have to honour and respect their parents keeping up the good name of their family and looking after the parents at their dotage. ***Teachers*** have to train and instruct their pupils well and ***pupils*** have also in return to respect , give their service and attention to them. A ***husband*** must be courteous, faithful and respectful to the ***wife*** providing for her needs and the wife must also be faithful and protect her husband's property, fulfilling her duties well. ***Friends*** sould be generous, courteous, and helpful to each other. ***Employers*** should assign to his employees work according to their strength, pay them in time, give them holidays and ***employees*** in return should perform duties skillfully and uphold the good reputation of their master. ***Laymen*** should reverend to the Monks by welcoming them gladly, and supplying their needs and in return ***Monks*** should be kind to the laymen with compassion and persuade them to do more and more meritorious acts.

Through this **'Sutta'** each & everyone can understand own duties to be performed, to face with a happy and peaceful family life with material progress. All the problems of humanity would dissolve and vanish if this **Singalovada sutta** is to be universally studied and put into practice. If one cannot render service to others, at least, one learns how to live **aloof** at this short life span, without doing any harm or betraying to anybody which is also regarded as a service to society.

For the economical problems, social problems as well as the other family problems each of them has its own solution here. The **'Singalovada Sutta'** stands unique in the world's religious literature because it is free from doctrines as well as from vague mysticism. It's wisdom is clear and brilliant like a diamond. **It is the voice of the Buddha.**

Mrs K.S.N. Goonetilleke

ACKNOWLEDGEMENT

I deem it a pleasure and a happy duty to express my grateful thanks to **Ven Buddhangala Bhikku Ananda Thero** who made me enthusiastic in writing the next book when I was about to stop writing after completing my 12th issue: "සාධු දෘක්ම -The Excellent View-7" at the beginning of 2021.

Giving me a currently important theme too, He-thero urged me to start this book which will be beneficial to the society spiritually as well as morally. Worshipping silently through my pious heart I accepted the challenge, though I have had a certain complication with the vision of my eyes. However, I was strengthened by 'He-thero' when I was unable to find some facts in "Ti-Pitaka" and I was reinforced when I heard this publishing program would thrive from one outstanding success to another. With such blessings and guidance I could complete this book within few months before the end of 2021.

My deepest gratitude and thanks go to **Ven Dr. Mirisse Dhammika thero** who made me to write books on moral virtues to distribute among the Scholarship recipients and the sponsors of **Sri-Lanka – Canada Scholaship Foundation** and the **Parents Memorial Scholarship Foundation**, which were advised by He-Thero since the conception of them. Also he guided me to write my 1st Book **"Ma Piya Guna Samara"** : a biography of a great father: a principal of a school in 2005.

It gives me a great pleasure to record here my gratitude thanks to **Dr. Dayani Siriwardena** who dedicatedly expounded a real illustration of the book and submitted a preface in time.

I take this opportunity to express my sincere gratitude to **Ven Deeghawapiye Suseema Thero** and **Ven Gonadeniye Wimalajothi Himi** for sending me “forewords” with massages of blessings, intently spending their precious time.

I must record here my profound gratefulness to **Justice N.E.Dissanayaka and Mrs. Sriyanganie Dissanayaka** who forwarded a message with blessings, as they always do for the success of these meritorious endeavors.

I wish to recollect and thanks to **Mr. Pemachandra Perera, Mrs. Sujatha Karunaratna** and **Mr Subhash Dulshan** who dedicatedly donated a contribution after reading the previous books of **"Saadhu Dekma:The Excellent View" series.**

Specially I wish to express my thanks to my family members: husband, sons and daughter-in-laws who extend me a helping hand, in one way or another to fulfill my religious goals.

My special thanks go to Mrs Sunethra Hettiarachchi who spent endless hours for proof reading at various stages until the completion of this task. Also I admire the effort taken by Melani, Marium, Shereen and Tarinya: my obedient students, who helped me, in various ways.

My gratitude is extended to all who helped to bring out this book on time, specially to Mr Darshana Relapanawa: the Director of the "Darshana Enterprise (Pvt) Limited

May you all be well and happy !

Mrs K.S.N.Goonetilleke,
392/2, Perera Mawatha,
Kotuwegoda, Rajagiriya.
011 2 877950

ප්‍රවේශය

1

මිනිසත් භවය - Life span of human

සංසාර භව කතරේ අතරමංවී සිටින අයෙකු හට මෙවන් බුද්ධෝත්පාද කාලයක මිනිසත් භවයක් ලැබීමට තරම් වාසනාවක් උරුම වූයේ නම්, එම විඤ්ඤාණය මව් කුසකට බැසගැනීම ස්වාභාවික සංසිද්ධියයි. ස්වකීය පුණ්‍ය බලමහිමයේ තීව්‍රතාවය මත, ලැබුවා වූ භාග්‍යයේ සුරක්ෂිත භාවය රඳා පවතී. අනතුරුව මවගේ සෙනහස සහ ආරක්ෂාව ලබමින් දස මසක් සම්පූර්ණ වනවිට සිඟිති දරුවකු සේ මෙලොව එළිය දකී. ඒ ඔබ අප සැමගේ ජීවන ගමනේ ආරම්භයයි.

ලෝකයේ පැවැත්මට මවක විසින් දෙනු ලබන මෙම සක්‍රීය දායකත්වය අද්විතීයයි. මිනිස් සම්පත් ලොවට බිහිකිරීම පමණක් නොව, උපන් බිළිඳා පෝෂණය කර හදා වඩා නිසි ලෙස සකස්කර ලොවට දායාද කිරීමේ මහඟු ක්‍රියාදාමයේ නියමුවා ද ඇයයි.

ප්‍රඥා ගෝචරව, දූරදර්ශීව, බුද්ධිමත්ව තීරණ ගැනීමේ හැකියාව මෙන්ම දෛනික කටයුතු හමුවේ නොපසුබට උත්සාහයද, අභියෝග ජයගැනීමේ ක්‍රමවේදය ද ඇයගේ ජීවන දර්ශනය තුළින්ම විද්‍යාමාන වීම ඉතා වැදගත් ය. ඉවසීම, දයාව, කරුණාව, ස්ථානෝචිත ප්‍රඥාව, කඩිසර බව, සුභාෂිතය මෙන්ම කායික, මානසික සුපිරිසිදු භාවය යන ගුණාංග, යුග දිවිය තුළ ඇයව ගෙනයනු ලන්නේ ජයග්‍රහණයේ ජය ටැඹ කරාය.

ජීවිත කරළියේ භූමිකාවන් විවිධ ය. අපි කවුරුත් බුද්ධෝත්පාද කාලයක දුර්ලභ වූ මිනිසත් බව ලැබීමට භාග්‍යසම්පන්න වූවෝ වෙමු. අනිකුත් සත්ත්වයන්ට සාපේක්ෂව මිනිසත් භවයක් ලැබීමට ඇති සම්භාවිතාව ඉතා අල්ප බවත්, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබීම ඊටත් වඩා අහඹු සිදුවීමක් බවත්, එම උපත බුද්ධෝත්පාද කාලයක සිදුවීම ඉතාමත්ම දුර්ලභ සංසිද්ධියක් බවත් බුදු පියාණන් වහන්සේ ලොවට වදාරා ඇත.

"දුල්ලභඤ්ච මනුස්සත්තං - බුද්ධුප්පාදොච දුල්ලභං"

"කිච්ඡො මනුස්ස පටිලාභො - කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්ම සවණං - කිච්ඡො බුද්ධානං උප්පාදො"

(ධම්ම පදය - බුද්ධ වග්ග)

It is hard to be born as a human being. The life of mortal is also hard. The opportunity of listening Dhamma does not come easily. The birth of the Buddha is rare.

මිනිසත් බව ලැබීම ඉතා අපහසු බවත්, ජීවිතය පවත්වා ගැනීම අපහසු බවත්, ධර්ම ශ්‍රවණය සඳහා අවස්ථා විරල බවත්, බුදුවරුන්ගේ ඉපදීම දුර්ලභ බවත් මෙහි අදහසයි. ජීවිත ජයග්‍රහණය සඳහා මෙවන් ගාථාවන්හි සත්‍යාර්ථය කුමන භාෂාවකින් හෝ අවබෝධ කටයුතුමයි. ඉතා අපහසුවෙන් ලැබුවා වූ මිනිස් භවය සාර්ථක කළමනාකරණයකින් යුතුව පවත්වා ගැනීමට, උපන් සත්ත්වයාට සද්ධර්මය තුළින් ලැබෙනුයේ අමිල දායකත්වයකි. එහෙත් එහි ඵල නිසි ලෙස ලබාගැනීමට ඇතැමුන් අපොහොසත් ය. සසර ගමනේදී, පෙර භවයන්හිදී, සිදුකරගෙන ඇත්තා වූ කුසලා'කුසල කර්මයන් ද මෙයට හේතු විය හැකියි.

මව් කුසෙන් මෙලොවට ජනිත වූ බිළිඳාගේ ලෝකය මවයි. නෙත් හැර ලොව දෙස බලන ඒ සිඟිත්තාගේ නෙතට ගෝචරවන ආකර්ෂණීය දර්ශනය සිය දයාබර මෑණියන් මය. ඒ සුන්දර දසුනට වඩා ලෝකයක්, මවගේ උණුසුමට වඩා සැනසුමක් බිළිඳාට නැත. මව් කුසෙන් බිහිවීමේදී මව මෙන්ම දරුවාද විඳින්නා වූ වේදනාව අසීමිතය. දරුවා බාහිර ලෝකයේ ජීවය ලබාගන්නේ දැයි මවට ඇත්තේ විශාල බියකි. දරු පැටියා හඬන ශබ්දය ඇසුණ විටම ඒ බිය පහව යන මවට ස්වකීය වේදනා පවා අමතක වී යයි. ඇය දීර්ඝ ලෙස සහනදායී ගැඹුරු සුසුමක් හෙළයි. (a deep breath of relief) විශාල වෑයමක ප්‍රතිඵලයකි. සම්පතක් ලැබීමට වෙහෙස විය යුතුමය.

උත්තරීතර මවු පදවියට හිමිකම් ලද ඇය, ඒ මොහොතේ සිටම, දරුවාගේ ලෝකය සුන්දර කිරීමට අප්‍රමාණ වෙහෙසක් දරයි. ඇයගේ හද තුළ තෙරපෙන මෛත්‍රිය, දයාව, කරුණාව සිය සිරුරේ සෑම රුධිර

නාලිකාවක් ඔස්සේම, සෑම කේශ නාලිකාවක් ඔස්සේම තෙරපෙමින් ගලා බසී.

මෙලොව කිසිම පර්යේෂණාගාරයක් තුළ කිසිම විද්‍යාඥයෙකුට මේ දක්වා සොයාගත නොහැකි වූ තරමේ අධි පෝෂණ ගුණයකින් හා ප්‍රතිශක්තියකින් යුතුව, මවගේ රුධිර ධාතුව සුදෝසුදු සුපිරිසිදු කිරි බවට පත්වන්නේ මෙලොව එළිය දුටු දරුවා කෙරෙහි ඇතිවූ අපරිමිත ස්නේහය නිසාමය. ලොව මවිත කරවන මෙම ආධ්‍යාත්මික මෙන්ම අද්‍යශයමාන අති විශිෂ්ඨ ක්‍රියාදාමයට සමකළ හැකි වෙනත් පර්යේෂණාත්මක සොයාගැනීමක් භෞතික ලෝකයේ මේ දක්වා විද්‍යාමාන වී නැත. මාතෘත්වය කෙතරම් ආශ්චර්යමත් ද? මෙම සංසිද්ධිය මත ලෝකයක් මැවෙද්දී, මවකගේ අභිමානය කවරෙකුට නම් සුළුකොට තැකිය හැකිද ?

"තොටිල්ල පදවන අත ලොව පාලනය කරයි." යන පැරණි ආප්තෝපදේශයේ සත්‍යතාවය යම් පමණකින් හෝ ආදි මිනිසා ද අවබෝධ කරගෙන තිබූ බව මෙයින් පැහැදිළිය. මෙම අදියරේදී මාතෘ භූමිකාවට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

මව හඳුනාගන්නා බිළිඳා මොහොතින් මොහොත අවට ලොව හඳුනා ගැනීමට වෙර දරයි. ආරම්භයේදීම බිළිඳා තම පියා හඳුනාගන්නේ ද මවගේ කාරුණික හඳුන්වා දීමෙනි. අනතුරුව මව් පිය සෙනෙහස මත හැදෙන වැඩෙන දරුවා මොහොතින් මොහොත අවට ලෝකය හඳුනාගනී. **රාග, ද්වේෂ, මෝහ,** කෙලෙස් කිසිවක් නොමැති දරුවාගේ සුසිනිඳු මනස පියකරු ලෙස දිස්වන්නේ මුව කමලෙනි. අහිංසකත්වයේ ප්‍රතිමූර්තියක් බඳු ඒ බිළිඳාගේ, අව්‍යාජත්වයේ සංකේතයක් බඳු වූ සිනහව වැඩිහිටි සැමගේ සිත් පහන් කරවීමට සමත් නොවන්නේද? ඒ සිනහව තුළ කාරුණික ඉල්ලීමක සේයාවක් ඇත. ඒ ආදරය, දයාව, කරුණාව, පෝෂණය මෙන්ම ආරක්ෂාවයි. මෙම පෝෂණය කායික මෙන්ම ආධ්‍යාත්මික ගුණ දහම් පෝෂණයක් විය යුතුමය. එය අවබෝධ කරගැනීම මූලික වශයෙන්ම මව්පියන් සතුය. ජීවිත කාලය පුරාම නිසිලෙස එම අවශ්‍යතා සපුරාලීම දෙමව්පියන්ගේ යුතුකම මෙන්ම, නොසලකාහැරිය නොහැකි වගකීමක් බවට දෙමව්පියන් දැනුවත් විය යුතුමය.

බහ තෝරන අවධියේ සිටම දරුවාගේ හදතුළ පියා කෙරෙහි ගෞරවය රෝපණය කරවීමේ මූලික වගකීම මාතෘ භූමිකාවේ ආරම්භක පදනම විය යුතුයි. එමෙන්ම මව කෙරෙහි ගෞරවය ජනිත කරවීමේ මූලික

වගකීම පීතෘ භූමිකාව සතුය. අන්‍යෝන්‍ය වශයෙන් මෙම වගකීම පැහැර හරින මව් පියන් පසුකාලීනව දරුවන්ගේ ගෞරවයට පාත්‍ර නොවන අතර, ස්වකීය අභිමතය පරිදි පැහැර හරිනු ලැබූ එම මූලික වගකීම් හා යුතුකම් වෙනුවෙන් ඔවුහු දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් මෙම භවයේදීම පීඩාවට පත් වෙති. දෙමාපියන් වශයෙන් සිය දරුවනට ඉටුකළ යුතු යුතුකම් රැසකි. මෙම අදියර එහි මූලාරම්භයයි.

2

මිනිස් දිවියේ දශක දහය - (10 Decades of aging)

බුදු දහමට අනුව මිනිස් දිවියේ දශක 10 කි. (**අභිධම්ම පිටක - විසුද්ධි මග්ග**) වර්තමාන කාලයට සාපේක්ෂව අවුරුදු 100 ක පමණ උපරිම ආයුෂ ප්‍රමාණයක් භුක්ති විඳින අයෙකු සොයා ගැනීම ඉතාමත් අසීරුය. එහෙත් බුදු දහමේ පෙන්වා දී ඇති මෙම අදියර 10, උපන් සෑම සත්ත්වයෙකුටම තම ජීවිත කාලය තුළ විවිධාකාර අත්දැකීම් ලබමින් පසුකිරීමට සිදුවන බව සත්‍යයකි. උපන් මොහොතේ සිටම **උත්පාද, ඨිති, භංග** යන ධර්මතාවයන්ට යටත් වන ජීවිතය, නියත වූ මරණය කරා කුමන අවස්ථාවක හෝ ළඟාවෙයි. ජීවිත කාලය තුළ කුමන අදියරක දී අප කරා මරණය ළඟා වේදැයි අපි නොදන්නෙමු. අප ජීවත් වන කාල සීමාව ඉතා සීමිත විය හැක.

මෙම සිරුර විවිධාකාර රෝගයනට ආකරයකි. (**ගිරිමානන්ද සූත්‍රය**) '**රෝග නිට්ඨං පභංගුරං**' කුරුල්ලන්ට කැදැල්ල මෙනි. බුදුපියාණන් වහන්සේ ඒ බව ගිරිමානන්ද සූත්‍රය තුළ මෙන්ම විවිධ ධර්ම පර්යායන්හි පෙන්වා දී ඇත්තේ අප සිරුරට වැළඳිය හැකි රෝග සියල්ලද හඳුන්වා දෙමිනි. ලොව පහළවූ ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයා බුදු පියාණන් වහන්සේමය. කායික, මානසික රෝගයන්ට පමණක් නොව චෛතසික රෝගයන්ට පවා නිසි ඖෂධ ලබාදී භවදුක සහ වේදනා සමනය කරන ශ්‍රේෂ්ඨතම වෙද ඇදුරාණෝ අපගේ අති උත්තම බුදු පියාණන් වහන්සේමය.

සකල රෝගාබාධයන්ගෙන් සුවය ලැබීමට ධර්ම ඖෂධය හා සමාන ඖෂධයක් නැත. එහෙත් මෙම ධර්ම රසය පානය කිරීමට නුවණ තිබිය යුතුය. පානය කරන තරමට වැඩි වැඩියෙන් සුවය දනෙන මෙම ධර්මයෙහි රසය අනූනය. බලය අද්විතීය ය. එහෙත් දුෂ්ප්‍රාඥයා මෙය පානය කිරීමට අපොහොසත් වෙයි.

තක්ද්ච අප්පටි වානීයං - අසෙවනක මොජවං
පිවන්ති මක්දකෙ සප්පක්දකා වළාහකම්ව අද්ධගුති

(සංයුක්ත නිකාය)

"කෙතරම් ඇසුවත් ඇති වීමකට නොපැමිණෙන්නාවූ, පිටතින් යෙදූ පැණිවලින් නොව, එහිම තිබෙන්නා වූ මිහිරි ගුණයෙන් සුමධුර වූ, එහෙයින්ම ඕජෝ ගුණවත් වූ ඒ ධර්මය, වළාකුළු අතරින් නිකුත් වූ ජලය බොන පිපාසයෙන් පීඩිත මගීන් මෙන් නුවණ ඇත්තෝම පානය කරන්නාහ."

කායික රෝග නිවාරණය පිණිස ලොව බහුලව විවිධාකාර වූ ඖෂධ වර්ග කොතෙක් තිබුණේ වුවද ධර්ම ඖෂධය හා සමාන ඖෂධයක් නොමැත. මිනිසාගේ කය හා මනස අන්‍යොන්‍ය වශයෙන් බැඳී පවතින බවත්, සියල්ලට මනස පූර්වංගම වන බවත් බුදුපියාණන් වහන්සේ පෙන්වා දී ඇත. මනස අපිරිසිදු වීමෙන් අප පසුපස දුක ලුහුබඳින පීඩාකාරී ආකාරයත්, මනස පිරිසිදු වීමෙන් අප පසුපස සැපය ලුහුබඳින සන්සුන් ආකාරයත් බෞද්ධයාගේ අත් පොත වූ "ධම්ම පදය" නම්වූ ග්‍රන්ථයෙහි පළමු ගාථා දෙක තුළින් ඉතාමත් පැහැදිලිව විදහා දක්වෙයි.

මනො පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන - භාසති වා කරෝති වා
තතො නං දුක්ඛමන්වෙති - චක්කංව වහතෝ පදං

කිලිටි සිතින් යමක් කීම හෝ කිරීම නිසා, ගොනාගේ පසුපස කරත්ත රෝදය එන්නාක් මෙන් මිනිසා පසු පස දුක ලුහුබඳී.

All thoughts begin in mind; mind is spreme and mind made are they. If one speaks or acts with impure mind pain follows him like the wheel that comes after the hoof of the ox.

මනො පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පසන්නේන - භාසති වා කරෝති වා
තතො නං සුඛ මන්වෙති - ඡායාව අනපායිනී

පිරිසිදු සිතින් යමක් කීම හෝ කිරීම නිසා, සිරුර අත් නොහරින සෙවණැල්ල මෙන් මිනිසා පසු පස සැපය පැමිණේ.

All thoughts begin in the mind; mind is spreme and mind made are they. If one speaks or acts with pure mind happiness follows him like one's shadow that never leaves;

(ධම්ම පදය - යමක වග්ග)

කායික මානසික රෝගාබාධයන්ට පමණක් නොව, භව සංසිඳීමට, ජරාව මරණයට පත් නොවන අජරාමර නිවන් සුවය හැර සදාකාලික සුවය දෙන වෙනත් ඖෂධයක් චතුරාර්ය සත්‍යයෙන් පරිබාහිරව නැත්තේය.

ධර්මයෙන් සන්නද්ධ වූවෙකුට ඇත්තේ පුදුමාකාර ශක්තියකි. බාහිර බලවේග මගින් හෝ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, පලිගැනීම ආදී දූෂිත මනෝභාවයන් නිසා අන්ධබාලයින් විසින් කරනු ලබන අදෘශ්‍යමාන බලවේග මගින් හෝ, යොදනු ලබන සියළු උපක්‍රම ඔවුන් ඉදිරියේ බල ශූන්‍ය බවට පත්වන්නේ දුෂ්ඨ චේතනා ඇත්තවුන් ලජ්ජාවට හා පරාජයට පත් කරවමිනි. ධර්මයේ ආරක්ෂාව එතරම් ප්‍රබලය. එය බොරු කළ හැකි ප්‍රාඥයෙකු මේ දක්වා ලොව පහළ වී නැත.

වත්මන් සමාජයේ ඇතැම් පාලක-පාලිත, මිතුරු-හතුරු, ගුරු-ගෝල පාර්ශ්වයන් අතර පමණක් නොව ස්වාමි-භාර්යාවන් අතර පවා, එකිනෙකා පරයා යාමේ දීන රුචිකත්වයකින් යුතුව විවිධාකාර ලෙස විවේචනය කිරීම්, මානසික හා ශාරීරික පීඩාවන්ට පත් කිරීම් අනන්තය, අප්‍රමාණය. එහෙත් ධර්මයේ ශක්තිය ලැබූවෙකු ඒ කිසිවකින් පීඩාවට පත්වන්නේ නැත. කොතෙක් අපහාස කළ ද, චෝදනා කළ ද, චරිත ඝාතනය කළ ද, ඒ කිසිවක් ඔවුන්ට අදාළ නොවේ. නෙළුම් කොළය මතුපිටට වැටෙන දිය බිඳුව සේය. ධර්මය එතරම් ප්‍රබලය.

සර්වඥතාඥානයෙන් දුටු සත්‍යය, ලොවට හෙළිකළ බුදු පියාණන් වහන්සේ, අප විසින් කළයුතු ප්‍රධාන දෙය ලෙසට අප්‍රමාදී වීම අනුදැන වදාළහ. නිසි කලට නිසි දෙය, නිසි අයුරින් අප්‍රමාදීව නිම කිරීම සාර්ථක කාල කළමනාකරණයයි. එසේ ජීවත් වන්නාට, පසුකාලීනව පසු තැවීමට ඇති ඉඩකඩ අවමය. අවසන් දශකයට පත්වීමේදී කායික ශක්තිය පලාගෙ ාස් ය. යම් පමණකින් හෝ රඳවාගත හැක්කේ මානසික ශක්තිය පමණි. ඒ සඳහා උසස් මනෝභාවයක් ගොඩ නගා ගෙන තිබිය යුතුමය. එය ආරම්භක දශකයේ සිටම ධර්මානුකූල පසුබිමක් ඔස්සේ ක්‍රමානුකූලව සංවර්ධනය විය යුත්තකි.

විසුද්ධි මග්ගයෙහි පෙන්වා දී වදාළ මිනිසාගේ ජීවිත කාලයේ විවිධ අදියරයන්, බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත සාරාංශගත ග්‍රන්ථයක මිනිසාගේ සාමාන්‍ය ආයුකාලය වසර 100 ක් ලෙස උපකල්පනය කරමින් මෙසේ පැහැදිලි ලෙස දශකයන් 10 ක් ඔස්සේ වර්ගීකරණය කර ඇත.

මන්ද දශකය	-	**Tender decade**
ක්‍රීඩා දශකය	-	**Playful decade**
වණ්ණ දශකය	-	**Colourful decade**
බල දශකය	-	**Strong decade**
ප්‍රඥා දශකය	-	**Wise decade**
හානි දශකය	-	**Decline decade**
වණ්ණ ප්‍රස්ථ දශකය	-	**Stooping decade**
පබ්භාර (ප්‍රවංක) දශකය	-	**Bent decade**
මෝහමූල දශකය	-	**Silly decade**
සයන දශකය	-	**Bed ridden / prone decade**

මෙලෙස මිනිසාගේ ජීවිතය දශක දහයකට ධර්මයේ බෙදා දක්වා ඇත. එබැවින් ඒ ඒ දශකය තුළදී කළයුතු කාර්යයන් පිළිබඳව නිසි අවධානය විමර්ශනාත්මකව යොමු කර ඵලදායී ලෙසින් ජීවිතය ගත කිරීම මිනිසාගේ යුතුකම මෙන්ම වගකීමයි. එහි සඵලත්වය සඳහා විශේෂයෙන්ම පරම්පරාවක් ඉදිරියට ගෙන යාමට පූර්ණ දායකත්වයක් ලබා දෙන යුග දිවිය සුවිශේෂී සන්ධිස්ථානයකි. ස්වාමි භාර්යාවන් විසින් සිය යුතුකම් සහ වගකීම් දෙස සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු අවධියයි. නොඑසේ නම් ඉදිරි පරම්පරාවට උපදින දරුවා මන්ද දශකයේදීම අභාග්‍ය සම්පන්න ලෙස විනාශ වී යයි. සම්බාධක බහුල වුවද, ජීවිත සාර්ථකත්වයට යුග දිවිය නිර්මාණය කරදෙන්නේ මාහැඟි භූමිකාවකි.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පෙරුම් දම් පුරා, සර්වඥතාඥානය අවබෝධ කරගත් අපගේ ලොව්තුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සිය බුදු නුවණින් දැක, අනවරත සංසාර ගමනේ, අප්‍රමාණ දුක් විඳිමින් මැරී මැරී උපදින ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව, ලද මිනිසත් භවයේ නිසි ඵල ලැබීම පිණිස අපට නිසි මග පෙන්වා දී ඇත. අප විසින් කළ යුත්තේ ඒ ඔස්සේ පා නැගීම පමණි.

ජීවිත කාලයේ දශක 10 තුළ මනා අවබෝධයකින් යුතුව සිහි නුවණින් තම **යුතුකම්** හා **වගකීම්** පිළිබඳව දැඩි කැපවීමකින් යුතුව **ස්වාර්ථය** මෙන්ම **පරාර්ථය** පිණිස තම චර්යාවන් සකසා ගතයුතු ආකාරයත්, එය ලෞකික මෙන්ම ලෝකෝත්තර සැපත කරා ඉවහල් වන ආකාරයත්, සසර ගමන කෙටි කර ගැනීම පිණිස එයින් ලැබෙන පිටිවහලත් සම්බුදු දහම තුළ පැහැදිලිව දේශිතය. ඒ අනුව ජීවිත කාලය මනා කළමනාකරණයකින් යුතුව අප්‍රමාදීව, විමර්ශනාත්මකව, ධර්මානුකූලව කටයුතු කරන්නාට ධර්මයේ ආරක්ෂාව ලබමින් ලෞකික මෙන්ම ලෝකෝත්තර සුවය කරා ළඟා විය හැක.

"ධම්මෝ හවෙ රක්ඛති ධම්ම චාරී"

ධර්මානුකූලව ජීවත් වන්නා ධර්මය විසින් ආරක්ෂා කරයි. එහෙත් අවම වශයෙන් දෛනික ජීවිතය තුළ පඤ්ච ශීලය රැකගත නොහැකිව, පාප කර්මයන්ට හසු වන්නන් හට ධර්මයේ ආරක්ෂාව අහිමි වනු ඇත. **කෙතරම් අභාග්‍යයක් ද?**

මඩ ගොහොරුවක බැසගෙන සිටින්නෙකු අමතර බරක් ඉසිලීමට උත්සාහ කරන්නේ නම් තව තවත් මඩේ එරෙනු විනා ගොඩ ඒමක් නැත. එබැවින් '**සීලය**' නමැති පාදම මත තමාගේ ස්ථාවරය පළමුව සකස්කර ගත යුතුමය. එහි මූලික අඩියර **පඤ්ච ශීලයයි.**

PICTURE DESCRIPTION

This Picture reveals the life circle of human beings. One who starts the life as a tender baby, finally at the dotage gets into the Bed-Ridden Stage, following 10 periods as categorized in the **Visuddhi-Magga**, approximately taking 100 years of life expectancy.

1. **Tender Decade** - මන්ද දශකය
2. **Playful Decade** - ක්‍රීඩා දශකය
3. **Beautiful Decade** - වණ්ණ දශකය
4. **Strong Decade** - බල දශකය
5. **Wise Decade** - ප්‍රඥා දශකය
6. **Declining Decade** - හානි දශකය
7. **Stooping Decade** - වණ්ණ ප්‍රස්ත දශකය
8. **Bend Decade** - පබ්භාර දශකය
9. **Silly Decade** - මෝහ මූල දශකය
10. **Bed-ridden Decade** - සයන දශකය

One who starts the life as a baby, ends the life as a feeble old human. From cradle to coffin all humans have to suffer a lot. After the death, one gets a rebirth. This is a universal phenomenon. It’s unending until gets into **supreme Nibbana.**

So it is obvious to follow a righteous livelihood at each and every decade as far as possible at this rare human birth, fulfilling the duties and responsibilities as directed and preached vividly by **the Supreme Buddha.**

10 Decades of Human Life



3

මන්ද දශකය (1) - The Tender decade

මෙම ආරම්භක දශකය වූ මන්ද දශකය උපන් බිළිඳාගේ ජීවිතයේ ආරම්භක වසර කිහිපයයි. බිළිඳා ශක්තිමත් නැත. දෛනික සියලු කටයුතු සඳහා දෙමාපිය සහාය සහ මග පෙන්වීම අනිවාර්යමය. මව සහ පියා අනුකරණය කරන අවධියයි. ඒ සඳහා යහපත් පසුබිමක ඉඩ හසර සකසා වැඩිහිටි අවධානය මත දරුවා වැඩෙයි. දරුවා දකින දෙය, ඇසෙන හඬ දරුවාගේ පෞරුෂ වර්ධනයට හේතු වෙයි. අදූරදර්ශී දෙමාපියන්ගේ අසමගිකම්, කායික හා වාග් ප්‍රහාර හමුවේ දරුවාගේ පෞරුෂ වර්ධනයට එල්ල වන්නේ මරු පහරකි. එවන් අවස්ථා ඉවසීමෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව මග හරවා ගැනීම මව් පියන්ගේ වගකීමයි. එසේ නොවන කල්හි යහපත් දරුවෙකු නිසි ලෙස සකසා සමාජයට දායාද කිරීමේ වගකීම ඔවුන් අතින් ගිලිහී යනු ඇත. අසතුටෙන් වුවද එහි ප්‍රතිඵලය මූලික වශයෙන්ම විඳ දරාගැනීමට සිදුවන්නේ මව් පියන්ට මය.

එවන් දරුවා සමාජගත වූ පසු ඔහු තුළින් ක්‍රෝධය, වෛරය, පළිගැනීම් වැනි සමාජ ද්‍රෝහී හැඟීම් නිතැතින්ම පැන නගී. නීති විරෝධී ක්‍රියාවන්ට පවා සම්බන්ධ වීමට සිත් පහළ වෙයි. ඒ සඳහා අවශ්‍ය වන මූලික බීජය ඒ හදවත් තුළ රෝපණය වී ඇත්තේ ළාබාල අවධියේදීමය. ඉරණම කුමක් වුවත් දරාගනිමින් සුසුම් හෙළමින් පසුතැවෙනු විනා මෙම අදියරේදී දෙමව්පියන් හට කළ හැක්කක් නැත. ළාබාල අවධියේදී මව් පියන්ගේ පූර්ණ අවධානය යොමුවිය යුත්තේ කායික පෝෂණය සඳහා පමණක් නොවේ. මනසේ නිසි පෝෂණය ද ඉතා සුපරීක්ෂාකාරී ලෙසින් ලබා දිය යුතු අවධියක් බවට දැනුවත් විය යුතුමය.

ඇතැම් අන්ධබාල වත්මන් මව්වරු, පියා දැනුවත්ව හෝ නොදැනුවත්ව තම දරුවා ළාබාල අවදියේදීම ජල පහරකට, පාලු ළිඳකට හෝ වැසිකිළි වළකට විසිකර දැමීමට තරම් කුරිරු වන අවස්ථා අද සමාජයේ බහුලව නැතත්, ප්‍රකෘති ඇසින්ද දැකිය හැකි ජීවමාන සංසිද්ධීන් බවට පත්ව ඇත. තමා වෙත දෛවයෙන් ලද සම්පතකට එවන් අභාග්‍ය සම්පන්න ඉරණමක් අත් පත් කර දී දෙමාපියන් වශයෙන් ඔවුනට සහනයක් ලද හැකිද? ගැටලු පෙරටත් වඩා උග්‍ර වීමෙන්, කායික

හා මානසික නීතිමය දඬුවම් විඳිමින් සිර මැදිරියක හිරවී මුළු ජීවිත කාලය පුරාම සුසුම් හෙළනු විනා වෙනත් විකල්පයක් නැත්තේමය.

උපන් සත්ත්වයෙකුගේ ජීවිතය අත්තනෝමතික ලෙස විනාශ කර දැමීමට කිසිවෙකු හට පෞද්ගලික අයිතියක් හෝ නෛතික බලයක් නැත. පඤ්ච ශීලයෙහි පළමුවන සිල් පදය මෙලෙසින් කඩ කරන්නා හට සතර අපායේ දොරගුළු විවෘත වනු විනා වෙනත් යාහැකි තැනක් නැත්තේමය.

ඇතැම් දෙමාපියෝ ජීවිතයේ සුන්දරම අවධියේදී තමාට කර්මානුරූපීව උරුම වූ දරු සම්පත නිධානයක් සේ දකිති. එය ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් නොවුනද, ලද පමණින් සැනසෙති. කර්මය හා කර්මඵල විශ්වාස කරන්නවුන්ගේ ප්‍රඥාව යම් පමණකින් හෝ දියුණු වී තිබීම නිසා කිසි විටෙකත් දරුවා ප්‍රතික්ෂේප නොකරයි. මිනිසත් භවයේ ශ්‍රේෂ්ඨත්වය එයයි.

තමාට උරුම වූ දරු සම්පත ලද පමණින් සැනසී කෙසේ හෝ හදා වඩා පෝෂණය කිරීම, ගුණ ධර්ම මත පිහිටුවා අධ්‍යාපනය ලබා දීම ආදී සියලු යුතුකම් නිසි ලෙස සපුරාලන දෙමව්පියන් අද සමාජයේ නැත්තේ නොවේ. එවන් දෙමාපියන් හට ස්වභාව ධර්මයෙන් පවා ආශිර්වාද ලැබෙනු ඇත. ඔවුන්ගේ උත්සාහය කවරෙකුගේ හෝ මැදිහත් වීමෙන් කවදා හෝ මල් ඵල ගැනෙනු ඇත. මෙයට ජීවමාන උදාහරණ "**මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම**" සතුය.

සම්පත් අවම පවුලක උත්පත්තියෙන්ම ආබාධිත එවන් දරුවෙකු කුඩා කල සිටම ආදරයෙන් හදා වඩා පෝෂණය කර ගුණ දහම් මත පිහිටුවා, විශ්ව විද්‍යාල අධ්‍යාපනයද ලබාදී සමාජයට ඵලදායී පුරවැසියෙකු ලෙසින් සමාජගත කළ ඒ දිරිමත් දෙමාපියන් හට සමස්ත ලෝකයේම ගෞරවය හිමිවනු නොඅනුමානයි. අද, දැනුමට සුදුසු, රජයේ රැකියාවකින් මාසික වේතනයක් ලබන ඔහු සතු ආධ්‍යාත්මික සම්පත ස්වකීය දයාබර දෙමාපියන් ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලද **ආදරය, දයාව** සහ **කරුණාව** වන අතර, භෞතික සම්පත ජීවිත කාලය පුරාම තමාට දෛවයෙන් උරුම වූ රෝද පුටුව යි.

අද, **යථා ලාභ සන්තුෂ්ටියෙන් යුතුව** ධර්මානුකූල දිවි පෙවෙතක් ගෙන යන ඔහු දහම් පාසැල් දරුවනට ස්වේච්ඡාවෙන් දහම් අධ්‍යාපනයද ලබා දෙයි. නිවසේ සියලු අවශ්‍යතා කළමනාකරණය කර

ගනිමින්, ස්වකීය බාල සොහොයුරියන්ගේ අධ්‍යාපනයට ද අත හිත දෙමින් මනා පෞරුෂයකින් යුතුව යහපත් දිවි පෙවතක් ගත කරයි. සියල්ල ත්‍රිලක්ෂණයට යටත් බවත්, මෙම නැවතුම් පොළ සංසාර ගමනේ එක් නැවතුම් පොළක් පමණක් බවත් ධර්මාවබෝධයෙන් ලද ප්‍රඥාව තුළින් අවබෝධ කරගෙන ඇති ඔහු අභියෝග හමුවේ නොසැලෙන උදාර පෞරුෂයකට හිමිකම් කියයි.

"ධම්මෝ හවේ රක්කති ධම්ම චාරී"

ධර්මානුකූලව ජීවත්වන්නා ධර්මය විසින් ආරක්ෂා කරන බව තරයේ විශ්වාස කරන ඔහු සමබර මානසිකත්වයකින් හා ආත්ම ශක්තියකින් යුතුව තම වෘත්තිමය ක්ෂේත්‍රය තුළ අදාළ කාර්ය භාරයද නිසි ලෙස (duty conscious) උසස් නිලධාරීන්ගේ ආදර ගෞරවයට පාත්‍රවෙමින් ඉටුකරනු ලබයි. ස්වකීය දියුණුවට අත හිත දුන් සැවොම නිරන්තරයෙන්ම කෘතඥ පූර්වකව සිහිපත් කරමින් ඔහු යන මේ ගමන් මඟ අභියෝග හමුවේ පසුබසින සමස්ථ ආබාධිත සිසු පරපුරටම මහඟු ආදර්ශයකි.

මන්ද දශකයේදී නිසි පෝෂණය, මව් පියන්ගේ පූර්ණ ආරක්ෂාව සහ කැපවීම, ආදරය, දයාව, කරුණාව, මවගේ පියාගේ උණුසුම මෙන්ම ත්‍රිවිධ රත්නයේ මහානුභාව බල සම්පන්න ආශිර්වාද ලබමින් හැදෙන වැඩෙන දරුවා ක්‍රීඩා දශකයට පා තබන්නේ, කායික අශක්නුතාවයක් (physically impared) පැවතියේ වුවද, ප්‍රකෘති මානසික සමතුලිතතාවයෙනි. මෙම අදියරේදී ගුණවත්, බුද්ධිමත් සත්පුරුෂ, මව් පියන් ගේ කැපවීම අපරිමිතය. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය මැන බැලීමට හැකි මිනුම් දණ්ඩක් මේ දක්වා ලොව පහළ වී නැත.

4

ක්‍රීඩා දශකය (2) - The Playful decade

උපන් දරුවාගේ ජීවන ගමනේ දෙවන අදියර ක්‍රීඩා දශකයයි. දරුවා අවට ලෝකය හඳුනා ගැනීමට වෙහෙසෙයි. දකින, පෙනෙන, ඇසෙන සෑම දෙයක් පිළිබඳවම තොරතුරු දැනගැනීමේ කුතුහලයකින් පසුවෙයි. සිය බාහු එතරම් ශක්තිමත් නොවුනද, සිය නෙත ගැටෙන දෙය දෙසට අත් දිගු කරමින් "අර මොකක්ද? මේ මොකක්ද?" යනුවෙන් මව් පියන්ගෙන් අසන වාර ගණන අනන්තය. වරක් කියූ පමණින් ළපටි මනසට උකහා ගත නොහැකි දරුවා 100 වාර ගණනක් ඇසුවේ වුවද, මව් පියන් කාරුණිකව පහදා දෙනු විනා දරුවා සමග උරණ වී ඔහුට පහර දෙන්නේ නැත.

යම් දිසාවකට යාමට අවශ්‍යනම් ඒ දෙසට අත දිගු කරනු විනා ඔහුගේ අවශ්‍යතාව පැහැදිලිව ප්‍රකාශ කිරීමට ඔහුට ශක්තියක් නැත. මව ගේ හෝ පියාගේ දෑත් මත හොවාගෙන සිටින දරුවා මෙලෙසින් ක්‍රමයෙන් අවට ලෝකය හඳුනා ගනී. මෙම අදියරේදී පවා දෙමාපියන් ඉතාමත් ඉවසිලිවන්ත නොවන්නේ නම් දරුවා මානසිකව කඩා වැටෙයි.

මෙලෙසින් කායික මානසික ශක්තිය ලබාගන්නා දරුවා අනතුරුව ස්වාධීනව ක්‍රීඩාවන්හි නිරත වීමට රුචිකත්වයක් දක්වයි. දඟකාර ගති පැවතුම් පෙන්නුම් කිරීමට පෙළඹෙයි. ශාරීරික කුසලතාවන් එළිදැක්වෙන අවධියයි. තමාට හැකි යැයි සිතෙන සෑම කාර්යයකම නිරත වීමට උත්සාහ කරයි. මව සහ පියා නිරතුරුවම අනුකරණය කරයි. දරුවාගේ ක්‍රියාශීලීත්වය අගය කළයුතු අවධියයි. දෙමාපියන් ඒ සඳහා ඉඩ හසර ලබා දිය යුතුයි. එහෙත් දෙමාපියන්ගේ අධීක්ෂණය වැදගත්ය. ආරක්ෂාව පිළිබඳ දැනුමක් දරුවාට නැත. එබැවින් විශාල අනතුරකට ඇති ඉඩ දෙමාපියන් විසින් අවම කර, දරුවාට සාමාන්‍ය පරිදි අත්දැකීම් ලැබීමට සුදුසු ලෙස පසුබිම නිර්මාණය කර දීම වැඩිහිටියන්ගේ යුතුකම හා වගකීමයි.

මෙම අදියරේදී දරුවා සම වයසේ දරුවන් සමග සෙල්ලමින් ගතකිරීමට ද මහත් රුචිකත්වයක් දක්වයි. ජය පරාජය හමුවේ රණ්ඩු දබර ඇතිකර ගන්නේ නම් දෙමාපිය මැදිහත්වීම අවශ්‍යමය. සෙල්ලම් වයසේදී එකිනෙකා අතර ඇතිවන සුළු සුළු ගැටලු අමනාපකම් සම

සිතින් දරා ගැනීමේ අවශ්‍යතාව මුලින්ම හඳුන්වා දෙන්නේ දෙමාපියන් ය. කණ්ඩායමක් වශයෙන් කටයුතු කරද්දී සාමූහික වගකීම් පිළිබඳ මූලික අවබෝධය දෙමාපියන් විසින් ලබාදිය යුතුමය. එවිට ඒ ඒ අවස්ථාවට අදාළ අත්දැකීම් ඔවුන් විසින්ම ලබනු ඇත. ඒ අනුව ක්‍රීඩාවන්හි නිරත වන දරුවා ආත්මාර්ථකාමී නොවී මිතුරන් ඇසුරු කරයි. ක්‍රීඩා කරන අතර තුරදී වුවද, එක් අයෙකු පසු බසින්නේ නම් ඔහුට ද මානසික ශක්තිය ලබා දී උද්යෝගිමත් කර තම කණ්ඩායමට එක්කර ගනී. කායික අපහසුතාවයක දී වුවද අන් ක්‍රීඩකයන් ඔහු ගැන සැලකිලිමත් වෙයි. ඒ පරාර්ථකාමී බව සහ බෙදා හදාගෙන භුක්ති විඳීමේ ආකල්ප (give and take policy) මව් පියන් විසින් අගය කිරීම දරුවාගේ ආකල්ප වර්ධනයට හේතු වෙයි. මෙම අවදියේදී ද දෙමාපියන්ගේ කාර්ය භාරය සුළු පටු නොවේ.

මෙසේ හැදී වැඩී එන දරුවා වඩාත් පුළුල් වූ පසුබිමක ක්‍රීඩාවන්හි නිරතවීමට වෙහෙසෙයි. පාසලේදී ඒ සඳහා පුහුණුව ලබන ඔහු අන්තර් පාසැල් තරගවලට ඉදිරිපත් වෙයි. ලබන්නාවූ ජයග්‍රහණයන් පාසැල් මට්ටමෙන් අගය කිරීමේදී ඔහු තව තවත් උද්යෝගිමත් වෙයි. සිය හැකියාවන් හා කුසලතාවයන් අගය කිරීම මෙම අදියරේදී දෙමාපියන් ගේ මෙන්ම ගුරුවරුන්ගේ යුතුකමයි. කිසිදු භේදයකින් තොරව සාධාරණ ලෙස එම කාර්ය භාරය ඉටුවීමේදී දරුවා ඉදිරියට යන්නේ වඩාත් ජව සම්පන්න ලෙස ප්‍රබල ආත්ම ශක්තියකිනි. දරුවාට මෙම අදියරට ළඟාවීමට දෙමාපිය ගුරුවරු වැඩිහිටියන්ගෙන් ලැබෙන්නා වූ අමිල දායකත්වය අතිප්‍රබලය.

අනතුරුව අන්තර්ජාතික මට්ටමේ තරඟ වලට පවා දරුවා ඉදිරිපත් වෙයි. මෙම අදියරේදී සිය ජයග්‍රහණය සිකුරු විය හැකියි. එහෙත් මෙම අදියරට තමා පැමිණි ආකාරය මතකයෙන් ගිලිහී ඇත්නම් ඔහු ලබනුයේ නිසි ජයග්‍රහණයක් නොවේ. එය ඔහුගේ අභිවෘද්ධියට නොව ජීවන මගෙහි පරිහානියට ම හේතු විය හැකියි. අත් පා සොලවා ගැනීමට නොහැකි වූ මන්ද දශකයේ සිට තමා ආ ගමන් මග පිළිබඳව නිසි අවබෝධයකින් යුතුව, දෙමාපිය ආශිර්වාදය ඇතිව, ආත්මාර්ථකාමීත්වයෙන් තොරව ක්‍රීඩා පිටියට බසින ක්‍රීඩකයා ලබනුයේ ස්වයං ජයග්‍රහණයක් පමණක් නොව සාමූහික ජාත්‍යන්තර ජයග්‍රහණයකි. එවන් ජයග්‍රහණයන් ලැබීමට හේතු වන්නේ ආකල්පමය සංවර්ධනයකින් ද ඔහු පෝෂණය ලබා තිබීමයි. එය උත්තරීතර විජයග්‍රහණයක් වන්නේ එතුළින් ඔහු, දෘශ්‍යමාන වන

ජයග්‍රහණයෙන් ඔබ්බට දිවෙන ජීවිත ජයග්‍රහණයට ද මග පාදාගෙන ඇති හෙයිනි.

පසුගිය වසරක ඔලිම්පික් ක්‍රීඩාවක (Para Olympic) යෙදුණ ආබාධිත ක්‍රීඩකයින් කණ්ඩායමක් මීටර් 100 යේ ධාවන තරගයක් හමුවේ ක්‍රියා කළ ආකාරය මෙයට කදිම නිදසුනක් සපයයි. සාමාන්‍යයෙන් තරග කරුවන්ගේ අභිලාෂය පළමු තැන හිමිකර ගැනීමයි. එදින තරගය ආරම්භ කිරීමට සංඥාව ලද විගස තරග කරුවෝ යුහුසුළුව ධාවන තරගය ආරම්භ කළහ. දිනුම් කණුව පෙනෙන තෙක්මානයේ දී එක් ධාවකයෙකු සමබරතාවය ගිලිහී අනපේක්ෂිත ලෙස බිම ඇද වැටුණි. දිනුම් කණුව අසලටම ගිය අනිකුත් ජයග්‍රාහකයින් ජයග්‍රාහී සීමාව ළඟ නතර වූවා මිස සීමා ඉර (Finish line) අභිභවා යාමෙන් වැළකුණි. දෙදෙනෙකු ආපසු දුව ගොස් වැටී සිටි තම මිත්‍ර ක්‍රීඩකයාද ඔසවා ගෙන විත් ඔහුද සමගින් ජයග්‍රාහී සීමා ඉර පසුකර ඇත. ක්‍රීඩාවේදී ඔවුන් තුළ තිබූ සාමූහික සුහදතා ආකල්පය (sports spirit) කෙතරම් අගනේද? ස්වකීය ජයග්‍රහණය ඒකායන අරමුණ කර නොගත් ඔවුන්, ආත්මාර්ථකාමී නොවී කටයුතු කිරීමෙන් ලද සමස්ථ ජයග්‍රහණය මුළු ලොවටම මහඟු ආදර්ශයක් ලබා දීමට සමත් විය.

කායික සංවර්ධනය පමණක් නොව දරුවන් අතර මෙම වයසේදීම ගොඩ නැගිය යුතු සදාචාරාත්මක ආකල්ප සංවර්ධනයක අවශ්‍යතාව පිළිබඳව ද මව්පියන් හා වැඩිහිටියන් දැන සිටිය යුතුමය. ජය පරාජය සමසිතින් දරා ගැනීමටත්, සතුට බෙදා හදා ගැනීමටත් දරුවා පුරුදු කළ යුතු අවධියයි. ජයග්‍රාහකයින් කෙරෙහි වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ජනිත නොවන ලෙසට දරුවාගේ මනස සකස් කිරීමද මෙම අදියරේදී මව් පියන් හා වැඩිහිටියන් සතු යුතුකමකි. දරුවාගේ පරාජය වුවද සතුටු සිතින් භාර ගෙන ඔහුගේ ඉදිරිපත්වීම පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කතා කළ යුතුයි. ඉදිරි අවස්ථාව සඳහා සාර්ථකව මුහුණ දීමට ආත්ම ශක්තිය දරුවාගේ හද තුළ ගොඩ නැංවීම කෙරෙහි මෙම ක්‍රීඩා දශකයේදී මව් පිය අවධානය විශේෂයෙන්ම යොමු කිරීම අතිශයින්ම වැදගත්ය. Failiure is the pillar of success "පරාජය යනු ජයග්‍රහණයේ ස්ථම්භයයි." මෙවන් ප්‍රස්ථාපිරුළු ඔස්සේ ද දරුවා දිරිමත් කිරීම වටී. පරාජය වූ දරුවාගේ දායකත්වය නොවන්නට අනෙකාට ජයග්‍රහණයක් නොලැබෙන බවද පෙන්වා දී දරුවා වඩාත් දිරිමත් කරමින් නැවත ඉදිරිපත් වීමේ ශක්තිය සහ අවශ්‍යතාව ඔහුගේ මනස තුළ ගොඩ

නැගිය යුතුයි. එවිට මෙම අදියරේදීම, පරාජය හමුවේ පසු නොබසින මානසිකත්වය දරුවාගේ හදවතේ ස්ථාපිත වෙයි. මව් පිය භූමිකාවේ ශ්‍රේෂ්ඨත්වය එයයි. දරුවා උද්දීපනය කිරීමට (motivate & encourage) මෙම අවස්ථාවේදී මව් පියන් ඔහු වටා සිටිය යුතුමය.

දරුවන් සමග මව් පියන් කයින් මෙන්ම මනසින් ඒකරාශීව ජීවත් නොවන්නේ නම් මෙම මහඟු අවස්ථාව දරුවාගෙන් ගිලිහී යයි. වගකිවයුත්තෝ දෙමාපියන් මය. මව සහ පියාගේ රැකවරණයෙන් ගිලිහී හුදෙකලාව ජීවත් වෙන දරුවෙකුට මෙවන් මහඟු අවස්ථාවල් මග හැරෙන අතර, එය ඔහුගේ පෞරුෂ වර්ධනයට සපයනු ලබන්නේ සෘණාත්මක බලපෑමකි. මෙම අදියරේදී දරුවා, මව සහ පියා සමග නිරන්තරයෙන්ම යහපත් ලෙස අන්‍යෝන්‍ය සන්නිවේදනය පවත්වා ගැනීම වටී. ඔවුන් මව්පිය ඇසුරේ ජීවත් විය යුතු අතර, එසේ ගෘහස්ථ පරිසරය සකසා ගැනීමට අපොහොසත් වන්නේ නම් එතුළින් පෙනී යන්නේ දෙමාපියන්ගේ අපගාමී පෞරුෂය යි. එවන් දෙමාපියෝ අභිමානවත් මාතෘත්වයට සහ අභිමානවත් පීතෘත්වයට නුසුදුස්සෝ වෙති.

මෙම ක්‍රීඩා දශකයේදී දරුවා හට ලබාදිය යුතු සෞඛ්‍යමය පුරුදු (Health Habits) රාශියකි. දරුවාගේ ශාරීරික නිරෝගීතාවය වෙනුවෙන් බුද්ධිමත් දෙමව්පියන් අතින් මෙම අංශය කිසිසේත් ගිලිහී නොයයි. එහෙත් දෛනිකව සෞඛ්‍ය පුරුදු වලට අනුගත වී නැති තිරිසන් සතුන් මෙන් හැදී වැඩී ඇති පිරිසක්ද සමාජයේ නැත්තේ නොවේ. ඔවුන් දරුවන්ට කලට වේලාවට අනුගත වීමට සෞඛ්‍ය පුරුදු පුහුණු කරවනවා තබා ස්වකීය පෞද්ගලික සෞඛ්‍යය කෙරෙහිවත් නිසි අවධානයක් යොමු කරන්නේ නැත. මෙහි වටිනාකම නොදත් මෙවන් දෙමාපියන් අළුයම අවදි වූ විට කට සෝදාගෙන පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීමට දරුවා පොළඹ වන්නේ නැත. මෙය දෛනික පුරුද්දක් කර ගන්නේ නම්, කා හට වුවද සෞඛ්‍යමය වශයෙන් ශාරීරික සමතුලිතතාවයක් පවත්වා ගැනීමට එය ඉමහත් දායකත්වයක් සපයයි.

මුඛ සෞඛ්‍යය කෙරෙහිද දැඩි අවධානයක් යොමු කළයුතු මෙම අදියරේදී, නිසි ලෙස දත් පිරිසිදු කරගත යුතු ආකාරය දරුවාට මැනවින් හුරු පුරුදු කළ යුතුමය. මුලදී තරමක අපහසු කාර්යයක් සේ පෙනුනද මෙම උත්සාහය බුද්ධිමත් දෙමව්පියන් අතහරින්නේ නැත.

ශරීරකෘත්‍යය සඳහා වැසිකිළි යන දරුවාට සබන් යොදා දෙඅත් පිරිසිදු කර ගැනීමේ අභ්‍යාසයද පුරුදු පුහුණු කළ යුත්තේ මෙම අදියරේදීමය. දිනකට දෙවරක් ඇඟ සෝදා ගැනීමටත්, අසනීපයක් නොවන අවස්ථා වලදී ස්නානය කළ යුතු පිළිවෙළත් දරුවන්ට මෙම ක්‍රීඩා දශකයේදීම පෙන්වා දිය යුතුය. මෙවන් සරල පුරුදු පිළිබඳව සැලකිලිමත්ව අභ්‍යාස කරවීමෙන්, පසුකාලීනව මහත් ව්‍යසනයනට ගොදුරු වීමට ඇති ඉඩකඩ බොහෝ සෙයින් අවම කරගත හැක. වත්මන් සමාජයේ තිබෙන "**Covid - 19**" වසංගතය මෙහි සත්‍යතාවය ලොවට පෙන්වා දී ඇත. මෙවැනි සරල පුරුදු දෛනිකව පවත්වා ගැනීමට දරුවා පුරුදු පුහුණු කරවීම දෙමව්පියන්ගේ වගකීමක් මෙන්ම යුතුකමකි.

5

වණ්ණ දශකය (3) - The Beautiful decade

මිනිස් ජීවිතයේ තෙවන දශකය මෙයයි. මෙම අදියරේ දී ළමා සිත ලස්සන, පියකරු දේ කෙරෙහි ඇදී යයි. තාරුණ්‍යයේ හැඟීම් ඉස්මතු වෙයි. ඉක්මනින්ම සමාජ රැල්ලට හසුවෙයි. නවීකරණය වීමට මහත් රුචිකත්වයක් දක්වයි. දියණියක නම් මවකගේ විශේෂ අවධානය යොමු විය යුතුම අවධියයි.

මේ අදියරේ සිට විශේෂයෙන්ම දියණියක විසින් දෛනික ගෘහස්ත කටයුතු සඳහා පුහුණුවක් ලැබිය යුතුමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශකත්වය ලබා දීම මවගේ යුතුකමයි. මවක් දියණියට අණකිරීමෙන් පමණක් එම යුතුකමෙන් බැහැර වන්නේ නම් එය ද ඉතාමත් අභාග්‍ය සම්පන්න දසුනකි.

කවදා හෝ උත්තරීතර මාතෘත්වයට හිමිකම් කියන එම දියණිය, සිය මව් විසින් නිසි ලෙස සකසා සමාජයට දායාද නොකිරීමේ හේතුවෙන් ගැටලු රාශියකට මුහුණ දෙයි. මෙම අදියරේදී තම යුතුකම් පැහැර හැරිය මව, කිසියම් දිනයක දියණිය වෙනුවෙන් මානසික පීඩා විඳියි. කඳුළු සලයි. එහෙත් දෝෂාරෝපණය තමා වෙතම එල්ලවනු විනා වෙනත් කෙනෙකු ඒ සඳහා වන්දි නොගෙවනු ඇත. ඇතැම් විට විවාහපත් දියණියගේ විවාහ ජීවිතය දෙදරා යාමටද මෙය හේතුවිය හැකිය. එබැවින් කාරුණික දයාබර මවක් ලෙස ඒ ඒ අදියරේදී තම යුතුකම් සහ වගකීම් කෙරෙහි මනා අවබෝධයකින් යුතුව උත්තරීතර මාතෘත්වයේ නාමයෙන් තම දියණිය නිසි ලෙස සකසා සමාජගත කිරීමේ භාර ධූර කාර්යය ට කැපවිය යුතුමය.

දෛනික ජීවිතයේදී වණ්ණ දශකය පසුකරන දියණියක විසින් පිරිසිදුකම, අරපිරිමැස්ම, ඇඳුම් සෝදා ගැනීම සහ නිසි පරිදි තද අව්වේ වේලා ගැනීම, ඇඳුම් නිසි ස්ථානයක පිළිවෙළකට අසුරා තැබීම ඉතා වැදගත්ය. ඇතැම් නිවෙස් වල ඇඳුම් තැබීමට නිසි තැනක් නැත. අව්වට දැමූ ඇඳුමක් හොඳින් වේලුන පසු කළ යුත්ත නොදනී. ඒ සඳහා පිළිවෙළක් දරුවන්ට පෙන්වා දී නැත. සෑම පුටුවක් උඩම, සෑම කාමරයකම, සෑම මුල්ලකම ඇඳුම් අවිධිමත් ලෙස දමා තිබීම අප්‍රසන්න දසුනකි.

වර්ණ දශකයේ පසුවන දියණියන් සිටින නිවස සුන්දර නිවසක් වීම මවගේ දක්ෂතාවය විදහා දක්වයි. එමෙන්ම සුළු වශයෙන් ඉරී ගිය ඇඳුමක් මසා සකස්කර ගැනීමට තරම්වත් දියණියක් දැනුවත් වී නැත්නම් එයින් පිළිබිඹු වන්නේ ද මවගේ අකාර්යක්ෂම බවයි. සමාජයෙන් මවට දෝෂාරෝපණය සෘජුව එල්ලවීම ස්වාභාවිකය. එවන් මව නාම මාත්‍රික මවක් පමණි. මාතෘත්වයේ උත්තරීතර භාවය රැක ගැනීමට අපොහොසත් වී ඇත.

උදෑසන අවදි වූ පසු නිදා සිටි සයනය නිසි පිළිවෙළට සකස් කර තැබීම, ඇඳුම් මෙන්ම තමාගේ පොත් පත් පිළිවෙළකට තබා ගැනීම, කෑමට බීමට පාවිච්චි කරන භාජන නිසි ලෙස සෝදා නිසි තැන්වල තැන්පත් කර තැබීම, නිරතුරුවම ගෙබිම අතුගා කුණු කසළ අදාල භාජනයකට දැමීම ආදී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරන සාමාජිකයින් සිටින නිවහන කෙතරම් පිවිතුරු ද? එවන් නිවසට ශ්‍රියා කාන්තාවගේ බැල්ම ලැබෙන බවත්, නිවැසියන් විවිධ රෝගාබාධ වලින් ආරක්ෂා කෙරෙන බවත් නොරහසකි.

කාල සටහනක් අනුව දවසේ කටයුතු සියල්ල නිම කිරීම, කාලයෙන් උපරිම ඵල නෙලාගැනීම, කරන කාර්යයන්හි ක්‍රමානුකූල බව, කාර්යක්ෂම බව සහ අරපිරිමැස්සම ඇතිව හැදෙන වැඩෙන දරුවා සමාජගත වූ දිනක නාස්තිය පිටු දකිමින් සිය වෘත්තීමය කටයුතු වල පවා නිරත වෙයි. දරුවා තුළින් එවන් යහපත් චර්යා ලක්ෂණ දිස් වන්නේ නම්, මව් පියන් සාමූහිකව දායාද කර ඇත්තේ රටට වටිනා සම්පතකි.

මැණිකක් වුව, කපා ඔප මට්ටම් දැමීමේදී එහි දීප්තිය වැඩි වෙයි. වටිනාකමද වැඩිවෙයි. එසේම උපන් දරුවා, නිරන්තරයෙන්ම වල් පඳුරු හා වල්පැල ලෙස වැඩී යාමට නොදී, හරි වැරදි පෙන්වා දෙමින්, සමාජයට සකස්කර දායාද කිරීමෙන් දරුවාගේ වටිනාකමත්, ඵලදායිතාවත් දෙගුණ තෙගුණ වෙයි. නිසි ලෙස හැදී වැඩී ඇති දරුවාගේ ක්‍රියාකාරකම් ඔස්සේ මව් පියන්ගේ අභිමානය දිදුළයි. සංවර බව සහ නිවසින් බැහැර යාමේදී අවස්ථාවට ගැලපෙන සේ සුදුසු ඇඳුමින් සැරසීම, සුභාෂිතය, මව් පියන්ට කීකරු බව, වැටිහිටියනට ගරු සැලකිලි දැක්වීම ආදිය දරුවාට ප්‍රාථමික අවදියේදීම පුහුණුව ලබා දිය යුතු ගුණාංගයන් ය. ඒ සඳහා මවක්, පියෙක් අපොහොසත් වන්නේ නම් ඔවුන් සුදුසු වන්නේ වනචාරී යුගයට විනා දියුණු මිනිස් සමාජයට නොවේ.

නිවසින් පිටතට ඇසෙන සේ උස් හඬින් කථා කිරීම සහ සිනාසීම ඉතාමත් අමනෝඥ ක්‍රියාවකි. කිසිදු ගුණ ධර්මයක් නැති, ආගමක් ධර්මයක් කෙරෙහි විශ්වාසයක් නැති, නිසි චර්යාදාමයකින් පෝෂණය ලබා නැති, පුහු මාන්නයෙන් උද්දාමයට පත් අන්ධ බාලයින්ගේ මෙවන් අශෝභන හැසිරීම් රටාව බුද්ධිමත් සමාජය හෙළා දකියි. එවන් දින චර්යාවන් ඇත්තෝ සමාජ අපකීර්තියට දිනෙන් දින පත්වෙති. තම දුශ්චරිත අවබෝධ කර ගැනීමට තරම්වත් දියුණු ප්‍රඥාවක් නොමැති වීමේ හේතුවෙන් සමාජයේ ගැරහුමට පාත්‍රවෙයි. සමාජය පිළිකුල් කරයි. දිනෙන් දින පරිහානිය විනා දියුණුවක සේයාවක්වත් දිස් වන්නේ නැත. කෙතරම් අභාග්‍යයක් ද?

වරද සෘජුවම ඔවුන්ව හැදූ වැඩූ දෙමාපියන්ටය. දරුවකු මෙලොවට ජනිත කළ පමණින් මාතෘත්වයේ හෝ පීතෘත්වයේ ගෞරවය හිමි නොවනු ඇත. ගුණ ධර්ම මෙන්ම හරි දේ කුමක්ද? වැරදි දේ කුමක්ද'යි කුඩා කල සිටම දරුවාට පෙන්වා දීම දෙමාපියන් සතු යුතුකම් හා වගකීම්ය. කුමන හේතුවක් නිසා හෝ එය පැහැර හරින්නේ නම් එය උත්තරීතර මිනිසත් බවට නිගාවකි. මව් පියන් දරුවන්ට කළයුතු යුතුකම්, තුන් ලොවක් සුවපත් කළ බුදුපියාණන් වහන්සේ පෙන්වා වදාරා ඇත.

(සිඟාලෝවාද සූත්‍ර - ගිහි විනය)

දරුවන් පවින් වලකා යහපත් වැඩෙහි යෙදවිය යුතුය. වැරදි දේ කුමක්ද, නිවැරදි දේ කුමක්දැයි පහදා දෙමින් සිප් සතර ලබා දිය යුතුයි. නිසි වයසට පත් වූ කළ ආවාහ, විවාහ කරදී දේපළ පවරා දිය යුතුයි.

"දුවේ, පුතේ මෙලෙසින් කෑම කන්න. පාරේ ගමන් කරන විට දකුණු පැත්තෙන් යන්න. මෙසේ ඇඳුම් අඳින්න. පැළඳුම් පළඳින්න. මේ ලෙසට සමාජයේ හැසිරෙන්න. ගරුකළ යුත්තාට ගරු කරන්න. ස්වාමීන් වහන්සේට පසඟ පිහිටුවා වඳින්න. ගෙදරින් පිටට ඇසෙන සේ සිනහ නොවන්න" ආදී සිරිත් විරිත් කියා දී පළමුවෙන්ම දරුවා හික්මවන්නේ දෙමාපියන් හෙයින් ඔවුන් මුල් ගුරුවරු වන බවද බුදු පියාණන් වහන්සේ වදාළ සේක.

විහාරස්ථානයක් වැනි පූජනීය ස්ථානයකට යාමේදී දියණියකගේ ඇඳුම් පිළිබඳව විශේෂයෙන්ම මවක් සැලකිලිමත් විය යුතුයි. එම ස්ථානයට සුදුසු සේ අනවශ්‍ය විලාසිතාවන්ගෙන් තොරව, රටේ

සංස්කෘතියට ගැලපෙන සේ සිරුර වැසෙන ආකාරයේ දිග ඇඳුම් ඇඳීම පිළිබඳව සැමදෙනාගේම විශේෂ අවධානය යොමු විය යුතුමය. එම භූමිය තුළ හැසිරීමේදී කාය, වාග් සංවරය ද ඉතා වැදගත් බව අමතක නොකළ යුතුයි.

පිරිසිදු බව, හැසිරීම, ගරුකළ යුත්තන්ට ගරු කිරීම ආදී සියලු දේ පිළිබඳ නිසි අවබෝධයක් මෙම අදියරේදී දරුවන්ගේ මනසට යොමු කිරීම ඉතා වැදගත්ය. මෙවන් පෙර හුරුවක් කුඩා අවදියේදීම ලබාදීම දරුවන්ගේ චර්යා වර්ධනයට ඉමහත් වටිනා දායකත්වයක් සපයයි. මෙය මාතෘ භූමිකාවේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් බව අමතක නොකිරීම මවගේ ශ්‍රේෂ්ඨත්වයයි. එය රැක ගැනීම මව් වරුන්ගේ යුතුකම හා වගකීම බව සිත්හි ධාරණය කරගත යුතුමය.

ඇතැම් දියණියෝ වැඩිවිය පැමිණීමෙන් පසු ස්වකීය පවිත්‍රතාවය පිළිබඳවත් නොසලකමින් දරුණු රෝගාබාධයන්ට පවා ගොදුරු වෙති. මුඛ සෞඛ්‍යය පිළිබඳව ඇතැම් දරුවන්ගේ කිසිම අවධානයක් නැත. ස්වකීය සනීපාරක්ෂාව සඳහා නිසි පැවැත්මක් නැත. කළයුතු දෙය නොකළ යුතු දෙය පිළිබඳව ඇය නොදනී. ඒ සඳහා මග පෙන්වීමක් නිසි කල ලබාදීමට මව් පියන් අසමත් වී ඇත. දරුවන්ගේ සුන්දර ලෝකය මව් පියන්ගේ ඇස් පනා පිටම බොඳ වී යද්දී, සරුව පිත්තල කඩතුරාවන් ගැලවී යන දෙමාපියන්ගේ යථාර්ථය එළිදැක්වෙනු ඇත.

පාසැලට යන දරුවාගේ චර්යා දෙස නිරතුරු විමසිල්ලෙන් පසුවන ගුරුතුමිය දෙමව්පියන් පාසලට ගෙන්වා කරුණු විමසා අනතුරු හැඟවීමක් කළද, ඇතැම් අවස්ථාවලදී බිහිරි අලින්ට වීණා වාදනය කරන්නා සේය. ඒ පිළිබඳව සුභවාදී ප්‍රතිචාර නොදක්වයි. ඔවුන් නිහඬය. කිසිලෙසකින්වත් අසරණ දරුවාට වරද පැවරිය නොහැකියි. ස්වභාව ධර්මයේ සංසිද්ධීන් හමුවේ පවා දියණිය අලස වෙයි. උදාසීන වෙයි. දෛනික කාර්යයන්හි උද්‍යෝගිමත් බවක් දැකිය නොහැකියි. අනිකුත් දරුවන් සමග කණ්ඩායම් කටයුතු වල නිරතවීමේදී පවා විශාල පසුබෑසීමක් ඇති බව ගුරුවරයා හඳුනාගනී. ඇයගේ පෞරුෂයේ අපගමනය ගුරුවරයාට පමණක් වළකාලිය හැකිද? මෙවන් දෙමාපියන් අද සමාජයේ බහුලව නැතත් විරලව දැකිය හැකියි. සංසාර කර්ම ඵල අනුව එවන් දෙමාපියන් හට උපන් දියණියන් හට කාගේ හව්හරණක් ද?

මෙම අදියරේදී දියණිය සෞඛ්‍ය සම්පන්නව, ප්‍රකෘති මානසිකත්වයෙන් උද්‍යෝගිමත් ලෙස තබා ගැනීම සෑම මවකගේම වගකීමක් සේ සැලකිය යුතුය. දියණියකගේ යෞවනය මල් ඵල ගැන්වෙන්නේ සිය මවගෙන් ලබන්නාවූ ආදර්ශ මතමය. එහි වගකීම වෙනත් අයෙකුට කිසිසේත් පැවරිය නොහැක්කේමය. ආදර්ශමත් මවක් ඵලදායී ලෙස දවස ගත කරන්නේ නම් දියණියද නිරන්තරයෙන් ඇයව අනුගමනය කරයි. දරුවන්ට සිය යුතුකම් ඉටු නොකරන, උත්තරීතර මාතෘත්වයට හා පීතෘත්වයට නිගා කරගන්නෝ එහි ප්‍රතිඵල දිට්ඨ ධම්ම වේදනීය වශයෙන්ම ලබා ගනිති.

'අවවාදයට වඩා ආදර්ශය උතුම්' ය. දයාබර මවක විසින් සිය දියණියට, සිය දැතින් අලංකාර ලෙස ගවුමක් මසා ඇය හැඩ ගන්වා බැලීමෙන් කෙතරම් මානසික තෘප්තියක් ලබයිද, එවන්ම වූ තෘප්තියක් බෝනික්කාට ඇඳුම් මැසීමෙන් දියණිය ලබයි. ආදර්ශය එයයි. බෝනික්කාගේ ගවුමේ උස ප්‍රමාණවත් නොවන විට 'ගවුම කෙටි වැඩිය' කියමින් ගවුමට වෙනත් රෙදි කැබැල්ලක් ගෙන උසට සිටින සේ වාටි මහණ දියණියන් අපි දැක ඇත්තෙමු. මෙම ක්‍රියාව පැසසිය යුතුමය. ආදර්ශය කෙතරම් ශ්‍රේෂ්ඨද? මෙය අනාගත පරපුරට දෙන වටිනා දායාදයකි. මවට මෙන්ම දරුවාට ඇතිවන්නේ කෙතරම් මානසික සංහිඳියාවක්ද? මව නොයෙක් ආකාරයේ ගැලපෙන විලාසිතාවන්ට අනුව එලෙස කටයුතු කරද්දී, එම ආදර්ශය දියණිය ලබා ගන්නේ නිතැතිනි. මෙම අදියරේදී මවගේ සෑම ක්‍රියාවක් දෙසම විමර්ශනාත්මකව බලා සිටින දියණිය සිය මව අනුකරණය කරයි.

එහෙත් අභාග්‍යයකට මෙන් අද සමාජයේ ඇතැම් මව්වරු, තම ඇඳුම් පැළඳුම් ස්වඋත්සාහයෙන් මසා සකස් කර ගැනීම පිළිබඳව දක්වන්නේ නිහැඬියාවකි. එවන් නූතන අම්මාවරු සතුව ඉඳිකට්ටක්, නූලක් පවා නැත. මලක් මැසීමට තරම්වත් ප්‍රමාණවත් රෙදි කැබැල්ලක්ද නැත. දියණිය ඉඳිකටුව නොහඳුනයි. කෙසේනම් ආදර්ශයක් ලබන්නේද?

ඇඳුම් පැළඳුම් සියල්ල විවිධ විලාසිතාගාර ඔස්සේ ඇදෙමින් මුදල් දී සකස් කරගනී. නිවෙස් තුළ රෙදි කැබැල්ලක්, නූලක්, ඉඳිකටුවක් නොතිබීම පුදුමයක් නොවේ. මුදලට ගෙන එනු ලැබූ ඇඳුමක වාටියක මැස්මක් යම් තරමකින් හෝ ලිහිල් වී ඇත්නම් එය සකස් කර ගැනීමට පවා ඇය නොදනී. දියණියගේ ඇඳුමක් වී නම් ලිහිල් වී ඇති මැස්ම ඔස්සේ දිගටම ඉරා දමා එම කෙටි ඇඳුම ඇයට

අන්දවා සෙනග ගැවසෙන ප්‍රසිද්ධ ස්ථානවලට පවා දියණිය රැගෙන යන නාමික අම්මාවරු අද සමාජයේ බොහෝය. වැඩිහිටි අයෙකු ඒ පිළිබඳව විමසුවේ වුවද, පිළිතුර වී ඇත්තේ කාර්ය බහුලත්වය යි. වෙනත් ගෘහස්ථ හෝ වෘත්තිමය කාර්ය භාරයන් ඔවුන් සතුව නොමැති හෙයින්, මුහුණු පොතෙහි යහළුවන් සේ පෙනී සිටින විවිධාකාර චරිත ඔස්සේ දොඩමලු වන නූතන අම්මාවරු එම පරාසය තුළ කාර්ය බහුලත්වයට පත්වූවා විය හැකියි. දරුවන් ගැන පවා නොතකා, පණිවිඩ හුවමාරුවට ඇබ්බැහි වී සිය වටිනා කාලය කොපමණ කැප කළද, බුදුන් වහන්සේ පෙන්වා දුන් කල්‍යාණ මිතුරෙකු නූතන තාක්ෂණික මෙවලම් තුළ නැත. අවසානයේදී කපටි, කෛරාටික, වංචනික, කාමාතුරයෙකුගේ ග්‍රහණයට හසුව වටිනා ජීවිතය විනාශ කරගනී.

තාක්ෂණ පහසුකම් කිසිවක් නැති යුගයක අම්මා නමැති චරිතය තුළින් එදා දිස්වූයේ කාර්ය ශූරත්වය යි. ඉවුම්, පිහුම් ඇඳුම් පැළඳුම් පමණක් නොව නිවසේ ඇති සකල කාර්ය භාරයම බාහු බලයෙන් ඉටු කරමින්, මනාසේ කාල කළමනාකරණය කරගත් එදා අම්මාවරු. දූ දරුවන්ගේ පොත් පත් කෙකෙරහිද අවධානය යොමු කිරීමට අමතක නොකළහ. සම්මුතියට අනුව උගත් යැයි පැවසෙන වත්මන් මව්වරුන්ගේ පූර්ණ කාලය තාක්ෂණික මෙවලම් විසින් සොරාගෙන ඇත. එදා අම්මාවරුන්ගෙන් දරුවන් ලද ආදර්ශ නූතන දරුවන්ට අහිමි වී තිබීම කෙතරම් ශෝචනීයද?

බටහිර සංස්කෘතිය කරපින්නා ගත් මෙවන් මව්වරු තමා සමාජයේ විරාජමාන වන බව ලොවට එළි දක්වීමට සුදුසු පහසුම ක්‍රමය ලෙසට අදහස් හුවමාරු කරගැනීමේදී ඉංග්‍රීසි භාෂාවම උපයෝගී කරගනී. ගෘහ සේවිකාවක් ලෙස විදෙස් රටක මාස තුනක සේවයේ යෙදී සිට පෙරළා මව් බිමට පැමිණි අයෙකුට වුවද මව් භාෂාව අමතක වීම කෙතරම් විහිළුවක්ද? එවන් දීන රඟපෑමක් කළ එක්තරා කාන්තාවක් ගම්බද එළවළු කඩයකට ගොස් (baby jak) ඉල්ලූ විට කඩ හිමියා විසින් ශුද්ධ සිංහලෙන් දෙනු ලැබූ වාග් ප්‍රහාරය හමුවේ ඇය ඉගෙන ගත්තා වූ පාඩම පොලොස් ඇඹුලට වඩා රසවත් වන්නට ඇත.

දේශීය සංස්කෘතිය, දේශීය සභ්‍යත්වය රැක ගැනීමට ලාංකිකයින් අපොහොසත්වීම කෙතරම් විහිළුවක්ද? කෙතරම් නිවට කමක්ද? හෙළ සිරිත් විරිත් හැල්ලුවට පත් කරමින් නොඑසේනම් යල් පැනපු ක්‍රම

වේදයන් ලෙස හුවා දක්වමින් දේශීය භාෂාව දේශීය සිරිත් විරිත්, දේශීය ආහාර හා දේශීය සංස්කෘතියට ගැලපෙන ඇඳුම් පැළඳුම් හෙළා දකීමට තරම් දීන මානසිකත්වයකට ඇතැම්හු අද පත්ව ඇත. ඔවුන්ටද නිසි මග පෙන්වීමක් ඔවුන්ගේ දෙමාපියන් ගෙන් ලැබී නොතිබීම කෙතරම් අභාග ්‍යයක්ද? අපගේ හෙළ සංස්කෘතියට සහ හෙළ සභ්‍යත්වයට ගරුකරමින් එය රැක ගැනීම සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම පරම යුතුකම සේ සැලකිය යුතුමය. ජාත්‍යාලයත්, දේශානුරාගයත් මිනිස් හදවත් තුළින් ගිලිහී යාම මව් බිමේ පිරිහීමයි.

විදේශ භාෂාවන් ඉගෙනීමේ කිසිදු වරදක් නැත. එහෙත් එයට අදාළ සංස්කෘතිය අප කරපින්නා ගතයුතු නැත. මෙතරම් වටිනා ඓතිහාසික සංස්කෘතියක් සිංහල ජාතිය සතුව තිබියදී එය පසෙකලා විදේශීය භාෂාවන්ට, විදේශීය සංස්කෘතීන්ට ආවඩන අම්මාවරු මිනිසා ඇඳුම් අඳින්නේ ඇයි ද යන්න පවා නොදැනීම කෙතරම් නිර්ලජ්ජිත ද?

ආදි මිනිසා සතුව විවිධ මාදිලියේ ඇඳුම් නොතිබුණද ගස් වැල්, කොළ අතු ආදිය හෝ යෙදාගනිමින් ජාතියක් වශයෙන් ස්වකීය නිරුවත වසා ගැනීමට පෙළඹුණ බවට ඉතිහාසය සාක්ෂි දරයි. එදා ආදි වාසීන්ට පවා යම් පමණක සංස්කෘතියක් උරුම වී තිබුණ බව මෙයින් පැහැදිලිය. මිනිසා තිරස්චීන සතුන්ගෙන් වෙන්වූ උසස් මානසිකත්වකට හිමිකම් කියන සමාජගත සත්ත්වයෙකි. ගල් යුගයේ සිටම කෙසේ හෝ නිරුවත වසා ගැනීමට පුරුදු වූ මිනිසා එය චාරිත්‍රයක් ලෙසින් රැකගත් බව පැහැදිලිය. මීට ශතක ගණනාවකට පෙර සම්බුදු පියාණන් වහන්සේගේ බුදු නෙතට හසුවූ පෙර පින් තිබූ දාරුචිරිය පවා ලී පතුරු එකට තබා සකස්කරගත් ඇඳුමකින් සැරසී සිටි බව බෞද්ධ ඉතිහාසයෙන් පිළිබිඹු වෙයි.

ඇඳුම් කෙරෙහි මිනිසා අනාදිමත් කාලයක සිට සුවිශේෂී අවධානයක් යොමුකර ඇත. බුදු දහමේ පෙන්වා දෙන අන්දමට මිනිසා ඇඳුම් අඳින්නේ, සුවිශේෂී කරුණු 3 ක් උදෙසා ය. එනම් **සීත, උෂ්ණ වැනි ස්වභාවික පරිසර සාධකයන්ට ඔරොත්තු දීමටත්, මැසි මදුරු ආදී පරිසරයේ වෙසෙන සතුන්ගෙන් ආරක්ෂාවීමටත්, සිරුරේ ලජ්ජා සහිත අඟ පසඟ වසා ගැනීමටත්ය.**

මේ පිළිබඳ අනවබෝධයෙන් අද ඇතැමුන් ඇඳුම් විලාසිතාවක් කර ගෙන ඇත. ඇඳුම් ඇඳීමේ අරමුණු කිසිවක් සාක්ෂාත් නොවන අයුරින්

විලාසිතා ලෝකයේ ඔබ මොබ දුවන අන්ධ බාලයින්, තම මාතෘ භූමිකාව පවා කෙලෙසා ගන්නේ, එයින් බාල පරපුරට ලැබෙන්නාවූ නරක ආදර්ශ පිළිබඳ කිසිදු තැකීමකින් තොරවය. මේ මගින් සමාජයට සිදුවෙන පරිහානිය සුළු පටු නොවේ. අනාගත පරපුර නොමග යැවීමේ වරදට ඍජුව හෝ වක්‍රාකාරව දෙනු ලබන මෙම දායකත්වය වෙනුවෙන් කවර හෝ දිනක ඔවුන් වන්දි ගෙවනු ඇත. විපාකය පසුපස හඹා එයි. මාතෘ භූමිකාවේ ගෞරවය මෙලෙසින් කෙලෙසෙද්දී වණ්ණ දශකයේ සිටින දියණියන් හට **කාගේ නම් පිළිසරණක්ද?**

එක්තරා ගෞරවනීය විදුහල්පති පියතුමෙකු සිය දරුවන්හට කුඩා කල සිටම නිරන්තරයෙන් දෙනු ලැබූ එක්තරා අවවාදයක් මට නිතැතින් සිහිපත් වෙයි. එම අවවාදයේ ඔවුන් පිහිටා ඇත්දැයි අධීක්ෂණය කළ වාර ගණන ද අනන්තය.

"කරනවා නම් වැඩක් ඒ වැඩය හරියට කරන්න. නැත්නම් නොකර නිකං ඉන්න. කළයුතු දෙය කළයුතු වේලාවට නිසි විධියට කරන්න ඉගෙන ගන්න."

එතුමා නිතර ප්‍රකාශ කළ එම වදන් පෙළ ඔස්සේ ඔවුහු දිරිමත් වූහ. නිරතුරුවම ලබා දුන් ඒ අවවාදය ගාම්භීරය. සරල සුමට වදන් විදුහල්පති වරුන් සතු නොවන නිසා විය හැකියි. අදත් ඒ වදන් පෙළ හදවත තුළ දෝංකාර දෙයි. දරුවන් දෛනිකව නිවසේදී නිරතවන සෑම කාර්යයක් කෙරෙහිම එම දෙමාපියෝ සැලකිලිමත් වූහ. නිවසින් පිටට යාමේදී ඇඳුම් කෙරෙහි පවා විශේෂ අවධානයක් යොමු කළ ඔවුහු, දණහිසෙන් පහළට සිටින සේ ඇඳුම් ඇඳීමට දරුවන්හට උපදෙස් දුන්හ. ස්වකීය බාහු බලයෙන් දරුවන් වෙනුවෙන් ඇඳුම් සකස් කළ එම මෑණියන් වහන්සේගේ උත්කෘෂ්ට කැපවීම අති විශිෂ්ඨය. අද එම දරුවන්ගේ ස්ථාවරය දෙස බලද්දී සමාජයට පසක් වන්නේ, දරුවන්ගෙන් මව්පියන් බැබළෙන බවත්, මව් පියන්ගෙන් දරුවන් බැබළෙන බවත්ය. මෙය අවබෝධ කරගත් ප්‍රඥාවන්ත ජන සමාජය අද එම දෙමාපියන් ජීවතුන් අතර නැතත්. එම දරුවන් දකින සෑම අවස්ථාවකම ධර්මයේ පෙන්වා දෙන **"සක්කත්වා, ගරුකත්වා, සේවිසබ්බා"** යන බුද්ධ භාෂිතයට අනුව ඔවුනට ගරු සැලකිලි දක්වමින් ඇසුරට මහත් රුචිකත්වයක් දක්වයි. කෙතරම් වටිනා සමාජ සංහිඳියාවක්ද?

තමාටත් ඵලදායී, අනුන්ටත් වැඩදායී කාර්යයන්හි ම යෙදිය යුතු බවට දරුවන් දැනුවත් කළ දෙමාපියෝ, එලෙස කටයුතු කිරීමේදී ඇතිවන සම්බාධක අපමණ බවත්, ඒවා හමුවේ තම උත්සාහය අත් නොහැරිය යුතු බවත්, තම අභිමතාර්ථ සාක්ෂාත් වන තෙක් පසු නොබැසිය යුතු බවත් නිරතුරුවම අවධාරණය කරන්නට වූහ. ඵල ඇති රුකට ගල් වරුසා එන බවද පහදා දුන් ඔවුන් එදා කියා සිටියේ, කළයුතු දේ, කළයුතු අවස්ථාවේදී දිරිමත්ව, නොපසුබස්නා වීර්යයෙන් ඉටු කරන්නාගේ ජයග්‍රහණය ස්ථිර බවයි. කවුරු කෙසේ විවේචනය කළද, ඒවා උත්සාහවන්තයාට අදාළ නොවන බවද දරුවන්ගේ මනසට කා වැදුණි. ඒ සියලුම අවවාද අද ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැකිය හැක. වත්මන් ස්ථාවරයට දරුවන් ඔසවා තැබුවේ ද දෙමාපියන්ගේ අවවාද බව අද සක්සුදක් සේ පැහැදිලිය.

එදා මව් පියන් සතු දෛනික කාර්ය භාරය සුළු පටු නොවිණි. එහෙත් ඔවුන්ගේ චර්යාවන් තුළින් සෑම අවස්ථාවකම දරුවා ලැබුවේ ආදර්ශයකි. එදා අද මෙන් තාක්ෂණික පහසුකම් නොතිබුණි. සියලුම දෛනික කටයුතු බාහු බලයෙනි. රෙදි සේදීම, වේලීම, මැදගැනීම, ඇඳුම් මැසීම, ගෙබිම පිරිසිදු කරගැනීම සහ ආහාර පිළියෙල කර ගැනීම පමණක් නොව දෛනිකව පාසැලෙන් දෙනු ලැබූ අභ්‍යාස දරුවන් ලවා කරවීමට ද, එම කටයුතු අධීක්ෂණය කිරීමද සියල්ලක් කෙරෙහි මව් පියන් නිසි අවධානය යොමු කරන්නට වූයේ තාක්ෂණික මෙවලම් මගින් නොවේ. ඉතාමත් සැකසුරුවම් ලෙස කාලය කළමනාකරණය කරගත් ඔවුන් දරුවන්ට ද නිසි පුහුණුවක් හා ආදර්ශයක් ලබා දෙමින් පිය නැගූ ජීවන මඟ **කෙතරම් සාර්ථකද? කෙතරම් සුන්දරද?**

ආදර්ශයෙන්ම ජීවිතයට මුහුණ දීමට මග පෙන්වූ එවන් මව්පියන් ලැබීමට එම දරුවන් හට පෙර පින් තිබුණා විය හැකියි. ඒ ලද ආදර්ශ හා පෙරහුරුව මුළු ජීවිත කාලයට පමණක් නොව ඉන් ඔබ්බටද මහත් ආශිර්වාදයක් වී ඇත. වර්ණ දශකයේ පසුවන වත්මන් දරුවාට මෙවන් ස්වර්ණමය අවස්ථා ගිලිහී ගොස් ඇත. ඒ සමාජ පරිහානියේ අඳුරු සේයාවන් ය.

මේ එක් සත්‍ය සිද්ධියකි, එක්තරා පියෙකු විසින් තම පුතු හට නිසි පරිදි ගුරු හරුකම් දී හදා වඩා ගන්නා ලදි. විභා ආදියෙන්ද සමත්ව යෞවනයට හිස ඔසවමින් සිටි ඔහුගේ මනස තම පියාගේ නිරන්තර අවවාද හා අණකිරීම්

කෙරෙහි නිෂේධනාත්මක ප්‍රතිචාර දක්වන්නට විය. කුමක් හෝ රැකියාවක් ලැබුණු විගසම නිවසෙන් පිටව යාමේ අදහසින් ඔහු රැකියා සඳහා ඉල්ලුම් කරන්නට විය. ප්‍රමාණවත් අධ්‍යාපන සුදුසුකම් තිබුණෙන් අප්‍රමාදීව ඔහුව සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවිණි. ඒ එක්තරා ආයතනයක සහකාර කළමණාකරුවෙකු ගේ පුරප්පාඩුවක් සඳහාය. දෙමාපියන්ට වැඳ සම්මුඛ පරීක්ෂණයට යාමට සූදානම් විය. එදින ද පුතා ඇමතූ පියාණන් කියා සිටියේ කළයුතු දෙය නිසි වෙලාවට කරන්නත්, අහන ප්‍රශ්නයකට කෙළින් උත්තර දෙන්නත් සිහි තබා ගතයුතු බවත් ය.

කල් වේලා ඇතිව අනවශ්‍ය කලබලයකින් තොරව ඔහු සම්මුඛ පරීක්ෂණය සඳහා අදාළ ආයතනයට ගියේය. ඇතුල්වන දොරටුව ළඟට ගිය ඔහු, එහි පියන් 2 ම විවෘත වී තිබෙනු දුටුවේය. අදාළ භූමියට ඇතුල් වූ ඔහු පුරුද්දට මෙන් ගේට්ටුව වසා දමා අදාළ ගොඩනැගිල්ල පිළිබඳව විමසිලිමත් විය. ඒ දෙසට යන මොහු දුටුවේ කරාමය ඇර දැමීම නිසා වතුර නිරපරාදේ ගලා යන ජල නලයකි. එතනට ගිය ඔහු කරාමය නිසි පරිදි වසා ශාලාවට ඇතුල් විය. සම්මුඛ පරීක්ෂණය උඩුමහලේ වුවද, පහත මාලයේ විදුලි පංකා 2 ක් ක්‍රියාත්මක වෙමින් තිබුණි. විමර්ශනාත්මකව මොහොතක් නැවතී සිටිය ඔහුට එම ස්ථානයේ කිසිවකු කාර්යයක නියුතු නැති බව අවබෝධ විණි. විදුලි පංකා 2 නිවා දැමූ ඔහු උඩු මහලට සේන්දු විය. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණි අයදුම්කරුවන් තැන් තැන්වල කතා බහ කරමින් සිටියහ. මහත්වරු තිදෙනෙකු කාමරයට පැමිණෙනවාත් සමගම ඔවුහු අසුන් ගන්නට වූහ. කාමරයට ඇතුල් වන ස්ථානයේ උඩ බිත්තියේ බුදු පිළිමයක් වඩා හිඳුවා තිබුණි. එහි දූවිලි බැඳී අපවිත්‍ර වී තිබෙනු දුටු ඔහු එය ද රැගෙන තම අතේ තිබූ ලේන්සුවෙන් පිසදා නැවත තැන්පත් කළේය.

සම්මුඛ පරීක්ෂණය සඳහා අංක 8 අමතනු ඇසිණි. ඔහුගේ අංකය 20 හෙයින් කිසිම කලබලයකින් තොරව ඔහු නැවතත් වට පිට බලන්නට විය. අසල මුල්ලක කොස්සක් තිබෙනු දුටු ඔහු එය රැගෙන විත් එම ස්ථානයේ බිම පිරිසිදු කරන්නට විය. අනතුරුව අසුන්ගත් ඔහු සම්මුඛ පරීක්ෂණයට ගොස් කාමරයෙන් එළියට එන අයගේ දර්ශන පථයට හසුවිය. ඔවුන් සමග කෙටි පිළිසඳරක යෙදුන ඔහුට දැනගන්නට වූයේ එම තනතුර ඔවුනට හරියන එකක් නොවන බවයි. ටික වේලාවකින් අංක 20 ඇමතීමෙන් පසු ඔහු අදාළ ලිපිගොනුව ද අතැතිව ඇතුල් විය. රැකියාවේ ඇති වගකීම් පිළිබඳව ප්‍රකාශ කළ සම්මුඛ පරීක්ෂකවරු ඇසුවේ

එක් ප්‍රශ්නයක් පමණි. "හෙට සිට රැකියාවට පැමිණිය හැකිද" යන්නයි. ඔහු පුදුමයට පත් වුවද තාත්තාගේ අවවාදය සිහිපත් වීමෙන් එක්වරම පැමිණිය හැකි බව ප්‍රකාශ කිරීමට මැලි වූයේද නැත. අවසානයේදී නිසි තනතුරේ ඔහුව පිහිටුවීමට තීරණය කළ ආයතන අධ්‍යක්ෂ කියා සිටියේ සියලුම අයදුම් කරුවන් ගේට්ටුව ළඟ සිට සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණි විලාශය ඔහු නිරීක්ෂණය කළ බවත්, ආයතනයක ප්‍රතිලාභ ලැබීමට නිසි කළමනාකාරිත්වය ඉමහත් දායකත්වයක් සපයන බවත්ය. ඒ අනුව අප බලාපොරොත්තු වූ පරිදි කළයුතු දේ කළයුතු වෙලාවට ඉටුකරන, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ඔබ වැන්නකු ආයතනයට ආශිර්වාදයක් බව කියමින් අධ්‍යක්ෂතුමා ඔහුට සුබ පතන්නට විය. ඉතා සතුටින් නිවෙස බලා ගිය ඔහු දෙමාපියන්ගේ දෙපා සිඹිමින් සතුටු කඳුළු වගුරවන්නට විය.

වත්මන් දරුවාට ආදර්ශයක් ගතහැකි කිසිවක් අද නිවෙස් තුළින් විද්‍යාමාන නොවේ. මවක් මෙන්ම ගෘහණියක් ලෙසටද අම්මා සතු කාර්ය භාරයක් ඇති බව ඇතැම් වත්මන් අම්මාවරු නොදනිති. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ සිය රූප ශෝභාව රැකගැනීම පිණිස විවිධ ක්‍රමවේදයන් අනුගමනය කිරීමයි. මව රූපලාවණ්‍යාගාරයට ගොස් දහස් ගණනින් මුදල් වැය කර තමාගේ රූ සපුව කෘත්‍රිම ලෙස වර්ධනය කරගැනීමේ ඒකායන අරමුණෙන් වෙහෙසෙයි. ඇඳුම් සියල්ලක් මුදල් වැය කරමින් බාහිර ආයතන වලට ගොස් සකසා ගනී. දරුවාට ආදර්ශයක් ලබාගත හැකි වට පිටාවක් නිවෙස් තුළ නැත. ආහාර පාන පවා නිවසේ සකස් වන්නේ නැත. දරුවාගේ පෞරුෂ වර්ධනයට අත්දැකීම් ලැබිය හැකි කිසිදු සාධකයක් නිවෙස තුළ නැත. ළමා අවධියේදී ඒකරාශී කරගත යුතු සාමාන්‍ය දැනීමට පවා අගුල් වැටී ඇත. කෝප්පයක්, හැන්දක්, කොස්සක්, අල්ලන ආකාරය පවා දරුවා නොදනී. දුවට පුතාට ආදර්ශයක් ගතහැකි පසුබිමක් හෝ අනුකරණය කළහැකි චර්යාවක් නිවෙස් තුළ නැත වණ්ණ දශකයේ දරුවා අද **හුදෙකලා වී ඇත.**

ඇතැම් වත්මන් මව්වරු දරුවා කතා කළද, සිය කාමරයෙන් එළියට නොඑති. ඇතැම් විට මුහුණ පුරා තවරා ගෙන ඇති කෘත්‍රිම ආලේපනයන් නිසා දරුවා බියවේදැයි සිතා විය හැකියි. නොඑසේ නම් 'ස්මාර්ට් ෆෝනය' ඔස්සේ දීර්ඝ ගමනක හෝ වෙනත් අරමුණක යෙදී සිටීම විය හැකියි. දරුවා කෙතරම් උස් හඬින් කතා කළද, හඬා වැළපුණ ද ඒවාට කිසිම ප්‍රතිචාරයක් නැත. යාබද නිවෙස් වල සවන් ඇත්තවුන් පවා මවිත කරවන

මෙම හඬ ඔස්සේ, දරුවා බිහිකළ මව් පියන් ගොළුවත රකින්නේ නම්, සසර සැරි සරණ තාක් කල් ඔවුන් හට මව් පිය පදවිය උරුම නොවනු ඇත. මෙම ජීවිත ගමන සංසාර ගනුදෙනුවක් බවත්, අත්තනෝමතික ලෙස දරුවන් හදා, ඔවුන් පසෙකට දමා ස්වකීය අභිමතයන් පරිදි නූතන මෙවලම් ඔස්සේ විකෘති මනෝ ලොවක සැරිසැරීම තම බුද්ධියට නිගාවක් බවත් අවබෝධ කටයුතුය.

දරුවා විශාල කරදරයක් සේ සිතන ඇතැම් අම්මාවරු එම අවස්ථාවෙන් ගැලවීම පිණිස නූතන උපක්‍රම ද යොදා ගැනීමට නොදන්නේ නොවේ. වසා ඇති තම කාමරයේ දොර උපරිම වශයෙන් අංශක 10 ක් පමණ විවෘත කර දරුවා අතට ද වෙනත් ෆෝනයක් ලබා දී ඇය ස්වකීය සුන්දර ලෝකයේ සිහින දකියි. ෆෝනය ගෙන නිහඬ වන දරුවාද ලැබුණා වූ තාක්ෂණික නූතන මෙවලම අනවබෝධයෙන් වුවද, කෙසේ හෝ හසුරුවා ගනිමින් විවිධ රූප රාමු නරඹයි. එහි හඬටද සවන් දෙමින් එය ළමැදෙහි හොවා ගෙන නිදි දෙව් දුව වැලඳගනී. දරුවාගේ සුන්දර ලෝකයට ස්වභාවික මවගේ උණුසුම නැත. සදාචාරාත්මක ආදර්ශයන් නැත. වයසින් මුහුකුරා යන මෙවන් දරුවන්ගෙන් බිහිවන පරම්පරාව මවගේ භූමිකාව කෙලෙසින් හඳුනාගනී ද? මව් සහ පියා නිසි ලෙස හඳුනා ගැනීමට දරුවා අපොහොසත් වීම පුදුමයට හේතුවක් නොවනු ඇත. සදාචාරාත්මක ආකල්ප කිසිවක් ඔවුන් තුළින් අපේක්ෂා කළ හැකිද?

ඇතැම් වත්මන් මව්වරුන්ට හා පියවරුන්ට තම භූමිකාවේ නිසි අවබෝධයක් නොමැති වීම යුගයේ පිරිහීමයි. පියා ඔහුගේ ලෝකයේ නිසොල්මන්ය. ධර්මයේ පෙන්වා දී ඇති අන්දමට මෙය මෘග සංඥා පහළවන යුගය දැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. මවක සතු ගෘහස්ථ කාර්යභාරය කුමක්දැයි ඇය නොදනී. පියාගේ ගෘහස්ථ වගකීම් හා කාර්යභාරය ඔහු නොදනී. නිසි වයසේදී නිසි ආදර්ශ සහ ප්‍රායෝගික දැනුම දරුවාට මව් පියන්ගෙන් නො ලැබෙන්නේ නම් ඔවුන් කෙතරම් අසරණද? අභාග්‍ය සම්පන්නද? **"වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසමු ඒ අමාරුව"** වැනි අප්තෝපදේශ එදා සමාජයේද තිබී ඇත. ඇදට යන කක්කුට්ටා සිය පැටියාට කෙළින් යාමට කෙසේ උගන්නන්න ද? දරුවාගේ වර්ණ දශකයේ අද ඉතිරිව ඇත්තේ අඳුරු සේයා පටලයක් පමණි.

පෙර භවයන්හිදී සිදු කරගත්තා වූ කර්ම හා කර්ම ඵල අනුව දෙමාපිය - දරුවන් ලෙස ඉපදී කර්ම ගෙවනවා විනා නැවතත් මිනිස් භවයක් ලැබීම උගහටය. ලැබුණා වූ මිනිස් භවයේදී තම යුතුකම් හා වගකීම් මනා ලෙස සපුරාලමින් ධර්මානුකූලව ජීවත් වන්නා ඉතා ක්‍රමවත් ලෙස තම ජීවන මග සකස් කරගනී. ඔවුහු මෙලොව මෙන්ම පරලොවට ද වැඩදායී ලෙසින් සංසාර ගමන සැලසුම් කරගනිති. පෙර පින් නැත්තෝ ප්‍රඥාව අවදි කරගත නොහැකිව සසර ගමනේ මංමුළා වී අඳුරෙන් අඳුරටම පා නගති. එවන් මව් පියන් සමාජයේ පිළිකුලට පාත්‍ර වෙයි. සත්පුරුෂයින් ඇසුරෙන් ඈත්වෙයි. කෙතරම් අභාග්‍යයක් ද?

දරුවන් සදාචාර සම්පන්න ලෙස සමාජ ගත වී නොමැත්තේ නම්, සත්පුරුෂයින් විසින් හෙළා දකින එවන් දරුවන්ගේ ක්‍රියාකාරකම් හමුවේ ආරූඪ කරගත් අභිමානයකින් යුතුව සමාජයේ විරාජමාන වීමට වෙර දරන මව් පියන්ගේ සියලු කඩතුරාවන් සිඳී බිඳී ගොස් සත්‍ය වශයෙන්ම ඔවුන්ගේ යථාර්ථය එළි දක්වෙනු ඇත. ගුණ ධර්ම, සාර ධර්ම උඩු යටිකුරු වී ඇති මෙවන් යුගයක ධර්මයට පිටුපාමින් ගමනාන්තයක් නොදැක සසර ගමනේ වේගයෙන් දුවන ධාවකයින් මොහොතක් නතර වී ප්‍රඥාව අවදිකර ගැනීමට සුදුසු මොහොත උදාවී ඇත.

සදාචාරාත්මක ශික්ෂණයක් කුමන සමාජයකට හෝ අත්‍යවශ්‍යමය. සියල්ල පසෙක ලා, ලැබුණා වූ මිනිසත් බවේ නාමයෙන් සංවර වූ දිවි පෙවෙතකට අප්‍රමාදීව අවතීර්ණ වීම ඉතා වැදගත්ය. මෙම සංවරය බුදු දහමේ පෙන්වා දෙන අන්දමට **චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන** ආදී ආයතන 6 තුළින්ම ලබන පූර්ණ සංවරයක් විය යුතුමය. එසේ නම් ඉඳුරන්ගෙන් ලබන්නා වූ **රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ** ආදී අරමුණු වල කිසියම් පාලනයක් කුඩා කල සිටම දරුවන්හට ලබා දීම අත්‍යවශ්‍යමය.

6

බල දශකය (4) - The Strong decade

මෙම අදියරේදී දරුවා ශක්තිමත්ය. ජවසම්පන්නය. ආවේගශීලීය. අන් අයගේ මත නුරුස්සයි. එහෙත් අත්දැකීම් අල්පය. ක්‍රියාශීලීත්වය මතින් අත්දැකීම් ලැබීමට නැඹුරු වෙයි. නිදහස් ස්වෛරී චින්තනය ඔස්සේ ජීවිතයක් ගතකිරීමේ අවශ්‍යතාවය මතුවෙයි. කෙනෙකු යටතේ යැපීම ප්‍රතික්ෂේප කරයි. සිරුර පෘෂ්ඨිමත්ය. ජව සම්පන්න රණවිරුවකු සේ ඉදිරියටම යයි. එඩිතරය. පසුබැසීමේ හෝ කිසිවෙකුට යටත් වීමේ චේතනාවන් පහළ නොවෙයි. ස්වකීය ගෞරවය, නම්බුව, පිළිගැනීම අපේක්ෂිතවම කටයුතු කරන මෙම බල දශකයේදී, එයට එරෙහිව කටයුතු කරන්නන් කෙරෙහි කෝපාවිෂ්ට වෙයි. ඉතා ඉක්මනින් ඉවසීමේ සීමාව අභිබවා යයි. අනවශ්‍ය ලෙස කලකෝලාහල ආදියෙහි පැටලෙයි. වැඩිහිටි අවවාදයන් නොරුස්සයි. තමාගේ මතයම නිවැරදි බව සනාථ කිරීමට තර්ක කරයි.

මව්පියන් සහ ගුරුවරු වුවද, තර්කයෙන් පැරදවීමට මෙම අදියරේදී තරුණයා ශක්තිමත්ය. වැඩිහිටියන්ගේ අවවාද උපදෙස් කල් පැනපු ඒවා බවත් ඒවා අද සමාජයට නොගැළපෙන බවත් පවසමින්, ඇතැම් තරුණයින් ස්වකීය දර්ශනයම සනාථ කිරීමට දරන්නාවූ වෑයම හමුවේ ප්‍රඥාවන්ත වැඩිහිටියෝ නිහඬ වෙති. ඒ බුදුපියාණන් වහන්සේ අවවාද නොදිය යුතු පුද්ගලයින් ලොවට හඳුන්වා දී ඇති හෙයිනි. **(මජ්ඣිම නිකාය - අනුමාන සූත්‍රය)**

මිනිසාගේ සර්වකාලීන ජීවිත ජයග්‍රහණය සඳහා බුදු පියාණන් වහන්සේ පෙන්වා දී ඇති උතුම් අවවාද පවා ප්‍රතික්ෂේප කරමින් තම වටිනා ජීවිත අකාලයේ විනාශ කරගන්නා අභාග්‍ය සම්පන්න තරුණයින් ද අද සමාජයේ නැත්තේ නොවේ. ධර්මයට වෛර කරන්නන් හා ධර්මයට ද්වේෂ කරන්නන් ගේ ජීවිත දිනෙන් දිනම පරිහානියට පත්වන බව සර්වඥතාඥානය අවබෝධ කරගත් බුදු පියාණන් වහන්සේ දේශනා කර වදාළේ සකල ලෝ සතුන්ගේ යහපත පිණිසමය.

"සුවිජානො භවං හෝති - සුවිජානො පරාභවො
ධම්මකාමො භවං හෝති ධම්ම දෙස්සී පරාභවො"

දියුණුවන පුද්ගලයා ඒ ඒ කරුණු වලින් දත හැකි වෙයි. පිරිහෙන පුද්ගලයාද එසේම දත හැකි වෙයි. දශ කුසල කර්මයට කැමති වූ පුද්ගල තෙමේ දියුණු වෙයි. ධර්මයට ද්වේෂ කරන තැනැත්තා පිරිහෙයි. **(පරාභව සූත්‍රය)**

මෙම බල දශකයේ සමෘද්ධිමත් පැතිකඩක් ද තිබේ. ජීවිතයේ ඉතා වටිනා ශ්‍රේෂ්ඨතම දශකය මෙය බව ධර්මානුකූලව අවබෝධ කරගෙන මෙම අදියරට පා තබන යෞවනයා ඉතා චමත්කාර ලෙසින්, තම බුද්ධියට නිගා නොවන සේ ස්වකීය ජීවිතයේ වාසනාවන්තම හැරවුම් ලක්ෂයක් ලෙසට මෙම මොහොත පත්කර ගනී. මෙලොවට පමණක් නොව පරලොවට ද ඵලදායී ලෙසින් ජීවිතය කළමනාකරණය කරගන්නා ඔහු අනායාසයෙන් ම විශාල ලෙස පින් රැස් කරගැනීමට මෙම අදියර කේන්ද්‍රස්ථානයක් කරගනී.

ඵලදායී ලෙස මෙම බල දශකය පසු කරන්නා ජීවිතයේ ඉදිරි දශකයන්හිදී සුවයෙන් හා සැනසුමෙන් යුතුව අවසානයේ සයන දශකයේදී නිර්භයව මරණයට මුහුණ දෙයි. කළයුතු කාර්යයන් සියල්ල නිසිකල නිසිලෙස මනා කළමනාකරණයකින් යුතුව ඉටු කරගත් ඔහුට පසුතැවිල්ලක් නැත. සංසාර භව ගමනේ අතරමංව කල්ප ගණන් තිරිසන්, ප්‍රේත ආදී භවයන්හි ඉපිද, අපා දුක් විඳිමින් පැමිණ, ඉතා අපහසුවෙන් ලැබුවා වූ මෙම මිනිස් භවයේ නිසි ඵල ඔහු ලබාගත්තේ වෙයි. නැවත සසරට නොවැටීමට අවශ්‍ය සියලු කටයුතු ඔහු මනා ලෙස මෙම බල දශකයේදී සපුරා ගෙන ඇත.

මව් පියන්ගේ මග පෙන්වීම ඔස්සේ දිවි මගෙහි මෙම සන්ධි ස්ථානයට පැමිණි බෝසත්, ගුණවත් දරුවා ප්‍රඥා වර්ධනය සඳහා වඩ වඩාත් ධර්මයට ම සමීප වෙයි. දහම් පොත් පත් පරිශීලනය කරයි. බුදු පියාණන් වහන්සේ පෙන්වා දී ඇති පරිදි පඤ්ච ශීලයටම අනුගත වෙමින් දානමය පුණ්‍ය කර්මයන් කෙරෙහි ද අවධානය යොමු කරයි. තමා මස් මාංශ ප්‍රතික්ෂේප කරමින් එහි ආදීනව වැඩිහිටියන්ට ද පෙන්වා දෙයි. **ජීවග්‍රහණයට හසු වූ සත්ත්වයෙක් මරණාසන්න මොහොතේදී බියෙන් වෙව්ලයි. සිතුවිලි වේදනාත්මකය. ආවේගශීලීය. ඒ සත්ත්වයාගේ සිරුර පුරා ඒ මොහොතේ දිවෙන රුධිරයට ද එම ආවේගයන් ආරෝපණය නොවන්නේද? එවන්**

සතෙකුගේ මාංශ අනුභවයෙන් මිනිස් සිරුරට කුමන යහපතක් ද? කුමන පෝෂණයක් ද?

මදුරුවකු සිය සිරුරෙන් ලේ උරා බොන්නේ නම් උගේ සිරුර එම රුධිරයෙන් මොහොතින් මොහොත පෘෂ්ඨිමත් වන ආකාරය දෙස ඉවසිලිමත්ව, විමසිල්ලෙන් බලාහිඳින බෝසත් දරුවා තෘප්තිමත්ව ඉවතට පියඹා යන මදුරුවා දෙස බලා සිටින්නේ පුදුමාකාර සතුටකිනි. අනතුරුව එම සතුට දෙගුණ තෙගුණ කරගැනීමට ඔහු සැලසුම් කරයි.

කිසිදු අපහසුතාවයකින් තොරව බල දශකයේ දී සිදු කර ගතහැකි උසස්ම දානය ඔහුට සිහිපත් වෙයි. තම මෑණියන් සිය රුධිරය කිරි කර පොවා තමා ශක්තිමත් කළ බව ඔහුට නිතැතින් ම සිහිවෙයි. එසේ නම් රුධිරය නොමැතිව කිසිවෙකුට ජීවය පවත්වා ගත නොහැකි බව ද අවබෝධ වෙයි. එම සිතුවිල්ල, තමාගේ වත්මන් කායික හා මානසික ස්ථාවරයට ආරෝපණය වනවාත් සමඟම ඔහු ස්වකීය සිරුරෙන් '**ලේ දන්දීම**' ට පෙළඹෙයි. මෙම උත්කෘෂ්ට පරිත්‍යාගය විශිෂ්ඨ පෞරුෂයේ ලක්ෂණයකි. මෙම දානමය පරිත්‍යාගය බහුල වශයෙන් පවත්වා ගනිමින් වාර ගණන 100 අභිබවා යනවිට ඔහුට ඇතිවන්නේ ආත්මාභිමානයකි. **එම රුධිරයේ මූලික සංඝටක සිය සිරුරට එකතුකළ මෑණියන් වහන්සේ ද නිවුණේ වෙයි.**

මෙම මහත් ඵල මහානිශංස ලැබෙන පරිත්‍යාගය තුළින් ලබන මානසික තෘප්තිය ඔස්සේ ඔහු ව ගෙනයනු ලබන්නේ දියුණුවේ ජයටැඹ කරා ය. මස් මාංශ අනුභවයෙන් සහ සුරා සූදුවෙන් වැළකී මෙවැනි පුණ්‍ය කර්මයන්හි යෙදෙන්නන්ගේ ජීවිතයේ සමෘද්ධිය දෛනිකව විනිවිද දැකිය හැකියි. ඒ ධර්මයේ අනුසස්ය. **සිතන පතන සෑම යහපත් ක්‍රියාවකම සාර්ථක ප්‍රතිඵල දෙනෙත් අබියස දිදුලයි.**

එහෙත් කාය බල ශක්තියෙන් දස මහ යෝධයින් මෙන් විරාජමානව, කඹයක් පමණ විශාල රන් ආභරණවලින් ගෙල සරසා සිටියද, ඇතැමුන් හට තම සිරුරෙන් ලේ බිඳක් දන් දීමට සිතක් පහළ නොවේ. මෙවන් මගකට අවතීර්ණ නොවන්නන් මෙන්ම බාහිර බලවේගයන් නිසා මෙම මාවතෙන් ඉවතට පනින්නන්ද අද සමාජයේ නැත්තේ නොවේ. ඔවුනට ධර්මයේ අනුසස් නොලැබෙයි. පෙර කළ පින් නැත්තේ හෝ පෙර කළ පින් අවසන් වූයේ නම් හෝ ඔහුගේ සමෘද්ධිමත් දිවිය දෛනිකව මන්දගාමී වී පරිහානිය කරාම යයි.

එබැවින් යහපත් ජීවන රටාවක් යමෙකුට උත්පත්තියෙන්ම උරුම වී, එය ප්‍රගුණ කරගැනීමට ලද ශාස්ත්‍රීය දැනුම මෙන්ම ප්‍රඥාවද පහළ වූයේ නම් ඔහු ස්වකීය චින්තනය ඔස්සේ අරඹනු ලැබූ එවන් පුණ්‍ය ක්‍රියා වඩ වඩාත් අඛණ්ඩව ඉදිරියට සාර්ථක ලෙස පවත්වා ගැනීමට උත්සුක විය යුතුයි. එවන් යහපත් කටයුතු නැවත නැවතත් බහුල වශයෙන් ප්‍රගුණ කළයුතු බව ධර්මයේ සඳහන්ය. එමගින් ඔහුගේ සමෘද්ධිය, නිරෝගී බව මෙන්ම ජීවිත ජයග්‍රහණය වඩ වඩාත් දිදුලයි. සිරුර පැහැපත් වෙයි. **"දානං දුක්ඛ නිවාරණං" "දානං සග්ගස්ස සෝපානං" "දානං ඛන්ති පරමං සුඛං"** වශයෙන් දානයේ අනුසස් ධර්මයේ පෙන්වා දෙයි. **'දානය'** දුක නැති කරන බවත්, **'දානය'** දෙව්ලොවට හිණිමගක් බවත්, **'දානය'** පරම සුවය ලබා දෙන බවත් මෙයින් පැහැදිලිය.

බල දශකයේ පා නගන ඇතැම් සත්පුරුෂයෝ සිය දෙමාපියන් පවා වඩවඩාත් ධර්මයට නැඹුරු කරවති. ඔවුන් කිසියම් පුණ්‍ය කර්මයක නිරත වන්නේ නම්, ඒ සඳහා තම පූර්ණ දායකත්වය ලබා දෙයි. මූල්‍යමය දායකත්වය සඳහා වුවද පසුබට නොවෙයි. තමා කුඩා අවධියේදී තමාට ධර්මාවබෝධය මෙන්ම සාමාන්‍ය දැනුම පුළුල් කරවීමේ අදහසින් දිවයිනේ විවිධ ආගමික සහ දේශීය උරුමයන් සහිත ඓතිහාසික ස්ථාන කරා දෙමාපියන් ඔවුන් ව රැගෙන ගිය ආකාර සිහිපත් වෙයි. එවන් අවස්ථාවන් තමාගේ වයෝවෘද්ධ දෙමාපියන්ට පරිපූර්ණ ලෙස පෙරළා ලබාදීමට නොහැකි වුවද, යම් ස්ථාවරයක සිටින බුද්ධිමත් දරුවා මනාව සැලසුම් කර, කාරුණිකව මව් පියන් ගේ කැමැත්ත පරිදි ඔවුන් පූජනීය ස්ථාන කරා රැගෙන යයි. කායිකව මෙන්ම ආර්ථිකව ද යහපත් පසුබිමක සිටින බෝසත් දරුවෝ මව් පියන් දඹදිව වන්දනාවේ පවා රැගෙන යති. අවම වශයෙන් පූජනීය ස්ථාන වැඳපුදා ගැනීමට වට වන්දනාවේ හෝ රැගෙන යාමට අමතක නොකරති. අන්ධ මව් පියන් පවා රැගෙන දඹදිව වන්දනාවේ යන සත්පුරුෂ බෝසත් දරුවන් ද අපි දැක ඇත්තෙමු. බල දශකයේ පසුවන යෞවනයින්ට වඩ වඩාත් දෙමාපිය ආශිර්වාදය ලබාගත හැකි මෙවන් අනගි අවස්ථාවන් බොහෝය.

බෝධිසත්වයන් වහන්සේ එක්තරා භවයක වෙළඳාමෙහි යෙදී සිට වෙළඳ භාණ්ඩ රැගෙන සිය මෑණියන්ද සමගින් වෙනත් රටකට නැවකින් ගමන් කරමින් සිටියදී, නැව කුණාටුවකට හසුවී මුහුදුබත් වූ කතා පුවත අපි අසා ඇත්තෙමු. එම අවස්ථාවේදී බල දශකය පසුකරමින් සිටි බෝසතාණන් වහන්සේ වෙළඳ භාණ්ඩ සියල්ල පිළිබඳ අදහස අතහැර දමා සිය මෑණියන්ගේ ජීවිතය බේරාගැනීම සඳහා මහා සටනක යෙදුණි. සිය

මැණියන් වහන්සේ උරහිස මතට ගෙන වෙහෙස නොබලා දැඩි වීර්යයෙන් යුතුව සති ගණනාවක් මහා සමුද්‍රය තරණය කර වෙරළකට සේන්දු වී මැණියන් වහන්සේගේ ජීවිතය බේරාගත් ආකාරය කෙතරම් විශ්මිත ද? වයසට ගැලපෙන කායික ශක්තියත්, අධිෂ්ඨාන ශක්තියත්, වීර්යයත් ඒකරාශී කරගෙන ඒ මගින් සිදු කර ගත්තාවූ මහා පුණ්‍ය කර්මය, බුද්ධත්වය සඳහා මැණියන්ගෙන් විවරණ ලැබීමට හේතු විය. මවක් හදපත්ලෙන්ම නැගී ආ සෙනෙහසින් දරුවෙකුට කිසියම් ආශිර්වාදයක් කළේ නම් එය එල දරනු නියතය. එහි අනුසස් අනන්තය.

මවගේ රුධිරය කිරිකර උරා බීමෙන් සිය සිරුර පෘෂ්ඨිමත් වූ බව මතකයේ රැඳී ඇති යෞවනයා තව දුරටත් මවගේ ආශිර්වාද ලබමින් දිවි ගමන සරුකර ගනී. ඔහු මෙලොවත් පරලොවත් දෙකෙහිම සැප පිණිස, සිය බලදශකය කළමනාකරණය කරගනී. එහෙත් මෙහි එලදායිතාව උකහා ගැනීමට දුෂ්ප්‍රාඥයාට නොහැකිය. මානයෙන් උදම් වී ආවේග ශීලීත්වය තුළින් තම බලය විදහා දක්වීමට ඇතැම්හු වෙර දරති. තමා දිනුවේ යැයි සිතා වේගවත් වාග් ප්‍රහාර මගින් දෙමාපියන්ගේ සිත් රිදවති. කායික බලය පෙන්වා ගතට ද පහර දීමට තරම් දීන පෞරුෂයක් ඇතැමුන් සතුව ඇත. මෙය මානසික රෝගයකි. කායික වශයෙන්ද දෘෂ්‍යමාන වන ලක්ෂණ නැත්තේ නොවේ. සත් පුරුෂයෝ එය වහා හඳුනා ගනිති.

මව් පියන් යනු මුළු ජීවිත කාලය පුරාම තම දියුණුව, සමෘද්ධිය අපේක්ෂා කරන්නවුන් බවත්, කිසි විටෙකත් තමාට අයහපතක් නොපතන අය බවත් බල දශකය පසු කරන මෙවන් තරුණයින්ට අවබෝධ නොවනු ඇත. ඒ මානසික රෝග ලක්ෂණයන්ය. මෙම රෝගයට පාත්‍ර වූවන් සඳහා ඖෂධ ප්‍රතිකර්ම භෞතික ලෝකයේ නොතිබීම ඔවුන්ගේ අභාග්‍යයකි. කිසිම දේශීය වෛද්‍ය වරයෙකු හෝ බටහිර වෛද්‍ය වරයෙකු හෝ මෙවන් රෝගීන්ගේ වගකීම භාර නොගනු ඇත. යමෙකුට රෝගය සුව කරගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා පිළියම් සෙවිය යුත්තේ සිය අධ්‍යාත්මය තුළින් විනා ඔවුන්ගේ අදහස් සියල්ල අනුමත කරන, තම ග්‍රහණයට හසු කරගෙන සිටින බාහිර ලෝකයෙන් හෝ අන්තර්ජාලයෙන් හෝ නොවේ. සකල ලෝක සත්ත්වයාම සුවපත් කළ බුදු පියාණන් වහන්සේ මෙම රෝග සමනය කරගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වා දී ඇත. ඒ සඳහා ප්‍රඥා වර්ධනය අවශ්‍යමය.

රෝග නිධානයට සෘජුවම පාදක වන ධර්ම ශ්‍රවණය කෙරෙහි රෝගියාගේ අවධානය යොමුවිය යුතුමය. ධර්මයට ද්වේෂ කරන්නා

මානසික වශයෙන් පමණක් නොව කායික වශයෙන්ද පිරිහෙන බව ධර්මයේ පැහැදිලිය. අප්‍රමාදීව ධර්මානුකූල ජීවිතයකට අවතීර්ණ වීම විනා වෙනත් විකල්ප නැත්තේමය. ධර්මයේ බලය අසීමිතය.

ආදරය, කරුණාව, මුදිතාව, මෛත්‍රිය වැනි උසස් ගුණ දම් මිනිස් සන්තානයෙන් ගිලිහී යන සමාජයක ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම වැනි මිත්‍ර ද්‍රෝහී අසත්දම් හිස ඔසවන බව පැහැදිලිය. සමාජ සාර ධර්ම සෝදා පාළුවකට ලක්වී ඇති මෙවන් යුගයේ අසත්පුරුෂ ග්‍රහණයකට හසු නොවීම, තරුණ ජීවිත ගත කරන බුද්ධිමත් සැමගේ අභිප්‍රාය විය යුතුමය. මෙම අදියරේදී වඩාත් ප්‍රවේශම් විය යුත්තේ ජීවිතයේ ස්වර්ණමය යුගය විනාශ කර දැමීමට මිත්‍ර ද්‍රෝහී අසත්පුරුෂයාට එක් තත්පරයක් වුව ප්‍රමාණවත් වන හෙයිනි. එබැවින් බල දශකයට පා තැබූ බුද්ධිමත් යෞවනයා මිත්‍රත්වයේ ලීලාවෙන් තමා කරා එළඹීමට වෙර දරන්නන්ගෙන් ප්‍රවේශම් විය යුතුමය. **නියම ඇසුරට සුදුසු පුද්ගලයින් බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා වදාරා ඇත.**

තාක්ෂණික ලෝකයේ මුහුණු පොත ඔස්සේ දැන හැඳින ගන්නා ඇතැම් මිතුදම් අවසන් වන්නේ ශෝචනීය මරණයකිනි. නොඑසේ නම් නීතියේ රැහැනට හසුවීමෙන් සිර දඬුවම් ලැබීමෙනි. එසේත් නැත්නම් කායික හෝ මානසික විකෘති රෝගාබාධයකට පත්වීමෙනි. ආරක්ෂාව තමා සතුය. **"තමා හිසට තම අතමය සෙවණැල්ල"** ආදී ප්‍රකාශනයන්හි සත්‍ය අත්දැකීමට සුදුසුම යුගය බල දශකයයි. මුහුණු පොත ඔස්සේ මිතුදම් ව්‍යාප්ත කරගැනීමට අසීමිත උත්සාහයක යෙදෙන ඇතැම් අන්ධ බාලයින් මිතුරන් ලෙස පෙනී සිටින දසදහස් ගණන් මනසින් සමීප කරගෙන ඔවුනොවුන් සමග අදහස් හුවමාරු කරගනිමින් වටිනා කාලය තත්පර, විනාඩි, පැය ගණන් පමණක් නොව ඇතැම් විට දින, මාස, අවුරුදු ගණන් පවා කාලය අපතේ දමමින් කටයුතු කළද, ඡායා මාත්‍රයෙන් මිතුරා ලෙස පෙනී සිටින හතුරා හඳුනාගත නොහැක.

එහෙත් නූතන ලෝකයේ ඇතැමුන්, ජනප්‍රියතාවය, කීර්තිය, නම්බුව වැනි ගුණාංග, මුහුණු පොතේ යහළුවන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව ලැබෙතැයි සිතයි. දිවා රාත්‍රී වෙහෙසෙමින් මුහුණු පොත සිසාරා අදූරදර්ශී වෑයමක යෙදෙන මෙවන් දුෂ්ප්‍රාඥයින් අද සමාජයේ බහුලය. සිය ආත්මාරක්ෂාව හා පාරිශුද්ධිය පිළිබඳ අනවබෝධයෙන් ඔවුහු සැවොම ළං කරගනිති. මිතුරෙකුගේ ලීලාවෙන් ළඟා වන මොවුන්ගේ ගුප්ත, කූට උපක්‍රම වලට හසුවී අවසානයේදී නීති විරෝධී රහසිගත ජාවාරමකට හෝ සත්පුරුෂයින්

හෙළා දකින සමාජ විරෝධී වෙනත් අපයෝජන වලට හෝ හසුව, ගුණ ධර්ම පිරිහී යන්නේ නොසිතූ ලෙසිනි. අවසානයේදී සිදුවූයේ කුමක්දැයි ඔවුන්වත් නොදනී. අභාග්‍යයක මහත?

මුදිතා ගුණයෙන් යුත් මිනිසුන් සමාජයේ අල්පය. යමෙකු දියුණුවෙන් දියුණුවට පා තබන්නේ නම් ඔවුන්ව දෙපයින් ඇද පහත හෙළීමට වෙර දරන දුෂ්ඨ කුරිරු චරිත අපමණය. එදා අණවින කොඩිවින වැනි අදෘශ්‍යමාන බලවේග ඔස්සේ මිනිසාට වින කළ පාපතරයෝ අද ඒ සඳහා ද තාක්ෂණය ඔස්සේ විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරති. අසත්‍ය චෝදනා, චරිත ඝාතන පවා සිදුකරමින් යමෙකු අගාධයකට ඇද දැමීමට පවා පෙළඹෙන දුෂ්ඨ චරිත අපමණය. දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් ඔවුන් පසුපස විපාකය ලුහුබඳී. අති විශාල අනර්ථයක් සිදු කර ගනී. දීන අසත්පුරුෂයින් ගේ මෙවන් පහත් චර්යා ධර්ම කෙරෙහි විමසිලි නුවණින් යුතුව බල දශකයේ සිටින යෞවනයින් දූරදර්ශීව කටයුතු කිරීම ස්වකීය යහපත පිණිසම හේතුවනු ඇත. නොඑසේ නම් දෙමව්පියන්ගේ ගෞරවයද කෙලෙසා දමමින් තමාද විනාශ වනු ඇත. තමා යා යුතු නිවැරදි මාර්ගය සහ නොයා යුතු නොමඟ කුමක්දැයි අවබෝධ කරගත නොහැක්කා දිනෙන් දිනම පරිහානියට යයි.

බුදු පියාණන් වහන්සේ පෙන්වා දී ඇති අන්දමට කෙනෙකුගේ **යසස, කීර්තිය, ජනප්‍රියතාව** ඇතිවන්නේ තමා ගැන තමාටම දැනෙන සිහිය ඇති, නිදොස් දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත්, දැහැමි දිවි පැවතුම් ඇති, උත්සාහයෙන් ස්වාර්ථය මෙන්ම පරාර්ථය පිණිස වන යහපත් කටයුතුවල යෙදෙන අප්‍රමාදී පුද්ගලයාටය.

උට්ඨානවතො සතිමතො - සුචී කම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤත තස්ස ච ධම්ම ජීවිනො - අප්ප මත්තස්ස යසොභි වඩ්ඪති

(ධම්ම පදය - අප්පමාද වග්ග)

The fame of him who strives (after perfection), is mindful, is pure in deed, considerate, is restrained, righteous and heedful, spreads far and wide.

බල දශකයේ යුග දිවිය

ජීවිතයේ සමෘද්ධිමත් යුගයට පිවිසෙන තරුණයා හා තරුණිය ගේ වැදගත් ම ඉලක්කය විවාහයයි. ඒ අනුව ස්වකීය සහකරු හෝ සහකාරිය දෙමාපියන් මැදිහත්වීමෙන් කුල පරම්පරාවට ගැලපෙන සේ සොයා බලා චාරිත්‍රානුකූලව ඉටුකර දීම ලෝක සම්මත ක්‍රමයයි. බෝධි සත්ත්වයන් වහන්සේ සිදුහත් ආත්ම භවයේදී මෙන්ම පෙර ආත්ම භව වලදීද එලෙස චාරිත්‍රානුකූලව විවාහ පත්වී ඇති බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි.

එහෙත් සියලු සාර ධර්ම සිරිත් විරිත් උඩු යටිකුරු වී ඇති වත්මනෙහි තාරුණ්‍යයේ සිතුම් පැතුම් හා වගකීම් මෙන්ම යුතුකම් සියල්ල ද ශෝචනීය ලෙසින් විකෘති භාවයට පත්ව ඇත. එදා විවාහයක මූලික අරමුණ වූයේ අනාගත පරම්පරාවයි. උපන් බිළිඳා මවගේ මෙන්ම පියාගේ කරුණාව, දයාව, මෛත්‍රිය, උණුසුම, සෙනෙහස හා ආරක්ෂාව ඇතිව ඒ ගුණ බර දෙමාපියන් විසින් හදා වඩා රටට ජාතියට යහපත් පුර වැසියකු ලෙසින් සමාජයට දායාද කළේ රතු පලස් මත සුඛෝපභෝගී ජීවිත ගත කරමින් නොවේ. අග හිඟ කම්, දෛනික ගැටලු දහසක් හමුවේ වුවද තම යුතුකම් හා වගකීම් පැහැර හැරීමේ සිතුවිලි මාත්‍රයක් වත් ඔවුන් හමුවේ නොවීය. කුමන තරමේ අභියෝග ජීවිතයට පැන නැගුණේ වුවද, දරුවාගේ පරිපූර්ණ මානසිකත්වය හා ආරක්ෂාව කෙරෙහි දැඩි අවධානයකින් හා කැපවීමකින්, ජීවිත පරදුවට තබා ඔවුන් සිය යුතුකම් සියල්ල ඉටු කළේ උත්තරීතර මාතෘත්වයේ සහ පිතෘත්වයේ ශ්‍රේෂ්ඨත්වයට සුළු වශයෙන් හෝ නිගා නොවන පරිද්දෙනි.

වත්මන් දරුවන් බොහෝ දෙනෙකුගේ මානසිකත්වය අඩපණ වී ඇත. ලා බාල අවධියේදී ඔවුන්ගේ පෞරුෂ වර්ධනයට අවශ්‍ය පසුබිම සකසා දීමට වත්මන් මව් පියවරු අසමත්වීම එයට හේතුව බව අද මනෝ විද්‍යාඥයින්ගේ මතයයි.

වත්මන් සමාජයේ තම තමා විසින්ම සොයාගනු ලැබූ සහකාරිය හෝ සහකරු තුළින් පවා මුලින් දුටු ගුණාංග පසුකාලීනව නොදකියි. **(සඤ්ඤා විපල්ලාසයන්)** ඒවා ඔවුන් තුළින් පලා ගොස්ය. ආරම්භයේදී තෘෂ්ණා මූලික මනෝභාවයෙන් යුතුව සියල්ල, ශාන්ත, ප්‍රණීත, මධුර, මනෝහර ලෙසින් දකියි. එහෙත් කිසිවක් එලෙසින් පවතින්නේ නැත. ඇති වූ සෑම දෙයක්ම

වෙනස් වෙමින් පැවතී නැතිවී යාම ලෝක ධර්මතාවය යි. ස්වකීය අභිමතය පරිදි මව ඇයටම වෙන්වූ වෙනත් සිහින ලොවක ය. චර්යා රටා විවිධය. විශ්මය ජනකය. පියා ද ඔහුට වෙන්වූ තවත් සිහින ලොවකය. දෙදෙනා අතර සංහිඳියාවක් නැත. සන්නිවේදනයක් නැත. තම දරුවන් යහපත් ලෙස සමාජයට දායාද කිරීමේ වගකීමක් යුතුකමක් තම තමා සතු බව නොදනී. ආරවුල් බහුලය. උපන් දරුවා කෙරෙහි නිසි අවධානයක් නැත. බල දශකයේ දිවි ගත කරන මොවුන් ළඟ බාහු බලය ඇත. එහෙත් බොහෝවිට එය යහපත් පෞරුෂයකට ඉලක්ක වී නැත. විවාහ පත් යුවලකට ආදර්ශමත් දිවි පෙවතක් ඔස්සේ තම දරුවන් නිසි ලෙස හදා වඩා ගැනීමට නම් දරු පවුල එක් ස්ථානයක ජීවත් වීමේ ඇති වැදගත්කම මූලික වශයෙන්ම අවබෝධ විය යුතුයි. එකිනෙකා ළඟ ස්වයං විනයක් පවත්වා ගැනීමට එය මූලික සාධකයයි. අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් අබිමුව පෞරුෂය මා හැඟී කොටසක් රඟපායි. දරුවන්ගේ මානසික සහ ශාරීරික වර්ධනය සංකූලතාවයන් ගෙන් තොරව උද්දීපනය කිරීමට, එම පසුබිම සපයන්නේ ඉමහත් දායකත්වයකි.

අද සමාජය තුළ දිනෙන් දින වැඩිවන දික්කසාද නඩු ගණන අප්‍රමාණය. එදා මවුවරු දරුවන්ගේ නාමයෙන් සියල්ල ඉවසා සිටියහ. ඇතැම් අකෘතඥ ස්වාමිවරු බීමත්ව පැමිණ තම ස්වාමි දියණිය ඉදිරියේ කේශර සිංහ රාජයෙකු මෙන් රඟපෑමට දරන්නා වූ නීච උත්සාහය හමුවේ ධර්මානුකූල දිවි පෙවතක් ගෙන යන ස්වාමි දියණිය නිසොල්මන්ය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හමුවේ දහසකුත් එකක් පීඩා වින්දේ වුවද, ධර්මානුකූල පසුබිමක සිටින ඇයගේ ස්ථාවරය අභිබවා යෑමට ප්‍රකෘති සිහියකින් විනා විකෘති මානසිකත්වයකින් නොහැක්කේමය.

ස්වාමියාගේ අපගාමී පෞරුෂය හඳුනා ගත්, එදා මව්වරු දරුවන්ගේ කායික, මානසික, භෞතික හා සමාජයික වපසරිය යහපත් කිරීමේ අදහසින් සියලු කායික, මානසික වේදනා ඉවසුවා ය. දරුවන් වෙනුවෙන් මවකට විඳ දරා ගත නොහැකි වේදනාවක් නොතිබිණි. ප්‍රචණ්ඩත්වයට එරෙහිව නඩු මඟට බැස්සේ ද නැත. ස්වකීය ගෞරවයත්, දරුවන්ගේ අනාගතයත් ගැන සිතා උදා වූ අවස්ථා වෙස් වළාගෙන පැමිණි ආශිර්වාදයන් සේ සිතා දහම් මඟ ඔස්සේම පිය නගන්නට වූවාය. ආරවුල් මතභේද ගැටුම් සියල්ලක් කර්මානු රූපීව තමාට උරුම දෙය බව සිතා එම කර්මයන් මෙම භවයේදීම ගෙවා දැමීමට වෙහෙස වූවා විනා පවුලේ ගැටුම් විසඳීමට යැයි සිතා තවත් පාර්ශ්වයක් පවුලට එක් කර ගත්තේ ද නැත. වෛරය,

මෛත්‍රියෙන්ම පැරද වූවාය. බීමත් කමට එරෙහිව සත්‍යක්‍රියා කළාය. දරු පවුල සමග ඒකරාශීව ජීවත් වීම ඒකායන අරමුණ කරගෙන ඒ මත දරුවන් වෙනුවෙන් සියලු යුතුකම් හා වගකීම් ඉටු කළාය. ඒ එදා සිටි මවගේ **ජයග්‍රාහී මාතෘ භූමිකාවයි. විශිෂ්ඨ පෞරුෂයයි**

එහෙත් වත්මන් දෙමාපියන් මවගේ පියාගේ යුතුකම් කවරේදැයි නොදන්නා සේය. බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් ලෝක සම්මත ධර්මතාවන් පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැත්තන් සේ අමුතුම රඟපෑමක යෙදෙයි. විටෙක මුදල් ඉපයීමේ ඒකායන අරමුණ නිසා මනුෂ්‍යත්වය ඉක්මවා යයි. විටෙක තමා කවරෙකුදැයි අමතක වී යයි. එදා දෙමව්පියන් අප්‍රමාණ දුක් විඳිමින් තමා හදා වඩා නිසි ලෙස ශිල්ප ශාස්ත්‍ර ලබා දී සමාජයේ පිළිගත් උසස් රැකියා ක්ෂේත්‍රයකට යොමු කළේ වුවද, එතනට පැමිණි ආකාරය අමතක වූවා සේය. බල දශකයේ ජීවත් වන ඇතැම් නූතන දෙමාපියන් දරුවන්ට ශිල්ප ශාස්ත්‍රය ලබාදීම පිළිබඳව කිසිදු සැලකිල්ලක් නැත. විෂය දැනුම තබා දෛනික ජීවිතයේ කටයුතු හමුවේ වුවද නිසි මඟ පෙන්වීමක් නැත. මඟපෙන්වීම තබා දරුවා සමග නිසි සන්නිවේදනයක් ද නැත. මව මවගේ මනෝ ලෝකයේ විරාජමාන වෙයි. බිරිඳ හා ස්වාමියා අතර සුහද බැඳීමක් නැත. පියා ස්වකීය ආර්ථික ස්ථාවරය ඔස්සේ මහත් පෞරුෂයක් යැයි සිතා ඔහුගේ මනෝ ලෝකයේ ය. එහෙත් එය අපගාමී පෞරුෂයක් විනා විශිෂ්ට පෞරුෂයක් නොවන බව ඔහු නොදනී. එක් විෂය ක්ෂේත්‍රයක් ඔස්සේ විශාල පරාසයක දැනුම් සම්භාරයක් ලැබූ පමණින්, මිනිසා ප්‍රඥා වන්තයෙකු නොවන බව ධර්මයේ සඳහන්ය. කර්මය හා කර්ම ඵල විශ්වාස නොකරන, ධර්මය ප්‍රතික්ෂේප කරන, සියල්ල **නිත්‍ය සුඛ, ආත්ම** වශයෙන් අල්ලා ගන්නා පුද්ගලයාට ප්‍රඥාව නොපිහිටයි.

දෙමාපියන්ගෙන් දරුවන්ටත්, දරුවන්ගෙන් දෙමාපියන්ටත් ඉටුවිය යුතු යුතුකම් තුන් ලෝකයක් සනසාලූ බුදු පියාණන් වහන්සේ සිඟලෝවාද සූත්‍රයේ පෙන්වා දී ඇත. ධර්මය සර්වකාලීනය. අවශ්‍ය නිසි පසුබිම සකසාගැනීම දෙමාපියන්ගේ යුතුකමයි.

1. **මව් පියන් දරුවා පවින් වැළකිය යුතුයි.**
   They dissuade them from evil

2. **යහපතෙහි යෙදවිය යුතුයි.**

They persuade them to do good

3. **සිප් සතර ඉගැන්විය යුතුයි.**

They teach them

4. **නිසි කළ ආවාහ විවාහ කරදිය යුතුයි.**

They would give them in marriage to a suitable partner

5. **නිසි කළ දේපොළ පවරා දිය යුතුයි.**

At the proper time they handover their inheritance

මෙවන් ධර්මානුකූල පසුබිමක හැදුණු වැඩුණු එදා සිටි අම්මාවරුන් මෙන්ම පියවරු ද සිය සියලු යුතුකම් දරුවන් වෙනුවෙන් පරිපූර්ණ ලෙස ඉටු කර දී, ඔවුන්ට සමාජයේ ඉහළ ස්ථරයක, උසස් රැකියාවක, නිරතවීමට අවශ්‍ය පසුබිම සකසා දුන්හ. එහෙත් අද බල දශකයේ පසුවන එම දරුවන් පවා ස්වකීය දූ දරුවනට ඉහත සඳහන් යුතුකම් ඉටුකිරීම ප්‍රතික්ෂේප කරයි. **දරුවන් පවින් වැළකීම සහ යහපතෙහි යෙදවීම පිණිස** ඔවුන් කරන කියන දේ පිළිබඳව මව් පිය අවධානය යොමුවිය යුතුයි. ඔවුනොවුන් අතර යහපත් සන්නිවේදනයක් තිබිය යුතුයි. ඒ සඳහා පවුලේ සැම දරු පවුලක් සේ එක්ව එක් ස්ථානයක ජීවත් වීම ඉතා වැදගත්ය. දෙමාපියන්ගෙන් ලද දේපළ සහ ගෙවල් දොරවල් මෙන්ම ඔවුන් විසින් ස්වකීය අභිමතය පරිදි ඉදිකර ගත් වාසස්ථාන කොතෙක් තිබුණද, ඒ සියල්ල වෙනත් අරමුණු සඳහා ය. **දරුවන් පවින් වැළකීම හෝ යහපතෙහි යෙදවීම** සඳහා අවශ්‍ය පසුබිමක් එහි නැත. මෙලෙස ස්වකීය යුතුකම් හිතා මතා පැහැර හරින මව් පියන් අද සමාජයේ නැත්තේ නොවේ.

නවීන පහසුකම් කිසිවක් නොතිබුණ යුගයක් වුවද, එදා දෙමාපියන් දහසකුත් එකක් කරදර මැද තමාට අධ්‍යාපනය ලබා දුන් ආකාරය පිළිබඳව ඇතැම් වත්මන් දෙමාපියන්ට අමතකය. යම් පමණකින් හෝ මතකයක් ඇත්තේ නම් ඒ දීපු දඬුවමක් හෝ සිදු වූ සුළු ප්‍රමාද දෝෂයක් පමණි. තමාට සිදුවූ යහපත, ලබාදුන් ශිල්ප ශාස්ත්‍ර, නිසි වයසේදී පවරා දුන් දේපොළ, වත්මන් සමාජ ස්ථාවරයට තමා ඔසවා තැබූ අයුරු

කිසිවක් මතකයේ රැඳී නැත. නොඑසේ නම් මතකයෙන් ගිලිහී ඇත්තා සේ රඟපානවා විය හැක. කෙසේ වුවද ජීවිත ජයග්‍රහණයට විශාල අභියෝගයක් වන මෙය යෞවනයට පාතබන අසත්පුරුෂයින්ට ඇතිවන උන්මාදයේ එක්තරා ප්‍රභේදයකි. **"සබ්බේ පුථුජ්ජනා උම්මත්තකා"**

දෙමාපියන් විසින් දරුවනට **සිප් සතර ඉගැන්විය යුතුයි** යන බුදු වදන පවා ප්‍රතික්ෂේප කරමින්, කිසිම අවධානයක් නොමැතිව ඉබේ හැදෙන වල් පැළ මෙන්, උස් මහත් වීමට පමණක් දරුවන්ට ඉඩ හරින මව් පියන් ද අද සමාජයේ බහුලව නැතත් නැත්තේ නොවේ. දරුවා යනු නොමේරූ මනසක් ඇති සෙල්ලමට කැමති අයෙකි. නිසි අධ්‍යාපන මඟට යොමුකර ගැනීම මව් පියන් විසින් බැහැර නොකළ යුතු වගකීමකි. එහෙත් දෙමාපියන් හිතා මතාම එම වගකීම් පැහැර හරින අවස්ථාවලදී, ගොළුවන රැකීමට නොහැකි සීයා, අත්තම්මා වැනි වැඩිහිටියන් ඒ සඳහා උනන්දුවීම පවා ප්‍රඥාවන්තයින් අගය කළද දුෂ්ප්‍රාඥයා හෙළා දකී.

"නිසි කල ආවාහ විවාහ කර දීම සහ නිසි කල දේපොළ පවරා දිය යුතුයි. නිසි කල යනු දරුවා යුග දිවියට සුදුසු යෞවනත්වයට කායික, මානසික, මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් මනා අවබෝධයකින් යුතු අවධියයි. දරුවාට හරි දෙය වැරදි දෙය කියාදී නිසි අධ්‍යාපනය ලබා නොදුන්නේ නම් මෙම යුතුකම් පිළිබඳව සිතීම පවා සිහිනයකි. දරුවන්ගේ සුන්දර අනාගතය ළාබාල අවධියේ සිටම හිතා මතාම බොඳ කරන, අඳ, බල දශකය පසු කරන මෙවන් දෙමව්පියන්ගේ මෙම විකෘති මානසිකත්වයට වගකිව යුත්තෝ කවුරුද?

වත්මන් සමාජයේ රැකියා අවස්ථා බහුලය. කිසිදු ශාස්ත්‍රීය දැනුමක් ලබා **නොතිබීම** උසස්ම සුදුසුකම සේ සැලකෙන රැකියා ද අද සමාජයේ හතු පිපෙන්නාක් මෙනි. එවන් රැකියා සඳහා අවම වශයෙන් කිසිම භාෂාවක අකුරු ටික (alphabet) පවා හරියාකාරව **නොදන්නේ නම්** එය ද ලොකු සුදුසු කමකි. සලකා බලන එකම සුදුසුකම ශාරීරික වශයෙන් මනුෂ්‍යයෙකු වීම පමණි. එයද ඇතැම් ආයතන වල තවත් ලිහිල් කොට ඇත. මිනිස් භාවය ලබා ඇත්නම් ගොළුවෙකු හෝ බිහිරෙකු වුවද පුරප්පාඩු ඇත. සැලකිය යුතු මාසික වේතනයක් ලැබෙන අතර, ඉටුකරනු ලබන කාර්ය භාරය අනුව වේතනය දෙගුණ තෙගුණ වෙයි. **මේ විපරීත සමාජයක දර්ශනයයි.**

පවින් වළකා යහපතෙහි නොයෙදූ දරුවා සතු ශාස්ත්‍රීය දැනුමක් ද නොවන්නේ නම් ඔවුන් ගේ ජීවිත වල සමෘද්ධියක් අපේක්ෂා කළ හැකිද? වත්මන් යුගයේ සමාජ සල්ලාලයින්ගේ ගොදුරක් බවට පත්වීම විනා ඔවුනට අන් විකල්පයක් නැත්තේමය. දෙමාපියන් තම යුතුකම් නිසි අයුරෙන් ඉටු නොකිරීම නිසා මෙලෙස වටිනා ජීවිත විනාශ වී යාම කෙතරම් ශෝචනීයද? මෙහි විපාක කල්ප ගණන් තමා පසුපසම හඹා එනු ඇත. බුදු පියාණන් වහන්සේ සකල සත්ත්වයාගේ යහපත පිණිස දේශනා කර වදාළ '**ගිහි විනය**' පවත්වා ගනු විනා වෙනත් විකල්පයක් භව ගාමී වූ සත්ත්වයාට නැත්තේමය.

නූතන මව් පියන් ධනයෙන්ද, දේපළ ආදියෙන්ද, පිරිස් බලයෙන් සහ කිසියම් විෂයකට අදාළ ශාස්ත්‍රීය දැනුමෙන් ද ආඪ්‍යව සිටියේ වුවද, බුදු දහමේ පෙන්වා දෙන අන්දමට ඉදිරියේදී තවත් **දශක හයක්** ගත කිරීමට සිදුවන බව අමතක නොකළ යුතුමය. සියළුම දේ **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** යන ත්‍රි ලක්ෂණයට යටත් බවත්, අද ලබා ඇති සියලුම සම්පත් වල උරුමය ඉතා කෙටි කාලයකින් අවසන් වන බවත්, ජීවිත කාලය තුළ රැස්කර ගන්නා වූ කුසලාකුසල කර්ම දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් මේ භවයේදීම හෝ කර්ම ඵල අනුව ඉදිරි භවයන්හිදී තම තමා පසුපසම හඹා එන බවත් සිහිපත් කරගත යුතුමය.

මෙවන් යථාර්ථවාදී පසුබිමක ඇතැම් දෙමාපියෝ ස්වකීය නිදහස වෙනුවෙන් විවිධ ක්‍රියා මාර්ග ගනිති. දරුවන් සමග එක්ව ජීවත් වීම විශාල කරදරයක් සේ දකින ඇතැම් මව්වරු මෙන්ම පියවරු ද වත්මන් සමාජයේ දැකිය හැකිය. මෙලෙස ස්වකීය යුතුකම් හා වගකීම් නොතකා ආත්මාර්ථකාමීව කටයුතු කරන දෙමාපියන් මිනිසත් බවට පවා නිගාවකි.

ඔවුන්ගේ දර්ශනය නිවැරදි බව හුවා දැක්වීමට විවිධ මත ඉදිරිපත් කළ ද, ස්වකීය කාර්යභාරයේ ඇති සංකීර්ණත්වය සහ කාර්ය බහුලත්වය විදහා දැක්වූයේ වුවද, උපමා උපමේය ඉදිරිපත් කරමින් ස්වකීය දැනුම විශේෂිත බව හුවා දැක්වීමට වෙර දැරුවේ වුවද, ඒ සියල්ලක් ප්‍රඥාවන්ත සත්පුරුෂයින් ඉදිරියේ නින්දිතය. ප්‍රඥාවන්ත වැඩිහිටියන් එම හර ශුන්‍ය ප්‍රකාශන හෙළා දකින්නේ ස්වකීය යථාර්ථවාදී බුද්ධියට නිගා කරගත නොහැකි හෙයිනි. කෙසේ වුවද ධර්මයෙන් පිට පනින වත්මන් යෞවනයාගෙන් සිදුවන්නේ ස්වකීය දරුවන්ගේ අනාගතය තව තවත් අගාධයකටම ඇදී යාම පමණි.

මානයෙන් උදම් අනන දුෂ්ප්‍රාඥයින්, සීමිත විෂය පරාසයකට අදාලව ලබාගත්, තමාගේ උගත්කම සූක්ෂම ලෙස හුවා දක්වමින් ස්වකීය දරුවන්ට පවා හිතා මතාම සිදු කරනු ලබන ව්‍යසනය සුළු පටු නොවේ. **'මහ ගස් යට පොඩි ගස් වැඩෙන්නේ නැතැ'** යි පවසන ඔවුහු තම දරුවන්හට ඉගෙනීම සඳහා කිසියම් මඟක් පෑදී තිබේ නම් එයට ද ඉතා සූක්ෂම ලෙස මාර්ග බාධක යොදති. දරුවන් හට අධ්‍යාපනය ලබාදීමේ හෝ අවම වශයෙන් දෛනික ජීවිතයට අවශ්‍ය නිසි මඟ පෙන්වීමක් හෝ නොමතිව මාතෘත්වයේ හා පිතෘත්වයේ වගකීම් හා යුතුකම් අමු අමුවේ පැහැර හරින මෙවන් අකෘතඥ මිනිස් රූකඩ අද සමාජයේ බහුලව නැතත්, නැත්තේ නොවේ. මොවුන්ගේ රඟපෑම, තුන් ලොවක් සනසා වදාළ බුදු පියාණන් වහන්සේගේ සර්වඥතාඥානය පවා අභිබවා ඇත්ත වුන් සේය. **අභාග්‍යයක මහත ?**

සිත් පිත් නැති ගසක වර්ධනයත්, ඇට, ලේ, මස්, නහර වලින් සුසැදි දරුවෙකුගේ කායික හා මානසික වර්ධනයත්, උපමාවකින් හෝ සමකළ හැක්කක් නොවේ. එහෙත් පැළයකට ලැබෙන සූර්යාලෝකය, අසල ඇති, අතු පතර විහිදී ඇති වෘක්ෂ රාජයා විසින් ආවරණය කරන බව නම් සත්‍යයකි. ඒ අනුව දරුවාගේ ජීවිතාලෝකය ද ධර්මානුකූලව යුතුකම් නොදන්නා, දුෂ්ප්‍රාඥ වූ රූකඩ දෙමාපියෝ හිතා මතාම ආවරණය කරති. රංගනය කෙසේ වුවද, බුද්ධිමත් ප්‍රේක්ෂකයා යථාර්ථය දකී. ගොනා හැරෙන විටම, පොල් පැළයට බව අවබෝධ කර ගැනීම ඔවුනට අසීරු නොවනු ඇත.

අනාදිමත් කාලයක සිට බෞද්ධ ඉතිහාසයකට හිමිකම් කියන ජාතියක් වශයෙන් අප ලබා ඇති ඓතිහාසික සංස්කෘතික වටිනාකම් පිළිබඳව බාල පරපුර දැනුවත් කිරීම දෙමාපියන් ගේ යුතුකමයි. මෙපමණ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් ඇති රටක පුරවැසියන් ලෙසින්, තම වගකීම් හා යුතුකම් යමෙක් හිතාමතා පැහැර හරින්නේ නම් ඔහු ජාතිද්‍රෝහියෙක් මෙන්ම රට, දැය, සමයට ද්‍රෝහීවන සමාජ පිළිලයකි. යුග ගණනාවක් පසු කරමින් අපගේ මුතුන් මිත්තන් දිවි පරදුවට තබා රැකගත් දේශීය සංස්කෘතිය, ප්‍රෞඪ ඉතිහාසය සහ ආගමික සංහිඳියාව ආදී සියල්ලෙහිම ප්‍රබල හැරවුම් ලක්ෂයක පෙර නිමිති අද ප්‍රඥාවන්ත සත්පුරුෂයින්ගේ දෙනෙත් අබියසය. **මේ යුගයේ පරිහානියේ සේයාවන්ය.**

විවාහ ගිවිස ගත් ස්වාමි භාර්යාවන්ගේ වගකීම් හා යුතුකම් ආරම්භයේදීම දිසා තුනකට යොමුවිය යුතුය. සමපාද ත්‍රිකෝණයක මධ්‍ය ලක්ෂයේ සිට බලන්නාසේ ශීර්ෂ තුනක් දෙසට අවධානය යොමුවිය යුතුය. එක් ශීර්ෂයක දෙමාපියන් ය. තව ශීර්ෂයක දරුවන් ය. ඉතිරි ශීර්ෂයේ බිරිඳට සාපේක්ෂව ස්වාමියා ය. ස්වාමියාට සාපේක්ෂව බිරිඳය.

තමා වෙත මව් පදවිය, පිය පදවිය හිමි වන්නේ දරුවාගේ උපතින්ම ය. එවන් ස්ථාවර, උත්තරීතර ශ්‍රේෂ්ඨ පදවිය තමාට උරුම කළ දරුවා උපතේදී මැණිකක් මෙන් සලකයි. එය ඔපමට්ටම් කර සමාජයට දායාද කිරීම දෙමාපියන්ගේ ශ්‍රේෂ්ඨ යුතුකමයි. කුඩා කල සිටම හරි වැරදි පෙන්වා දෙමින් ගුණ දහමින් පෝෂණය කළ යුතුයි. ඒ ගුණ දහම් නමැති මුතුවැළ ගෙල පළඳා දරුවා සමාජයට දායාද කිරීම සත්පුරුෂ මව් පියන්ගේ යුතුකමයි. එතෙක් දරුවා වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් අපමණය. පොල් තිබූ පලියට තෙල් ලබාගත නොහැක. නිධානයක් තම ඉදිරිපිට තිබුණද මන්දෝත්සාහී නම් එය ලබා ගත නොහැක. පුද්ගල අධිකාරියක් ඕනෑම පුද්ගලයෙකු සතුව පවතී. ඒ තුළින් සෞභාග්‍යය කරා ළඟාවීමට නම් කළයුත්ත කළයුතු වේලාවට උත්සාහයෙන්, සිහියෙන් හා සංයමයෙන් යුතුව නිහතමානීව ඉටුකළ යුතුය.

වයෝවෘද්ධ දෙමාපියන් කෙරෙහිද පැවතිය යුතු ආකාරය ඉතා වැදගත් ය. ඔවුන්ගේද ආරක්ෂාව, පෝෂණය සහ ඉඳුම් හිටුම් ආදී සියලු කාර්යයන් කෙරෙහි පූර්ණ අවධානය යොමු විය යුතුම ය. ඔවුන් හට මහපාරට බසින පසුබිමක් උදා නොවිය යුතුය. එවන් අවස්ථාවක් උදාවූයේ නම්, සිදුවන්නේ එම බල දශකයේ පසුවන යෞවනයින්ගේ අපගාමී පෞරුෂය සමාජයට හෙළිදැක්වීම පමණි.

බිරිඳ ස්වාමියාටත්, ස්වාමියා බිරිඳට නිසි ලෙස තම යුතුකම් ඉටු කළයුතුයි. මේ සඳහා අනුගමනය කළයුතු නිසි මඟ බුදු පියාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ මනා කොට දේශනා කර වදාළ සේක. ස්වාමියා බිරිඳට ආදර සැලකිලි සහිතව කතා කළ යුතුය. කටයුතු අගය කළ යුතුය. (**සම්මානනාය** - by courtesy) ඇයට අවනම්බු නොකළ යුතුයි. (**අනවමානනාය** - by not despising her) - පරදාර සේවනයෙන් වැළකිය යුතුයි. (**අනති චරියාය** - by faithfulness) ගෘහස්ථ පාලන බලය පවරා දිය යුතුයි. (**ඉස්සරිය වොස්සග්ගෙන** - by handing over house hold authority) අලංකාර ඇඳුම් පැළඳුම් ආදිය ලබා දිය යුතුය (**අලංකාරනුපපාදනෙන** (by providing her with ornaments)

තාරුණ්‍යයේ අභිමානය රැක ගනිමින් ස්වකීය යුතුකම් හා වගකීම් නිසි ලෙස මෙලෙස කළමනාකරණය කරගන්නා තරුණයා ආත්ම අභිවෘද්ධිය මෙන්ම පරාභිභිවෘද්ධිය සඳහා මග සලසා ගනී. එතුළින් ඔහුගේ අධ්‍යාත්මය තුළ වූ බහුශ්‍රැත බව, හික්මුණු බව, නිහතමානී බව, කාර්ය ශූරත්වය පිළිබිඹු වෙයි. ඒ සිය බුද්ධිය විනිවිද දැකිය හැකි අවධියයි.

ගුණ දහම් මගින් කපා ඔප මට්ටම් කර නිසි ලෙස හැදුණු වැඩුණු දියණිය හෙළ සිරිත් විරිත් වලට කිසි කලෙක පිටු නොපායි. මුතු කැට එකින් එකට අමුණා ගත්තා සේ දේශාභිමානයෙන් ඔද වැඩී යයි. මෙවැනි අමිල වටිනාකමකින් යුත් දියණියක් සමාජයට දායාද කරන දෙමව්පියන් කෙතරම් ශ්‍රේෂ්ඨද? එම දියණියද, යම් දිනයක සිය මාතෘ භූමිකාවේ ගෞරවය රැක ගනිමින්, හෙළ සිරිත් විරිත් හා සාරධර්ම ඔස්සේ තවත් පරම්පරාවක් ඉදිරියට ගෙන යනු ඇත.

දහමින් පෝෂණය වෙමින් හෙළ සිරිතට ගරු කරමින් මාතෘත්වයේ අභිමානය රැක ගනිමින් ඇය යන මේ ගමන් මග කෙතරම් අභිමානවත් ද? ජාත්‍යාලයෙන් හා දේශාභිමානයෙන් යුත් එවන් දියණියකට ජාතියේ ප්‍රණාමය හිමිවන්නේ නිතැතිනි. එවන් දියණියක් සමාජගත කළ දෙමව්පියන් තිවුණෝ වෙයි. මේ සඳහා සෑම මවක් හා පියෙක් තම යුතුකම් හා වගකීම් හමුවේ වඩාත් සැලකිලිමත් විය යුතුමය.

කුඩා කාලයේදී වරදක් කළද, වරදට දඬුවම් නො දෙන ඇතැම් උගත් යැයි සම්මත පියවරු දරුවාට පහරක් ගසන්නේ නැත. දරුවා ඉල්ලන ඕනෑම භෞතික වස්තුවක් ලබාදීමට පෙළඹෙයි. දරුවා හදා ගැනීමේ අරමුණෙන් දරුවාගේ වයසට ගැලපෙන අන්දමට පහරක් දීම හෝ වෙනත් දඬුවමක් දීම හෝ ප්‍රතික්ෂේප කරයි. බුදු රජාණන් වහන්සේ ජීවමාන අවධියේදී පවා දඬුවම සමාජයේ ස්ථාපිතව තිබුණි. පෙර භවයන්හිදී දිසාපාමොක් ඇදුරු වී සිටි අවධියේද වරදට පහර දුනි. (තිලමුට්ඨි ජාතකය) දඬුවමෙන් යහ මඟට ගැනීමට නොහැකි වූවන් සඳහා බ්‍රහ්ම දණ්ඩනය පවා පනවා තිබුණ බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි. (චන්න හිමියන්ට)

"දඬුවම් නොදී හදන දරුවා හැඳි නොගා හදන හොද්ද වගෙයි"

යන පැරණි ආප්තෝපදේශයෙහි ද සත්‍යතාවය ගැබ්ව ඇත. එදා මව් පියන් උගත් කමින් පරතෙර පැමිණ නොතිබුණි. එහෙත් දරුවන් නිසි ලෙස සකසා සමාජයට දායාද කර ඇත.

වත්මන් සමාජයේ දඬුවම් නොදී දරුවා හැදීමට උත්සාහ කළ, සම්මුතියට අනුව උගත් පියෙකු මුහුණ දුන් එක්තරා අභාග්‍ය සම්පන්න සිද්ධියක් මෙසේය. බටහිර සංස්කෘතිය වැළඳගෙන සිටි ඔහු කුඩා දරුවා සමග නිවසේදී ද කතා බහ කළේ ඉංග්‍රීසි භාෂාවෙනි. පාඨක අවබෝධය සඳහා එම දෙබස එලෙසින්ම පහත සඳහන් වෙයි.

දිනක් පියා කුඩා දරුවා සමග ගෙමිදුලේ ඇවිදිමින් සිටියදී දරුවා හඬන්නට විය. වටපිට බැලුවේ වුවද කිසිදු හේතුවක් සොයාගත නොහැකි වූයෙන් පියා මෙසේ අසන්නට විය.

Father - Why are you crying my darling?

(මල් පැළයක් දෙසට අත් දිගු කළ දරුවා යමක් ඉල්ලන්නට විය.)

Child - I want that ......

(අඩියක් පමණ දිග, වක් වෙමින් බඩගානා පණුවා දුටු පියා)

Father - How can I take it? it's a dirty worm.

(දරුවා වඩාත් ශබ්ද නගා හඬන්නට විය.)

Child - I want it some how

දරුවාගේ හැඬීම දරා සිටීමට නොහැකි වූ පියා කෝටුවකින් පණුවා ගෙන ලැල්ලක් උඩ තබා දරුවාට දුනි. මොහොතක් ඒ දෙස බලා සිටි දරුවා වඩාත් ශබ්ද නගා හඬන්නට විය.

Father - Now what is the problem? Why are you crying again?

Child - I want this worm to cut into 2 pieces

හැඬීම නතර කළේ නැත. පියා තම ස්ථාවරයද වෙනස් කළේ නැත. ඔහු කුඩා පිහියක් ගෙනවිත් දෙනෙත් වසාගෙන පණුවා දෙකට කැපුවේ දරුවාගේ හැඬීම එවිට නවතීවි යන අදහසිනි. සිදුවූයේ අනෙකකි. දරුවා බිම පෙරළෙමින් වඩ වඩාත් ශබ්ද නගා හඬන්නට විය.

Father - Now what do you ask me to do again ?

පියා තරමක උස් හඬින්, නැවත හැඬීමට හේතු අසන්නට විය.

Child - I want YOU…. to eat ONE half.

දරුවා එය නැවත නැවත කියමින් හඬන්නට විය. මව ද අසලකය. මෙම අවස්ථාවේදී ද සිය ප්‍රතිපත්තිය වෙනස් නොකළ පියා දෙනෙත් වසාගෙන, නාසයද ඇඟිලි දෙකකින් තද කරගෙන, ඉතා අපහසුවෙන් පණුවාගෙන් භාගයක් ගිල දැමීය. මෙම මොහොතේදී ද දරුවා නැවතත් මහ හඬින් හඬන්නට විය. පියා නැවත හඬ අවදි කරමින් හැඬීමට හේතු විමසීය.

Father - Why are you so stubborn?

Child - You ate the wrong half Daddy- That is the part that I wanted

දරුවා යටිගිරියෙන් කෑ ගසමින්, හඬමින් ප්‍රකාශ කරන්නට වූයේ පියා විසින් ගිල දැමුවේ තමාට අවශ්‍ය කොටස බවයි. මහත් සේ කම්පාවට පත් වූ පියා නිවස තුළට සේන්දු වී ආලින්දයේ තිබූ සුවදායක පුටුවෙහි හාන්සි වී කල්පනා කරන්නට විය.

සිද්ධිය දෙස විමර්ශනාත්මකව බලා සිටි මව අසල තිබූ පඳුරකින් කෝටුවක් කඩා ගෙන දරුවාට පහර දෙකක් දීමෙන් අනතුරුව හැඬීම නතර විය.

ස්වකීය මතයේම එල්බී දරුවන් හදන පියවරු මෙවන් අභාග්‍ය සම්පන්න අවස්ථාවලට මුහුණදීම වැළැක්විය නොහැකිය. බල දශකයේ සිටියේ වුවද දරුවන් සම්බන්ධව තීන්දු තීරණ ගැනීම මව් පිය දෙපාර්ශ්වය විසින් ම සාකච්ඡා මාර්ගයෙන් සිදුවිය යුත්තකි. දරුවා වෙනුවෙන් මවගේ දායකත්වය ද අවශ්‍යම බවට පියවරු දැනුවත් විය යුතුයි. අවම වශයෙන් දරුවා පිළිබඳ තීන්දු තිරණ ගැනීමේදී ඇයගේ අදහස් විමසීමට තරම් පියා නම්‍යශීලී විය යුතුයි. එසේ නොවන කල්හි පියවරුන්ට පණුවෙකු නොව වහ පවා කෑමට සිදුවන අවස්ථා නැත්තේ නොවේ. යමෙක් ධර්මයෙන් ඈත්වී, පුරුෂාධිපත්‍යයෙන් ඔද වැඩී, මානයෙන් මත්වී මෝහයෙන් මුළාවී යුග දිවියේ ගත යුතු ඒකාබද්ධ තීන්දු තීරණ හමුවේ ආත්මාර්ථකාමී ලෙස

නිගමනවලට පැමිණෙන්නේ නම් එය පීතෘත්වයේ අභිමානය ට නිගාවක් බව සිහි කටයුතුමය.

අන් අයගේ මතයට සවන් දීම සහ එයට ගරු කිරීම විමර්ශනාත්මක බව, ඉවසීම සහ ස්ථානෝචිත ප්‍රඥාව සහ සුභාෂිතය යුග දිවියේ සාර්ථකත්වයට මහත් සේ ඉවහල් වන අතර, එතුළින් මව් පියන්ගේ විශිෂ්ට පෞරුෂය එළි දක්වෙයි.

තාරුණ්‍යයේ දී පෞරුෂය මාහැඟි භූමිකාවක් නිර්මාණය කරයි. එය ස්ත්‍රී පුරුෂ කාගේත් ස්වීයත්වයට නොඑසේ නම් පුද්ගලත්වයට සාපේක්ෂ මනෝභාවයකි. මෙය පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධය. උගත්කම්, ධනවත්කම්, බලවත්කම් වලට සාපේක්ෂව වර්ධනය වන්නක් නොවේ. එතුළින් ස්වකීය පෞරුෂයේ උද්ගාමී ලක්ෂණ මෙන්ම අපගාමී ලක්ෂණ ද පෙන්නුම් කරයි. උද්ගාමී පෞරුෂය විශිෂ්ටයි. ගෞරවනීයයි. වීර්ය වඩන්නෙකුට ස්වකීය අපගාමී පෞරුෂය වුවද විශිෂ්ට පෞරුෂයක් කරා වර්ධනය කරගත හැකියි.

ඇලීම්, ගැලීම් සහ මුළාවෙන් යුතුව තමා ගන්නාවූ තීන්දු තීරණ ස්වකීය අපගාමී පෞරුෂය විදහා දක්වයි. නොඇලී. නොගැටී, නුමුළාව ගන්නා වූ තීරණ මනසට ප්‍රේරණය වීමෙන් උද්ගමන පෞරුෂය නිර්මාණය වෙයි. මනා පෞරුෂයකින් උපලක්ෂිත වීමට මෙම මනෝ භාවයන් උපරිම ලෙස පාලනය කරගත යුතුයි. නොඑසේ නම් මනෝ විකෘතීන් නිසා අපගාමී තාවය වඩාත් වර්ධනය වෙයි.

වසල, පරාභව, සිඟාලෝවාද ආදි සෑම සූත්‍රයකම බුදු පියාණන් වහන්සේ පෞරුෂ වර්ධනයට ඉතා පැහැදිලිව මග පෙන්වා වදාළහ. දරුවන් හට අනුකම්පාවෙන් දෙමාපියන් තම යුතුකම් සියල්ල ඉටුකිරීමේදී දරුවන්ගෙන්ද දෙමාපියන් හට ඉටුවිය යුතු යුතුකම් ඒ සූත්‍රයන් තුළින් විදහා දක්වෙයි. ඒ අනුව තම චර්යාදාමය සකස් කරගැනීමට අපොහොසත් වන්නා පරිහානිය කරා ගමන් කරයි.

ලෝභ, ද්වේෂ, මෝහ ආදී තෘෂ්ණා මූලික හැඟීම්, අපගාමී පෞරුෂයක් කෙරෙහි හේතු සාධක වනබව බුදු දහම පෙන්වා දෙයි. **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච,** විචිකිච්ඡා යන පඤ්ච නීවරණ පෞරුෂය කෙරෙහි මහත් බලපෑමක් ඇති කරයි. මෙවන් මනෝභාව දහසයකි. **(වත්ථූපම සුත්ත.)**

1. **අභිජ්ඣා විසම ලෝභො** - covetousness

(තමන් සතු හා අනුන් සතු දේ ගැන ඇති ලෝභය)

2. **ව්‍යාපාදො** - ill will (කේන්ති යාම, තරහ)

3. **කෝධො** - anger (ක්‍රෝධය - සිත කෙලෙසන්නෙකි)

4. **උපනාහො** - long standing hatred (බද්ධ වෛරය)

5. **මක්ඛො** - ill feeling (අනුන්ගේ ගුණ මකා දැමීම, ගුණ මකු බව)

6. **පලාසො** - disparaging (තමා උසස් අය හා සමකොට සැලකීම)

7. **ඉස්සා** - malicious (ඊර්ෂ්‍යාව)

8. **මච්ඡරිය** - egocentric (මසුරුකම)

9. **මායා** - hypocrisy (මායාව, අනුන් නැසීමට අනවිණ,කොඩිවිණ කිරීම)

10. **සාඨෙය්‍ය** - treachery (කපටිකම, වංචාව)

11. **තම්භ** - stubbornness (නම්‍යශීලී නොවී දැඩිව සිටීම)

12. **සාරම්භ** - impetuosity (එකට එක කිරීම - අහංකාරකම)

13. **මානො** - vicious pride (මාන්නය)

14. **අති මානො**- arrogance (අධික මාන්නය)

15. **මදො** - intoxicated by pride: by youth: by status (මදය)

16. **පමාදො** - negligencec (සිහි මුළාව)

නිවන ආවරණය කරන, සිත කෙලෙසන මෙම චිත්ත වේග ඇති කල්හි පෞරුෂය පිරිහේ. උගතෙකු හට විෂය දැනුම් සම්භාරයක් තිබුණේ වුවද, දුර්වල පෞරුෂයක් ඇත්තේ නම් සත්පුරුෂයින් ගේ පිළිග ැනීමක් නැත. යොවුන් වියේදීම මෙම අපගාමී පෞරුෂ ලක්ෂණ බැහැර කරගැනීමට වෙර දැරිය යුත්තේ එබැවිනි.

එසේ නොවන කල්හි දෛනික ජීවිතයේ ගැටලු හමුවේ, ගැටළුව හඳුනා නොගෙන, එය විශ්ලේෂණය නොකොට ක්ෂණික විසඳුම් සඳහා ප්‍රයෝග කාරී ලෙස, ආවේගශීලීව, ප්‍රචණ්ඩාත්මකව කටයුතු කරයි. එමගින් ගැටලුව වඩාත් උග්‍ර වන අතර, තම අපගාමී පෞරුෂය සමාජයට එළිදක්වෙයි. බුද්ධිමත් සත්පුරුෂයින් විසින් හෙළාදකිනු ලබයි. එබැවින් තුරුණු වියේදී

ආවේගයන් පාලනය කරගනිමින්, බුද්ධියට මුල් තැන් දී කටයුතු කිරීමෙන් ගෞරවණීය පෞරුෂයකට හිමිකම් කීමට උත්සාහ දැරිය යුතුයි.

මෙම අදියරේදී නූතන දෙමාපියන් සතු සුවිශේෂී යුතුකම වන්නේ රටේ, ජාතියේ අඛණ්ඩ පැවැත්ම වෙනුවෙන් වැඩි වැඩියෙන් දරුවන් සමාජයට බිහි කිරීමයි. මෙම යුතුකම විවිධ හේතූන් නිසා අද සමාජයෙන් ගිලිහී ඇත. සිංහල බෞද්ධ පවුල්වල දරුවන් ඉතා සීමිතය. පවුලක් නඩත්තු කිරීමේදී ඇතිවන සම්බාධක අපමණය. එයට ප්‍රධාන සාධකය බවට අද පත්ව ඇත්තේ මව් පියන් අතර පවතින ආධ්‍යාත්මික බැමි ලිහිල් වී යාමයි. නීතිමය බැම්ම පමණක් ශක්තිමත් හෙයින් තරමක් දුරට විවාහ සහතිකය බල සහිත වුවද, පවුලේ ගැටළු සාකච්ඡා මාර්ගයෙන් විසඳාගෙන ඉදිරියට යාමට ස්වාමි භාර්යා දෙපාර්ශ්වයම අපොහොසත්ය. ඇතැම් මව්වරු තව තවත් දරුවන් ලැබීම ප්‍රතික්ෂේප කරන්නේ ස්වාමියාගේ නොමනා ක්‍රියා කලාපය සහ අමානුෂික ප්‍රචණ්ඩත්වය නිසාමය. මත් වතුරට ඇබ්බැහි වූ ඇතැම් ස්වාමි පුරුෂයන් රැකියාවට ගොස් ගෙදර එන්නේ බීමත්වය. සිය බිරිඳ බලා සිටින්නේ පවුලේ අවශ්‍යතාවන් පිළිබඳව සුහදව සාකච්ඡා කිරීමටය. ඇය කුමක් කථා කළ ද ස්වාමියා නුරුස්සයි. ස්වකීය දරුවා දරා සිටින කුසට පවා පා පහර දීමටත්, මහ රෑ නිවසින් එළියට දමා දොර වැසීමටත් තරම් නින්දිත, අධම චරිත හමුවේ බිරිඳක් තව දුරටත් දරුවන් ලැබීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එහි වරද ඇයට පැවරිය හැකිද? මෙවන් ස්වාමි පුරුෂයන් බහුලව නැතත්, අද සමාජයේ නැත්තේ නොවේ. ස්වාමි පුරුෂයාගේ ආදරය, දයාව, කරුණාව, බිරිඳකට ලැබිය යුතුම මෙම අදියරේදී රංගනය මෙසේ වී නම් ඔහුට තවදුරටත් පීතෘ භූමිකාව විවෘත නොවනු ඇත.

බුදු දහම තුළ ඇත්තේ මිනිසාගේ පෞරුෂ වර්ධනයට මෙන්ම චර්යා වර්ධනයට පාදක වන කරුණු රාශියකි. ශීලය යනු සංවර බවයි. ශීලයකින් තොරව, ධර්මයෙන් පරිබාහිරව ගොඩ නගා ගැනීමට උත්සාහ කරන ජීවිත අනපේක්ෂිත ලෙස කඩා වැටෙයි. එය ලෝක ධර්මතාවයයි. එයට එරෙහි වන්නන්ට දඬුවම් ලැබෙන්නේ ස්වභාව ධර්මයෙන්මය. එය ප්‍රබලය. දරුණුය. සර්ව සාධාරණය.

සමාජ දෘෂ්ටි කෝණයට හසුවන මෙවන් අවස්ථා බොහෝය. ඒ සියල්ල මෙවැන්නකින් විස්තර කිරීමට වෙර දැරීම ලෙහෙනෙකු තම දරු පැටවුන් බේරා ගැනීම සඳහා මහ මුහුද ගොඩ කිරීමට දැරුවා වූ තැත හා සමාන වනු ඇත.

7

ප්‍රඥා දශකය (5) - The Wise decade (Pannna Dasaka)

'ප්‍රඥාව' මිනිස් සන්තානය තුළ ස්ථාපිත වන වටිනාම සම්පතයි. මෙය අද්විතීය බලයකි. කිසිම බාහිර උපක්‍රමයකින් මුදල් ගෙවා ලබාගත හැකි ශක්ති විශේෂයක් නොවේ. කාය බල ය, ධන බලය, පිරිස් බලය, නිල බලය ආදිය සාධාරණ ලෙස හෝ අසාධාරණ ලෙස මිනිසාට ළඟාකර ගතහැක. ඒ සෑම බලයක්ම කලින් කලට පිරිහී යයි. අසාධාරණ ලෙස උපයා ගත් බලයක් වේ නම් එය පිරිහී යාමට වැඩි කාලයක් ගත නොවෙයි. මිනිසා කුමන බලයක් තමා වෙත ආරෝපණය කර ගත්තේ වුවද, එහි පැවැත්ම සඳහා 'ප්‍රඥාව' තිබිය යුතුමය. "පඤ්ඤා දදාති විනයං"

කායික වශයෙන් ජව සම්පන්න වුවද, ධනයෙන් ආඪ්‍ය වුවද, නිල ඇඳුමෙන් තේජවන්ත වුවද, පිරිස් බලයෙන් විරාජමාන වුවද, ඒ කඩතුරාව තුළින් මානුෂික ගුණ ධර්ම විනිවිද දැකිය නොහැක්කේ නම් ගෞරවණීය පෞරුෂයක් ඔහු සතුව නැත.

සාවද්‍ය තොරතුරු නිරවද්‍ය ලෙස හුවා දක්වමින් තනතුරු ලබා ගැනීමෙන් පසු එම තනතුරෙහි ශ්‍රේෂ්ඨත්වය ඔහු ළඟා කරගනුයේ හදවතට නොව හිස මතටය. සුදුස්සන් තනතුරු ලැබූ පසු එම තනතුර ඔහුගෙන් බැබළෙයි. නුසුදුස්සා තනතුරු ලැබූ පසු ඔහුගේ හිස මානයෙන් ඉදිමෙයි. තනතුරෙහි ගෞරවය පවා විනාශ වී යයි. දියෙන් ගොඩට දැමූ මාළුවෙකු මෙන් සෑම විටම සිත සසල වෙයි. ඒ, තමා එම ස්ථානයට නුසුදුසු බව ඔහුගේ හෘදය සාක්ෂිය දන්නා හෙයිනි.

චරන්ති බාලා දුම්මෙධා - අමිත්තෙනෙව අත්තනා
කරොන්තා පාපකං කම්මං - යං හොති කටුකප්ඵලං

(ධ.ප. - බාල වග්ග - 66)

නුවණ මඳ මෝඩයෝ කටුක විපාක දුක් ගෙන දෙන පව්කම් කරමින් තමාටම හතුරු වූ ආත්මයක් සමග හැසිරෙත්.

Fools doing evil deeds which bestow bitter consequences behave in a manner hostile to themselves.

එවන් මිනිසා බාලයෙකි. තමාගේ අනුවණ කම් නොදකී. සිත, කය, වචනය තිදොරම අසංවරය, අපිරිසිදුය. ඒ ඔස්සේ ගන්නා තීන්දු තීරණ වල අණිටු විපාක තමා කරාම පැමිණීම වලකාලිය නොහැක. ඒ ධර්මයේ සත්‍යතාවයි. එය සාවද්‍ය බව ඔප්පු කළ හැකි කිසිවකුත් තුන් ලොවෙහිම නැත.

මෙම ප්‍රඥා දශකයට ළඟා වන ඇතැම් අය බොහෝ විට යම් යම් ආයතනයන්හි නායකත්වය සඳහා වෙර දරති, සම්මුඛ පරීක්ෂණ ආදියට යාමේදී තම අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීමය පළපුරුද්ද මෙන්ම සෞඛ්‍ය තත්ත්වයද සැලකිල්ලට ගනු ලබන හෙයින් ඒ සියල්ල සනාථ කිරීම සඳහා විවිධ ලියකියවිලි සූදානම් කරගනිති. අදාළ ආයතන නිලධාරීන්ගේද ඇතැම් අවස්ථාවලදී සමාදාන විනිශ්චය කරුවන්ගේ ද අත්සන් සහ නිල මුද්‍රාව ද සහිතව ලිපි සකසා, ලිපි ගොනුවක සියල්ල අසුරා ගෙන බටහිර ඇඳුමෙන් සැරසී අදාළ තනතුරට සුදුසුම පුද්ගලයා වීමට දරන්නාවූ තැත ද සුළුපටු නොවේ. එහෙත් තමා විසින් ගෙන යනු ලබන සහතික සහ අනිකුත් ලිපි ලේඛන ආදියේ සාවද්‍යතාව හෝ නිරවද්‍යතාව දන්නේ තමා පමණි. බොහෝ විට සත්‍ය තොරතුරු වසන් කොට ඇත. සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරදී ද දුරකථනය ඔස්සේ සම්මුඛ පරීක්ෂකවරුන්ට විවිධාකාර බලපෑම්ය. කෙසේ හෝ අවසානයේදී සුදුස්සන් පසෙක සිටියදී ධන බලය, කාය බලය, පිරිස් බලය හෝ දේශපාලන බලය හිස ඔසවයි. කෙලෙස තනතුරු ලැබුවද, අනුවණකමින් ආයතනයක් පාලනය කළ නොහැක. **ඡන්ද, ද්වේෂ, භය, මෝහ** ආදී සතර අගතීන්ට අනුගතවී ගනු ලබන කිසිදු තීරණයක් ප්‍රායෝගික නැත. සියලුම සැලසුම් අසාර්ථක වී යයි. ආයතනය දිනෙන් දිනම පිරිහෙයි.

ධර්මයේ පෙන්වා දෙන අන්දමට මිනිසාගේ ජීවන චක්‍රයේ බල දශකය ගෙවීමත් සමග මෙම පඤ්ඤා දසකයට එළඹෙයි. සාමාන්‍ය මිනිසාගේ ආයු කාලය හා සසඳන විට ජීවිතයෙන් හරි අඩක් පමණ ගෙවී ඇත. (විසුද්ධි මග්ග) අවුරුදු 50 ක් පමණ වන මෙම දශකයේ දී මිනිසා කායික හා මානසික වශයෙන් පරිණත බවට පත්ව ඇත. බල දශකය දක්වා ධර්මානුකූල පදනමක් ඔස්සේ මිනිස් චිත්ත සන්තානය හැඩ ගැසී ඇත්නම්, මෙම අදියරේදී ද සාර්ථක ලෙස දිවි ගෙවීමට බාධාවක් නොවනු ඇත. බල දශකයේ දී ඇතිකර ගත්තා වූ ගෞරවණීය පෞරුෂය මෙම අදියරෙහි සාර්ථකත්වයට මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දෙයි.

ජීවිතයක ස්වර්ණමය සහ බල සම්පන්න යුගයේ උච්චස්ථානයට මේ අදියරේදී මිනිසා පත්වෙයි. ප්‍රඥාව අඩු පුද්ගලයෙකු ගේ වුවද මෙම අදියරේදී යම් පමණක ප්‍රඥා වර්ධනයක් දැකිය හැකිය. ඒ භෞතික හා සමාජයීය වටාපිටාවෙන් එක්රැස් කරගත්තා වූ අත්දැකීම් මතය. ධර්මානුකූල පදනමක් මත එම අත්දැකීම් ලැබීමට ඔහු භාග්‍ය සම්පන්න වූයේ නම් මෙම දශකය ද සමෘද්ධිමත් වනු ඇත.

"පඤ්ඤාවන්තස්සායං ධම්මො - නායං ධම්මො දුප්පඤ්ඤස්ස"

මෙම උතුම් දහම් නුවණ ඇත්තන්ට ය - නුවණ නැත්තන්ට නොවේ.

මෙලොව ගත කරන ජීවිතයේ සෑම අදියරකදීම මෙන්ම පරලොවදී සුගති සැප සලසා ගැනීම් සඳහා ද, ධර්මයෙන් පරිබාහිරව මගක් දැකිය නොහැක්කේමය. එසේනම් මෙම පඤ්ඤා දශකයේදී ද අප ක්‍රියා කළ යුත්තේ බුද්ධි ගෝචරවය. මෙම අදියරට පා තැබූ පුද්ගලයා සන්සුන් ඉඳුරන් ඇත්තෙකු විය යුතුමය. තීන්දු තීරණ ගැනිමේදී තම බුද්ධියට නිගා නොවන ලෙස කටයුතු කිරීමෙන් සහ අගතිගාමී නොවීමෙන් සිය ගෞරවණීයත්වය රැක ගැනීමට ප්‍රඥා වන්ත විය යුතුමය.

චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන අභ්‍යන්තරික (අජ්ඣත්ත) ආයතන සඳහා **රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම** ආදී බාහිර (බහිද්ධ) අරමුණු ලබාගැනීමේදී මනා සංවරයක් තිබිය යුතුමය. වත්මන් ලෝකයේ තිබෙන තාක්ෂණික උපකරණ අනවබෝධයෙන් සීමාවන් නොදැන පරිහරණය කරන ඇතැමුන් මෙම අදියරේදී ද අනපේක්ෂිත ගැටළු වලට මුහුණ දෙන අවස්ථා බොහෝ ය. ඒ ස්වයං පාලනයක් ඇතිකර ගැනීමට අපොහොසත් වීමයි. ඇතැමුන්ට නූතන මෙවලමක් අතට ලැබුන විට " **වඳුරාට දැලිපිහිය හසුවුණා සේ**" ය. කළයුත්ත නොකළයුත්ත නොදැනීම නිසා අඳුරේ අත පත ගාන්නාසේ එය හසුරුවා ගනිමින් මහත් ව්‍යසනයන්ට පත්ව චරිත ඝාතනයන්ට පවා ගොදුරු වෙයි. "**මඳ දැනුම විනාශයට මූලය**" වැනි කියමන් වල සත්‍යතාවය ඔවුන්ට අවබෝධ වන්නේ සියල්ල සිදුවීමෙන් අනතුරුවය.

ඇතැමුන් තම වයසට, ගෞරවයට, බුද්ධියට නොගැළපෙන කටයුතුවල නියැලීමට දීන රුචිකත්වයක් දක්වන්නේ එතුළින් තමාද නවීකරණය වී ඇති බව සමාජයට හුවා දැක්වීමට සුදුසු ප්‍රවිෂ්ඨය එය ලෙස

දකීමෙනි. නීතියේ රැහැනට හසුව, විද්‍යුත් මාධ්‍ය හමුවේ මුහුණ සඟවා ගැනීමට වෙර දරන අන්ධබාලයින් අද සමාජයේ බහුලය. නොකළ යුත්ත නොකිරීමටත්, කළයුත්ත කිරීමටත් මිනිසා සතු ආත්ම ශක්තියක් නොවේ නම් ඔවුනට 'මිනිස්' යන වදන සුදුසු වන්නේ නැත. ජීවිත කාලයෙන් අඩක් ගෙවී ගිය ද ඔවුන්ගේ මනස උසස් ස්ථරයකට පත් නොවී තිබීම කෙතරම් ශෝචනීයද?

මිනිසා සහ තිරිසනා වෙනස් වන්නේ ධර්මයෙනි. තිරිසනාට තීරණ ගැනීම සඳහා දියුණු ප්‍රඥාවක් නැත. උසස් චින්තනයක් නැත. ධර්මානුකූල පදනමක් නැත. එහෙත් මිනිසාට මෙන්ම හැඟීම්, රුචි අරුචිකම් ඇත. මිනිසා තම බුද්ධියට සාපේක්ෂව වාරණ යොදාගනී. තිරිසනාට එසේ තීරණ ගැනීමට බුද්ධියක් නැත. කිසියම් කටයුත්තක් සඳහා සුදුසු තැන, සුදුසු පිළිවෙළ, සුදුසු වේලාව තිරිසන් සත්ත්වයා නොදනී. එබැවින් හැඟීම්වලට වහල් වී සිය ඕනෑ එපාකම් ඉටුකර ගැනීම සත්ත්ව ලෝකයේ ස්වභාවයයි.

මෙවන් චරිත වත්මන් සමාජයේ බහුලව දැකිය හැකිය. එදා සමාජයේ උසස් යැයි සම්මත නිලතල සමාජ ගෞරවයට පාත්‍ර විණි. ඔවුන්ගේ සදාචාරාත්මක පැවැත්ම මගින් එදා වෘත්තියේ ගෞරවය රැකුණි. පාසලක අධිපතීත්වය දරණ විදුහල්පති වරයෙකු කෙරෙහි එදා තිබූ ගෞරවය, විශ්වාසය මා හැගිය. අද මෙන් සුඛෝපභෝගී වාහන නොතිබුණ යුගයක විදුහල්පති පාසලට පැමිණියේ බක්කි කරත්තයෙනි. ගම්මුන් විදුහල්පති හැඳින්වූයේ 'ගුරුන්නාන්සේ' යන නමිනි. 'ගුරුන්නාන්සේ' ගේ බක්කි කරත්තය බොරලු පාර දිගේ එන ශබ්දය ඇසෙනවාත් සමගම ගම්මුන් හිස බැඳි ජටාව ගලවා දමා, කැහැපට ගසා සිටියේ නම් එයද මුදාහැර පාරේ පසෙකට වී හිස නමා ආචාර කරන අයුරු අපි දැක ඇත්තෙමු.

මෙම චාරිත්‍ර වාරිත්‍ර ගුණධර්ම වෙනස් වෙමින් පැමිණ අද වන විට මහත් අගාධයකට මෙන්ම දරුණු පරිහානියකට ළඟා වී ඇත. "Every thing is subjected to change " මෙය විද්‍යාඥයින් විසින් සොයා ගැනීමට ශත වර්ෂ ගණනාවකට පෙර අප ශාන්ති නායක බුදුපියාණන් වහන්සේ **උත්පාද, ඨිති, භංග** යන ධර්මතාවය මත ලොවට හෙළි කළ සේක.

එදා දිසාපාමොක් ඇදුරුතුමාද වැරදි කළ රාජ කුමරුන් හට පවා දඬුවම් දීමට පසුබට වූයේ නැත. වරද දුටු තැන වරදට ගැලපෙන දඬුවමක් නොදෙන්නේ නම් එය සමාජ ද්‍රෝහී ක්‍රියාවකි. යහපත් සමාජයකට යහපත්

පුරවැසියන් අවශ්‍යමය. එය අවබෝධ කරගත්, එදා සිටි විදුහල්පතිවරු බාල පරපුර යහ මඟට ගත්තේ, වරද පෙන්වා දී නිසි කළ, නිසි දඬුවම්, නිසි පරිදි ලබා දීමෙනි. එදා 'තල' සොරකමට රාජකුමරු දඬුවම් නොලැබුවේ නම් ඔහු කපටි සොරකු වනවා විනා රජකමට සුදුස්සෙකු නොවනු ඇත.

දඬුවම ප්‍රතික්ෂේප නොකළ එදා සිටි විදුහල්පතිවරු වරදට නිසි දඬුවම් දුනි. ඒ නොමේරූ මනසක් ඇති දරුවාගේ මනස මෝරා යාමට පෙර යහමගට නැඹුරු කරවීමේ පරම පවිත්‍ර චේතනාවෙනි. ළමයා කාගේද? පවුල් පසුබිම කෙසේද? ආදි ප්‍රශ්න ඔහුට අදාළ නොවිණි. ස්වකීය දරුවා වුවද වරද කළේ නම් දඬුවම් ලැබිය යුතුව තිබුණි. ඒ යුගයේදී සිදු වූ එක්තරා සත්‍ය සිද්ධියක් මෙසේය. ඒ විදුහල්පති තුමා විසින් තම දියණියට පාසැලේදී ලබාදුන් දඬුවමකි. එදා විදුහල්පති පියා ද, මව ද සමග ඇය පාසැලට පැමිණියේ එකම වාහනයෙනි. මවද එම පාසැලේම උප ගුරුවරියක වූවාය. එදා මහා පරිමාණයේ ආර්ථික ස්ථාවරයක් ගුරුවරයා සතු නොවුන ද, කුඩා ෆියට් වර්ගයේ මෝටර් රථයක් (CL 4914) විදුහල්පති තුමා සතුව තිබුණි. සැතපුම් 10 ක් පමණ දුර ගෙවා, දෛනිකව නිසි වේලාවට පාසැලට පැමිණි විදුහල්පති තුමා සිය රාජකාරිය අකුරටම ඉටු කරමින් වෘත්තියේ ගෞරවය රැකගත් අතර, උසස් නිලධාරීන්ගේ ගෞරව සම්මානයන්ට පාත්‍ර වූයේ නිතැතිණි.

පාසැලේ බාලාංශ පන්ති පෙ.ව. 11.00 ට අවසන් වුවද, ගුරු මහත්ම, මහත්මීන්ගේ දරුවන් හට සිදු වූයේ ඉහල පන්ති අවසන් වනතුරු පාසැල් භූමියේ රැඳී සිටීමට ය. ඒ කාල සීමාවේදී ඔවුන් පිට්ටනියේ සෙල්ලම් කිරීමට පෙළඹුනි. දිනක් බෝල ගසමින් සිටි ඔවුන් අතර බෝලයකට ආරවුලක් ඇති වුණි. කතා බහ දුර දිග යාමෙන් එක් දරුවෙකු, තවත් ගුරු මහත්මියකගේ දරුවකුට පහර දුනි. ඒ පහරින් ඔහු තුවාල ලැබුවේ වුවද බෝලය ලබා ගැනීමට අනිත් පාර්ශවය සමත් වුණි. ආරවුල විදුහල්පති තුමාට වාර්තාවීමට ගතවූයේ නිමේෂයකි. විදුහල්පතිතුමා මොහොතකින් වේවැල රැගෙන පැමිණියේ වරද කළවුනට දඬුවම් දීමේ අදහසිනි. ආරවුල විමර්ශනයට ලක් කළ විදුහල්පතිතුමා වරදකරු වූ සිය දියණියට වමත දිගු කිරීමට අණ කළහ. වේගවත් ලෙස ඇගේ අල්ලට පහර දෙකක් දීමෙන් අනතුරුව ඔහු කාර්යාලය දෙසට ගියේය. දකුණු අතින් වම් අල්ල තදින් අල්ලාගෙන වේදනාව යටපත් කර ගැනීමට උත්සාහ කළද, ඇගේ අල්ල පුපුරා ලේ ගලන්නට විය. පාසල නිමාවෙන්

පසු නිවෙස් බලා යද්දී අතර මග වෛද්‍ය මධ්‍යස්ථානයක නවතා ඇගේ අතට ප්‍රතිකාර පවා ලබාදී ඇත.

කෙසේ වුවද, ඒ දඬුවම ලැබීමෙන් අනතුරුව ඇය කිසිවකුට කුමන හේතුවක් නිසා හෝ පහරදීමක් නොකළ බවත්, එම කායික සංවරය ඇය තුළ ජනිත කරවූයේ සිය පියාණන් වහන්සේම බවත්, මේ වන විට ඇය ලොවට හෙළිකර හමාරය. එවන් ඍජු ප්‍රතිපත්ති ඇති පියෙකු ලැබීමට ඇය භාග්‍යවන්ත නොවූනේ නම්, ඇය අද සිටින ස්ථාවරය සිහිනයක් විනා යථාර්ථයක් නොවනු ඇත. බුදු පියාණන් වහන්සේ පවා වරදට දඬුවම ප්‍රතික්ෂේප කර නැත. චන්න ස්වාමින් වහන්සේගේ මානාධික හැසිරීම් පවා බ්‍රහ්ම දණ්ඩයෙන් පාලනය කළ ආකාරය ධර්මයේ සඳහන්ය.

වත්මන් සමාජය දඬුවම් ප්‍රතික්ෂේප කළද, දඬුවම් පැනවූ එදා පාසැල් පද්ධතිය තුළින් දෘශ්‍යමාන වූයේ මාහැඟි විනයකි. කදිම කළමනාකරණයකි. බිහිවූයේ රට, දැය, සමය වෙනුවෙන් වැඩ කළහැකි දරු පිරිසකි. විදුහල්පති සිය ධූරයේ ගෞරවය රැකගත් අතර, ගුරුවරයා තම සීමාව හඳුනාගෙන සිය කාර්ය භාරය ඉටු කළේය. තම සුදුසුකම් වලට අනුව ලැබුණා වූ පත්වීම් ලිපියෙහි ප්‍රකාර අදාල විෂය කුමක් වුවද, එය ඉගැන්වීමෙහි නිරත වූ අතර, එය සාර ධර්ම පරිපෝෂණයක් පාදක කර ගනිමින් සිසු හදවත් තුළ පතිත කරවීමේ ක්‍රමවේදය ද හඳුනාගෙන තිබුණි. එය ගුරුවරයාගේ ප්‍රඥාව විනිවිද දැකිය හැකි අවස්ථාවක් විය. විෂයානුබද්ධ ක්ෂේත්‍රය මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින්ද පෙනුණේ සමගාමී ප්‍රගතියකි. සිසුහු ද තම සීමාව දැන, ගුරු භක්තිය සහ ගුරු ගෞරවය ඇතිව ස්වකීය අධ්‍යාපන කටයුතු වල නිරත වූහ. ගුරුවරයාගේ ආශිර්වාදය ම ඔවුන්ගේ ජයග්‍රහණයට හේතු විය.

'**ආශිර්වාද**' යනු ඉතා බලසම්පන්න අදෘශ්‍යමානී බලවේග යකි. එය හදවතකින් හදවතකට සම්ප්‍රේෂණය වනු විනා, කඩයකින් කිලෝ ගණනින් මුදලට ගත හැක්කක් නොවේ. සමාජ රැල්ලට හසුවී ඇති වත්මන් දරුවන්, **හායි**, **බායි**, **ටටා** වැනි හර ශූන්‍ය, නුවණැත්තන් විසින් ප්‍රතික්ෂේප කරන, හිස් වදන් වලින් ගුරුවරුන් දෙමාපියන් අමතන්නේ නම් ඔවුන් කරා මව්, පිය ගුරුවරුන්ගේ ආශිර්වාද නිසි ලෙස ගලා ඒවිද?

වත්මන් පාසැල් පද්ධතිය හාත්පසින්ම වෙනස් වී ඇත. අද පරිපාලන ක්ෂේත්‍රය ද කඩා වැටී ඇත. ගුරුවරයා සිය භූමිකාව නොදනී. සිසුවා තම සීමාව නොදනී. සමාජ සාර ධර්ම පවා ගිලිහී ඇත. ඇතැම් ගුරුවරු

අදාළ විෂය ඉගැන්වීම තමාට අවමානයක් සේ සලකති. චිත්‍ර, මැහුම්, මැටි වැඩ (handicraft) වැනි විෂයයක් වුවද ළමා මනස තුළ නිර්මාණ ශක්තිය උද්දීපනය කරන විෂයයන්ය. ඒ සඳහා සුදුසුකම් සහ පුහුණුව ලැබූ ගුරුවරයෙක් වේ නම් එම විෂය ඉගැන්වීම සතුටින් කිරීම සිය යුතුකමයි. පුස්තකාල කටයුතු සඳහා පුහුණුවක් ලබා ඇත්නම් එහි උන්නතිය තකා කටයුතු කළ යුතුයි. ඇතැම් ගුරුවරුන් හට තම වෘත්තීමය ක්ෂේත්‍රය පිළිබඳ තෘප්තියක් (duty concisious) නැත. ලද දෙය ගැන සෑහීමකට පත් නොවී නොලද දේ සොයා යයි. සෑම විෂය ක්ෂේත්‍රයක්ම ඵලදායී බවත්, එතුළින් තව තවත් අලුත් දේවල් සොයා ගත හැකි බවත් දත යුතුය. ගුරුවරයා තමාට අදාළ විෂය පිළිබඳ දැනුම පුළුල් කරගැනීමට වෙහෙස වී, එම දැනුම් සම්භාරය දිනෙන් දින යාවත්කාලීන කර ගන්නේ නම් තම විෂය පථය ඔස්සේ ඔහු ප්‍රවීණයෙකු වෙයි. (Rolling stone gathers no moss)

මේ එක්තරා වත්මන් පාසලක සිදුවූ සිදුවීමකි. බටහිර සංස්කෘතිය කරපින්නාගත් එක්තරා ගුරුවරයෙක් විය. ඔහු ඉංග්‍රීසි භාෂාවෙහි දක්ෂයෙකු ලෙස සිසුන් ඉදිරියේ මෙන්ම ගුරුවරු ඉදිරියේද නිරන්තරයෙන්ම විරාජමාන වීමට දරන්නා වූ තැත විටෙක හාස්‍යජනකය. නිතරම අතැතිව ඇත්තේ විශාල ප්‍රමාණයේ ඉංග්‍රීසි පොත් කිහිපයකි. තමාට අදාළ විෂය කෙරෙහි තෘප්තිමත් වීමක් නැත. දිනක් විදුහල්පති තුමා මොහු ගුරු විවේකාගාරයේ සිටිනවා දැක, ගුරුවරයෙකු නොමැති පන්තියකට යාමට අණ කළේය. ඒ අනුව 7 වන ශ්‍රේණියේ පන්තියකට ගිය මොහු, ඒ කාල පරිච්ඡේදය කුමක්දැයි විමසීය. ඉංග්‍රීසි බව දැනගත් ඔහු සිසුන්ට කියා සිටියේ අදාළ ගුරුවරයා දී ඇති අභ්‍යාස සම්පූර්ණ කරන ලෙසත්, ගැටලුවක් තිබේනම් අසන ලෙසත්ය. එදින ඔවුනට 'අලියා' (The Elephant) ගැන රචනයක් ලියන ලෙස විෂය භාර ගුරු භවතා පවරා තිබුණි.

එක සිසුවෙකු නැගිට ගුරුවරයාගෙන් මෙසේ ඇසීය. සර්, කොහොමද සර් අලියාගේ කන් කුල්ල වැනිය කියා ලියන්නේ? වෙනත් ළමයෙකු නැගිට කුල්ලට ඉංග්‍රීසියෙන් කියන්නෙ මොකක්ද සර්? යනුවෙන් විමසීය. සියලුම දරුවන් පිළිතුර ලැබෙන තෙක් නො ඉවසිල්ලෙනි. ගුරුවරයාගේ හිසේ සිට පහතට දහඩිය ගලන්නට විය.

'කුල්ලට' ඉංග්‍රීසි වචනය නොදත් ගුරුවරයාගේ ප්‍රතිචාරය මෙසේ විය.

'කුල්ල' .... නේද? බලන්න අත් උස්සන්න කුල්ල දැකලා තියෙන අය. සියල්ලෝම අත් එසවූහ. එහෙත් දරුවන්ට පිළිතුරක් නොවීය.

අත් පහත හෙළීමට අණකළ ගුරුතුමා ඔර්ලෝසුව දෙස බලන්නට විය. කාල පරිච්ඡේදයෙන් භාගයක් පමණ ඉතිරිව ඇත. පන්තියේ සිසුන් 40 ක් පමණ විය. නැවත දහඩිය පිසදා ගත් ගුරුතුමා අනතුරුව ප්‍රශ්නය ඇසූ ළමයින් දෙදෙනා හැර අනිකුත් සෑම ළමයෙක්ම පිළිවෙලින් එකිනෙකා නැගිටුවමින් මෙසේ එකම ප්‍රශ්නය සෑම දෙනාගෙන්ම අසන්නට විය.

හා ...... ඔය ළමයා කියන්න බලන්න 'කුල්ලට' ඉංග්‍රීසියෙන් කියන්නෙ මොකක්ද කියලා.... සෑම දෙනාගේම පිළිතුර මෙසේ විය. " දන්නෙ නෑ.... සර්"

"හතේ පන්තියට එනතුරු ඕක ඉගෙනගන්න බැරිවුණා .... නේද ?" කියමින් වේවැල පසෙකින් තබන විටම කාල පරිච්ඡේදයද අවසන් වන සීනුව නාද විය. සැනසුම් සුසුමක් හෙළූ ගුරුතුමා කියා සිටියේ ගෙදර ගිය විට වචනය සොයාගෙන රචනය ලියාගෙන එන ලෙසයි. ඔහුගේ ප්‍රතිචාරය සිසු දරුවන් ගේ හාස්‍යයට හේතු විය. ලජ්ජාවට සහ අපහසුතාවයට පත් වූ ගුරුභවතා හැකි ඉක්මනින් පන්ති කාමරයෙන් ඉවතට ගියේ දරුවන් කෙරෙහි කෝපාවිෂ්ටවය. මේ වත්මන් ගුරු භූමිකාවේ එක් රංගනයක් පමණි.

මෙවැනි සිදුවීම්, උත්තරීතර ගුරු භූමිකාවට කැළලකි. මෙවන් මාන්නාධික චරිත ඇත්තෝ බොහෝවිට සමාජයෙන් ගැරහුම් ලබති. තමාට අයිති විෂය පථය පිළිබඳව තෘප්තිමත්ව කටයුතු කිරීම කෙතරම් මානසික සංහිඳියාවක්ද?

වරදකට දඬුවම් දීමේදී වුවද අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග යක් ඇත. වරද හරියාකරව සොයා බැලීමට විශ්ලේෂණය කර ගැනීමට ගුරුවරයා සමත් විය යුතුයි. දැඩි ලෙස තම මතයේම එළඹී තීරණ ගැනීම බොහෝ විට අසාර්ථක විය හැකියි. "Two heads are better than one" යන ප්‍රකාශනයන්හි සත්‍යතාව අවබෝධ වන්නේ පසුවය.

අංගුලිමාල 999 ක් මිනිස් ඝාතන සිදුකර තිබුණේ වුවද, බුදු පියාණෝන් වහන්සේ මහා කරුණාවෙන් ඔහු දෙස බලා වරද අවබෝධ කරවා යහ මඟට ගත්තේ විනා ඔහු රාජ්‍ය දණ්ඩනයකට යටත් කොට හිස

ගසා දම්මේ නැත. එසේ නම් පාසැල් ශිෂ්‍යයකු විසින් කරනු ලබන වරදක් දෙස ගුරුවරයා කෙසේ සානුකම්පිකව බැලිය යුතුද ? සිසු දරුවෙකුගේ මනස මෝරා නැත. අත්දැකීම් අවමය. එවන් දරුවන් අතින් වැරදි සිදුවීම ස්වභාවිකය.

යමෙකුගේ ප්‍රභාෂ්වර සිතක් කිලිටි වන්නේ උපක්ලේශ වලිනි. වරදට පෙළඹෙන්නේ කිලිටි වූ සිතෙනි. දඬුවමකින් බලාපොරොත්තු විය යුත්තේ මනස සකස් කිරීමයි. විශේෂයෙන්ම පාසල් සිසුවෙකුට දඬුවම් දීමේ දී, දඬුවම් දෙන්නා කිපෙන සුළු නොවිය යුතුයි. අගතිගාමී නොවිය යුතුයි. ඔහු සතුව ඇති **ධන බලය, නිල බලය, පිරිස් බලය, දේශපාලන බලය** හිස මතට ගෙන ආරූඪ කරගත් පෞරුෂයකින් විරාජමානව, කසයක් පමණ දිගැති වේවැලක් අතට ගත් පමණින් ඔහු පාසැල් සිසුවෙකුට දඬුවම් දීමට සුදුස්සෙකු නොවේ.

එක්තරා පාසැලක සිදු වූ තවත් සිදුවීමක් මෙසේය. එකම පවුලක සහෝදරයෝ දෙදෙනෙක් 9 සහ 10 ශ්‍රේණිවල ඉගෙනුම ලැබූහ. ඔවුන් කුඩා කලම පියා අහිමි විය. ඒ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ය. මැදිවියේ පසු වූ සිය මෑණියන් පුතුන් දෙදෙන රැක බලා ගනිමින් දිනපතා පාසැලටද රැගෙන ආවාය. ආපසු රැගෙන යාම ද ඇය විසින්ම සිදු කළා ය. එක් සිසුවෙකු යම් යම් වැරදි වලට හසුවී විදුහල්පති තුමාගෙන් විටින් විට දඬුවම් ලැබුවේය. විටින් විට මව ද කාර්යාලයට ගෙන්වීය. කිහිප විටක් පැමිණියද අවසානයේදී ඇය කාර්යාලයට පැමිණීම ප්‍රතික්ෂේප කරන්නට වූයේ ඇයගේ පැමිණීම ශිෂ්‍යයාගේ වරදට ඉවහල් නොවන්නක් වූ හෙයිනි. අවසානයේදී මෙම සිසු දරුවාට ප්‍රසිද්ධියේ දඬුවම් දීමට (Public Cane) තීරණය කළ විදුහල්පති තුමා විනය කමිටු තීරණය පවා නොසළකා සියළුම පන්ති සහ ගුරු මණ්ඩලය රැස් කළේය. ශිෂ්‍යයාගේ මවට ද එදින පැමිණීම අනිවාර්ය විය. දඬුවමට පාත්‍ර වන දරුවා වේදිකාව මතය. මව ශාලාවේ ඉදිරිපස සුසුම්ලයි.

විදුහල්පති තුමා ද්වේශයෙන් කුපිතව වේවැලද අතැතිව මහා පරාක්‍රමයක් යැයි සිතා ආරූඪ කරගත් පෞරුෂයකින් යුතුව වේදිකාවට නැඟී වරදට දඬුවම තමයි මේ.... කියමින් සිසුවාට පළපුරුදු කස කරුවකු මෙන් පහර දෙන්නට විය. ඇඟ සිටි නිල ඇඳුමද ඉරී ගොස් දෙපා දිගේ මුත්‍රා ගලනු දුටු මෑණියන් ක්ලාන්ත වී බිම ඇද වැටෙන්නට යාමේදී ගුරු මහත්මීන් කිහිප දෙනෙකු ඇය ප්‍රථමාධාර සඳහා යොමු කළ ආකාරය කෙතරම් සංවේදීද ?

ප්‍රථමාධාර මගින් ඇය ශාරීරික වශයෙන් යථා තත්ත්වයට පත් වුවද, ඇගේ මානසික පීඩාවට වන්දි ගෙවන්නෝ කවරහුද?

එදා එම දඬුවම ලබා දුන්නේ සිසුවාට නොවන බව ප්‍රඥාවන්තයින්ට අවබෝධ වීමට සාක්ෂි අවශ්‍ය නොවීය. මෙවන් විදුහල්පතිවරු එදා සමාජයේ දක්නට නොවීය. තම සීමාව නොදන, මෝහයෙන් මුළාවී, ද්වේෂයෙන් වියරු වැටී, රාගයෙන් දැවී ඇති මෙවැනි දුෂ්ප්‍රාඥයින්ට සුදුසු වන්නේ අළුගෝසු තනතුරක් විනා විදුහල්පති තනතුරක් නොවන බව ප්‍රඥාවන්තයින්ට අවබෝධ කරගැනීම අසීරු නොවනු ඇත. සිත, කය, වචනය පාලනය කරගත නොහැක්කා තමාද පිරිහී සමාජයද පරිහානිය කරා ඇද දමයි.

ආත්ම අභිමානය, ආත්ම ගරුත්වය, ආත්ම ශක්තිය, පෞරුෂය ආදී සියලු සංකල්ප පුද්ගල යහ පැවැත්මට බෙහෙවින්ම ඉවහල් වෙයි. එබැවින් තමා පාලනය කර ගැනීම උසස් කොට සැලකිය යුතුයි. තමා පාලනය කර ගත නොහැක්කා කෙසේ නම් අන් අය හෝ අන් ආයතන පාලනය කරන්නද? පණ්ඩිතයා තම **සිත, කය, වචනය** පාලනය කරගැනීමට නිරතුරු වෙහෙසෙයි.

අත්තනාමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො

(ධ.ප. අත්ත වග්ග)

තමාම පළමු කොට සුදුසු ගුණයෙහි පිහිටා ඊ ළඟට අනුන්ට ඒ ගැන අනුශාසනා කළ යුතුයි. එසේ කරන පණ්ඩිතයා නොකෙලෙසෙයි.

Let One establish oneself on the correct path first and then only should he admonish others. Let not the wise man polute himself.

තමා පහනක් කොට සිතා තමාගේ ආලෝකය තමාම සලසාගත යුතු බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දී ඇත. ඒ සඳහා නිරතුරුවම සිත, කය, වචනය පිරිසිදුව තබා ගත යුතුමය. ඇතැම්හු එදා සමාජයේ තිබූ සිරිත්, විරිත්, ගුණ ධර්ම හෙළා දකිති. ඒවා යල් පැනපු, ගතානුගතික,

නිස්සාර දේ බවට හුවා දක්වති. එහෙත් බුදු දහම අකාලික බවත්, ධර්මය සර්වකාලීනව විශ්වය තුළ පවත්නා බවත් අවබෝධ කටයුතුය.

ප්‍රඥා දශකයේ පසුවන ඇතැම් අය දුෂ්ප්‍රාඥයින් සේ, ලද මිනිස් භවයේ අවසාන කාලය නිරපරාදේ විනාශ කර දමති. ඇතැම්හු තම වටිනා කාලය කුණුරසය සමාජගත කරන මාධ්‍යයක් ඔස්සේ මෙහෙයවති. ඇතැම්හු රාජ්‍ය පාලන තන්ත්‍රය පිළිබඳ අල්ප මාත්‍රයක හෝ දැනුමක් නොමැති වුවද, පාලන තන්ත්‍රය විවේචනය කරමින් කාලය අපතේ යවති. මේ සියල්ල බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කළයුතු බවට පෙන්වා දුන් '**දෙතිස් කථා**' විනා කළයුතු '**දස කථා**' නොවේ. බුදු මග පා නැගීමට, පෙර පින් නොමැති වීම මහත් අභාග්‍යයකි.

විශිෂ්ඨ පෞරුෂයක් සහිත මිනිසෙකු ලෙස **සිත, කය, වචනය** ආදී තුන් දොර සංවරව, පිරිසිදුව තබාගෙන ප්‍රඥාවන්ත මිනිසෙකු ලෙස කටයුතු කරන්නේ නම් අවසාන සයන දශකයේදී ඇතිවන්නේ කෙතරම් මානසික සංහිඳියාවක්ද ?

8

හානි දශකය (6) - The Declining decade

මිනිස් දිවියේ 'පස්දසා' දශකයෙන් පසු උදාවන මෙම කාල සීමාව තුළ වඩාත් සුපරික්ෂාකාරී වීම ඉතා වැදගත්ය. කායික මෙන්ම මානසික වශයෙන්ද මිනිස් ජීවිතයේ අපගමනය ආරම්භ වන යුගයයි. ස්වකීය දක්ෂතාවයන් සහ හැකියාවන් (skills & capabilities) මන්දගාමී වීමට සැරසෙයි. ඉදිරියේ ජීවත් වීමට ඇති කාල සීමාව **කෙටිය, වේගවත්ය, අවිනිශ්චිතය, භයානකය.** එහෙයින් මේ දක්වා ආ ගමන් මගෙහි පසු කළා වූ බාල, තරුණ අදියරයන්හි දී අතපසු වී ගිය, "ධර්මය" දක ගැනීමේ උත්තරීතර මොහොත උදාකර ගැනීමේ භාරධූර වගකීම අප අභිමුවට පත්ව ඇත. මේ දක්වා ධර්මය දැකීමට නොහැකි වූයේ නම්, අප්‍රමාදීව ඒ සඳහා යොමු විය යුතු යුගයට පිවිස ඇති බව අවබෝධ කටයුතුමය. වර්ණ, දුර්වර්ණ වීගෙන යන, සියළු හැකියාවන් ක්‍ෂය වීගෙන යන, අවසානයේදී එක්තැන් වී සයනය මතට සීමාවන, මෙම ධර්මතාවයට අනුව මිනිසා හැඩ ගැසෙනු විනා මිනිසාට අවශ්‍ය පරිදි මෙම **'සත්‍යය'** වෙනස් කළ නොහැක. මෙම දශකය ද අනිකුත් සියලුම ධර්මතාවයන් මෙන්ම ඇති වී පැවතී නැති වී යයි. **(උත්පාද, ඨිති, භංග)** ඒ බුදු වදනයි. අප්‍රමාදී විය යුතුමය. ජීවත් වීමට ඇත්තේ සීමිත කාලයකි. ගෙවී යන සෑම තත්පරයක්ම අගනේය. එය අර්ථවත් දෙයක් සඳහාම යොමු කර ගැනීම ඉතා ශ්‍රේෂ්ඨය.

ජීවිතයේ ළමා කාලය බහුල වශයෙන් සෙල්ලමට හා ඉගෙනීමට ගත වී ඇත. දෙමාපියන් විසින් දැඩි කැපවීමකින් යුතුව, ධර්මානුකූල පසුබිමක නිසි ධර්මාවබෝධය ලබා නොදුන්නේ නම් එම අදියරේදී " **ධර්මය**" දැකීම උගහටය. ඇතැම් දෙමාපියෝ දරුවා බහ තෝරන අවධියේ සිට පූජනීය ස්ථානවලට ගෙන ගිය ද, එහි හැසිරිය යුතු ආකාරය පහදා නොදෙති. දරුවාට මග පෙන්වීමක් නැත. ඇතැම් දෙමාපියන් දරුවා කෙසේ හැසිරුණේ වුවද අඳ, ගොළු, බිහිරන් සේය. විටෙක අල්ලාප සල්ලාපයේ ය. නොඑසේ නම් නූතන මෙවලමක් ඔස්සේ මනෝ ලොවක සැරිසරයි. දරුවා ධර්මශාලාව (Preaching hall) තුළ ශබ්ද නැගෙන පාවහන්ද පැළඳ ඔබ මොබ දුවයි. සදහම් ලැදිව සත්සුන් ව දහමට සවන් යොමු කරන ශ්‍රාවක සුපින්වතුනගේ අවධානය පවා සුණු විසුණු වී ගියද, දරුවාගේ දෙමාපියන්

නිහඬය. ප්‍රඥාවන්තයෙකු සිය කටහඬ අවදි කර මේ දරුවා කාගේ දැයි විමසූ කල්හි, කුපිතව දරුවා කරපින්නා ගෙන, මන්ත්‍රයක් ජප කරන්නාක් මෙන් යමක් මුමුණමින් ශාලාවෙන් පිටතට යන රූකඩ දෙමාපියන් ද අද සමාජයේ නැත්තේ නොවේ. මෙවන් මවු පියන් ලද දරුවන් කවදා, කෙලෙසින් "ධර්මය" දකින්නද? කුඩා කළ ධර්මය දැකීමට හැකි වාතාවරණයක් ඇති පවුලක ඉපදීමටද, පෙර පින් තිබිය යුතුමය. විශාඛාව සත් අවුරුදු වයසේදීම ධර්මය දැක සෝවාන් ඵලයට පවා පැමිණ සිටි කාන්තාවක් බවට බුදු දහම සාක්ෂි දරයි.

තරුණ වියට පැමිණි කල්හි හෝ '**ධර්මය**' දැක ගත්තේ නම් එය විශාල භාග්‍යයකි. ධර්මය '**දැන ගැනීම**' සහ ධර්මය '**දැක ගැනීම**' යනු කරුණු දෙකකි. මෙම දැක ගැනීම යනු ප්‍රඥාව අවදි වීමක් ලෙස දැනෙනු ඇත. මෙය උසස් මනෝ භාවයකි. එහෙත් **තරුණ විය**, වගකීම් සම්භාරයක් හිස මත දරා ගෙන ජීවිතය ගොඩ නඟා ගැනීමට දැඩි පරිශ්‍රමයක යෙදෙන අවධියයි. උසස් විභාග. රැකියා, විවාහය, දරුවන් ආදී සියළු කටයුතු සඳහා පූර්ණ කාලය කැප කිරීමට සිදුවන හෙයින් ධර්මය '**දැකීමට**' අවස්ථාවක් වෙන් කර ගැනීම ඉතා අසීරුය. තරුණ වියේදී පෙර පින් බලයක් ඉස්මතු වූයේ නම් විනා එය යථාර්ථයක් බවට පත්කර ගැනීම උගහටය.

මහළු කාලයේ පළමු අදියර මෙම **"හානි දශකය"** යි. **ප්‍රවංක, පබ්භාර, මෝහ මූල, සයන** ආදී දශකයන් ද නෙත් අබියසය. අප්‍රමාදීව "ධර්මය" දැක ගැනීමට වෙහෙස විය යුතුමය. **"තමා පහනක් කොට සිතා තමා ගේ ආලෝකය තමාම සලසා ගන්න"** ඒ බුදු වදනයි, මෙම බුදු වදන්, ආත්ම ශක්තියෙන් නැගිට, ආත්ම අභිමානයෙන් හා මනා පෞරුෂයකින් යුක්තව ජීවිතය හැඩ ගස්වා ගැනීමට මහෝපකාරී වෙයි.

අත්තානං චේ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤ තරං යාමං - පටිජග්ගෙය්‍ය පණ්ඩිතො

(ධ.ප. අත්ත වග්ග)

තමා තමාට ප්‍රිය නම්, තමා හෙවත් තම ආත්මය රැක ගත යුතුයි. පණ්ඩිතයා ළමා, තරුණ, මහළු යන තුන් අවස්ථාවන් ගෙන් එක් අවස්ථාවකදී හෝ කුසලින් තමා පෝෂණය කරන්නේය.

If one holds thyself dear, let him watch himself carefully. The wise man is kept vigilant { alert /heedful }himself at least in one stage of human life. i.e childhood,youth or dotage.

ශ්‍රැතවත් ආර්ය පෘථග්ජනයා මෙම අදියරේ දී අඛණ්ඩව ධර්මය ශ්‍රවණය කරයි. කෙලෙසින් හෝ ධර්මයට නැඹුරු වී ධර්මය ජීවිතයට ගලපා ගනිමින් අප්‍රමාදීව 'ධර්මය' දකී.

පණ්ඩිතයා එසේ වුවද, අනුවණයා ට ඒ භාග්‍යය නොලැබෙයි. මානයෙන් උද්දාමයට පත්වන ඔහු 'ධර්මයෙන්' ඉවතට පනී. ධර්මයට ද්වේශ කරයි. අසත්පුරුෂ ධර්මයට හෙවත් මිථ්‍යා දෘෂ්ඨියට ප්‍රිය කරයි. 'ධර්මය' ප්‍රතික්ෂේප කරයි. මුසාවෙන් අන් අය රවටයි. ලද වස්තුව තනිවම භුක්ති විඳියි, ස්ත්‍රීන් කෙරෙහි ලොල් වෙයි. මත් වතුරට ඇබ්බැහි වෙයි. **අවසානයේදී තමා ගේ උගත්කම විසින්ම තමාවම පහත හෙලයි.** ඒ බුද්ධ වචනයයි.

යාව දේව අනත්ථාය - ඤත්තං බාලස්ස ජායති
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධ මස්ස විපාතයං

(ධ.ප. බාල වග්ග)

අනුවණයා හෙවත් බාලයා, උගත්කමින් හා ඉසුරුමත්කමින් කොපමණ ආඪ්‍යව සිටියද, ඒ සියල්ල ඔහුගේම අනර්ථය පිණිස හේතුවෙයි. ඒ උගත්කම, යහපත් නුවණ නසා, යහපත් ගති ද නසයි.

Any knowledge, gained by the fool will be to his ruin. It will cleave his head of intelligence and destroy all virtues (in him)

අද සමාජයේ ආචාර්ය, මහාචාර්ය පදවි ලබා ඇති ඇතැම් අය තුළින් දකිය හැකි මෙම '**සත්‍යය**' එදා බුදු නෙතට ගෝචර වූ අයුරු.... **කෙතරම් විශ්මය ජනකද?**

දුර්ගුණ ඇති බාල පුද්ගලයා ගේ ස්වරූපය මෙයයි. මේවා දැනගෙන ඔවුන් සමග වැඩි ඇසුරකට නොයා සිටීමට වග බලාගත යුතුයි. "**හානි දශකය**" පසු කරන්නා තමාගේ ජීවිතයේ සාර්ථකත්වය මෙන්ම ආරක්ෂාවද සළසාගත යුතුය. "**පිහිය**" රත්තරන් වුවද. කැපුන හොත් තුවාල වන බව

දන තමාගේ ආරක්ෂාව වෙනුවෙන් ඇත්කොට තබා ගත යුතුයි. මෙවැනි පුද්ගලයෙකු ළඟා කරගතහොත් විනාශය වළකාලිය නොහැක්කේම ය. "හානි දශකයට" ළඟා වන විට පරිනත බුද්ධියක් ඇත. තම බුද්ධියට අවමන් නොවන සේ කටයුතු කිරීමට වග බලා ගතයුතුය.

අද ලෝකයේ සිටින සත්ත්වයන් අතුරෙන් තේරුම් ගැනීමට අපහසුම සත්ත්වයා මිනිසා ය. තමාට පිහිට වීමේ අරමුණෙන් ළඟා වන තෘෂ්ණාධික, කපටි, අසත්පුරුෂ, පාපතරයින්, කෝටි ගණනින් මුදල් ඉපයීමට හැකි කුට ක්‍රම සරල ලෙසින් හුවා දක්වන්නේ, විශ්‍රාම දිවියේ හෙවත් හානි දශකයේ ඇති කාන්සිය හා හුදෙකලා බව මග හරවා ගැනීමට සුදුසු ම ක්‍රමය එය පමණක් බව හුවා දක්වමිනි. බුදු දහමේ ද ඇතැම් ධර්ම පර්යායන් ගෙනහැර පානා මොවුන් උසස් ධර්මාවබෝධයක් ඇත්තන් සේ රඟපාමින්, ක්‍රමයෙන් ධර්මය" විකෘති කරන අයුරුද, ප්‍රඥාවන්තයා සූක්ෂම ලෙස දකී.

එහෙත් දුෂ්ප්‍රාඥයා මෙයට හසු වෙයි. වසරක් යාමටත් පෙර සතර මහා නිධානය පහළ වූවාසේය. අහස උසට මහල් නිවාස තනයි. අක්කර ගණනින් මහ පොළව බදාගනී. අධි සුඛෝපභෝගී වාහන තුළ විරාජමාන වෙයි. එහෙත් සුක්කානම යොමු වන්නේ යායුතු තැනට නොවේ. ගමනාන්තය නොදකී. දකුණට සංඥාවක් දුන්නේ වුවද, ධාවනය වමටය. මේ, නැත්තාට ඇති වූවිට හැදෙන රෝගයේ ලක්ෂණයන්ය. එය මාරාන්තිකය. කල්ප ගණනක් ගියත් මරු වසඟයෙන් ගැලවිය නොහැක. මෙම සමාජද්‍රෝහී ක්‍රියාවන්ට හසුවන, ප්‍රමාද වන, තෘෂ්ණාධික මනුෂ්‍යයාගේ ජීවිතයේ ඉරණම බුදු පියාණන් වහන්සේ අනු දන වදාළේ මෙසේය.

මනුජස්ස පමත්ත චාරිනො - තණ්හා වඩ්ඪති මාලුවා විය
සො පලවති හුරාහුරං - ඵල මිච්ඡං'ව වනස්මිං වානරෝ

(ධ.ප. තණ්හා වග්ග)

The craving of a heedless person grows like a creeper. He jumps from existence to existence like a fruit-loving monkey in the forest.

ප්‍රමාද වූ මිනිසාගේ ආශාව (ගස් විනාශ කරන) මාලුවා වැලක් මෙන් වැඩෙයි. වඳුරා වනයෙහි ඵල රසයට ගිජුව පැන පැන ඇවිදින්නාක් මෙන් හෙතෙම භවයෙන් භවයට යයි.

බුදුන් වහන්සේ දේශනාකොට වදාළ අන්දමට ප්‍රමාද වන මිනිසා තෘෂ්ණාවට ගොදුරු වන්නේ ගසක මාලුවා වැල එතී ගත්තාක් මෙනි. මෙසේ තෘෂ්ණාවේ වසඟයට යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු භවයෙන් භවය උපත ලබමින් සසර ගමන දික් කර ගනී. වඳුරෙකු ගෙඩි කෑමට ඇති රුචිකත්වය නිසා ගසෙන් ගසට පනින්නාක් මෙනි.

ප්‍රමාදය හා තෘෂ්ණාව කෙතරම් භයානකද යන්න මාලුවා වැලේ උපමාවෙන් පැහැදිලිය. එම වැළෙහිම හට ගන්නා ගොටු වර්ගයකට වසින විට ජලය පිරෙයි. බර දරාගත නොහැකි වූ කල්හි, ඒ වැල ගහත් සමගම කඩා වැටෙයි. මෙතරම් වටිනා මිනිස් ජීවිතයක් ලබා, යා යුතු මග ද බුදු පියාණන් වහන්සේ පෙන්වා දී තිබියදී, මං මුළා වූවන් සේ සසරට ම වැටෙන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක්ද?

හානි දශකයට පිවිසෙන ඇතැම් සත්පුරුෂ ප්‍රඥාවන්තයෝ මානසික සතුට මුදලට ගත නොහැකි බව දනීති. කපටි බස් වහර හමුවේ මුළා නොවෙති. සමාජ ද්‍රෝහී, වංචනික ක්‍රියාවකට සම්බන්ධ වූ පුද්ගලයා සෑම විටම පසුවන්නේ බියෙන් හා ත්‍රාසයෙනි. මානසික සංහිඳියාවක් තිබේද?

ප්‍රඥාවන්තයා තමාට ධර්මාවබෝධය පිණිස ලැබී ඇති මෙම අවසාන අදියර ඉතා සූක්ෂම ලෙස කළමනාකරණය කර ගනී. ඔහු මෙම අදියරේ දී හෝ ජීවිතයේ නිසි ඵල ලබයි. ළමා කාලයේදී හෝ තරුණ වියේදී හෝ දැක ගැනීමට නොහැකි වූ "**ධර්මය**" **දැක** ගැනීමට සුදුසුම අදියරට ප්‍රවිෂ්ට වීමට ලැබීම පිළිබඳව ඔවුහු වඩාත් සතුටට පත්වෙති. ජීවිත කාලය පුරාම නිසි කටයුතු නිසි වේලාවට, නිසි පරිදි අවසන් කර ඇති මෙවන් ප්‍රඥාවන්තයෝ ලද මොහොතෙන් නිසි ඵල ලබමින් සසරින් එතෙර වනු නියතය. එහෙත් දුෂ්ප්‍රාඥයෝ ලද දෙයින් තෘප්තිමත් නොවෙති. නොලද දෙයම සොයා යති. ඇතිවීමක් නැත.

As a rule man is a fool
When it's hot he wants it cool
When it's cool he wants it hot
Always waiting for what is not.

මෙම ප්‍රකාශයන්හි සත්‍යතාවය සමාජය දෙස නෙත් හැර බලන්නෙකුට මනාසේ අවබෝධ කරගත හැක.

රාජ්‍ය සේවයේ කිසියම් වෘත්තියක යෙදී අවංක සේවයක් ඉටු කළේ නම් විශ්‍රාම දිවිය ද සාර්ථක ලෙස ගත කිරීමට ඔහු අපොහොසත් නොවෙයි. සිය පරිනත වූ දැනුම් සම්භාරයත්, කුසලතා පූර්ණ ප්‍රඥාවත් මත කිසිසේත් හිස් දිවියක් ගත නොකරන ඔහු සමාජයට වඩාත් ඵලදායී කාර්යභාරයක් ඉටු කිරීමට මෙම අදියර මනා ලෙස කළමනාකරණය කරයි. "හානි දශකය" ට පිවිසිය ද, ඔවුන් මානසික වශයෙන් විශිෂ්ඨ පෞරුෂයකට හිමිකම් කියයි. සමාජයට වඩාත් යහපත් වූ සේවයක් ඉටු කිරීමට සැලසුම් කරයි.

විශේෂයෙන්ම ගුරු වෘත්තියට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. පාසැල් විෂය මාලාවට එදා මෙන් කොටු වී නැති, දක්ෂ ගුරුවරයා මෙම අදියරේදී අවශ්‍ය ශාස්ත්‍රීය දැනුම ධර්මානුකූල පදනමක් ඔස්සේ සිසු දරුවන්ගේ හදවත් තුළ රෝපණය කිරීමට සමත් වෙයි. ගුරු වෘත්තියේ ප්‍රධාන අරමුණ විය යුත්තේ ගුරු මුෂ්ටියකින් තොරව, සාර ධර්ම සම්පිණ්ඩිත පදනමක් ඔස්සේ ශිෂ්‍යයාට ශිල්පය ලබාදීමයි. එය කාර්යක්ෂම ලෙසත්, ඵලදායී ලෙසත්, අවංකව ඉටු කරමින් අපරිමිත ආත්ම තෘප්තියක් ලැබිය හැකිය. තම විෂය ක්ෂෙත්‍රයට අදාල දැනුම යාවත්කාලීන කරගැනීමේ සුවිශේෂී යාන්ත්‍රණයක්ද මොවුන් සතුව ඇත. මෙවන් ගුරු භූමිකාවක විශේෂත්වය සිසු දරුවන්ගේ **සුවිශේෂී ආකර්ෂණයයි.**

සිදු කරනු ලබන කාර්යයක් තමාටත්, අනුන්ටත් ඵලදායී නම් එය සිදු කළයුතු බව බුදු දහම පෙන්වා දෙයි. යමක් කොට සිත සතුටට පත්වේද, සිනාමුසු මුහුණුන් යුතුව එහි ඵලය භුක්ති විඳීද, සැපතට හේතුවන එවන් යහපත් ක්‍රියාවන් නිරතුරුවම කළයුතු බවද, නුවණැත්තා උත්සාහයෙන්ද, අප්‍රමාදයෙන්ද, සංයමයෙන්ද, ඉන්ද්‍රිය දමනයෙන්ද, කෙලෙස් වතුරට යට නොවන දිවයිනක් තනා ගන්නා බව ද ධර්මයේ සඳහන්ය..

උට්ඨානෙනප්පමාදෙන - සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මෙධාවී - යං ඔඝො නාභි කීරති

(ධ.ප. අප්පමාද වග්ග)

The wise man by endeavour, alertness,self control makes for himself an island which no flood of defilement overwhelms.

එහෙත් සිත ගැන නොදත් අය සිතට එන සිතුවිලි පසුපස හඹා ගොස් මංමුළා වෙති. මුලින් හඳුනාගත් නිවැරදි මග වැරදි ලෙස පෙනේ. එය අත් හැරීමට සිතෙයි. ජීවිත ඉලක්කය දැක දැකත්, දැන දැනත් ගමන දුර යැයි සිතා කෙටි පිළියම් සොයා ගොස් ජීවිතය අසාර්ථක කර ගන්නා අය බොහෝය. එබැවින් කළ යුත්තේ ඉක්මනින් ඵල ලැබීමට ක්‍රමය අවුල්කර ගැනීම නොව කඩිසරව, ක්‍රමවත්ව තම ජීවිත ඉලක්කය සපුරා ගැනීම පිණිස වෙර දැරීමයි.

කුමන වෘත්තියක නිරතව සිටියද, එයින් විශ්‍රාම ලද විගස අකර්මණ්‍ය විය යුතු නැත. හානි දශකයට පා තැබුවේ වුවද, අප්‍රමාදීව ප්‍රඥා වන්තයා තම ඉලක්ක සපුරා ගනී. උදාවී ඇත්තේ ජීවිතයේ වටිනාතම හැරවුම් ලක්ෂයක් බව නුවණින් දැක **සිත, කය, වචනය** යන තුන් දොර රැක ගැනීමට අති මහත් වෑයමක යෙදෙයි. **ලෝභ, ද්වේශ, මෝහ** අකුසල් මුල් තුන මුලිනුපුටා දැමීමට දරන්නා වූ තැත සුළු පටු නොවේ. ඒ සඳහා සිත යහපත් කාර්යයක යෙදවීම ඉතා වැදගත්ය. කල්‍යාණ මිත්‍ර සත්පුරුෂ ඇසුර මේ සඳහා ඉමහත් දායකත්වයක් සපයයි. ධර්ම ශ්‍රවණයටම අනුගත වීමට සිත් පහළ වෙයි.

එහෙත් අන්ධබාල අශ්‍රැතවත් පෘතග්ජනයින් හට මෙම අදියරෙහි වටිනාකම නොපෙනෙයි. සුපුරුදු කාර්යයන් සඳහා ගොඩ නගා ගෙන තිබූ වපසරියට සමුදීමට සිදුවීම නිසා බලවත් සිත් තැවුලට පත්ව ඇතැම්හු සුසුම්ලති. සියල්ල වෙනස් වන බවට වත් ඔවුන් දැනුවත් වී නොතිබීම කෙතරම් ශෝචනීයද?

මෙවන් බහුතරයක් තම මානසික කඩා වැටීම හමුවේ මංමුලාවෙයි. කළයුතු දේ නොකරයි. නොකළයුතු දෙය කරයි. අසීමිත ලෙස හර ශූන්‍ය ඉලක්ක හමුවේ හඹා යමින් මෙම අදියර විනාශ කර ගනී. ජීවත් වීමට ඇත්තේ සීමිත කාලයක් බව නොපෙනේ. නොකළයුතු **දෙතිස් කථා** ආදියෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතු අදියරකි. එහෙත් ඔවුනට '**වචනය**' සංවර කර ගත නොහැක. එකිනෙකා සමග අල්ලාප සල්ලාපයෙන් ඇතැම් කාර්යාල තුළ ඕපා දූප කථා කරමින් සිටි යුගය සිහිපත් වෙයි. දුරකථනය අතට ගන්නා ඔහු සුපුරුදු ලීලාවෙන් අල්ලාප සල්ලාපයේ යෙදෙයි. තත්පර, විනාඩි නොව පැය ගණන් විවිධ පුද්ගලයින්ගේ

පෞද්ගලික තොරතුරු, ආයාසයෙන් එක්රැස් කර බෙදා හැරීමේ නීච වෑයමක යෙදෙයි. මෙලෙස මෙතනින් එතනට, එතනින් මෙතනට තොරතුරු සන්නිවේදනය කරමින් **අසීමිත ලෙස ප්‍රාථමික වින්දනයක්** ලබයි. එසේත් නැත්නම් රූපවාහිනියේ විකාශය වන ප්‍රවෘත්ති දුර කථනය ඔස්සේ නැවත නැවතත් විකාශය කරයි. නැතහොත් විවේචනය කරමින් පැය ගණන් දෛනිකව පුරුද්දක් සේ තම වටිනා කාලය විනාශ කරදමයි. එහෙත් සැනසීම එහි නැත. අවසානයේදී නුවණ මෙහෙයවා බලන කල්හි කාලය ගෙවා දමා ඇත්තේ තමාටවත්, අනුන්ටවත් මෙන්ම, මෙලොවට හෝ පරලොවට ඵලදායී නොවන ලෙස බව අවබෝධ වනු ඇත. එවිට ප්‍රමාද වී වැඩිය. තමාට **"ධර්මය"** අවබෝධ කරගැනීමට තිබූ වටිනා කාලය දුරකථනය විසින් පැහැරගෙන ඇත. නොදැනුවත්වම තම මුදල් පසුම්බියටද දරුණු පහරක් එල්ල වී ඇත. කෙතරම් අභාග්‍යයක්ද? නිරන්තරවම ධර්ම ශ්‍රවණයට යොමු වූවන් දෙලොවම සැනසෙද්දී මොවුන් යන්නේ කොයිබටද?

ඇතැම්හු මෙම අදියරේදී තමාට තිබූ සමාජ ගෞරවය, පිළිගැනීම අහිමි වී ඇතැයි සිතා හීනමානයෙන් පෙළෙති. ඔවුහු අවශ්‍යතාවක් ඇතිව හෝ නැතිව ජනාකීර්ණ ස්ථාන කරා හඹා යති. එහිදී නවීන පන්නයේ "ස්මාර්ට් ෆෝනය" වම් අතට ගෙන, දකුණත වැලමිටෙන් නමා ඉනට තබා ගෙන, ආරූඪ කරගත් මහා අභිමානයකින් යුතුව, එය ඔස්සේ පැය ගණන් ඇතැම් විට උස් හඬින් දොඩමළු වෙයි. අත පය ද සෙලවෙන අවස්ථා නැත්තේ නොවේ. තමා සිටින්නේ කොහේදැයි නොදනී. දෙතිස් කථා විනා හරවත් වදනක් එහි නැත. පිස්සෙක්ද කොහෙද කියමින් ඇතැම් අය ඉවතට යති. අවසානයේදී තමා එතනට පැමිණි අරමුණ පවා අමතක වන ඔහු, සුවිශාල වගකිවයුතු කාර්යයක යෙදී සිටියෙකු සේ ආරූඪ කරගත් අභිමානයකින් යුතුව විඩා බරව ආපසු යයි. **"හානි දශකය"** මෙසේ ගෙවී යාම කෙතරම් ශෝචනීයද?

තම සිත පාලනය කර ගැනීම තමා සතුයි. මෙතෙක් කල් කළ, කී හරශූන්‍ය චර්යාවන් පසෙක ළා **"ධර්මය"** දැකීමට උත්සාහ ගත යුතුය. ඒ සඳහා වීරිය වැඩිය යුතුයි. මේ අදියරේදී අවධානයකින් යුතුව ධර්ම ශ්‍රවණයට සිත යොමු කරන්නා මහත් ප්‍රතිලාභයක් ලබයි.

"හානි දශකය" ට පිවිසි තවත් පිරිසක්, ප්‍රඥාවන්තයින් විසින් ප්‍රතික්ෂේප කරන එහෙත් අඥානයින්ගේ මන දොළ පිරවීමට පමණක්

සමත් බොළඳ නවකථා, කෙටිකථා ආදිය කියවීමට පෙළඹෙයි. නගර සභාවේ කසල එක්රැස් කරන්නන් පවා ප්‍රතික්ෂේප කරන තරමට කුණු රසය දෝරේ ගලා යන ඇතැම් පහත් පෙළේ අත්දැකීම් සමාජගත කිරීමට වෙර දරන අන්ධබාල රචකයින් සමාජයේ නැත්තේ නොවේ. අසූචි වුවද නොමැත්තේ නම් ඇතැම් තිරිසන් සත්තු කුසගින්නෙන් මැරෙති. ඔවුන්ගේ පැවැත්ම සඳහා ඉඳ හිට හෝ එවන් ග්‍රන්ථ එළිදැක්වීමට හැකි පුද්ගලයින් බිහි වීම සත්ත්ව ලෝකයට යහපතකි. එහෙත්, තමාද විශිෂ්ඨ ගණයේ ග්‍රන්ථයක් එළිදැක් වූ ලේඛකයෙක් යැයි සිතා සමාජයේ විරාජමාන වීමට දරන්නා වූ තැත කෙතරම් පිළිකුල් සහගතද? නින්දිතද?

ප්‍රඥාවන්තයා එවන් ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරන්නේ උදැසන ඉවතලන කෙළ පිඩුවක් සේය. ධර්මය දැකීමට වෙර දරනා ඔහු තව තවත් කෙලෙස් ගිනි අවුළුවා ගැනීමට තරම් දුර්වල මානසිකත්වයකට පත්ව නැත. ඔහු එවන් ග්‍රන්ථ හමුවේ ජීවිත කාලය තුළ අපහසුවෙන් ගොඩ නගා ගත් තම චිත්ත පථයට සුළු වශයෙන් හෝ හානියක් කර නොගනී. අන්ධබාලයින් ගේ නීච උත්සාහයන් දෙස උපේක්ෂාවෙන් බැලීමට තරම් ඔහුගේ මනස උසස්ය. "**නානත්ථ කායා - නානත්ථ සංඥා**" ඒ බුදු වදනයි.

මිනිස් සන්තානය තුළ රාග, ද්වේෂ, මෝහ ආදිය වපුරවන, පහත් රුචිකත්වයන් අවුස්සා දමන, සුභාෂිතය කෙලෙසා දමන, එමෙන්ම අපගේ සංස්කෘතියට නොගැලපෙන, පහත් පෙළේ ටෙලි නාට්‍ය සහ කුණු රස වැහෙන නව කථා හමුවේ, කාලයේ වටිනාකම දන්නා සත්පුරුෂ ප්‍රඥාවන්තයින් මංමුළා නොවනු ඇත.

"**හානි දශකය**" තුළ මිනිසාට ඉතිරි වී ඇත්තේ ඉතා ස්වල්ප කාලයකි. හිස ගිනි ගත්තෙකු එම ගිනි නිවන ලෙස අප්‍රමාදීව, දහමින් පෝෂණය ලබනු විනා වෙනත් පිළිසරණක් ප්‍රඥාවන්තයාට නැත්තේමය. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන ආදී සියළුම ඉන්ද්‍රියයන් ශීඝ්‍රයෙන් දුර්වල වීගෙන යන මේ මිනිස් කයෙහි යථා තතු මැනවින් අවබෝධ කටයුතුය. ලැබුණාවූ මිනිස් භවයෙහි අවසානය ආසන්නය. නැවත කවදා මිනිස් භවයක් ලබන්නද? සිතිය යුතු මොහොත නෙත් අබියසය.

ලෝභ, ද්වේෂ, මෝහ චෛතසිකයන් පණ ගන්වන, අපගේ සංස්කෘතියට හා අනන්‍යතාවයට නොගැලපෙන, රූප රාමු අද විද්‍යුත් නාලිකා ඔස්සේ හතු පිපෙන්නාක් මෙන් සමාජ ගත වෙයි. ඒ නිෂ්පාදකයින්ගේ වාණිජමය ඉලක්ක සපුරා ගැනීමේ අරමුණෙන් විනා

සමාජය සුඛිත, මුදිත කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් නොවන බවට ප්‍රේක්ෂකයා දැනුවත් විය යුතුයි. මෙවන් රූප රාමු ඔස්සේ පස් ඉඳුරන් පිනවීමට අනුගත වන්නා තමාටම සිදුකරගනු ලබන්නේ මහත් විපතකි. සිත, කය, වචනය සංවරව තබා ගත යුතු මෙම අදියරේදී පවා ප්‍රචණ්ඩත්වය, අපරාධ, ස්ත්‍රී දූෂණ. වංචා, කුමන්ත්‍රණ, මිනී මැරුම් ආදී සමාජය නොමග යවන රූප රාමු ඔස්සේ අරමුණු ලබාගන්නා ප්‍රේක්ෂකයා නොදැනුවත්වම ස්වයං පාලනයෙන් ගිලිහේ.

ලද මිනිස් භවය කෙසේ හෝ සුරක්ෂිත කර ගැනීම සෑම මිනිසෙකුගේම වගකීමයි. වැරදි චේතනා ඔස්සේ කරන ක්‍රියා අපායට මග පාදා දෙයි. ලෝභයෙන් කිසිවක් අල්ලා ගත යුතු නැත. කිසිවෙකුට ද්වේශ කළ යුතු නැත, මෝහයෙන් මුළාවිය යුතු නැත, ද්වේෂය ඉතා භයානකය. කරුණු 10 කින් මෙලොවදීම පීඩා විඳීමට සිදුවෙයි. **ද්වේෂ නොකළයුතු අයෙකුට යමෙක් ද්වේෂ කරයි නම් හෙතෙම දරුණු වේදනාවට, ධන හානියට, කායික බිඳීම් වලට, බලවත් ආබාධ වලට, සිහි විකලත්වයට, රාජ්‍ය උවදුරකට, තදබල දෝෂාරෝපණයකට, පිරිහීමට, සම්පත් විනාශයටද පත්වන අතර, නිවෙස් පවා ගිනි ගන්නා බවත්, මරණින් පසු ඒ අනුවණයා නිරයේ උපදින බවත්, ධර්මයේ සඳහන්ය.**

(ධ.ප. දණ්ඩ වග්ග)

විවෘත මනසකින් යුතුව සමාජය විශ්ලේෂණය කරන්නෙකුට මෙහි සත්‍යතාව ජීවමානව දැකිය හැකිය. මුදිතා ගුණයෙන් පිරිහී ගිය දුෂ්ඨ චරිත අද සමාජයේ බොහෝය. ඔවුන්ට අන් අයගේ දියුණුව, ඉසුරුමත් බව, බහුශ්‍රැත බව, සමාජ පිළිගැනීම සහ අභිමානවත් දිවිපෙවෙත හදවතට දරාගත නොහැක. දෙනෙතට කටු ඇනෙන්නාසේ ය. සමාජගත පුණ්‍යවන්ත ජීවිත පහළට ඇද දැමීමේ දුෂ්ඨ චේතනාවෙන් යුතුව, දුෂ්ප්‍රාඥයෝ විවිධ ගුප්ත ක්‍රියා මාර්ග යොදා ගනිති. ඇතැම්හු දින ගණන්, සති ගණන් තිස්සේ වස් කවි කියති. නො එසේ නම් තහඩු කැබලි වල නම් ගම් ලියමින් පුළුස්සයි. වැලි මතුරයි. මිරිස් පුච්චයි. පොල් ගසයි. අනතුරුව ඉතා සූක්ෂම ලෙස ප්‍රතිඵල තිබේදැයි සොයා බලයි. අවසානයේදී, තමා සාර්ථක ලෙස වැඩක් නිමකළේ යැයි සිතා, ආරූඪ කරගත් අභිමානයකින් යුතුව තම දුර්ගුණ වසා ගැනීමට වෙර දැරුවේ වුවද, ප්‍රඥාවන්ත සත්පුරුෂයන් ඉදිරියේ සිය කඩතුරාවන් සියල්ල ගැලවී යෑමෙන් යථාර්ථය ඉස්මතු වී පෙනෙනු ඇත. වත්මන් සමාජයේ ඇතැම් වධක චෛතසිකයන්ගෙන් යුත්, මෙවන් දුෂ්ඨ චරිත නැත්තේ නොවේ.

මෝහන්ධකාරයෙන් මුළාවී ඇති මොවුන්, ප්‍රතිඵලය තමා කරාම එන බවට වත් දැනුවත් වී නැත. ආධුනිකයනට තබා කාලාන්තරයක් තිස්සේ පුරුදු පුහුණු වී ඇති යකැදුරෙකුට වුවද, විශ්වීය ධර්මතාවයන් සාධාරණය. අවසානයේදී පසු විපරමක් ඔස්සේ බලද්දී සියල්ල අහිමි වී ඇත්තේ, දුෂ්ඨ චේතනාවෙන් පිරිපුන් තමාටම බව අවබෝධ වනු ඇත. ධර්මයේ පෙන්වා දී ඇති පරිදි මෙවන් අසත්පුරුෂයින්ට "විපාක 10" දහයකින් පීඩා විඳීමට සිදුවනු නියතය. සහයෝගය දුන් යමෙකු වේනම් ලබා දුන්නා වූ දායකත්වයට අනුරූපව ප්‍රතිඵල ඔවුන්ටද ලැබෙනු ඇත. **සර්ව සාධාරණ විශ්වීය ධර්මතාවය කිසිවෙකුට වෙනස් කළ නොහැක.** අදාළ ප්‍රතිඵලය, අනුන් නැති කිරීමට වෙර දරන දුෂ්ඨයින්හට විනා, ලොවට යහපත සලසන සත්පුරුෂයින්ට නොවන බව අද සමාජය තුළ විද්‍යාමානය. මුහුණු වසාගෙන හොර රහසේ දඬුවම තනිවම භුක්ති විඳිනු විනා වෙනත් විකල්පයක් නැත. මෙවන් සමාජ ද්‍රෝහීන් කෙසේ නම් සමාජයට මුහුණ දෙන්නද? කවදා "**ධර්මය**" දකින්නද?

"**ගහපු බෙරේකුත් නෑ... බෙරේ පළුවකුත් නෑ...**" ආදී ප්‍රකාශන පුරාණ ජන වහර තුළ පවා දිස් වන්නේ එදා ජන සමාජයේද සුළු පිරිසක් හෝ මෙවැනි දුෂ්ඨ ක්‍රියාවන්හි විපාක දැක ඇති හෙයිනි. දඬුවම, ඍජුවම දුෂ්ඨ සිත් ඇතිව උපක්‍රම යෙදූ අයටමය. යහපත් **කාය කම්ම, වචී කම්ම, මනො කම්ම** ඇත්තන් හට නොවන බව දහම පිරිසිඳ දැකීමේදී අවබෝධ කටයුතුමය....

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති - සුද්ධස්ස පොසස්ස අනංගණස්ස

තමේව බාලං පච්චේති පාපං - සුඛුමෝ රජෝ පටිවාතං ව ඛිත්තෝ

(ධ.ප. පාප වග්ග)

අනුන්ට ද්වේෂ නොකරන, පිරිසිදු සිත් ඇති, නිරපරාධ නෙකුට යාමෙක් අපරාධයක් කරයිද, එම විපාකය උඩු සුළඟට දැමූ දූවිල්ලක් මෙන් එය කළ මෝඩයා කරා ම එයි.

Whoever commits an offence on a harmless person free from blemish and extremely pure, upon that fool comes its evil consequences like fine dust cast against the wind.

ධර්මය දකින්න. මෙම "හානි දශකය" ද වේගයෙන් ගෙවී යයි. අප්‍රමාදීව අවම වශයෙන් නිරය ගාමී නොවීමට කටයුතු සළසා ගත යුතුමය. ආර්ය ප්‍රතිපදාව ජීවිතයට එක්කර ගැනීමට තිබෙන අවසාන වසර කීපයයි. ශ්‍රැතවත් ආර්ය පෘතග්ජනයෙකු වීමට, වෙර දැරිය යුතුමය. ඒ සඳහා ධර්ම ශ්‍රවණය මාහැඟි භූමිකාවක් සපයයි. සතර අපායේ දුක දැක සෝතාපත්ති මඟට පිවිසීමට, බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් **"ආර්ය අෂ්ඨාංගික මාර්ගය"** විනා වෙනත් විකල්ප මාර්ග නැත. සසර භව ගමනේ අතරමං වී සිටින මිනිසාට බුදු පියාණන් වහන්සේ හැර කාගේ හව්හරණක්ද? මෙම අදියරේදී පවා කෙලෙස් වලින් සිත දූෂණය කර ගන්නේ නම් තමා තමාටම සිදු කරගනු ලබන්නේ සුවිශාල හානියකි. මෙම දීර්ඝ භව ගමනේ කිසි කලෙක එම හානිය පිරිමසා ගත නොහැක. ඒ නැවත මිනිස් භවයක් ලැබීම ඉතා අසීරු කරුණක් හෙයිනි.

යා යුතු නිසි මඟ දකිමු.

කරන කියනා සෑම දෙයකම යථා **දැක්මක්** ලැබිය යුතුමයි
එයම මත **සංකල්පනාවන්** මනා ලෙස ගොඩ නැගිය යුතුමයි
වචන මුවගින් පිටට එනවිට **සුභාෂිත** දැයි බැලිය යුතුමයි
කරන කටයුතු සමාජයට ත් යහපතක්දැයි සෙවිය යුතුමයි

කවරදා කොයි දෙයක් කළ මුත් නොමැත සැනසුම මිනිස් හද තුළ
පවරලා හැම දේම නිදහස් මාවතක් ඇත බුදු දහම තුළ
නමැදලා තෙරුවන්ගෙ ගුණ කඳ යොමා නෙත් ඔබෙ ජීවිතය තුළ
සමරලා ඔබෙ **දිවිය - යහපත්,** සතුටු විය හැක හැරී බල බල

කළ යුතුම දෙය තමයි **වීරිය** යහපතින් අපි එල ලබන්නට
නොඑන්නට අකුසල් සිතක් හා පැමිණි අකුසල් ඉවත ලන්නට
පහළ වන විට සිතක් ඔබ හට පින්, කුසල් තව සිදු කරන්නට
ගත යුතුව ඇත තවත් වීරිය ලද කුසල් සිත නඟා ලන්නට

සිහිය යහපත් ලෙස තබන්නට භාවනාවයි හේතු වන් නේ
සවිය ගන්නට මෙතනදී අපි කෙසේ හෝ සැළසුම් කරන්නේ
එඩිය පානා විටදි වෑයම නොමැත කිසිදා අත හැරෙන්නේ
විරිය කරනා බවුන් වැඩුමයි දුවන සිත එක් තැන් කරන්නේ

කුසල් සිත මේ අ..දි..ය..රේ..දී **සමාධි** ගත වී බැබළි බැබළී
උපන් භවයේ නියම එල ලැබ එළිය දෙයි හැම අතට විහිදී
පහන් වූ හදවතක උපරිම සොම්නසක් සේ ඉගිලි ඉගිලී
නිවන් මඟ දැක, අඳුර නිමවෙයි - නොමැත දුක යළි ඉපදි ඉපදී

සාධු ! සාධු ! සාධු !

9

වර්ණ ප්‍රස්ත (වංක) දශකය (7) - The stooping decade

මෙය මිනිසාගේ ජීවිත කාලයේ හත් (7) වන දශකයයි. මිනිසා මෙම අදියරට ළගා වීමේදී සීලයෙන් පිරිපුන් අයෙකු වීම ඉතා වැදගත්ය. බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ විසින් සකසන ලද විසුද්ධි මග්ගයෙහි මැනවින් පහදා දී ඇති පරිදි "**ත්‍රි ශික්ෂා**" පූර්ණය මිනිසාගේ විසුද්ධිය පිණිස මාහැගි භූමිකාවක් නිර්මාණය කරයි. එහි ආරම්භය "**සීල විසුද්ධිය**"යි. එම පාදම ශක්තිමත් නම් ඒ ඔස්සේ "**පටිපදා ඤාණ දස්සන විශුද්ධිය**" කරා ළඟාවීමට හැක. මෙම ප්‍රතිපදාව ඔස්සේ ජීවිත ජයග්‍රහණය සාක්ෂාත් කර ගත හැකි එකම සත්ත්වයා මිනිසා පමණි.

ඒ සඳහා ජීවිත කාලය තුළ උදාවන අදියර දහයේදීම ඉතා විමසිලිමත්ව තමා තමාවම ආරක්ෂා කර ගත යුතුය. මෙම අදියරේදී විශේෂයෙන්ම කායික වෙනස්වීම් පැහැදිලිවම දකිය හැකිය. **චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය** නම් වූ අභ්‍යන්තර ආයතන සඳහා අපි අරමුණු ලබා ගැනීමේ දී එය වඩාත් පැහැදිලි වෙයි. එදා හොඳින් පෙනුන දෙනෙත අද දුර්වල වී ඇත. උපැස් යුවළක ආධාරයෙන් විනා පොත පත කියවීමට පවා නොහැකිය. ශ්‍රව්‍යාබාධ ද එසේමය. ඇතැම්හු ශ්‍රව්‍ය ආධාරක පළඳිති. දත්වල පවා ශක්තිමත් භාවය පලායයි. ඝන ආහාරයක් මුඛය තුළදී ජීර්ණයට අවශ්‍ය පරිදි සැකසෙන්නේ නැත. ශක්තිමත්ව තිබූ දත් එක එක ඇදී සෙලවී ගැලවී යයි. ආඝ්‍රාණ පද්ධතියද දුර්වලය. පෙර මෙන් කිසිවක ගඳ, සුවඳ නිසි පරිදි නොදැනේ. කුසගින්නට කෑම ගන්නවා විනා ලුණු රසවත් දිවට නොදැනෙන අදියරකට මිනිසා පත්වෙයි. කයද පෙර මෙන් පෘෂ්ඨීමත් නැත. කොඳු ඇට පේලියෙහි වක්‍රවීම් නිසා සිරුර පවා ඉදිරිපසට නැවී යයි (stooping) කය වැහැරී යයි. සම රැළි ගැසෙයි. ධර්මයේ පෙන්වා දෙන අන්දමට වංක දශකය තුළ මිනිසාගේ ස්වභාවය එයයි. පංචේන්ද්‍රියන්ම බාහිරට දෘශ්‍යමාන වන තරමේ වෙනසකට භාජනය වෙයි. ඇති වූ සෑම දෙයකම ස්වභාවය පැවතී නැතිවී යාමයි. මෙය පියවි නෙතට ගෝචර වෙයි.

එකවරම පිටතට නොපෙනෙන මනස ඊට වඩා හාත්පසින්ම වෙනස්ය. කායික වශයෙන් දුබලතා ඇති වුවද, මනස ඊට අනුරූපව

ප්‍රතිචාර නොදක්වයි. මේ වන විට උසස් මනෝභාවයකට පත්ව ඇති සීලවන්ත ප්‍රඥාවන්තයා ජීවිතය දෙස යථාර්ථවාදීව ආපසු හැරී බලයි. පංචේන්ද්‍රියන් තුළින් ලබාගන්නා අරමුණු කිසිවකට නොඇලෙයි. නොග ැටෙයි. කිසිවක් උපාදාන කර නොගනී. ඔහුගේ මනස සන්සුන්ය.

එහෙත් මෙම අදියරේදීද, මනස අවුලෙන් වියවුලට පත් කරගන්නා දුෂ්ප්‍රාඥයින් පිරිසක්ද සමාජයේ නැත්තේ නොවේ. ඇතැම් ටෙලි නාට්‍ය නිෂ්පාදකයෝ විවිධ රූප රාමු ඔස්සේ ප්‍රේක්ෂකයින් ගේ හද, මන බැඳ තබා ගැනීමට සුවිශේෂී ක්‍රම වේදයක් යොදාගනිති. වයස් ගත වූවන් සේ තිරය මත රඟපානා ඔවුන් ගේ චරිත ඇතැම් විට ප්‍රේමණීය ය. ඇතැම් විට ත්‍රාසජනක ය. තවත් විටෙක අද්භූත සහගතය. එසේත් නැත්නම් කාමාතුරයන්ගේ චරිතයන්ය. මේවා උපාදාන කරගන්නෝ ඒ ගැනම සිතති. එවැනි චෛතසිකයන්, තමා මේ දක්වා දැඩි වීර්යයෙන් සකස් කරගත්තා වූ කිසියම් උසස් මනෝ භාවයක් වේ නම් එය විනාශ කර දැමීමට සමත් වෙයි. එවිට සිදු වන්නේ තම ගමන සුගතියකටද? දුගතියකටද? යන්න තමා විසින්ම නිර්ණය කර ගැනිම පමණි.

වෘද්ධ භාවයට පත්වන මෙම අදියරේදී, ශාරීරික වේදනා ඇති වීමේ ප්‍රවණතාවය වැඩිය. ඇතැම් අය බටහිර වෛද්‍ය ක්‍රම ඔස්සේ තාවකාලික විසඳුම් සොයා යති. තවත් පිරිසක් දේශීය වෛද්‍ය ක්‍රම ඔස්සේ පිළියම් යොදති. කෙසේ වෙතත් මේ අදියරේදී වෛද්‍යවරයාට කළ හැකි දේ ඉතා සීමිතය. ඒවාගේම කෙටි කාලීනය. යථාර්ථය නැවත එළි දක්වෙනු ඇත. රෝගයක් සුව වීම යනු වයෝවෘද්ධ භාවය හෝ මරණය හෝ නතර කිරීමක් නොවේ. කෙසේ වෙර දැරුවේ වුවද, සත්‍ය වූ ධර්මතාවයට පිටුපා යා හැක්කෙකු ලොව නැත. ‘සත්‍ය’ මතුපිටට විත් දෘෂ්‍යමාන වෙයි. (Truth comes to the surface)

මෙම සියළු රෝගයනට නිසි ඖෂධය මෙළොව සොයාගත්තේ මීට වසර 2600 ට පමණ පෙර අප තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ පමණි. බුදුන් වහන්සේ සොයාගත්, ධර්ම ඖෂධය පානය කරන්නෝ මෙළොවත්, පරළොවත් දෙක්හිම සුව සෙත සාදා ගනිති. ඒ සදාකාලික සුවයයි.

"Being cured does not mean that the process of aging and dying simply stops (since whatever is constructed must undergo change). But we can, through wisdom, be “untouched” by aging

and death. Health consists of a sufficiently deep understanding of the nature of things that we do not cling to anything in the world. Non-attachment is itself the cure. "

මිනිස් සන්තානය තුළින් තණ්හාව, ඇලීම හෙවත් උපාදානය නැති කරගන්නා තෙක් මෙම බව දුකට පිළියම් නැත. නැවත නැවතත් භවයක්ම අල්ලාගෙන දුක් විඳියි. පූර්ණ සුවය ලැබීමට ධර්ම ඖෂධය හා සමාන ඖෂධයක් නැත. එබැවින් ධර්ම ඖෂධය පානය කළ යුතුමය.

යෙකෙචි ඕෂධා ලොකෙ - විජ්ජති විවිධා බහු

ධම්මොෂධ සමං නත්ථි - එතං පිවථ භික්ඛවො

(ඛුද්ධක නිකාය)

Of all medicines in the world, manifold and various, there is none like the medicine of Dhamma. Therefore monks swallow it

දුක් විඳින මිනිසා කෙරෙහි පතළ මහා කරුණාවෙන්, බුදු පියාණන් වහන්සේ මේ සියල්ල බුදු නුවණින් දැක අපට නොපෙනෙන ලෝකය පෙන්වා දී ඇත. අප විසින් කළ යුතුව ඇත්තේ එහි සත්‍යතාවය අවබෝධ කර ගැනීමට උත්සුක වීමයි. තමාටත් අනුන්ටත් යහපත පිණිස වන යහපත් ධර්මයක් අප සතු වේ නම්, එහි පවත්නා තත්ත්වය තේරුම් ගෙන එය වැඩි දියුණු කර ගැනීමට වෙර දැරීමයි. අප සසර ඉපදෙමින් දුක උරුම කර ගන්නා ආකාරය මේ භවය තුළදීම අවබෝධ කටයුතුමය. කෙසේ හෝ උපත නතර කර ගනු විනා නැවත නැවතත් භවයක් පැතිය යුතු නැත.

දුක් වේදනා උපන් සත්ත්වයාට උරුමය. පැලැස්තර යෙදීම තාවකාලික සැනසීමකි. කායික, මානසික වශයෙන් සදාකාලික සුවයක් ලැබීමට බුදුපියාණන් වහන්සේ මඟ පෙන්වා ඇත. රෝගයකට ප්‍රතිකාර කිරීමට රෝග නිධානය සොයා ගත යුතුය. බුදුපියාණන් වහන්සේ එය සොයා ගැනීමට සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා පර්යේෂණ පැවැත් වූ බව නොරහසකි.

බුදුපියාණන් වහන්සේ රෝගය හඳුනාගත්හ. එය විශ්ලේෂණය කරමින් එයට හේතු සොයා ගත්හ. සුව කළහැකි බව අවබෝධ කර ගත්හ. ඒ සඳහා අනුගමනය කළ යුතු මාර්ගය බුදු නෙතට ගෝචර විය. **ඒ චතුරාර්ය සත්‍යයයි. මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.** මෙම මඟට පිවිසෙන තාක් කල් සත්ත්වයා මැරි මැරී විවිධ භවයන්හි උපදී. පූර්ණ සුවය ලැබීමට මෙම උත්තරීතර මාර්ගය අනුගමනය කළ යුතුමය.

The healing symbolism of the the Buddha's teaching is exceptional. He is often pictured as the great physician who, seeing the suffering of all beings in the world, applies the medical formula of the **four noble truths** to…………

1) describe the symptoms of suffering;

2) investigate its specific causes;

3) using this information, reverse the causes to conceive a cure; and finally

4) lay out a flexible program of treatment that will lead a person out of affliction to lasting health of body and mind..

මෙම අනවරත සංසාර ගමනට මූලික වන "**තණ්හාව**" අපගේ චිත්ත සන්තානය තුළ පවතින තාක් කල් අපගේ ගමන් මඟ චක්‍රාකාරව පවතී. අදියර 12 ක් ඔස්සේ ඉතාමත් සූක්ෂම ලෙස පියවරෙන් පියවර සකස් වී ඇති මෙම ගමන් මගෙහි මිනිසා අවිචාරයෙන් දුවයි. විචාර බුද්ධියකින් යුතුව උත්සාහයෙන් ප්‍රඥා ඇස විවර කර ගන්නේ නම් අප කාහටත් මෙම ගමන අවසන් කළ හැකි බව බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ සේක. එතෙක් මෙම සම්බාධක සහිත ගමන් මගෙහි චක්‍රාකාරව ගමන් කරනු විනා අපට වෙනත් විකල්පයක් නැත.

විචාර බුද්ධියකින් යුතුව මෙම චක්‍රාකාර **පටිච්ච සමුප්පදාය** පිළිබඳව යම් පමණක හෝ අවබෝධයක් අප්‍රමාදීව ලබා ගත යුතුමය.

මිනිස් ජීවිතයේ "මෝහමූල දශකය" ට අනුගත වීමේදී මනසෙහි ක්‍රියාකාරිත්වයද දුර්වල විමට ඇති සම්භාවිතාව ඉතා අධිකය. එසේ වුවහොත් ඉන් ඔබ්බට අපගේ වෑයම අසාර්ථක වීමට ඇති ඉඩ කඩ බොහෝය. එතෙක් අප පමා විය යුතු නැත. ධර්මයේ පෙන්වා දෙන අන්දමට අප්‍රමාදය නිවනට හේතු වෙයි. පමාවීම මරණයට හේතු වෙයි.

(ධ.ප. අප්පමාද වග්ග)

උපතට හේතුව බුදු නෙතට ගෝචර වූයේ මෙසේය.

අවිජ්ජා පච්චයා සංඛාරා - සංඛාරා පච්චයා විඤ්ඤාණං - විඤ්ඤාණ පච්චයා නාම රූපං - නාම රූපං පච්චයා සළායතනං - සළායතන පච්චයා ඵස්සො - ඵස්ස පච්චයා වේදනා - වේදනා පච්චයා තණ්හා - තණ්හා පච්චයා උපාදානං - උපාදාන පච්චයා භවො - භව පච්චයා ජාති - ජාති පච්චයා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස සම්භවන්ති.

Avijja – ignorance or delusion (මොඩකම, මුලාව)

Sankhara – kamma formations (කර්ම සකස්වීම)

Vinnana – consciousness (විඤ්ඤාණය බැසගැනීම)

Nama-rupa – mind and matter (නාම රූප සකස් වීම)

Salayatana – six sense bases (ආයතන හය සකස් වීම)

Phassa – contact or impression (ස්පර්ශය ඇතිවීම)

Vedana – Feeling (දැනීම)

Tanha – craving (ඇලීම)

Upadana – clinging (තදින් අල්ලා ගැනීම)

Jati – rebirth (නැවත උත්පත්තිය)

Bhava – becoming (භවයක් උරුම වීම)

Jara-marana – dotage and death (මහළුවිය ජරා, මරණ)

මරණයෙන් මේ සංසාර ගමන අවසන් වන්නේ නැත. භවයෙන් භවය කොහේ යන්නේදැයි අපි නොදන්නෙමු. ප්‍රේත, අසුර, තිරිසන්, නිරය ආදි අපායයන්හි අනන්ත අප්‍රමාණ දුක් විඳිමින් ඉපිද, මැරෙමින් යන්නා වූ මේ ගමන නවතා ගැනීමට අප ලද එකම මොහොත මෙය විය හැකියි. මෙම භවයේ නිසි ඵල නෙලා නොගන්නේ නම් නැවත සසරටම වැටෙනු නියතය. මෙය චක්‍රයක් සේ නොනැවතී භ්‍රමණය වෙයි.

නාම, රූප යන්හි යථාර්ථය දකින විට තෘෂ්ණා, මාන, දිට්ඨි ඉවත්වී යයි. මෙම ගම්භීර ධර්මය කෙසේ හෝ අවබෝධ කර ගැනීමට වෙර දැරිය යුතුමය. එය සාක්ෂාත් කරගත හැක්කේ මිනිස් මනසකින් පමණි. අප තෝරා ගත යුත්තේ සසරේ ඇවිදින මං තීරුව නොවේ. සසරින් එතෙර වන මගයි. ඒ ඔස්සේ ගමන් ගන්නා පුද්ගලයා අතරමං වී සිටින තවත් අයෙකුට නිසි මග පෙන්වයි. ඒ සත්පුරුෂ ලක්ෂණයයි. එවන් පුද්ගලයා නිතැතින්ම ගරු සම්භාවනාවට ද පාත්‍ර වෙයි. ඒ බුදු වදනයි.

මෙවන් වෘද්ධ පුද්ගලයෙකු තම නිවසේ සිටී නම් හෝ ඇසුරට ලැබෙන්නේ නම් හෝ එය විශාල භාග්‍යයකි. ඒ තමාට ද ආයුෂ, වර්ණ, සැප, බල, ලබාගත හැකි පුණ්‍ය නිධානයක් මතු වී ඇති හෙයිනි.

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණෝ සුඛං බලං

වයෝ වෘද්ධ, ගුණ වෘද්ධ, සීල වෘද්ධ, උත්තමයන්ට නිතර වැඳුම්, පිදුම් කරන්නන්ගේ සහ නිතර ඔවුන්ගේ සැප දුක් විචාරා බලමින් පිහිට වන්නන්ගේ නිරතුරුවම ආයුෂ, වර්ණ, සැප, බල නමැති ධර්මතා 4 වැඩේ.

(ධ.ප. සහස්ස වග්ගය)

Abhivādansilissa - niccaṃ vaddhapacāyino
Cattāro dhammā vaḍḍhanti - Āyu vanno sukhaṃ balaṃ

One who constantly respect, worship, and venerate the ethically characterized elders: restricted with moral virtues will

be blessed with Long life, beauty (pleasant look), happiness and discriminate strength to control anything or anyone, due to the improving intellect.

නිරතුරුවම අප කරා ළඟා කර ගත හැකි පුණ්‍ය සම්පත් අනූනව අප වටා රැස්ව තිබුණ ද, එයින් ඵල ලැබීමට, පෙර පින් නැති අය අද සමාජයේ බොහෝය.

අභාග්‍යයක මහත? අද සමාජයේ වැඩිවිය පත් ඇතැම් දරුවෝ මෙවන් වෘද්ධ පුද්ගලයෙකු තම නිවසේ සිටී නම් ඔවුන් පළවා හැරීමට විවිධ උපක්‍රම යොදති. ඇතැම් අකෘතඥ දරුවන් සුනඛයා ගෙතුළට ගෙන වයෝ වෘද්ධ පියතුමා සුනඛ කූඩුවට දමා දොර වැසූ අවස්ථාද වත්මන් සමාජයේ දෘශ්‍යමාන වෙයි. නොඑසේ නම් නිසි පරිදි හිරු එළියවත් නොලැබෙන ගබඩා කාමරයකට ඔහුගේ ජීවිතය සීමා කරයි. ඇතැම්හු එපමණකින්වත්, නිවසේ ජීවත් වීමට ඉඩ හසර ලබා නොදී නිවසින් පිටුවහල් කරති. හව් හරණක් නොමැති අසරණ දෙමව්පියෝ අව්ව, වැස්ස, සීතල, පින්න නොතකා මහ මඟ හිඟමන් යදිති. හිසට වහළක් නැත. ගතට නිසි ආවරණයක් නැත. හිතට සැනසීමක් නැත.

ඇතැම් අය, වත්මන් සමාජයේ ඇති නවීනතම විලාසිතාව සේ සළකා තම යුතුකම් හා වගකීම්, මුදල් ගෙවා වැඩි හිටි නිවාසයකට පවරති. කුඩා දරුවන් අත්තම්මා හා සීයා ගෙනියන්න එපා කියමින් හඬා වැලපෙද්දී, මොවුන් දෙමාපියන් වැඩිහිටි නිවාස කරා ගෙන යන්නේ සුඛෝපභෝගී වාහනයකිනි. ආරූඪ කරගත් මහා අභිමානයකිනි. ගම්භීර කර්තව්‍යයක් සාර්ථකව අවසන් කළා සේ ආපසු නිවසට පැමිණෙන මොවුහු පවිටු මිතුරන් සමග එක්ව ජය පැන් බොති. නිවස සියළුම දුෂ්චරිත සඳහා දූන් විවෘතය. සම්බාධක නැත. මහා වික්‍රමයක් සේ දූනෙයි. දෙමව්පියන් හැඬූ කඳුළෙනි. මිනිසාගේ මෙම අධම ක්‍රියා සියල්ල කා හට වසන් කළේ වුවද විශ්වීය ධර්මතාවයට වසන් කළ නොහැක. ස්වභාව ධර්මයෙන් දඬුවම් ලැබෙනු නියතය. එය කිසි විටකවත් මුදල් හෝ අල්ලසක් දී කල් දැමීමට හෝ අවලංගු කර ගැනීමට හෝ නොහැක.

වයෝ වෘද්ධ දෙමව්පියන් ඔවුන්ගේ දහඩිය මහන්සියෙන් මුදල් උපයා, නිවාස ඉදිකර, දරුවන් ලොකු මහත් වනතුරු සියළු දේපළ නඩත්තු කරමින් ආරක්ෂා කර, දරුවන් වෙතම නිසි කල පවරා ඔවුන්ගේ

යුතුකම් සියල්ල ඉටු කළ ද, දරුවන් ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඔවුන් පැහැර හරින්නේ නම් ඔහු **වසලයෙකු** බව වසල සූත්‍රයේ පෙන්වා දෙයි.

ගේ දොර, ඉඩ කඩම්, වතුපිටි, යාන වාහන ආදී කිසිවක් එදා සිටි මුතුන් මිත්තන් ගෙන නොගිය බවත්, අද සිටින කිසිකෙනකු ගෙන නොයන බවත්, අද සිටින වත්මන් පරපුරට ගෙන යාමට ද නොහැකි බවත් දන්නා දෙමව්පියන් හුදෙකලා ජීවිතය තුළ සිත් තැවුලට පත්වන්නේ නැත. ඒ ඔවුන්ගේ චිත්ත සන්තානය තුළ ගොඩ නැගී ඇති ධර්ම ශක්තියේ බලයෙනි.

මහ පාරේ අතරමං කළේ වුවද, ඔවුහු දරුවන්ට ද්වේෂ නොකරති. දරුවන් ගේ පෙර පින් අවසන් වී ඇති බව සිතෙන විට සංවේගයක් ඇති වුවද, එය ස්වකීය මනසට පීඩාවක් කර ගැනීමට තරම් ඔවුහු අන්ධ බාල නොවෙති. දරුවෝ සිය දීර්ඝ වූ සසර ගමනට ඉන්ධන එකතු කර ගනිති. ධර්මාවබෝධය ලද දෙමාපියෝ තම චිත්ත පථය අවුල් කර ගැනීමට එය හේතුවක් කර නොගනිති. දරුවන් ගමනේ දුර ප්‍රමාණයට සාපේක්ෂව ඉන්ධන ගබඩා කරගත යුතු බව දෙමාපියෝ දනිති. ස්වකීය මිනිස් ජීවිතයේ 7 වන දශකයට (වංක) ළඟාවන විට මෙතරම් ප්‍රබල **මානසික ශක්තියක්** දෙමාපියන්ගේ චිත්ත සන්තානය තුළ ස්ථාපිත වී තිබීම කෙතරම් භාග්‍යයක්ද?

ලැබුවා වූ මිනිස් භවයට නිගරු නොවන සේ, ලෞකික ජීවිතය පවත්වා ගැනීමටත්, ඉදිරි භවය සුවපත් කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ගය බුදු පියාණන් වහන්සේ සිය සර්වඥතා ඥානයෙන් දැක, මිනිසා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව, **සිඟාලෝවාද සූත්‍රය** තුළින් ලොවට පහදා දුන් සේක. ඒ මග ඔස්සේ යාම, නොයාම පුද්ගලයා සතු කාර්යයකි. ස්වකීය චින්තනය ඔස්සේ කැමති නම් යාමටත්, අකැමති නම් නොයාමටත් ඉඩ හසර පාදා ඇත. බුදු දහම තුළ බල කිරීම් නැත. තහංචි පනවා ද නැත. ධර්මය ඒහි පස්සිකය.

තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාර බන්ධනා

(ධ.ප මග්ග වග්ග)

"ඔබ විසින්ම කෙලෙස් තවන වීර්යය කළ යුතුයි. බුදුවරු එයට මඟ කියන්නෝය. ඒ මඟට බැස ධ්‍යාන වඩන්නෝ මාර බන්ධනයෙන් මිදෙන්නෝය."

(You yourself should strive towards perfection, Buddhas are only revealers of the path. Those who enter the path and strive will be released from the bondage of Mara)

සිඟාලෝවාද සූත්‍රයේ බුදු පියාණන් වහන්සේ අනු දන වදාළ පරිදි දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් 5 කි.

1. **භතො නෙ භරිස්සාමි**

   ඔවුන්ගෙන් පෝෂණය ලැබූ මම ඔවුන්වද පෝෂණය කරමි.

   Being supported I shall support them.

2. **කිච්චං නෙසං කරිස්සාමි**

   ඔවුන්ගේ ආවතේව ඉටු කරන්නෙමි.

   I shall do their duties.

3. **කුලවංසං ඨපෙස්සාමි**

   පවුල් සම්ප්‍රදා රකින්නෙමි.

   I shall keep the family linage

4. **දායජ්ජං පටිපජ්ජාමි**

   පරම්පරාගත වස්තු උරුමයට සුදුසුකම් ලබන්නෙමි.

   I shall act in such a way as to be worthy of inheritece

5. **අථව පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමි'ති**

   මියගිය ඥාතීන් වෙනුවෙන් දන් දී පින් පමුණුවන්නෙමි.

   Further more I shall offer alms and transfer merits in honour of my departed parents & relatives.

සිඟාලෝවාද සූත්‍රයේ බුදු පියාණන් අනු දන වදාළ පරිදි දෙමාපියන්ගෙන් දරුවනට ඉටුවිය යුතු යුතුකම් 5 කි.

1. **පාපෙ නිවාරෙනන්ති**

   දරුවන් පවින් වැළැක්වීම

   They dissuade them from evil

2. **කල්‍යාණෙ නිවෙසෙන්ති**

   දරුවන් යහපත් වැඩවල යෙදවීම

   They persuade them to do good

3. **සිප්පං සික්ඛාපෙන්ති**

   සිප් සතර ඉගැන්වීම

   They make the path to get good education

4. **පතිරූපෙන දාරෙන සංයොජෙන්ති**

   නිසි කළ ආවාහ විවාහ කරදීම

   They would arrange the marriage to a suitable

   partner in time

5. **සමයෙදයප්ජං නීයාාදෙන්ති**

   නිසි කළ දේපල පවරා දීම

   At the proper time, they would hand over them their inheritance.

අන්‍යෝන්‍ය වශයෙන් මෙම යුතුකම් ඉටු වී ඇත්ද? නැද්ද? යන්න පසුවිපරමක් තුළින් තම තමාට අවබෝධ වනු ඇත. තමාගේ යුතුකම් නිවැරදි ලෙස ඉටුවී ඇත්නම් එතුළින් ලද හැක්කේ අප්‍රමාණ සතුටකි. එය ආත්ම තෘප්තියයි. ධර්ම මාර්ගයේ ඉහළටම ඔබව ඔසවා තැබීමට

එය සමත්වනු ඇත. එම ජයග්‍රහණය කිසිවෙකුට වළකාලිය නොහැක. උපන් භවයේ නිසි ඵල ලබාගත් ඔබගේ ගමනාන්තය ඔබගේ මනැසට දෘෂ්‍යමාන වනු ඇත. කෙතරම් මානසික සංහිඳියාවක්ද?

දෙමාපියන් සිය යුතුකම් සියල්ල ඉටු කර තිබියදී, කිසියම් දරුවෙකු තම යුතුකම් පැහැර හරින්නේ නම් ඔහු තමාටම සිදු කරගනු ලබන්නේ විශාල හානියකි. ඔහු ධර්මය දක නැත. කර්ම නීතිය ඔහු පස පස හඹා එයි. තමාට හැකියාව තිබියදී මව් පියන්ට නොසලකන, අඩු තරමින් ඔවුන්ගේ සැප දුක් සොයා නොබලන අකෘතඥ දරුවෝ අද සමාජයේ නැත්තේ නොවේ. වයස්ගත දෙමව්පියන්ට අවශ්‍ය කරන බෙහෙත් පෙත්තක් වත් ගෙනත් දීමට සිතක් පහළ නොවන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක්ද? කෙතරම් කාර්ය බහුල වුවද, එපමණකින්වත් දෙමව්පියන්ගේ සිත් සැනසීමට දායකත්වයක් නොදක්වන්නේ නම් ඒ වසල ගති බව **වසල සූත්‍රය** පරිශීලනය කරන්නෙකුට පෙනී යනු ඇත.

ඇතැම් දරුවෝ දෙමාපියන්ගෙන් ලද වස්තුව, දේපළ සුරක්ෂිතව පරිහරණය කිරීමකින් තොරව විනාශ කර දමති. නොඑසේ නම් නිසි නඩත්තුවකින් තොරව විනාශ වී යාමට ඉඩ හරිති. දෙමාපියන් ගේ ඇස් පනා පිටම එවැනි විනාශකාරී කටයුතු සිදු කරන දරුවන් ගේ පරිහානිය ද ඔවුන් පසු පසම හඹා එයි. මව් පියන් පෝෂණය නොකිරීම මෙන්ම ඔවුනට සිත් පීඩා ඇති කිරීම ද බලවත් පාපයකි. ඔවුන් හට පිරිහීමේ දොරටුව විවෘත වන්නේ නිතැතිනි. පෙර පින් අවසන් වූවෝ එම ද්වාරය සිය කැමැත්තෙන්ම විවර කර ගෙන සතර අපායට මඟ පාදාගනිති. **කාගේ හව්හරණක්ද?**

මුළු ජීවිත කාලයටම අදාළ වන '**ගිහි විනය**' යහපත් ලෙස පවත්වා ගැනීමට සිගාලෝවාද සූත්‍රය සපයා දී ඇත්තේ මාහැඟි භූමිකාවකි. ඒ අනුව ජීවිතය සකසා ගන්නෝ නිවන් මඟ දකිති. ප්‍රමාද වෙමින් ඒ සඳහා අපොහොසත් වන්නෝ නිරයට මඟ පාදා ගනිති. පවත්නා ජීවිතය ඉතා කෙටිය. සසර ගමන ඉතා දිගය. භෞතිකව ලද සියළු සම්පත්, හද බැඳගෙන සිටින සියළු ආශ්‍රිතයින් සහ උගත් කම් සියල්ල අත හැර දමා යාමේ මොහොත ඉතා ආසන්නය. ගෙන යා හැක්කේ තමන් සිදු කරගත්තා වූ පින් පව් පමණි. අප්‍රමාදීව ධර්මය දකින්නා සුගතිගාමී වෙයි.

10

පබ්භාර (ප්‍රවංක) දශකය (8) - The Bent decade

මෙම අදියරේදී මිනිසාගේ කායික ස්වභාවයේ වෙනස මැනවින් දෘෂ්‍යමාන වෙයි. ගතට වාරු නැත. හුනස්නෙන් නැගිටීමට ආධාරකයක් අවශ්‍යමය. පුටුවක වාඩිවීම පවා අනතුරු සහිතය. කය ඍජුව තැබිය නොහැක්කේමය. අනපේක්ෂිත ලෙස බිම ඇද වැටීමට ඇති ඉඩකඩ බොහෝය. එසේ වුවහොත් අස්ථි බිඳී යාමෙන් වඩාත් පීඩා විඳීමට සිදුවෙයි. අත පය වෙව්ලයි. අතට ගත් බත් පිඩ කටට දමා ගැනීමට පවා නොහැකිය. එබැවින් මෙම අදියරේදී මිනිසාගේ කයට පූර්ණ ආරක්ෂාවක් ලැබිය යුතුමය. කිසිම රක්ෂණ සමාගමක් මෙම අදියරේදී එම පූර්ණ වගකීම භාරගැනීමට සූදානම් නැත. මෙම ධර්මතාවයට එරෙහිව කිසියම් ක්‍රියා මාර්ගයක් ගත හැකි බලවේගයක් ද ලොව පහළ වී නැත. මෙය සංසාර දුක හෙවත් භව දුකයි. මෙයට නිසි පිළියම සොයාගත් එකම ශ්‍රේෂ්ඨයාණන් වහන්සේ තුන් ලෝකයක් සනසා වදාළ සම්මා සම්බුදු රජාණන් වහන්සේමය.

සෙත් සිරි දෙන මහ ගුණ මුහු දානන්
සත් හට වන භව දුකට වෙදාණන්
තිත් ගණඳුරු දුරලන දිනි දාණන්
සිත් සතොසින් නම දිමි මුණි දාණන්

(ලෝ වැඩ සඟරාව)

Glad at heart, I pay homage to the Supreme sage: the giver of Blissful peace, the great Ocean of virtue, the physician for the samsaric ills of beigns, the sun that dispels the pitchy darkness of false views.

ශාරීරික දුක් වේදනා උච්චස්ථානයට පැමිණ ඇති මෙම අදියරේදී අප විසින් කළයුත්තේ කය ගැන සිතමින් සුසුම් හෙළීම නොවේ. වේදනාව විදසුන් නුවණින් දැක, එම තත්ත්වයට නැවත පත් නොවීමට වග බලා

ගැනීමයි. ඒ සඳහා අප්‍රමාදී විය යුතුය. ගත වූ බාල, තරුණ අදියරයන්හිදී ධර්මානුකූල ජීවිතයක් ගත කළ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයෙකු මෙම අදියරේදී ද මනසින් ප්‍රබෝධමත්ය. මනසින් එල ලැබිය හැකි අවසාන අදියර මෙයයි. කය දුබල වුවද, ප්‍රඥාවන්තයාගේ මනස මෙම අදියරේදී ද ප්‍රකෘතිමත්ය. එහෙත් ඉදිරි දශකයේදී එයද දුබල වීමට ඇති සම්භාවිතාව වැඩි බව ඔහු දනී. තමන් ආ සාර්ථක ගමන් මඟ ඔහු සතුටින් මෙනෙහි කරයි. **කෙතරම් මානසික සංහිඳියාවක්ද?** ඔහුගේ චිත්ත සන්තානය සන්සුන්ය. සියල්ල මනස පූර්වාංගම කොට ඇති බව අවබෝධ කර ගැනීමට තරම්, ආධ්‍යාත්මික සංවර්ධනයකට ප්‍රඥාවන්තයා හිමිකම් කියයි. ධර්මයෙන් සන්නද්ධ වූවෙකුට ජීවිතයේ ඕනෑම අභියෝගයකට මුහුණ දීමට පුළුවන.

"**ප්‍රවංක**" දශකයට එළඹෙන විට හෙබ වූ තනතුරු, බලතල, නිලතල, උගත්කම්, සහතික, පිරිවර සියල්ල අත හැරී ඇත. තමාට පිහිටට පවතින්නේ සකස් කරගත්තා වූ මනස පමණි. එහෙත් ඇතැම්හු එම භාග්‍යය ද අහිමි වී සුසුම්ලති. ඔවුන්ගේ මනස ප්‍රකෝපකාරීය. අවුල් සහගතය. ඔවුන් නිරන්තරයෙන්ම ඇස, කණ හුරු කර ඇත්තේ සමාජය නොමඟ යවන, සුභාෂිතය කෙලෙසන, මනස විකෘති කරවන රූප රාමු වලට විනා ධර්මාවබෝධය පිණිස නොවේ. ඕපා දූප සහ දෙතිස් කථා වලට පූර්ණකාලීනව අවධානය යොමු කරමින් ස්වකීය පහත් රුචිකත්වයන් උද්දීපනය කරගනිමින් පහත් වින්දනයක් ලැබූ අන්ධබාලයිනට මෙම ප්‍රවංක අදියරේදී කාගේ හව් හරණයක්ද? මනසෙහි ධර්ම ප්‍රබෝධයක් නැත.

තමා පසු කොට පැමිණි ක්‍රීඩා දශකය, වණ්ණ දශකය, බල දශකය, පඤ්ඤා දශකය, මිනිස් ජීවිතයේ ශ්‍රේෂ්ඨතම අදියරයන්ය. ඒ කාල සීමාවේදී **ගිහි විනයට** අනුකූලව තම චර්යාවන් පැවැත්වූවෝ අද සැනසුම් සුසුම් හෙළති. බුදු පියාණන් වහන්සේ "**සිඟාලෝවාද සූත්‍රය**" ඔස්සේ දකුණු දිශාවෙහි පෙන්වා දුන් ගුරු උතුමාණන් හට, තමා ළමා කාලයේදී යුතුකම් ඉටු කළ ආකාරය සිහිපත් වෙයි. සිතට දැනෙන්නේ පුදුමාකාර සංහිඳියාවකි.

1. උට්ඨානෙන (by rising from the seat)

2. උපට්ඨානෙන (by attentive hearing)

3. සුස්සූසාය (by attending on them)

4. පාරිචරියාය (by accepting advice)

5. සක්කච්චං සිප්පං පටිග්ගහණේන (by establishing knowledge)

කීකරු ශිෂ්‍යයෙකු ලෙසින් හුනස්නෙන් නැගී සිටි ආකාරය, ශිල්ප ශාස්ත්‍ර ලබපු ආකාරය, ගුරුවරයා විඩාවට පත් නොකොට හැකි පරිද්දෙන් ගුරුවරයාට සහයෝගය දුන් ආකාරය, අවවාදයට මනාව සවන් දී අවවාදයෙහි පිහිටි ආකාරය, මනා ලෙස ශිල්ප ශාස්ත්‍රය පිහිටුවා ගත් ආකාරය, එකින් එක සිහිපත් වෙයි. තමාගේ නොමේරූ හිස් මොළය එදා දැනුම් සම්භාරයකින් **උද්දීපනය** කළ ආකාරයත්, පසුකාලීනව එහි උපරිම ඵල ලැබූ ආකාරයත් සිහිපත්වන විට, හුනස්නෙන් නැගිට ගැනීමට අද වාරු නැතත් කෘතඥ පූර්වක සත්පුරුෂයා දෑත් නළලෙහි තබා, තමාට ශිල්ප දුන් ගුරුවරුනට හිස නමා ආචාර කරයි. එම ගුරුවරු අද ජීවතුන් අතර නැති වුවද, අදෘශ්‍යමාන බලවේගයක් මගින් ආශිර්වාද ඔහු කරා සම්ප්‍රේෂණය වන බව ඔහු දනී. "**The teachers filled our empty minds with multifarious knowledge**" සත්පුරුෂ හද තුළ මෙවැනි මතකයන් නිතර රැව් පිළිරැව් දෙයි. සිතෙහි ඇත්තේ **විශ්මිත ප්‍රබෝධයකි.**

"ප්‍රවංක" දශකයේ සිටින ගුණබර වැඩිහිටියෙකුගේ අභිමානවත් අත්දැකීම් වලට සවන් දීමට දරු මුණුපුරෝ සුවිශේෂී රුචිකත්වයක් දක්වති. යමෙකුට මෙවන් වාතාවරණයක් ලැබීමට නම් තමා මේ දක්වා ආ ගමන් මඟ ධර්මානුකූල පදනමක් ඔස්සේ විය යුතුමය. මෙලෙස අතීතය සතුටින් ආවර්ජනය කළ හැකි වීම කෙතරම් මානසික සංහිඳියාවක්ද? එදා, එම භූමිකාව තුළ දී ගිහි විනයට අනුගතව තමා ලද පන්නරය, ස්වකීය ජීවිත සාර්ථකත්වයට කෙතරම් දුරට ඉවහල් වූයේද? ජීවිතයේ පසුකාලීන දශකයන්හිදී තමා ලද සියළු ජයග්‍රහණයන්හි ගෞරවය, එම ස්ථානයට තමා ඔසවා තැබූ දයාබර ගුරු මෑණි වරුන්ට සහ ගුරු පියවරුන්ට බව වැටහෙන්නේ, සත්පුරුෂ ආර්ය ශ්‍රාවකයෙකුට පමණි. ප්‍රවංක දශකයේදී පවා මෙවන් සුන්දර මතකයන් අවදි වන්නේ නම් තම චිත්ත සන්තානය කෙතරම් පිවිතුරුද? ගුරුවරයා කෙරෙහි හද තුළ පවතින කෘතඥතාවය ඔද වැඩී යයි. ඔහුගේ මනස මෙන්ම ඉදිරි භවයද සුවපත් වනු නියතය.

ඒ සංසාර සාගරයෙහි උඩුගම් බලා පිහිනන චරිතයකි. ඔවුහු පිරිපුන් ප්‍රඥාවකට හිමිකම් කියති.

එහෙත් වත්මන් සමාජයේ ඇතැමුන් හට මෙවන් භාග්‍යයකට හිමිකම් කීමට වරම් නැත. හිතට සතුටක් නැත. ඔවුනට සිහිවන්නේ පාසැල්යන අවධියේදී පවා සිදුකළ දුශ්චරිතයන්මය. ඔවුහු එදා ගිහි විනයට අනුගත වූවෝ නොවෙති. තවත් පිරිසක් "වර්‍ණ දශකයට" පැමිණීමෙන් පසු අත්තනෝමතික ලෙස කටයුතු කොට ජීවිතය පරිහානිය කරා ඇද දමා ගත් මිථ්‍යා දෘෂ්ඨිකයන්ය. ඔවුන්ගේ දෘෂ්ඨි කෝණයට අනුව ඔවුන් දෙමාපියන්ගෙන් ලද ආදර්ශයක් නැත. මව් පියන්ගෙන් ලද දායාදයක් ද නැත. සියල්ල ස්වකීය උත්සාහය මත පමණක් බව කියන ඔවුහු ගුරුවරුන්ගෙන් ලද දෙය ද අසත්‍ය බව හුවා දක්වති. මව් පියන් හදා වඩා පෝෂණය කළ බව පවා ඔවුන්ට අමතකය. අසත්පුරුෂ ධර්මයට කැමති මොවුන්ගේ දෘෂ්ඨිය විකෘති වී ඇත. වයෝ වෘද්ධ මව්පියන්ට නොසළකති. වාග් ප්‍රහාර මගින් ඔවුන්ගේ සිත් පීඩාවට පත් කරති. **සියල්ල පරිහානියේ සේයාවන්ය.**

දෙමව්පියන්ගේ, ගුරුවරුන්ගේ සිත් පීඩාවට පත් කරන මෙවැන්නවුන් **වසලයින්** බවත්, දිනෙන් දිනම පරිහානියටම පත්වන බවත් අවසානයේදී අප්‍රමාණ දුක් පීඩා විඳ දුගතිගාමී වී කල්ප ලක්‍ෂ ගණන් එහි දුක් විඳින බවත්, මිනිසා කෙරෙහි පහළ වූ මහා කරුණාවෙන් බුදුපියාණන් වහන්සේ අනුදැන වදාළ සේක. (වසල සූත්‍රය 9, 10) අහෝ ! ලද මිනිස් භවයේ ඵල ලබා ගැනීමට අපොහොසත් වූ අයුරු?

හුදෙකලාව ගත කරන "**ප්‍රවංක දශකය**" පසුකරන සත්පුරුෂ ආර්ය පෘථග්ජනයාට මී ළඟට සිහිවන්නේ තමා බල දශකය හා ප්‍රඥා දශකය පසුකරද්දී දෙමව් පියන් හට කළ උපස්ථානයන්ය.

1. **තමාව පෝෂණය කරණ ලද දෙමාපියන්ට, තමා පෙරළා පෝෂණය ලබාදීම.**
   (Being supported, I shall support them)
2. **දෙමා පියන්ගේ ආව තේව ඉටු කිරීම**
   (I shall do their duties)

3. පවුල් සම්ප්‍රදාය රැකීම

(I shall keep the family lineage)

4. පරම්පරා වස්තු උරුමයට සුදුසු වීම

(I shall act in such a way as to be worthy of my inheritance.)

5. මිය ගිය ඥාතීන්ට පින් පැමිණවීම.

(I shall offer alms in honour of my departed relatives.)

නැගෙනහිර දිශාව ලෙස සැලකෙන දෙමාපියන් හට යුතුකම් ඉටුකළ යුතු ආකාරය බුදු නෙතට ගෝචර වූ අයුරු මෙලෙසින් බුදු පියාණන් වහන්සේ පෙන්වා දී ඇත. **(සිඟාලෝවාද සූත්‍රය)** මෙම යුතුකම් සමූහයද, තමා අතින් සාර්ථකව, ගතවූ දශකයන්හිදී ඉටු වී ඇත්නම් සිතට කෙතරම් සැනසීමක්ද?

එහෙත් ඇතැම් අය මෙම **"ප්‍රවංක"** දශකයේදී පසුතැවෙති. ඔවුනට අතීතය සතුටින් ආවර්ජනය කළ නොහැක. ඔවුන්ට කළ කී දෙය මැවී පෙනෙයි. **කුස ගින්නට පුතු සොයා ආ මව එළවා ගත් හැටි! මව් පියන් ශාරීරික අබල දුබලතාවෙන් පසු වෙද්දී සිතාමතාම මඟහැර ගිය හැටි! පවුල් සම්ප්‍රදාය කඩමින් හිතුවක්කාර ලෙස විවාහ ගිවිස ගත් හැටි! බලහත්කාරයෙන් දෙමව්පියන් ගේ වස්තුව උරුම කර ගත් හැටි! මිය ගිය ඥාතීන් වෙනුවෙන් දානයක් පූජාකර ගැනීමට සිතක් නූපන් හැටි! ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් පීඩිතව, මානයෙන් උදම් වී, මෝහයෙන් මුළා වී, අනුන් පහත හෙළීමට අණ වින, කොඩිවින, යන්ත්‍ර මන්ත්‍ර, හූනියම්, ගුරුකම් සහ වස්කවි ආදී දේ දීන මානසිකත්වයකින් යුතුව, එහෙත් ආරූඪ කරගත් අභිමානයකින් කළ කී හැටි.!**

"සිත නොසන්සුන්ය. භීතිය මුළු මනසම රකුසෙකු ලෙස වෙලාගෙන ඇත. සිහිවන විට පවා ගතට දැනෙන්නේ මහා විඩාබර ගතියකි. ගත වෙව්ලයි. පිළිසරණයට කිසිවෙකු නැත. කළ කී දෙය වේගයෙන් තමා පසු පසම ලුහු බඳිනු නියතය. මට එදා, මෙවන් දුෂ්ඨ සිතුවිලි පහළ වූයේ ඇයි?...... තමා ම සිතිවිලි ලෝකයේ අතරමං වෙයි."

සියල්ලක් වෛවර්ණ චිත්‍රපටයක් සේ තමා ඉදිරියේ තිර ගත වෙයි. දෙනෙත් වසා ගත්තේ වුවද එම රූපරාමු මනැස අබිමුවය. හිතට විශාල බියක් දනෙයි. සිහිනෙන් පවා තිගැස්සෙයි. ඉටුකර ගැනීමට අපොහොසත් වූ යුතුකම් හමුවේ සුසුම්ලන මෙවැන්නන් හට, භව ගමන දීර්ඝ වනු විනා කුමන සැනසීමක්ද? **"අහෝ! මාගේ ඉදිරි භවය කොයිබටද? ලද මිනිසත් භවයෙන් මා එලක් නොලද හැටි! දුගතිගාමී වීම කවරෙකුට නම් වළක්වාලිය හැකිද?"** "ප්‍රවංක දශකයේ" දී පවා මෙවන් සිතිවිලි සමුදායක අතරමං වීම **කෙතරම් අභාග්‍යයක්ද?**

මිනිසෙකු වශයෙන් ඉපදුන ද, සිත, කය, වචනය තිදොරින් තිරිසන් වැඩ කරන්නා, තිරිසනෙකු ලෙසම මිය පරලොව යයි. සිත, කය, වචනය තිදොරින් ප්‍රේතයෙකු ලෙස හැසිරෙන්නා ප්‍රේතයෙකු ලෙසින්ම මිය පරලොව යයි. බුද්ධියට මුල්තැනදී සිත, කය, වචනය තිදොරින් මිනිසෙකු ලෙස කටයුතු කරන්නා මිනිසෙකු ලෙසින්ම මිය පරලොව යයි. මිනිසෙකු ලෙස ඉපිද දශ කුසලයන්හි නිරත වෙමින් පරහිතකාමී සේවයන්හි ද යෙදෙන්නෝ මිහිපිට උපන් දෙවියන් මෙනි. ඔවුන්ගේ ආකල්ප දේව ආකල්පයන්ය. නිතර සද්ධර්මයට සවන් දෙන ඔවුහු නැවත නැවතත් යහපත් ක්‍රියාවන්හිම යෙදෙති. ඔවුන්ගේ ඇවතුම් පැවතුම් සියල්ල මනුෂ්‍යත්වය ඉක්ම වූ දේව, බ්‍රහ්ම තල වලට ගැලපෙයි. ඔවුහු දේවත්වයෙන්ම මිය පරලොව යති. ඒ බුද්ධ වචනයයි.

හුදකලාව ගත කරන ප්‍රවංක දශකය පසුකරන සත්පුරුෂ ආර්ය පෘථග්ජනයාට මීළඟට සිහිවන්නේ තමා සිය **බිරිඳට/ස්වාමියාට** කළ යුතුකම්ය. මේ අදියරේදී තමාට සමීපව සිටි පිරිස ටිකෙන් ටික දුරස්ථ වී ඇත. ස්වාමියාට බිරිඳ විනා, බිරිඳට ස්වාමියා විනා අන් කිසිවකු නොමැති බව බොහෝ දෙනෙකුට මනාව අවබෝධ වන්නේද මෙම අදියරට පා තැබූ පසුවය. තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ යහපත් ගිහි දිවියකට අවශ්‍ය සියළු පැතිකඩවල් මෙතරම් විශ්ලේෂණාත්මකව අනු දන වදාළ ආකාරය කෙතරම් විශ්මය ජනකද? බුදු මඟ ගමන් ගත් කිසිවෙකු පරාජය නොවනු ඇත. අප විසින් කළ යුතුව ඇත්තේ මංමුළා නොවී උත්සාහවන්තව ගමන් කිරීම පමණි.

බල දශකයේ යුග දිවිය බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් ගිහි විනයට අනුව සාර්ථක ලෙස ගත කළ සත්පුරුෂ ආර්ය ශ්‍රාවකයා **"ප්‍රවංක දශකයේ"** දී අතීතය සතුටින් ආවර්ජනය කරයි. සිය යුතුකම් සියල්ල ධර්මයට අනුගතව

ඉටු වී ඇත්දැයි ඔහු විමසුම් නුවණින් මෙනෙහි කරයි. ඒ පිළිබඳව තෘප්තිමත් විය හැකි නම් සිය ගමනාන්තය සුගතියයි. ලද මිනිසත් භවයේ නිසි ඵල ලැබුවෝ මාර බන්ධනයෙන් නිදහස් වෙති.

ස්වභාවයෙන්ම මිනිසාගේ සිත පවට බරය. අයාලේ යාමට ඉඩ හරින්නේ නම්, තමා විසින් තමාටම සිදු කර ගනු ලබන්නේ විශාල හානියකි. එදිනෙදා ජීවිතයේදී මෙම සිත ක්‍රමයෙන් පුහුණු කළ යුතු බව බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළේ එබැවිනි. විටෙක සිත කුළු මීමෙකුට උපමා කරන බුදු පියාණන් වහන්සේ මෙය කෙසේ හෝ පාලනය කරගත යුතු හෙයින් ඒ සඳහා විවිධ මාර්ගෝපදේශ පෙන්වා වදාළහ.

එහෙත් ජීවිතයේ අවසාන අදියරට ළඟා වී සිටින ඇතැම් අන්ධබාල පෘතග්ජනයින්, පිරිසිදු මනසින් උදෑසන ලෝ සතුන්හට මෛත්‍රී වඩනවා වෙනුවට නිදි යහනේ සිටම දෝතින් වැළඳ ගන්නේ **"ස්මාර්ට් ෆෝනය යි"** අළුයම සිදු කළ යුතු මෛත්‍රී භාවනාව පවා අමතක කරන මොවුහු නූතන මෙවලම ඔස්සේ සැහෙන දුරක් සංචරණය කරති. ශරීර කෘත්‍යය වැනි කළයුතුම දෛනික කාර්යයන් පවා අමතක වී යයි. මංමුළා වූ කුළු මීමුන් සේය. යමක් ඇසුවේ වුවද අසන පුද්ගලයාගේ ඇඟට කඩා පනී. අසන දෙය ඇසෙන්නේද නැත. පිළිතුරු ලැබෙන්නේ වෙනත් දෙයකටය. මුළු දවසම ගෙවා දමන්නේ විකෘති මානසිකත්වයකිනි.

නවීකරණය වීමේ වරදක් නැත. එහෙත් ජීවත් වීමට ඇති කාල සීමාව ඉතා කෙටි බවත්, තමා මේ නතර වී සිටින්නේ අතර මඟ බවත්, තව බොහෝ දුර යාමට ඇති බවත්, මෙම සසර ගමන නවතා ගන්නා තෙක්, තමා පසු පස ලුහුබඳින්නේ දුකම බවත් මේ මිනිසත් භවයේදී අවබෝධ නොවීම **කෙතරම් අභාග්‍යයක්ද?**

දැඩි වීර්යයෙන් යුතුව කාලය කළමනාකරණය කරගෙන, ස්වයං පාලනයකින් යුතුව, ධර්මයට අනුගත නොවන්නේ නම්, එවැනි පාපතරයින් සුගතිගාමී කරවීමට, එදා ජීවමානව වැඩසිටි බුදුපියාණන් වහන්සේට පවා නොහැකි වූ බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි. ජේතවනාරාමය අසළ ඌරන් මරා විකිණීම ජීවනෝපාය කරගත් **චුන්ද සූකර** නමැති මස් වැද්දාගේ කථාවෙන් එය මනාව පැහැදිලිය. මධුර මනෝහර දහම් හඬ නිරන්තරයෙන් සවනත ගැටුනේ වුවද, චුන්ද සූකර කුල්මත් වූයේ ජීවිතක්ෂයට පත්වන ඌරන්ගේ මර ලතෝනි හඬෙනි. අවසානයේදී චුන්ද

සූකර මරණයට පත් වී ඇත්තේද දින ගණනාවක්ම මරලතෝනි දෙමින් බියපත්ව සිහි විකල්ව වධ බන්ධනයට පාත්‍ර වූ ඌරන් කෑගසන හඬින්ම යටිගිරියෙන් කෑගසමින්ය. දිට්ඨ ධම්ම වේදනීය කර්ම ඵල ඔහු කරා පැමිණියේ ධර්මයේ සත්‍යය ලොවට හෙළි දක්වමිනි. මිනිසත් භවයේ ශ්‍රේෂ්ඨත්වය වැළලී ගිය හැටි! **කෙතරම් අනුවේදනීය ද?**

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළ සෑම වදනකින්ම අමා රසය ගලා හැළෙයි. මිනිසාගේ විමුක්තිය පිණිසම ගලා හැළෙන්නා වූ එම අමා දහරින් එක දිය දෝතක් හෝ පානය කිරීමට තරම්වත් වරම් නොලද්දෝ බහුලය. සුගතගාමී වන්නේ ඉතා සීමිත පිරිසක් පමණි.

අන්ධ භූතො අයං ලොකො - තනුකෙත්ථ විපස්සති
සකුන්තො ජාලමුත්තොව - අප්පො සග්ගාය ගච්ඡති

(ධ.ප. ලෝක වග්ග)

මේ ලෝ වැස්සා මෝහයෙන් අන්ධය. මෙහි ටික දෙනෙක් පමණක් පඤ්චස්කන්ධය අනිත්‍යාදී වශයෙන් නිවැරදිව දකිති. දැලකින් මිදුන කුරුල්ලන් මෙන් ටික දෙනෙක් පමණක් ස්වර්ගයට යති.

The world is engrossed in darkness. Only a few see things clearly. Like birds escaping from a net only a few would go to a blissful state, after death.

යම් කෙනෙකුට කල්‍යාණ මිත්‍ර ඇසුරක් ලැබෙන්නේ නම් මෙම මෝහාන්ධකාරයෙන් මිදීමට මඟ පෑදෙයි. එහෙත් මෝහයෙන් මුළා වී, ද්වේශයෙන් වියරු වැටී, රාගයෙන් උමතු වී ඇත්තෙකුට කල්‍යාණ මිත්‍රයා හඳුනා ගැනීම ඉතා අසීරුය. ඒ ස්වකීය දෘෂ්ඨි කෝණයෙන්ම ඔවුන් දෙස ද බලන හෙයිනි. බුදු පියාණන් වහන්සේට පවා යශෝධරා දේවියගේ සොහොයුරු වූ දේවදත්ත නිරයගාමී වීම වළකාගත නොහැකී වූ බව ධර්මයේ සඳහන්ය.

තමාගේ ගැලවුම්කරු තමාමය. බුදු පියාණන් වහන්සේ විවිධ පැතිකඩ ඔස්සේ මඟ පෙන්වා ඇත. පහසු තොටුපළකින් මෙම සදහම්

සයුරට ප්‍රවිෂ්ඨ වී මන්දෝත්සාහී නොවී දැඩි වීර්යයෙන් යුතුව තරණය කළ යුතුමය. නො එසේ නම් ලද මිනිසත් භවයෙන් නිසි ඵල නොලැබූ අභාග්‍ය සම්පන්න පිරිසක් ලෙසින් නිරයගාමීව තව තවත් සසර දික් කර ගැනීමට සිදුවනු නොඅනුමානය.

ගිහි ජීවිතයේ මූලික පදනම ලෙසින් සිල් පද 5ක් පමණක් අනුදැන වදාළ බුදුපියාණන් වහන්සේ එහි නිවැරදිව පිහිටන්නා හට පියවරෙන් පියවර, අඩියරෙන් අඩියර ඉදිරියට යාමට මඟ පෙන්වා ඇත්තේ කෙතරම් නිරවුල් ලෙසද? ධර්මය සන්දිට්ඨිකය. මුල සිට අග දක්වා ඉතා පැහැදිලිව සැළසුම් ගත කර ඇත. අකාලිකය, ඒහි පස්සිකය, ඕපනයිකය. නිර්වාණය දක්වාම ගමන් කළ හැකි පැහැදිලි මාවතකි.

(Dhamma is perfectly expounded from beginning to the end. It exists and can be seen: not limited to a certain period, inviting one to come and see, leading onwards to Nibbana; to be individually realized by the wise.)

මෙපමණ ලස්සන දහමක්, මෙපමණ පැහැදිලි දහමක් නෙත් අබිමුව තිබියදී, මංමුළා වූවන්සේ තව දුරටත් අඳුරේ ඉබාගාතේ යා යුතු නැත. **සිත, කය, වචනය.** තුන් දොරටම වාරණ යොදා ගත්තවුන් අද සමාජයේ නැත්තේ නොවේ. මත් වතුරට ඇබ්බැහි වී සිටි ඇතැමුන් අද එය මුළුමනින්ම නවතා දමා ඇත. තුන් වේලම කුස පිරී ඉතිරී යන සේ බත් අනුභව කළ ඇතැමුන් කෑම වේල් ගණන එකකට හෝ දෙකකට සීමා කර ඇත. තම රුධිරය දන් නොදුන් ඇතැමුන් අද රුධිරය දන් දීමට පෙළඹී ඇත. ද්වේෂයෙන් දැවි දැවී, මානයෙන් මුළාවී අනුන් පහත හෙළීමට වෛර දැරූ බොහෝ දෙනෙකු ඒවායේ ආදීනව දැක සුචරිතයට අනුගතව ඇත. තමාටවත්, අනුන්ටවත් ඵලක් නැති **දෙතිස් කථා** වල නිරතව සිටි ඇතැමුන් අද **දස කථා** වලට වචනය සීමා කර ගෙන ඇත. ධර්මය දැකීමේ ලාභය ඔවුහු අද සතුටින් භුක්ති විඳිති. ඔවුන්ගේ ගත සිත ඉතා සැහැල්ලු බවට පත්ව ඇත. මිනිසාට කළ නොහැක්කක් නැත. අවශ්‍ය වන්නේ අධිෂ්ඨානය සහ වීර්යය පමණි.

ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල වූ ශ්‍රද්ධාවෙන් යුතුව, බුදු මඟ පා නගන්නෙකුට සිය ජයග්‍රාහී ගමනාන්තය දිස්වෙයි. එතරම් පැහැදිලි සූත්‍ර දේශනාවන් ධර්මය තුළ අන්තර්ගතය. **කරණීය මෙත්ත, මහා මඞ්ගල,**

පරාභව, වසල, සිඟාලෝවාද, වත්ථූපම ආදී සියළුම සූත්‍ර ඔස්සේ බුදු පියාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ ලද මිනිස් භවයෙන් නිසි ඵල ලැබීමට මිනිසා විසින් කළයුතු දේ සහ නොකළයුතු දේය. අවම වශයෙන් **එක් සූත්‍රයක** අන්තර්ගත කරුණු පිරිසිඳ දකින්නේ නම් එයම ස්වකීය ආත්ම ජයග්‍රහණයට හේතුවනු නොඅනුමානය.

ජීවිතයේ අවසාන අදියරයන්හිදී සිදු කරන මතකාවර්ජනය ඇතැම්විට තමාගේ අයහපතට හේතුවිය හැකියි. අතීතය ආවර්ජනය කරමින් ප්‍රමෝදයට පත්වීමට, සැනසීමට යමක් එම චිත්ත සන්තානය තුළ නොමැත්තේ නම් එය ආවර්ජනය කිරීමෙන් ඵලක් නැත. එය තමාගේ අයහපතටම හේතු වනු ඇත. එබැවින් මෙම අවසාන අදියරේදීවත් පවිටු අදහස් දුරලා ධර්මය දැකීමට වෙහෙස විය යුතුමය. එතුළින් සිතට දැනෙන්නේ අප්‍රමාණ සතුටකි. ඒ උතුම්ම ලාභයයි.

අප්‍රමාදීව කුසල් සිත් වඩමු.

නිරාමිස සතුටකින් ඔබ්බට ලොවක් ඇත එය දිනා ගන්නේ
දිරායන මේ සිරුර පිළිබඳ යථා දැක්මක් ලබා ගන්නේ
කිරා ගන්නට කරපු කී දෙය, මොහොත ටික ටික ළඟා වන්නේ
විරා ගී සිත ශක්තිමත් නම්, නොමැත කිසි විට බිය දැනෙන්නේ

පුරාලන පාරමී දම් බල දිවිය සරු කර තබනවාමයි
නිවාලන හද තුළින් තව තව කුසල් පිං රැස් කෙරෙනවාමයි
නිරාමිස සැනසුමක් ලබමින් දහම් මඟ පිය නගනවාමයි
පුරා හද සැනසුමක් ඇති විට දොරටු නිවනේ ඇරෙනවාමයි

දිනපතා බුදු සමිඳු නමදින දනන් යොමු වන්නේය දහමට
දුප්පතා වුව දහම් රසයෙන් පිබිදිලා එන්නේය කඳිමට
බලවතා තම බලය යෙදුවොත් ධර්ම පථයෙන් වෙනත් පසෙකට
ධනවතා වුව සියළු සම්පත් ගසා ගෙන යයි නොසිතු විලසට

තමා වෙත ශක්තිය ලබා දුන් දෙමා පිය නිති සිහි කරන්නට
පමා විය යුතු නොමැත සුදණෙනි, මඟක් හෙළි වී තිබෙයි දක්නට
යොමා නෙත් හදවතින් දක්නා විටදි පරහට සරණ වන්නට
මමායනයට බැරිය කිසිවක් ළඟ තබා ගෙන පොදි බඳින්නට

පරම යුතුකම ලෙසට අනුනට පිහිට වන්නට නැඹුරු වේවා!
සරණ යන්නට බුදුන්, දම්, සඟ චේතනාවන් පහළ වේවා!
දරණ ආයුෂ බොහෝ කල් නැත, ධර්මයෙන් සිත් පහන් වේවා!
වරණ, යහපත් පාදකය කොට, දැනුම ඒ මත ගොඩ නැගේවා!

සාධු ! සාධු ! සාධු !

11

මෝහමූල දශකය (9) - The Silly Decade

මෙම මෝහමූල දශකය ජීවිතයේ නමවන (9) දශකයයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මෝහයෙන් මුළා වූවකුසේ මය. මෝහයෙන් මුළාවූ තැනැත්තා කරන කියන දේ නොදනී. තැන නොතැන නොදනී. මිනිස් දිවියේ අවසන් භාගයට ඉතාමත් ආසන්නය. මතක ශක්තිය ඉතාමත් දුර්වලය. මූලික ශරීර අවශ්‍යතා කෙරෙහිවත් අවධානයක් යොමු වන්නේ නැත. කුසට ආහාර ගත්තේ ද? නැත්ද? යන්න පවා ඔහු නොදනී. කරන කියන සෑම දෙයක්ම අනවබෝධයෙනි. දෛනික චර්යාවන් පවත්වා ගැනීමට යම් පමණක මතකයක් තිබිය හැකිය. එහෙත් එහි සාවද්‍යතාව, නිරවද්‍යතාව පිරික්සීමට සිහි ඇති වෙනත් අයෙකු සමීපව සිටීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම මෙම අදියරේදී බොහෝ දෙනෙක් දෛනිකව පෙති, කරල් වැනි බටහිර ඖෂධ වර්ග භාවිතා කරති. එබැවින් ඒවායේ නිවැරදි මාත්‍රාව පිළිබඳව කවරෙකුගේ හෝ අවධානය යොමුවිය යුතුමය. නොඑසේ නම් අමතක වීමෙන් අදාල ඖෂධය ගතයුතු වාර ගණන වැඩි හෝ අඩු විය හැක. නිවසේ සිටින තරුණ දරුවෙකුට විශාල වශයෙන් පින් රැස් කර ගත හැකි අදියරකි. වයෝ වෘද්ධ මිනිසෙකු නිවසට මිණි පහනක් සේ සළකන පින්වත් දරුවෝද සමාජයේ නැත්තේ නොවේ. ඔවුන්ගේ ජීවිත දිනෙන් දිනම සාර්ථකත්වයට පත්වන්නේ ඒ වයෝ වෘද්ධ දෙමව්පියන්ගේ සුපිරිසිදු හදවතින් ගලා හැලෙන උතුම් ආශිර්වාදයේ බල මහිමය නිසාමය.

මේ අදියරේදී මිනිසා කායික වශයෙන් අබල දුබල තාවයට පත්වීම ස්වාභාවික සංසිද්ධියකි. ඒ "හානි දශකයේ" සිට ක්‍රමානුකූලව දිරාපත් වී ගිය ආකාරයයි. එහෙත් මෙම "මෝහමූල දශකය" දක්වා මනස ප්‍රකෘති ලෙසින් පැවතුණි. මෙයින් පෙනී යන්නේද කයට වඩා මනස ප්‍රබල බවයි. එහි උපරිම ප්‍රයෝජන අප්‍රමාදීව ලබාගත්තේ නම් සුගතිය උරුමය. එහෙත් අපගේ පරම නිෂ්ඨාව විය යුත්තේ සසර ගමන පවත්වා ගැනීම නොව සසර ගමන නවත්වා ගැනීමයි. නිවන් සුවයයි. මෙම **"මෝහමූල දශකය"** ඒ සඳහා අළුතෙන් වීර්ය කළහැකි අදියරක් නොවේ.

එහෙත් තමා පසුකර ආ "**වණ්ණ දශකය**", "**බල දශකය**" සහ "**පඤ්ඤා දශකය**" තුළ යහපත් ලෙස තම සිත, කය, වචනය පවත්වාගත් ඇතැමුන් හට ඔවුන්ගේ අතීත ක්‍රියාකාරකම් පිළිබඳව ඉතා හොඳ මතකයක් පවතී. සිහි නුමුළාව, අගතියෙන් තොරව සිදුකරනු ලැබූ ඇතැම් අතීත සිද්ධීන් දින වකවානු සමඟින් නිවැරදිව ආවර්ජනය කිරීමේ සුවශේෂී මතක ශක්තියක් ඔවුන් සතුව ඇත. විටෙක සවන් දී සිටින්නවුන් මවිත කරවන සුළුය. ඇතැම් වෘද්ධ රෝගීහු වෛද්‍යවරුන් පවා මවිතයට පත් කරවන සුළු අතීත සිදුවීම් ජීවමාන ලෙසින් ආවර්ජනය කරති.

එක්තරා වෛද්‍යවරයෙකු වයෝ වෘද්ධ රෝගියෙකුගෙන් පරම්පරාගත හෝ අතීත රෝගාබාධයන් පිළිබඳව විමසූ විට, ඔහු කියා සිටියේ වයස අවුරුදු 32 දී එවකට රටේ පැවති දරුණු මැලේරියා වසංගත රෝගයෙන් තරමක් පීඩා විඳි බවත්, ඒ හැර මේ දක්වා ඔහුට කිසිම රෝගාබාධයක් වැළඳී නොමැති බවත් ය. ඔහුගේ දෛනික පුරුදු ගැන දැන ගැනීමේ අදහසින් වෛද්‍යවරයා යොමුකළ දෙවන ප්‍රශ්නය වූයේ මත්පැන් හා දුම්වැටි භාවිතය පිළිබඳවයි. ඉතාම ශ්‍රේෂ්ඨ ලීලාවෙන් ඔහු ප්‍රකාශ කරන්නට වූයේ ජීවිතයේ කිසි දිනක තමා මත්පැන් හෝ දුම් වැටියක් හෝ මුවගට ළඟා කර නැති බවයි. පින්වත් මනුෂ්‍යයෙක් කියමින් ඔහුගේ මතකය අගය කළ වෛද්‍යවරයා එතනින් පිටත්වූයේ වයෝ වෘද්ධ භාවය හැර කිසිම අසනීපයක් ඔහුට නොමැති බව පවසමිනි. කායිකව දුබල වුවද මෙවැනි මතකයන් විඤ්ඤාණ ගතව ඉදිරි භවයට ද යන අවස්ථා ඇති බව මනෝ විද්‍යාඥයින්ගේ ඇතැම් පර්යේෂණ වලින් ද හෙළිදරව් වී ඇත.

නිසි කල ධර්මාවබෝධය ලැබිය යුතුමය. බුදු පියාණන් වහන්සේ සකල ලෝ සතුන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් යුතුව **අප්‍රමාදය** පිළිබඳව සුවිශාල ධර්මස්කන්ධයක් ශ්‍රී මුඛයෙන් වදාළහ. පවත්නා ජීවිත කාලයේ යථා තතු මිනිසාට අවබෝධ කිරීමට බුදු පියාණන් වහන්සේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා විඳි දුක්, කටුක අත්දැකීම් අනල්පය. ඇට, ලේ, මස්, නහර වලින් සුසැදි මිනිස් සිරුරකට දරාගත නොහැකි අන්දමේ කටුක අත්දැකීම්, කායික වශයෙන් පමණක් නොව මානසික වශයෙන්ද උසුලා ගනිමින්, අප්‍රතිහත ධෛර්යයකින් යුතුව බුදු පියාණන් වහන්සේ වැඩිමඟ කෙතරම් සංවේදීද යන්න, අද පවා දඹදිව පුණ්‍ය භූමිය නිසිලෙස වන්දනා කරගන්නා බැතිමතෙකුට අවබෝධ කරගැනීම අසීරු නොවනු ඇත. බුදු පියාණන් වහන්සේ දස මාර සේනාව පරදවා, බුද්ධගයාවේ ඇසතු බෝ රුක මුල දී සර්වඥතා

ඥාණය අවබෝධ කරගෙන උතුම් සම්මා බුද්ධත්වයට පත්වූ මොහොත දක්වා, අවසාන භවයේදී ගත කළ සය වසරක දුෂ්කර ක්‍රියා සමයේ ලද අත්දැකීම් සමුහය අද පවා දඹදිව් තලයෙහි, ඒ ඒ ස්ථානයන්හි ජීවමාන ලෙස නිරූපිතය.

උපන් මිනිසත් භවයේදී යමෙක් ගත කළාවූ, **වර්ණ දශකය, බල දශකය, ප්‍රඥා දශකය** ආදී කාල පරාසයන් තුළ, බුදු පියාණන් වහන්සේගේ බුදු මඟෙහි මතකය ආවර්ජනය කෙරෙන විවිධ ස්ථානයන්ට ඇතුලත් 4 **අවිජහිත ස්ථාන (හතර)** වැඳ පුදා ගැනීමට අපොහොසත් වූයේ නම්, ඔහු ලද දෙනෙතෙහි ඇති ඵලය කුමක්ද? සිය ප්‍රකෘති දෙනෙතින් දැක, වැඳ පුදා පහන් සංවේගය ඇති කර ගැනීමටද, පෙර පින් තිබිය යුතුමය. එය සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වූයේ නම් කෙතරම් අභාග්‍යයක්ද? බුදු පියාණන් වහන්සේ විසින්ම මහා පරිනිබ්බාන සූත්‍රයේ දේශනා කර ඇති පරිදි සෑම සැදැහැවත් බෞද්ධයෙකු විසින්ම දැක පහන් සංවේගය ඇතිකර ගත යුතු ස්ථාන 4 හැටියට, සිදුහත් කුමරු උපන් **ලුම්බිණි සල් උයනත්**, වජිරාසන මස්තකප්‍රාප්තව උතුම් සම්බුදු පදවිය ලද **බුද්ධගයා විහාරයත්**, පස්වග මහණුන්හට ප්‍රථම ධර්ම දේශනාව දෙසා වදාළ **ඉසිපතන මිගදායත්**, 45 වසරක බුදු කිස නිමවා, උතුම් පරිනිබ්බානයට පත්වූ **කුසිනාරාවත්** පෙන්වා වදාළ සේක. මෙම ස්ථානවල නිරූපිත අනුරුව තම දෙනෙතින් දුටුවේ නම් එය මතකයට නැගෙන වාරයක් වාරයක් පාසා ඇතිවන්නේ හදවතට දරාගත නොහැකි පහන් සංවේගයකි. කුසිනාරාවේදී සිය දෙනෙතින් කඳුළක් නොසෙළූ එවන් බැතිමතෙකු මිහිපිට දැකිය නොහැක. ජීවිතයේ අවසාන මොහොතේදී, සිය මතකාවර්ජනයට මෙම සුවිශේෂී දර්ශනයන් ඉලක්ක වූයේ නම්, එම චුති සිත යහපත්ය. සුපිරිසිදුය. සුගතිය නියතය. මෙතරම් අමිල සම්පතක් සියැසින් දැක ගැනීමට අපොහොසත් වූයේ නම් උපන් භවයේ ලද විශාලතම අලාභය එයම වනු ඇත. එය පියවා ගැනීමට නැවත මිනිසත් භවයක් පිළිබඳව සිතීම පවා උගහටය.

මෙම භාග්‍යයට පිටුපානා අවාසනාවන්ත අන්ධබාලයින් අද සමාජයේ නැත්තේ නොවේ. ජීවත් වීමට ඇති කාලය මොහොතින් මොහොත ගෙවී යන බවට ඔවුන් දැනුවත් වී නැත. අවසානය පසුතැවීම පමණි. ඇතැමුන්හට දඹදිව වන්දනා ගමනක් යාමට අවස්ථාව ලැබුණ ද, එතුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන්නේ වෙනත් අරමුණුය. සංවිධායකයින්ගේ සුළු හෝ ප්‍රමාද දෝෂයක් ඔස්සේ ද්වේෂයෙන් කටයුතු කරන මෙවැන්නෝ

ගමනාන්තය දක්වාම කෝපයෙන් ද්වේෂයෙන් පසුවෙති. මානසික සංහිඳියාවක් නැත. ඇතැම් අය වාණිජමය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පටු චේතනාවන් මත භාරතය බලා පිටත්වීමට මෙය අවස්ථාවක් කර ගනිති. තවත් පිරිසක් ඉතාමත් පටු ආකල්ප ඔස්සේ, තමාද විදෙස්ගතව ඇත්තෙකු බව අනුන්ට හුවා දැක්වීමට මෙවන් අවස්ථාවක් ලබා ගනී. ඒ කිසිවෙකු මෙම වටිනා අවස්ථාව තමාට මෙලොව පරලොව දෙක්හිම අභිවෘද්ධිය සකසා ගත හැකි, දුර්ලභ ගණයේ වටිනා අවස්ථාවක් බවට දැනුවත් වී නැත. අභාග්‍යයක මහත? අවස්ථාවක් ලද මුත් කෙසේ නම් ධර්ම සංවේගය උපදවා ගන්නද?

දැන් මිනිසා පැමිණ ඇත්තේ "**මෝහ මූල දශකයටය**". ලද මිනිසත් භවයෙන් ඵල ලැබීමට ප්‍රමාද වී ඇත. මෙම අදියරට මිනිසෙකු පත්වීමට වයස්ගත වීම එකම හේතුව නොවනු ඇත. උපතත්, එය සමඟ රැගෙන එන මරණයත් අතර කාල සීමාව තුළදී අපට විවිධ රෝගා බාධයන්ට පාත්‍ර වීමට ඇති ඉඩකඩ බොහෝය. හදිසි අනතුරුවලට භාජනය වීමට ඇති සම්භාවිතාවයද එසේමය. කුමන වයසේ පසු වුවද, අපගේ ජීවිත පැවැත්මට නිශ්චිත කාල සීමාවක් තක්සේරු කළ හැක්කෙක් නැත. ජීවත් වීමට ඇති අවසාන තත්පරය මෙය විය හැක. අප විසින් කළ යුත්තේද, කළ හැක්කේද **අප්‍රමාදී වීම පමණි.**

බුදු පියාණන් වහන්සේ සෑම ධර්ම පර්යායකම මිනිසාට මෙය අවබෝධ කිරීමට ගත් වෙහෙස අපමණය.

පමාදං අප්පමාදෙන - යදා නුදති පණ්ඩිතො
පඤ්ඤා පාසාද මාරුයිහ - අසොකො සෝකිනිං පජං
පබ්බතට්ඨෝව භුම්මට්ඨෙ - ධීරො බාලෙ අවෙක්ඛති

When the wise man avoids heedlessness by being heedful, he will ascend the palace of wisdom and ,free from sorrow: will look at those sorrowing folk around him, just as a wise atop a hill sees those who down below.

යම් විටක පණ්ඩිතයා නොපමාවෙන් පමාව මඟ හරවා ගනීද, එවිට ඔහු නුවණ නමැති ප්‍රාසාදයට නැග ශෝක රහිතව, ශෝකී ජනයා දෙස බලයි. පර්වත මුදුනට නැගි අයෙක් යම්සේ බිම සිටින්නන් දකිත්ද, එසේ නුවණැත්තා බාලයන් දකී.

යමෙක් මෙවන් සත් පුරුෂ කල්‍යාණ මිත්‍රයෙක් ලැබීමට භාග්‍යවන්ත වූයේ නම් ඔහුද ජීවිතය ජයගනී. ඒ ජීවිතයේ මධ්‍ය දශකයන්හිදී අප්‍රමාදීව කටයුතු කිරීමෙනි. එදා ධර්මානුකූලව, ප්‍රඥාගෝචරව, කළයුතු කටයුතු නිසි පරිදි ඉටු කළ ඇතැම් සත්පුරුෂයන් හට මෙම **මෝහ මූල දශකයේදී** පවා, එය සතුටින් ආවර්ජනය කළ හැක.

මේ එක් සත්‍ය සිද්ධියකි. **මෝහ මූල දශකයේ** පසු වූ ඔහු සොයා ආ ලේඛකයාට අවශ්‍ය වූයේ සාර්ථක පුද්ගලයෙකුගේ චරිතාපදානය ග්‍රන්ථාරූඪ කිරීමටයි. මෙහි කථානායකයා වූයේ, වයෝ වෘද්ධ විශ්‍රාමලත් විදුහල්පති වරයෙකි. එතුමාගේ බාල කාලයේ තොරතුරු ප්‍රමාණවත් තරමින් සටහන් කරගත් ලේඛකයා අනතුරුව ප්‍රවිෂ්ඨ වූයේ **ක්‍රීඩා දශකය** ඇතුළත් පාසැල් අදියරටයි. සිය මතකය ආවර්ජනය කරමින් තමා මූලික අධ්‍යාපනය ලැබූ පාසැල ඇතුළත් වීමේ අංකය ද සමගින් ප්‍රකාශ කිරීමට ඔහුට ගත වූයේ නිමේෂයකි.

එය ද සටහන් කරගෙන **බල දශකයට** සපැමිණි ලේඛකයා විමසන්නට වූයේ ඔහුගේ වෘත්තීමය ක්ෂේත්‍රයන් පිළිබඳවයි. ආරම්භයේදීම ඔහුට දෛවෝපගතව ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු සමඟ කටයුතු කිරීමට සිදු වූ බවත්, ඉංග්‍රීසි සිංහල භාෂා දැනුම මෙන්ම අත් අකුරුවල තිබූ සුවිශේෂී පැහැදිලි භාවයත් නිසා, ගුරුපත්වීම ලැබෙන තුරුම එම ස්ථානයේම සේවය කිරීමට සිදු වූ බවත් ඔහු ප්‍රකාශ කරන්නට වූයේ නිහතමානී සතුටකිනි.

යතුරු ලියන, පරිගණක නොතිබුණ එම යුගයේ පැහැදිලි අත් අකුරු සහ භාෂා ශෛලියට අද්විතීය ස්ථානයක් හිමිව තිබූ බව අවබෝධ කරගත් ලේඛකයා මීළඟට ප්‍රවිෂ්ඨ වූයේ එතුමාගේ **ප්‍රඥා දශකයට"යි.** ඒ පිළිබඳව මතකය අවදි කළ ඔහු කියා සිටියේ ගුරු සේවයට අවතීර්ණ වීමට ලැබීම විශාල භාග්‍යයක් බවත්, එතුළින් ලද හැකි ආධ්‍යාත්මික .තෘප්තිය මෙන්ම සුවිශේෂී පන්නරය ඉතා වැදගත් බවත්ය. දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි විදුහල්පති ලෙසට කටයුතු කර ඇති ඔහු ඒ ඒ පාසැල්වල සේවය කළ වසර ගණන පවා ප්‍රකාශ කරන්නට වූයේ, එම අදියරයන්හිදී සිදු වූ සුවිශේෂී

අත්දැකීම් රසවත් ලෙස ගෙන හැර පාමිනි. නිදහස් අධ්‍යාපනය ලැබීමට පාසැලට ඇතුල්වන දරුවාට, ආරම්භයේදීම පැන්සල් සහ අභ්‍යාස පොත් දුසිමක් තමා තිළිණ කළ බවත්, දුර්වල විෂයයන් සඳහා අමතර පන්ති නොමිළයේම පැවැත්වූ බවත්, එතුළින් ලද තෘප්තිය අප්‍රමාණ බවත් අප සමග ප්‍රකාශ කළේ හද පිරි සතුටිනි.

කාලය ගත වන අයුරු පවා නොදැනී ගිය ද ලේඛකයාට සිහිපත් වූයේ ඇතැම් වත්මන් විදුහල්පතිවරු සිසු දරුවෙකු පාසැලට ඇතුළු කරගැනීමේදී අනුගමනය කරන නිර්ලජ්ජිත ක්‍රම වේදයයි. "**බළලුන් ලවා කොස් ඇට බෑවීම**" ට හොඳින් දන්නා මොවුන් තමා තිරය පිටුපස හිඳ, දරුවා ඇතුලත් කිරීමට එන දෙමව් පියන්ගෙන් අල්ලස් ලබාගන්නේ ඉතාමත් සූක්ෂමවය. එය සුළු ප්‍රමාණයේ නොවන අතර වසර 5 ක විදුහල්පති ධූරයක් දැරුවේ නම් අවම වශයෙන් තට්ටු 5 ක ගොඩනැගිල්ලක් හෝ අක්කර 5 ක බිම් කොටසක් මිළයට ගත හැකි ආර්ථික ස්ථාවරයකට පත් වන්නේ හතු පිපෙන්නාක් මෙනි. බුදු මුවින් දේශනා කළ "**ඌනො ලෝකෝ අතිත්ථෝ තණ්හා දාසො**" යන වදන් කීපය ප්‍රකාශ කරමින් නූතන විදුහල්පති භූමිකාව හෙළා දැක, දීර්ඝ සුසුමක් හෙළූ ලේඛකයා මීළඟට අවතීර්ණ වූයේ "**හානි දශකයටයි.**"

"**හානි දශකයේ**" සිය විශ්‍රාම දිවිය පිළිබඳව මතකය ආවර්ජනය කළ ඔහු කියා සිටියේ එම අදියර කායික මෙන්ම මානසික සුවයක් වින්දනය කළ යුගයක් බවයි. ඒ වන විට ස්වකීය දරුවන් නිසි රැකියා වලට යොමුකර තිබූ බවත්, ආවාහ විවාහ කටයුතුද අවසන් කර තිබූ බවත්, බුදුපියාණන් වහන්සේ **සිඟාලෝවාද සූත්‍රයේ** පෙන්වා දී ඇති පරිදි, දේපළ ද පවරා දී, සියළු යුතුකම් දරුවන් වෙනුවෙන් ඉටුකර අවසන් වූ පියෙකු ලෙස, ආත්ම තෘප්තියකින් පසු වූ බවත්, සිහිපත් කළේ, ඒ ඒ කටයුතුවල දින වකවානුද නිවැරදි ලෙස ප්‍රකාශ කරමිනි. ගත වූ වසරවල කිසිදු දින පොතක් ඒ සඳහා ඔහුට අවශ්‍ය නොවිණි.

තමා පැමිණි අරමුණ වඩාත් මල් ඵල ගැන්වීමේ අදහසින් ලේඛකයා අනතුරුව ප්‍රවිශ්ඨ වූයේ "**වංක දශකයටයි.**" ඒ වනවිට, මුණුබුරු, මිනිබිරියන්ගේ අධ්‍යාපනයට අත හිත දුන් බවත්, ඔවුන්ගේ විභාග ජයග්‍රහණ හමුවේ නිහතමානී සතුටක් ලැබූ බවත්, ඒ සෑම අවස්ථාවකම ඔවුන්ට ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් යහපතම ප්‍රාර්ථනා කළ බවත් ප්‍රකාශ කරමින් 'ධර්මය' තුළින් ලද නොහැකි ජයග්‍රහණයක් නොමැති බව සැමට පසක්කර දුන් බවත් ප්‍රකාශ කළේය.

ප්‍රමෝදයට පත් ලේඛකයා අනතුරුව ප්‍රවිෂ්ඨ වූයේ "**ප්‍රවංක දශකයටයි**".

එම අදියරේදී සදහම් ග්‍රන්ථ පරිශීලනයට වඩාත් නැඹුරු වූ බවත්, දහම් පාසල් ළමයින් වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කටයුතු කළ බවත් පැවසූ ඔහු කියා සිටියේ තම දරුවන්ට මෙන්ම සියළුම සිසු දරුවන්ටත්, ස්වාමි දියණියටත්, නෑදෑ හිත මිතුරන්ට, යහළු මිත්‍රාදීන්ටත්, පැවිදි උතුමන්ටත්, දාසි දස්සන්ටත් **සිඟාලෝවාද සූත්‍රයේ** දේශිත සියළු යුතුකම් ඉටුවී ඇත්දැයි පසු විපරමක් කළ බවත්ය. ප්‍රමාද දෝෂයකින් හෝ කිසිවක් ගිලිහී නොතිබූ බව කියමින් ඔහු "**ප්‍රවංක දශකය**" ද ආවර්ජනය කළේ ඉමහත් සතුටිනි.

අමන්දානන්දයට පත් වූ ලේඛකයා, පවත්නා වත්මන් අදියර වූ "**මෝහමූල දශකයට**" ප්‍රවිෂ්ඨ විය.

තොරතුරු විමසීමේදී ඔහු කියා සිටියේ තමාට ඒ ඒ මොහොතේ කරන කියන දේවල් පිළිබඳව වැඩි මතකයක් නැති බවයි. එහෙත් ඒ පිළිබඳව තමා කනස්සල්ලට නොපැමිණෙන බවත්, ඔහුට නිරන්තරයෙන්ම සිහිපත් වන්නේ මේ දක්වා ආ ගමන් මග පිළිබඳවත්, විශේෂයෙන්ම පුරා දින 41 ක් ගතකරමින්, සිය **ප්‍රඥා දශකයේදී** සහභාගී වූ **දඹදිව දීර්ඝ වන්දනා චාරිකාව** බවත් සතුටින් සිහිපත් කළ ඔහු ස්වකීය උත්සාහයෙන් සම්පාදනය කළ "**දඹදිව දීර්ඝ වන්දනා**" යන මැයෙන් සම්පාදිත පොත් පිංචක් ඇති බව කියමින් සිය කාමරය දෙසට පිය නැගීය. ඉතා සතුටින් එහි පිටපතක් ගෙනැවිත් ලේඛකයා අත තැබූ ඔහු කියා සිටියේ තවත් යම් කිසි තොරතුරක් අවශ්‍ය වේ නම් **අප්‍රමාදීව** අසා දැනගන්නා ලෙසය. "**අප්‍රමාදීව**" යන වචනයට වැඩි කැමැත්තක් දැක්වූ ඔහු ජීවිතයේ සියළු යුතුකම් හා වගකීම් **අප්‍රමාදීව** සාක්ෂාත් කර ගෙන ඇති බව සැමට අවබෝධ වීමට වෙනත් තොරතුරු අවශ්‍ය නොවුණි.

කටහඬ අවදි කළ ලේඛකයා කියා සිටියේ තමා ද **අප්‍රමාදීව** මෙම අභිවන්දනයට පාත්‍ර වියයුතු චරිත කථාව ග්‍රන්ථකරණයට යොමු කරන බවයි. එයට ප්‍රතිචාර දක්වමින් ඔහු කියා සිටියේ එම ග්‍රන්ථය තුළින්, කවුරු හෝ, කවදා හෝ කුමන හෝ දෙයක් ඉගෙන ගන්නා බවත්, එහි පින ග්‍රන්ථ කතුවරයා කරා එන බවත්ය. එම වදන් ඔස්සේ නව ජවයක් හා දැනුම් සම්භාරයක් ලබා ගනිමින් උද්යෝගීමත් වූ ලේඛකයා එතනින් පිටත්වූයේ

එම වයෝ වෘද්ධ විදුහල්පති පියතුමාණන් හට පසඟ පිහිටුවා වැඳ උතුම් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ද ලබා ගැනීමෙන් අනතුරුව ය.

* * *

මෙම **'මෝහ මූල'** දශකයේදී මෙවන් අතීතයක මතකාවර්ජනයක් කළ හැකි වීම කෙතරම් ශ්‍රේෂ්ඨද? තම දෛනික චර්යා රටාව පවා සමාජයට දායාද කර, ලැබුණා වූ මිනිස් භවයෙන් සමුගන්නෝ අද සමාජයේ ඉතාමත් දුර්ලභය.

රාගයෙන් වල්මත්ව, ද්වේශයෙන් දැවි දැවී, මෝහයෙන් මුළාවී මතකාවර්ජන සමාජගත කිරීමට වෙර දරන අන්ධබාල පව්ටු පුඟුලෝ අද සමාජයේ හතු පිපෙන්නාක් මෙනි. ඕපා දූප විනා, ගත යුතු කිසිම ආදර්ශයක් එවා තුළ නැත. තමා ළඟ ඇති දෙයක් විනා නැති දෙයක් සමාජයට දිය නොහැකි හෙයින්, බුද්ධිමත් ජන සමාජය එවැන්නන්ට අනුකම්පා කරනු ඇත. එහෙත් ඔවුන්ගේ ජීවිතයේ අවසාන භාගයේදී ද එම දුෂ්චරිත සිහිපත් වීමෙන් අපායගාමී වීම කාහට නම් වළක්වාලිය හැකිද? **අභාග්‍යයක මහත ?**

මෙම කෙටි කාලීන මිනිස් ජීවිතයේ නිසි ඵල නොලබා, අනුන්ගේ ඕපාදූප එක්රැස් කරමින්, ඒවා සන්නිවේදනය කරමින් ලබන පහත් රුචිකත්වයෙන් පිනා යන අන්ධබාලයින් යහ මඟට ගැනීමට දරන්නා වූ උත්සාහය, අසූචි වළක එරී සිටින සත්ත්වයෙකු ගොඩ ගැනීමට දරන්නා වූ තැත මෙනි.

මෙලොව පරලොව දෙක්හිම යහපත පිණිස මිනිසා **සිත, කය, වචනය** තිදොර පාලනය කර ගැනීමට උත්සුක විය යුතුයි. තමාටත් ඵලක් නැති අනුන්ටත් වැඩක් නැති කථා සියල්ලෙන්ම වැළකී තම වචනය **අප්පිච්ඡ කථා** - talk about fewnes of wishes, **සන්තුට්ඨි කථා** - talk about contentment, **පවිවේක කථා** - talk about on seclusion, **අසන්සග්ග කථා** - talk about on aloofness of society , **වීර්යාරම්භ කථා** - talk on arousing energy , **සීල කථා** - talk on attainment of virtue, **සමාධි කථා** - talk on the attainment of concentration , **ප්‍රඥා කථා** - talk on attainment of wisdom, **විමුක්ති කථා** - talk on the attainment of deliverance, **විමුක්ති ඤාණ දර්ශන කථා** - talk on the attainment of knowledge and vision of deliverance, ආදී වූ

10 කථාවන්ට සීමා වන්නේ නම්, ඒ ඔස්සේ අභිධර්ම පිටකයේ විසුද්ධි මාර්ගයෙහි පැහැදිලිව පෙන්වා දී ඇති **පටිපදා ඥාණ දස්සන විසුද්ධි මාර්ගයට** පවා මාහැඟි ප්‍රවිෂ්ඨයක් සකසා ගත හැක. සසර ගමන නවතා ගත හැකි එකම මඟ ධර්මාවබෝධයයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. මෙහි එන **"සම්මා වාචා"** හෙවත් යහපත් වචනය **සීල, සමාධි ප්‍රඥා** තුනෙන්, **"සීලය"** කෙරෙහි මහත් වූ බලපෑමක් ඇති කරයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩන්නාට සම්පප්‍රලාප, ඕපා දූප, බලවත් පලිබෝධයන්ය.

ශ්‍රද්ධා ශීල සම්පන්න ගිහි බැතිමතෙකු විසින් වළක්වා ගත යුතු දෙතිස් කථා මෙසේය. A lay devotee must refrain from 32 types of unskillful talks. They are as follows. **(මජ්ඣිම නිකාය - උපරිපන්නාසකය)**

1. රාජ කථා - Raja katha -Talk about kings,
2. චෝර කථා - Chora Katha - Talk about robbers,
3. මහා මාත්‍ය කථා - Mahamachcha Katha - Talk about ministers,
4. සේනා කථා - Sena Katha - Talk about armies,
5. භය කථා - Bhaya Katha - Talk about fears,
6. යුධ කථා - Uadda Katha - Talk about wars,
7. ආනා කථා (කෑම පිළිබඳ) - Anna Katha - Talk about eatables,
8. පානා කථා (බීම පිළිබඳ) - Paana Katha - Talk about drinks,
9. වත්ත කථා (වස්ත්‍ර පිළිබඳ) - Waththa Talk about clothes,
10. මාලා කථා - Mala Katha - Talk about flowers,
11. ගන්ධ කථා - Ghanda Katha - Talk about scents,
12. ඤාති කථා - Talk about relations,
13. යාන කථා - Yana Katha - Talk about Vehicles or Conveyances,
14. ගාම කථා - Gama Katha - Talk about villages,
15. නිගාම කථා - Nigama Katha - Talk about hamlets,

16. නගරාලංකාර කථා - Nagaralankara Katha-Talk about towns,

17. ජනපද කථා - Janapada Katha - Talk about states,

18. ඉත්ථි කථා - Eththi Katha - Talk about women,

19. ශූර කථා - Shura Katha - Talk about heroes,

20. සුරා කථා - Sura Katha - Talk about intoxicants,

21. විසික කථා - Visika Katha - gossip at the street corner and…

22. කුම්භට්ඨාන කථා - Kumbattana Katha - gossip at the well,

23. පුබ්බා පේත කථා - Pubba Petha Katha - Talk of those dead and gone,

24. නානත්ථ කථා - Narnatta Katha -various useless talk apart from these 32.

25. ලොකයිකික කථා - Lokaikika Katha - Talk about the beginning of the world,

26. සමුද්ධකයිකික කථා - Samuddakkaikika Katha - Talk about the ocean,

27. ශාශ්වත දිට්ඨි කථා - Shaswatha Ditti Katha - Talk about eternal soul after death,

28. උච්ඡේද දිට්ඨි කථා - Uchcheda Ditti Katha - Talk about annihilation of soul after death,

29. වෘධි කථා - Wuridi Katha - Talking about others prosperity,

30. හානි කථා - Hani Katha - Talking about others debacle or less fortune,

31. පංචකාම සුඛ කථා - Pancha Kama Suka Katha : Talking about various sensuous pleasures,

32. අත්තකිලමථානුයෝගී කථා - Attakilamathanuyogi Katha - Talking about Self mortification as a form of liberation.

By engaging in the above 32 types of talks, one will develop greed (lobha), illwill (Dosa), ignorance (Moha) which are hazardous to the eight fold path of Nibbana. There fore one must abstain from these 32 types of talks & engage in 10 types of useful talks Preached in Rathavineeta Sutta in Majjima Nikaya .

මෙම දෙතිස් කථා වල යෙදීමෙන් කෙනෙකු තුළ ලෝභ, ද්වේෂ, මෝහ වැඩෙන අතර, එය නිවන් මඟට (ආර්ය අෂ්ඨාංගික මාර්ගයට) බාධාවකි. එබැවින් මෙම දෙතිස් (32) ආකාර කථාවන්ගෙන් වැළකී, ඉහතින් දක්වා ඇති දස (10) ආකාර ඵලදායී කථාවන්හි යෙදීම, මෙලොව පරලොව දෙක්හිම යහපත පිණිසම වේ. බුදුපියාණන් වහන්සේ සකල ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන්, මිනිසාගේ "වාග් සංවරයට" මහත් සේ ඉවහල් වන මෙම ධර්ම පර්යාය විශ්වයට මුදාහළ සේක.

බුදු පියාණන් වහන්සේ මේ සසර දුක් විඳින සත්ත්වයා කෙරෙහි පතළ අපරිමිත කරුණාවෙන් අපට යා යුතු මඟ පෙන්වා වදාළහ. තමා තනි තනිව එහි ගමන් කිරීමට වෙර දැරිය යුතුයි. (මග්ග වග්ගය) එසේ උත්සාහ නොකරන්නා අඳුරෙන් අඳුරටම යන බව ද බුදු පියාණන් වහන්සේ පෙන්වා වදාළහ. මෙවන් පැහැදිලි ලස්සන ධර්මයක් අප ඉදිරියේ ජීවමානව පවතිද්දී එය දැකීමට අපගේ මනස විවර නොවන්නේ නම් කෙතරම් අවාසනාවක් ද?

තෙරුවන් සරණ යමින්, පංච ශීල ප්‍රතිපත්ති දිවි හිමියෙන් සුරකිමින්, බුදු ගුණ නිතර සිහි කරමින්, පැහැදිලිවම දෘශ්‍යමාන වන, අපගේ නෙත් අබිමුව දිදුලන සදහම් මගෙහි පිය නගන ප්‍රඥාවන්තයා ශාන්ත, සුන්දර අමෘත මහා නිර්වාණ සුවය නම් ගමනාන්තය කරා නිදා පිබිදියාක් සේ සුවසේ ළඟා වෙයි.

12

සයන දශකය (10) - Bed ridden/ prone decade

මෙම සයන දශකය ජීවිතයේ අවසාන දශකයයි. බිළිඳෙකු ලෙස උපන් මිනිසා වයෝ වෘද්ධ මහල්ලෙකු ලෙසින් සයන් ගත වන අදියරයි. මෙය ලෝක ධර්මතාවයයි. සත්‍යය මෙයයි. එහෙත් බුදු කෙනෙකු ලොව පහළවන තාක්කල් මෙම "**සත්‍යය**" මෝහාන්ධකාරයෙන් වැසී පවතී. එබැවින් මිනිසාට "සත්‍යය" දැකිය නොහැක. ස්වේච්ඡාවෙන් සත්‍යය අවබෝධ කරගත නොහැක. කල්‍යාණ මිත්‍ර මඟ පෙන්වන්නෙකු සිටිය යුතුමය.

කලණ මිතුරකු හඳුන ගතහොත් දිවියෙ අර්ථය වැටහෙනා
පමණ දැන වැළකී සිටිනු ඇත දෙතිස් කථාවෙන් නොහොබිනා
සවණ ගැටෙනා විටදි නිෂ්ඵල කථා හමුවේ ගොළුවෙනා
සරණ යන්නට උතුම් තෙරුවන නිරන්තරයෙන් පෙළඹෙනා

මෙම හුදෙකලා සයන දශකය තුළ සිතිවිලි මොහොතින් මොහොත පැන නගී, පවතී, බිඳි බිඳී යයි. අතීතය සිහිපත් වෙයි. කළ කී දෙය චිත්‍රපටයක් සේ මැවී පෙනෙයි. එහෙත් එක් වදනක්වත් මුවගින් පිට කරගත නොහැක. තම ශාරීරික අවශ්‍යතාවයන් පිළිබඳව පවා ඉඟියක් පානු විනා ප්‍රකාශ කර ගත නොහැක. ඇතැම් විට එපමණකින් වත් සංඥාවක් දී ගැනීමට නොහැකිව ශරීරකෘත්‍යය පවා වැතිරී සිටින යහන මතමය. කාගේ නම් පිළිසරණක්ද? ඒ සයන දශකයේ තීව්‍ර අවධියයි. මරණය, **ආයුක්ෂය** (ආයුෂ ගෙවීමෙන්), **කර්මක්ෂය** (කර්මය ගෙවීමෙන්), **උභයක්ෂය** (ආයුෂ හා කර්මය දෙකම ගෙවී යාමෙන්), **උපච්ඡේදක** (වෙනත් බාහිර බලවේගයක් මගින්) ආදී වශයෙන් කර්මානුරූපීව මිනිසා කරා ළඟා වෙයි.

බිම්බිසාර රජතුමා බිත්ති හතරකට සීමාකර තබා ජීවිතයේ අවසාන කාලයේදී, සිය පුත් අජාසත් රජ විසින් දරුණු වද හිංසා වලට පත්කළ ආකාරය කෙතරම් ශෝචනීයද? සංසාරගත වෛරයක්, ද්වේෂයක් වේ නම් එයද ගෙවා දැමිය යුතුමය. කෙලෙස් සියල්ල දුරුකරන තුරු අපට නිවන් මඟට ප්‍රවිෂ්ඨ විය නොහැක්කේ මය. ජීවිතය, දුක මතම දෝලනය වෙයි.

එහෙත් මන්ද දශකයෙන් ඇරඹුණ මිනිස් දිවියේ ගත වූ දශකයන් තුළ දී මෙය අවබෝධ කර ගැනීම උගහටය. විශේෂයෙන්ම බාල, තරුණ අදියරයන්හිදී බොහෝ දෙනෙක් ජීවිතය සුන්දර ලෙස දකිති. එය මායාවකි. යථාර්ථය දකින්නේ නම්, ඒ පෙර සසරේ සිදු කරගත් පුණ්‍ය බල මහිමයෙන්ම ය. නොඑසේ නම් සියළු උපභෝග, පරිභෝග සැප සම්පත් අනූනව වින්දනය කළ සිදුහත් කුමරු, සතර පෙර නිමිති දැකීමෙන් පමණක් සිය චිත්ත සන්තානය තුළ සුවිශාල පරිවර්තනයකට කෙසේ නම් පත්වන්නද? පෙර සසරේ පුරාගෙන ආ පාරමීදම් බලය ඉස්මතු වූ අයුරු **කෙතරම් විශ්මිත ද?**

තම රුධිරය කිරි කර පොවා හදා වඩා, පාපයෙන් වළක්වා, යහපතෙහි පිහිටුවමින්, සිප් සතර ලබාදී උසස් රැකියාවලට යොමුකළේ වුවද, බල දශකයේ සිටින ඇතැම් දරුවනට ඒ සියල්ල අමතකය. ප්‍රඥා දශකයට පිවිසිය ද ඔවුනට දෙමාපියන් ගැන සිතීමට පවා විවේකයක් නැත. කාර්ය බහුලත්වය මෙන්ම අතෘප්තිකර ආශාවන් පසුපස හඹායාම නිසා ඔවුනට කළයුත්ත නොකළයුත්ත අවබෝධ වන්නේ නැත. ජීවත් වීමට අවශ්‍ය ආර්ථික පසුබිම කොපමණ සාර්ථක ලෙස මව් පියන් ගොඩනගා තිබුණේ වුවද, එයින් සෑහීමකට පත්විය නොහැකිව තව තවත් ඉසුරු සොයමින්, දෙමාපියන් තනිකර දමා අද විදෙස් ගත වන්නවුන් බහුලය. ඇතැම් අය රටේ අස්ථාවරත්වය දඩමීමා කරගෙන දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබාදීමට සිතා රට හැර යති. තවත් පිරිසක් වයස්ගත දෙමාපියන්ගෙන් ඈත් වී සිටීමට සුදුසුම ක්‍රමවේදය ලෙස සලකා රට හැර යයි. ඉසුරු ලැබුවේ වුවද, අභිමතාර්ථයන් සාධනය වූයේ වුවද, ඔවුන්ද මේ පසුකරමින් සිටින්නේ ඉතා කෙටි මිනිස් භවයක් බවත්, ස්වකීය සයන දශකය ද ආසන්න වෙමින් පවතින බවත් මොහොතකටවත් සිහියට නොනැගෙයි. එහෙත් සත්‍යය එයයි. සත්‍යය කවදා හෝ දිනක යථාර්ථයක් බවට පත්වනු ඇත.

ජීවිතය පිළිබඳව යථාවබෝධයක් ඇති, වත්මන් සමාජයේ ඇතැම් දරුවන් ලෝකයේ කුමන හෝ රටක ජීවත් වෙමින් උසස් රැකියාවල නියුතුව සේවය කරමින් කාර්ය බහුල ජීවිතයක් ගත කරන්නේ වුවද, සිය දෙමාපියන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැර හරින්නේ නැත. ඔවුනට රැකියාව සහ ආදායම් මාර්ග සියල්ල අතහැර මව් පියන්ගේ ආවතේව සියල්ල ඉටු කරමින් ඔවුන් සමීපයේම රැඳී සිටීම කළ නොහැක්කකි. ඒ බව සිහි මුළා නොවූ වයෝවෘද්ධ මව් පියන්හට අවබෝධ කර ගැනීම අසීරු නොවනු ඇත. සයන දශකයේදී පවා ස්වකීය දරුවන්

තමා සමීපයේම සිටිය යුතුය යන පටු ආකල්ප කෙනෙකු සතු වන්නේ නම්, එසේ නොවන කල්හි ඔවුහු දරුවන්ට වෛර කරති. එවන් වෛරී සිතකින් සහ ද්වේශයෙන් යුතුව අවසන් හුස්ම හෙළන්නන්ගේ ඉදිරි භවය යහපත් නොවනු ඇත. විවිධාකාර අමනුෂ්‍ය ආත්ම භවයන්හි ඉපිද, දුක් විඳිමින් පෙර භවයේ දරුවන්ගේ කටයුතුවලට ද විවිධාකාර අදෘශ්‍යමාන බාධා පමුණුවයි. දරුවන් විසින් දෙමව්පියන් මෙම තත්ත්වයට පත්කරන්නේ නම් එය සසර පුරාම ගෙවා නිම කරගත නොහැකි පාපයක් වනු ඇත.

ධර්මානුකූලව හිතන බුද්ධිමත් ජන සමාජයක එය එසේ නොවිය යුතුය. දරුවන්ගේ ලෝකය දරුවන්ට විවෘත කර තබා නිහඬ වන දෙමාපියන් වෙනුවෙන් දරුවන්ට **කළ නොහැකි දේ මෙන්ම කළ හැකි යුතුකම් ද බොහෝය.** එය අවබෝධ කරගත් බුද්ධිමත් දරුවෝ ඉතාම සානුකම්පිකව දෙමව්පියන්ගේ අවශ්‍යතා සොයා බලති. නිතර ඔවුන් සමග සන්නිවේදනය පවත්වා ගනිති. ඔවුන්ගේ ඉදිරි අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් මාසිකව ලබාගත හැකි ක්‍රමවේදයක් ඔස්සේ ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ඉතා සතුටින් තැන්පත් කර තබති. **මෙය යම් පමණක විසඳුමක් වුවද, බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇති පරිදි දෙමව්පියන් යනු එලෙසින් ණය ගෙවා අවසන් කළ හැකි ප්‍රතිමූර්තීන් නොවේ. තම උරහිස මත හොවාගෙන මුළු ජීවිත කාලය පුරාම ආවතේව, උපස්ථාන කළ ද දරුවන් හට ඒ ණය ගෙවා අවසන් කළ නොහැකි බව බුදු පියාණන් වහන්සේ සර්වඥතා ඥානයෙන් ලොවට පසක් කළ සේක.**

වයෝ වෘද්ධ දෙමාපියන් පිළිබඳව සොයා බලමින්, අවම වශයෙන් සේවක සේවිකාවන්ගේ බැල මෙහෙවර සහිතව, මව්පියන්ට යහපත් ලෙස සන්සුන් මානසිකත්වයකින් යුතුව දිවි ගෙවීමට මඟ සලසා දෙමින් සියළු කටයුතු නිසිලෙස අධීක්ෂණය කරන දරුවා යම් පමණකින් හෝ සැනසෙයි. එවන් දරුවන්ගේ අනාගතය අඳුරු නොවනු ඇත. ඔවුන්ගේ සයන දශකයද පීඩාවකින් තොරව සුවසේ ගෙවී යාමට එම පුණ්‍ය කර්මය පිටිවහලක් වනු ඇත.

බුද්ධිමත් පින්වත් දරුවෝ මෙලෙස තමාට හැකි කුමන ආකාරයකින් හෝ දෙමාපියන් ගැන සොයා බලා, ඔවුන්ගේ සිත් සතුටු වන පරිද්දෙන් සියළු අවශ්‍යතා උපරිම කැප වීමකින් යුතුව සකසා දෙති. එමඟින් දෙමාපියන් වෙනුවෙන් තම යුතුකම් යම් පමණකට හෝ ඉටු වනවා මෙන්ම සමාජයට ද රැකියා ක්ෂේත්‍රයක් විවර වෙයි.

ආර්ථික අස්ථාවරත්වයට පිළියම් සෙවීමේ අදහසින් අද මැද පෙරදිග ගෘහ සේවය සඳහා යන බහුතරයක් වසර කීපයකට පසු මව්බිමට එනවිට පවුලේ තිබූ ස්ථාවරය ද දෙදරා ගොස්ය. දරුවන් අයාලේ ගොස්ය. හැරදා ගිය කලත්‍රයා (spouse) වෙනත් විවාහයක් කරගෙන පවුල දෙදරා ගොස්ය. දැඩි වෙහෙසකින්, දස වධ බන්ධනවලට පාත්‍ර වෙමින්, පිටරැටියනට ආවතේව කර, පවුලේ උන්නතිය වෙනුවෙන් එවනු ලැබූ මුදල් විනාශ කරමින් මත්පැනට, සූදුවට හෝ අනාචාරයට ඔවුන් ඇබ්බැහි වී ඇත. දරු පවුල් වසර ගණනකට හැරදා යාමේ අවාසනාවන්ත ප්‍රතිඵලය එයයි. මේ, ඉසුරු සොයන වත්මන් මව්-පිය භූමිකාවන්හි එක්තරා පැතිකඩක් පමණි.

අද සමාජයේ දරිද්‍රතාවෙන් පෙළෙන පවුල් බොහෝය. මෙරට සිට යහපත් වේතනයක් ලැබිය හැකි නම් ඔවුන් **ගෘහ සේවය සඳහා විදෙස් ගත නොවනු** ඇත. මාසිකව දින කීපයක් නිවාඩු ද ලබා ගනිමින් දරුවන්, ස්වාමි භාර්යාවන් එකිනෙකා දකිමින් **මෙරට ගෘහ සේවයේ** යෙදීමට ඔවුහු පෙළඹෙති. ඒ සඳහා අවශ්‍ය පසුබිම ගෘහ සේවක සේවිකාවන් වෙත ලබා දීමට අද සමාජය තුළ කාලීන ක්‍රම වේදයන් ස්ථාපිත වී ඇත. විදෙස් ගතවී සිටින පින්වත්, බුද්ධිමත් දරුවන් තම දෙමාපියන්ගේ සුබ විහරණය පිණිස ගන්නා වූ ක්‍රමවේද හමුවේ මෙම **දේශීය ගෘහ සේවය** වඩාත් ඵලදායී ලෙස අද ව්‍යාප්ත වී ඇත. එය වඩාත් ක්‍රමවත්ව කළමනාකරණය කෙරෙන්නේ නම්, පාර්ශ්වයන් කිහිපයකට ම එයින් යහපත උදාවෙයි. වයෝ වෘද්ධ දෙමාපියන්ටත්, ඔවුන්ගේ දරුවන්ටත්, රැකියා සොයන ලාංකික මැදි වියේ තරුණ තරුණියන්ටත්, ඔවුන්ගේ දරු පවුල් වලටත් සෙත සැළසෙන මෙම ක්‍රමවේදය කාර්ය බහුල වත්මන් සමාජයේ දැකිය හැකි එක්තරා සමාජ මෙහෙවරකි.

එහෙත් මිනිසාගේ වයෝ වෘද්ධ **"සයන දශකය"** ඉතාමත් අභාග්‍ය සම්පන්න ලෙස ගෙවී යන අවස්ථාද නැත්තේ නොවේ. ඇතැම් දරුවන් අහසින් කඩා වැටුණා සේය. තමා පසුකර ආ, මන්ද දශකයේදී, ක්‍රීඩා දශකයේදී තමාට සියළු අවශ්‍යතා සපුරා දුන්, සියළු ආරක්ෂාව සලසා දුන් මව පියා සිහියට නොනැගෙයි. අසූචි, මළ මුත්‍ර සිරුරේ පහ කරගත් අවධියක් තමාට නොතිබුණා සේය. උඩුකුරුව සිටි එම අදියරේදී (මන්ද දශකය) තමාට මව, පියා හැර වෙනත් පිළිසරණක් නොවීය. සේවක සේවිකාවන් සිටියේ වුවද, පූර්ණ අධීක්ෂණය මව පියා සතු විය.

අද **සයන දශකයේ** සිටින ඇතැම් වයෝ වෘද්ධ දෙමාපියන් හට දරුවන්ගෙන් කිසිදු පිළිසරණක් නැත. බිළිඳා කුස තුළ සිටියදීම විනාශ කර දමන අමානුෂික දුෂ්ඨ චරිත වත්මන් සමාජයේ නැත්තේ නොවේ. දෙමාපියන් දරුවන් වෙනුවෙන් කුමක් නොකළේ වුවද, කුස පිළිසිඳගත් දරුවාට, දහසකුත් එකක් අභියෝග මධ්‍යයේ වුවද, **ඉපදීමට ඇති අයිතිය සුරක්ෂිත කරදීම** පමණක් ම කෙතරම් අගනේද? සයන දශකයේ සිටින මව් පියන් පිළිබඳව, මැදි වියේ පසුවන දරුවන් දෙවරක් සිතිය යුතු කාලය උදා වී ඇත. ඔවුනට කෘතගුණ දක්වීමේ උතුම්ම ක්‍රමවේදය වන්නේ ගත වාරු නැති කල්හි, තම ස්වකීය බාහු බලයෙන්ම තම දෙමාපියන්ට ශක්තියක් වීමයි. (Be a walking stick to the parents at their dotage)

එදා, මව් පියන් ඔවුන්ගේ බල දශකයේදී ඉතා මහන්සියෙන් සාධාරණව උපයා ගත් මුදල්, මනා කළමණාකාරිත්වයකින් සහ අරපිරිමැස්මෙන් යුතුව විය පැහැදම් කරමින් දරුවන්ගේ ලෝකය සුන්දර කිරීමට ගත්තා වූ වෙහෙස අපමණය. සාධාරණව උපයා ගත් මුදලකින් නිවහනක් ඉදිකර ගැනීම එදා සුළු පටු කරුණක් නොවීය. දහඩිය මහන්සියෙන් අනන්ත අප්‍රමාණ දුක් විඳිමින් මව් පියන් ඉදිකළ නිවසත්, උපයා සපයා ගත් දේපළ සහ රන් රිදී ආභරණ සියල්ලත් උපක්‍රමශීලීව හෝ තමා සන්තකයට ගන්නා ඇතැම් දරුවන් අනතුරුව මව් පියන්ගේ සුබ විහරණය වෙනුවෙන් කිසිදු තැකීමක් නැත. බටහිර හා දේශීය විවිධ බෙහෙත් වර්ග ඔවුන් දෛනිකව පාවිච්චි කළ ද එය ලබාදීමටවත් සිතිවිලි මාත්‍රයක් පහළ වන්නේ නැත. දෙසවන් බිහිරි, දෙනෙත් නොපෙනෙන මව් පියන් පවා ඇතැම් විට නිවසින් පළවා හැරීමට තරම් දරුවන් අකෘතඥ වන අවස්ථා ද නැත්තේ නොවේ. මහ පාරේ, පාළමක් යට හෝ කඩ පිලක **අව්ව, වැස්ස, පින්න, සීතල** ආදී සියළු අභියෝග හමුවේ, අප්‍රමාණ කායික මානසික වේදනා ඉවසමින් කඳුළු පිරි දෙනෙතින් යුතුව ඔවුහු මහ පාරේ අවසන් හුස්ම හෙළති. එහෙත් සත්‍ය තොරතුරු වසන් කරන ඔවුහු දරුවන්ගේ ගෞරවය අවසාන මොහොත දක්වාම රැකීමට අපමණ වෙහෙසක් දරති.

දෙමාපියන්හට නොසළකන ඇතැම් දරුවන්ගේ මෙම **වසල ගති,** බුදුපියාණන් වහන්සේ විසින් දේශිත **වසල සූත්‍රය තුළ** මනාව පැහැදිලි වෙයි. කර්මය ඔවුන් පසු පස අතරක් නොමැතිව සියළු භවයන් පසුපස හඹා එයි. මුගලන් මහ රහතන් වහන්සේ ආත්ම භව 500 ට පෙර මව් පියන් හට දුන් වධ හිංසාවන්හි කර්ම ඵලය, අවසන් වරට රහත් ඵලය ලද භවයේදී පවා අත් විඳීමට සිදුවූ අයුරු ධර්මය තුළ මනාව පිළිබිඹු වෙයි.

බුදු පියාණන් වහන්සේගේ නික්ලේෂී හද මඩළෙහි උපන් පරම ගම්භීර, ශ්‍රී සද්ධර්මය **විනය, සුත්ත, අභිධර්ම** ආදී පිටකත්‍රය (ත්‍රිපිටකය) ඔස්සේ මනා ලෙස වර්ගීකරණය කර, සැළසුම්ගත කොට (**well – expounded**), අනවරත සංසාර ගමනක යෙදී සිටින සත්ත්වයා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව ශ්‍රී මුඛ දේශනාවෙන් වදාරා ඇත. එහි විනය පිටකය තුළ **21000** ක ධර්මස්කන්ධයක් ද, සුත්ත පිටකය තුළ **21000** ක ධර්මස්කන්ධයක්ද, අභිධර්ම පිටකය තුළ **42000** ක ධර්මස්කන්ධයක් ද ආදී වශයෙන් **84000** ක ධර්මස්කන්ධයක්, සංසාර සාගරයේ අතරමංවී දුක් විඳින ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව බුදු පියාණන් වහන්සේ දේශනා කර ලොවට පසක් කළ සේක. රේරුකාණේ චන්දවිමල හිමිපාණන් විසින් රචිත **"අභිධර්මයේ මූලික කරුණු"** නම් වූ ග්‍රන්ථයෙහි ද මෙම වර්ගීකරණය වඩාත් පැහැදිලි ලෙස ඉදිරිපත් කර ඇත. සෑම ධර්ම පර්යායකම අන්තර්ගතව ඇත්තේ මිනිසාගේ යහපත පිණිසම වන මාර්ගෝපදේශයන් ය. ඒ මඟ පා නඟන්නවුන් හට සුගතිය දුර නැත. මේ බව අවබෝධ කර ගත් සම්‍යක් දෘෂ්ටික අතිජාත දරුවන් කිසි දිනක **සයන දශකයේ සිටින** තම දෙමාපියන් අත් නොහරිනු ඇත. ඔවුන් තනි නොකරනු ඇත. එය වෙස්වලාගත් ආශිර්වාදයක් මෙන්ම ස්වකීය සසර ගමන අවසන් කරගැනීමට දෛවයෙන් ලද උරුමයක් සේ සළකා ලද අවස්ථාවෙන් උපරිම ඵල නෙළාගනී. **මවට, පියාට සැළකීම වනාහි දෙලොවම සැනසීම ලැබිය හැකි මහා පුණ්‍ය කර්මයකි.**

බුදුපියාණන්වහන්සේගේශ්‍රීමුඛයෙන්දේශනාකරනලදකිසිවක්බොරු වී නැත. එය අසත්‍ය කළ හැක්කෙකු ද මේ දක්වා ලොව පහළ වී නැත. අල්ප මාත්‍රයක හෝ දෝෂයක් සොයා ගත හැක්කෙක් ද නැත. පණ්ඩිත, ආචාර්ය, මහාචාර්ය යැයි කියාගන්නා ඇතැම් අන්ධබාලයින්, සර්වඥතාඥාණයට සාපේක්ෂව නොසළකා හැරිය හැකි මට්ටමේ පවතින ඔවුන්ගේ දැනුම් පුංජය ඔස්සේ අප්‍රමාණ පර්යේෂණ වල යෙදෙමින් විවිධ කල්පිතයන් ගොඩනැගුවේ වුවද, ඒවායේ අවසන් නිගමනයකට මේ දක්වා පැමිණ නැත. ලෝකය පවත්වාගෙන යනු ලබන මෙම විශ්වීය ධර්මතාවය ඔවුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ, නිරීක්ෂණ හමුවේ පාඨාංක නොදක්වයි. **බුද්ධ විෂය අචින්ත්‍යයි.** කොපමණ වෙර දැරුවත් කිසිම මිථ්‍යා දෘෂ්ටික ප්‍රාඥයෙකුට එය බොරු කළ නොහැක. බුදු පියාණන් වහන්සේගේ උතුම් පරිනිර්වාණයෙන් වසර 2565 ගෙවී ඇති වත්මන් යුගයේදී ද ඒ සුපිරිසිදු ශ්‍රී සද්ධර්මය එලෙසින්ම තුන් ලෝකය පුරාම විද්‍යාමානව පවතී. ශ්‍රී සද්ධර්මය **සන්දිට්ඨිකය.** (can be seen) **අකාලිකය.** (not limited for a

certain period) **ඒහි පස්සික** ගුණයෙන් යුක්තය. (Invite to come and See) **ඕපනයික** ගුණයෙන් යුක්තය. (It's a walk along the correct path having a clear destination) **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති** ගුණයෙන් යුක්තය. (Can be realized by the degree of knowledge & wisdom)

මෙවන් නිර්මල වූත්, විනිවිද දැකිය හැකි වූත්, අති උතුම් වූ ශ්‍රේෂ්ඨ ධර්මයක් අපගේ නෙත් අබිමුව දිදුලයි. මිනිසා විසින් කළ යුත්තේ බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන් දහම් මඟ ඔස්සේ පා නගමින් දෙලොවම සැප පිණිස යහපත් ලෙස ජීවිතය සකසා ගැනීම පමණි. විශේෂයෙන්ම සයන දශකයේදී **වැඩි හිටියන් රැක බලා ගැනීම** දරුවන්ගේ පූර්ණ වගකීමයි. ඔවුන්ගේ හදවත් තුළ තෙරපෙමින්, දෙනෙතින් රූරා හැලෙන එක් කඳුළු බිඳුවක ගැබ්ව ඇති සංවේදීතාවය, ඇට, ලේ, මස්, නහර වලින් සුසැදි සිය දරුවන්ගේ හදවතට නොදැනෙන්නේ නම් එය දරුවන් ලද මිනිස් භවයට මහත් වූ නිගාවකි. එවන් දරුවනට නැවතත් මිනිස් භවයක් ලැබීම උගහටය. සසර ගමන තව තවත් දීර්ඝ කරගනු විනා ලද මිනිසත් භවයේ නිසි ඵල නොලැබුවෝ වෙති. කර්ම විපාක ආත්ම භව ගණනාවක් පුරාම තමා පසුපසම ලුහුබඳී.

සිඟාල ගෘහපති අමතා සදිසා නමස්කාරය අර්ථවත් කළ බුදු පියාණන් වහන්සේ **නැගෙනහිර දිශාව වූ මව්පියන් වෙනුවෙන් කළ යුතු, යුතුකම්** මැනවින් පහදා දුන් සේක. දරුවාට මවු පියන්, පායන හිරු වැනිය. දරුවාගේ ජීවිතයට ආලෝකය මව් පියන්මය. ඒ හිරු උදා නොවන්නට තමා අඳුරේම ය. එබැවින් මව් පියන් විසින් පෝෂණය ලද දරුවා, මහළු වියපත් සිය මව් පියන් පෝෂණය කළ යුතු බවත්, කුල පරම්පරාව පිහිටවිය යුතු බවත්, දායාද කරනු ලැබූ වස්තුව රැකගත යුතු බවත්, මව් පියන් මිය පරලොව ගිය පසු, දක්ෂිණාවන් පවත්වා ඔවුනට පින් අනුමෝදන් කළ යුතු බවත්, **සිඟාලෝවාද සූත්‍රය** තුළින් බුදු පියාණන් වහන්සේ ලොවට පහදා දුන් සේක. මේ එක් බුද්ධ වචනයක් තුළ ආත්ම ගණනක සැනසීමක් ගැබ්ව ඇත. සයන **දශකයේ පසුවන මව් පියන්** පෝෂණය නොකිරීම, ඔවුන් තනිකර හැරයාම, ඔවුන්ගේ වගකීම වැඩිහිටි නිවාස වලට පැවරීම ආදිය, නූතන බටහිර සංස්කෘතියට ආවඩන්නවුන්ට අමන්දානන්දයට පත්විය හැකි විසඳුම් වුවද, යථාර්ථයට අනුව ඔවුන්හට **කිසිකලෙක, කිසිවිටෙක, කිසි අයුරකින්** සැනසීමක් නම් නොලැබෙනු ඇත. ඔවුන් මව් පියන්හට දෙනු ලැබූ දුක් ගින්දර දෙගුණ, තෙගුණ වී ඔවුන් පසුපස ලුහු

බැඳීම ලෝක ධර්මතාවයයි. එයට එරෙහි විය හැකි ප්‍රාඥයෙක් මේ තුන් ලොවෙහිම නැත. "**සත්‍යය**" එයයි. ලෝකය දුක මත දෝලනය වෙමින්, සත්‍යය මත රඳා පවතී. (Universal Truth).

පරාභව සූත්‍රය තුළින් ද බුදු පියාණන් වහන්සේ දේශනා කර ඇත්තේ මෙළොව පරලොව දෙක්හිම මිනිසාට "**සැනසීම**" ළඟාකර ගත හැකි අනුශාසනාවන්මය. එහෙත් දෘෂ්ඨිය විෂම වූ මිථ්‍යා දෘෂ්ඨිකයින්ගේ "**වැනසීම**" ද සමාජය දෙස විවෘත මනසකින් බලන ඕනෑම කෙනෙකුට පහසුවෙන් දැකිය හැකිය. බුදු පියාණන් වහන්සේ ගේ විවිධ සූත්‍ර දේශනා තුළ "**මව් පියන්ට සැළකීම**" උසස් කොට සළකා ඇත. ඒ දෙමව්පියන්ගේ හද මඩළෙහි උපදින්නා වූ අව්‍යාජ ආශිර්වාද තුළ දරුවෙකු යහපත කරා ගෙන යාමට හැකි සුවිශේෂී, අදෘශ්‍යමාන බලයක් ගැබ්ව ඇති හෙයිනි. බෝධිසත්වයන් වහන්සේ එක්තරා භවයක සිය මෑණියන් වහන්සේ උරහිස මත හොවාගෙන දින ගණනක් මහ මුහුදේ පිහිනා නිරුපද්‍රිතව ගොඩ බිමකට සේන්දු වූ අවස්ථාවේදී, මෑණියන් වහන්සේ විසින් "පුතේ නුඹ බුදු වේවා !" යනුවෙන් කරනු ලැබූ ආශිර්වාදය කෙතරම් බලගතු වූයේද යන්න අප කවුරුත් හොඳින් දන්නා කරුණකි.

සයන දශකයේ සිටින මවකට, පියෙකුට සමීපව ඔවුන්ගේ බලසම්පන්න ආශිර්වාද ලබා ගැනීමට ද **පෙර පින් තිබිය යුතුමය.** එසේ නොවන්නන්ගේ පිරිහීම ද සමාජය දෙස නෙත් හැර බලන්නෙකුට පියවි ඇසින් දැකිය හැක. මවට පියාට සැලකීම කෙතරම් ශ්‍රේෂ්ඨද යන්න බුදුපියාණන් වහන්සේ සූත්‍ර ගණනාවකම පහදා දී ඇත්තේ අනන්ත සසර දුක් විඳින මිනිසාගේ විමුක්තිය පිණිසමය.

"යෝ මාතරං වා පිතරං වා - ජිණ්ණකං ගත යොබ්බනං
පහුසන්තෝ න භරති - තං පරාභවතෝ මුඛං"

යමෙක් පොහොසත් වූයේ, ජරාවෙන් දිරාගිය, ඉක්මවූ යොවුන් බව ඇති මව හෝ පියා පෝෂණය නොකරයිද, එය පිරිහීමට කරුණකි.

Whoever being affluent, does not support his mother and father who are old and past their prime - This is the cause of his downfall.

දියුණු වෙන පුද්ගලයාද, පිරිහෙන පුද්ගලයාද "**පරාභව සූත්‍රයේ**" ද මැනවින් පහදා දී ඇත. මව් පියන් පෝෂණය නොකරන්නා මෙන්ම ධර්මයට අකැමති පුද්ගලයාද අසත්පුරුෂ ධර්මය අගය කරන්නාද, ජාති මානයෙන් උඩඟුව, ධනයෙන් ආඪ්‍යව, තමා උසස් කොට සළකා දෙමාපියන් හා ඥාතීන්ට නොසළකා හරින්නාද, ස්ත්‍රීන් කෙරෙහි, මත්පැන් කෙරෙහි ලොල් වූ පුද්ගලයාද, සිය බිරිඳ කෙරෙහි සතුටු නොවී වෛශ්‍යාවන් හා අන්‍ය බිරින්දෑවරු කරා යන්නාද, කිසිම අරපරෙස්සමකින් තොරව පරිහරණය කරන දෑ විනාශ කරමින් නිකරුනේ ධනය විය පැහැදම් කරන්නෙකුට පවුලේ අධිපතීත්වය පවරන්නා ද, පිරිහී යයි.

ඉත්ථී සොණ්ඩිං විකිරණිං - පුරිසංවාපි තාදිසං
ඉස්සරියස්මිං ඨපාසෙති - තං පරාභවතො මුඛං

බුද්ධ භාෂිතයෙන් මෙම වදන '**විකිරණිං**' යන්නයි. එනම් විසුරුවා දමන්නේ යන අදහසයි. සියළුම සම්පත් විසුරුවා දැමීම පරිහානියේ අගතියයි. මෙම පිරිහීමේ කරුණු කිසියම් පණ්ඩිතයෙක් නුවණින් දකී නම්, ආර්ය ඥානයෙන් සමන්නාගත ඔහු ලැබුවා වූ මිනිසත් භවයෙන් උපරිම ඵල ලබයි. නොඑසේ නම් අන්තයටම පිරිහේ. බුදු පියාණන් වහන්සේ සර්වඥතා ඥානයෙන් දැන, දැක, දේශනා කළ මේ ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨිකය.

වසල සූත්‍රයේ පෙන්වා දී ඇත්තේද ලද මිනිසත් භවයට නිගා කෙරෙන වසල ගති සමූහයකි. මිනිසා වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු බවට පත්වන්නේ උපතින් නොවන බවත්, සිදුකරනු ලබන ක්‍රියාවන් මත බවත් බුදුපියාණන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණාට දේශනා කර වදාළ "**වසල සූත්‍රයෙහි**" මෙසේ පෙන්වා දී ඇත.

"කොධනො උපනාහීච - පාපමක්ඛීච යො නරො
විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති"

"යමෙක් ක්‍රෝධය, වෛරය ගුණමකු බව, **විපරීත වූ දෘෂ්ඨිය,** මායාව යන මේවායින් සමන්විත ද, ඔහු වසලයෙකැයි දැනගන්නේය."

"Whosoever is angry, harbors hatred and is reluctant to speak well of others {discredits the good of others}, perverted in views, deceitful – know him as an outcast"

මෙම ගාථාවෙහි **"විපන්නදිට්ඨී"** හෙවත් විපරීත දෘෂ්ඨිය යනු විකල් වූ දැක්මයි. **'යහපත'** අහපත ලෙස දැකීමත්, **'අයහපත'** යහපත ලෙස දැකීමත්ය, එමෙන්ම **'හරි'** දේ වැරදි හැටියටත්, **'වැරදි'** දේ හරි හැටියටත් දැකීමය. **"මායාවී"** යනු රඟපාන ස්වභාවයයි. **"වැරදි"** වසන් කරන ස්වභාවයයි. **අධර්මයෙන් සමාජද්‍රෝහී** වැඩවල **යෙදෙමින්, ධර්මානුකූල සමාජ හිතකාමී කෙනෙකු ලෙස සමාජයේ විරාජමාන වීමයි.** ඇතැමුන් ධනයෙන් ආඪ්‍ය වුවද, හිඟන්නන්සේ ය. දෙමව්පියන්ටවත් සතුටින් මුදලක් දීමට සිත් පහළ වන්නේ නැත. **මසුරුකම රජයයි.** අනුන්ගෙන් ඉල්ලාගෙන කෑමට ද මැලි නැත. ගමේ, පලාතේ කොහේ හෝ **අවමංගල්‍යක්, හත් දවසේ බණ පිං කමක් හෝ තුන් මාසයේ දානයක් වේ නම්,** මළගිය කෙනෙකුගේ නමින් හෝ හැඳුනුම් කමක් සාදා ගන්නා මොවුහු, යුතුකම් ඉටුකරන්නවුන් ලෙස එතනට පිවිස, ආහාර පාන ආදිය හොඳින් භුක්ති විඳ පිටව යති. මෙවැනි මායාකාරී වංචනිකයින් අද සමාජයේ නැත්තේ නොවේ.

ප්‍රඥාවන්ත සත්පුරුෂයෝ ඉතාමත් සූක්ෂම ලෙස මොවුන් හඳුනා ගනිති. මොවුන්ගේ සත්‍ය පැවැත්ම එකකි. රඟපෑම වෙනකකි. වත්මන් සමාජයේ පවතින සකලවිධ දුෂ්චරිත සියල්ලත්, මහ මොළ කරුවන්සේ හන්වඩු ගැසී ඇති **සමාජද්‍රෝහී. ජාතිද්‍රෝහී,** මෙන්ම **ශාසන විකෘතිකාමී** පුද්ගලයින්ගේ ලක්ෂණත්, බුදු පියාණන් වහන්සේ විසින් මීට වසර 2600 ත් පෙර ලොවට හඳුන්වා දී ඇත. **අංගුත්තර නිකායේ, පංචක නිපාතයේ තෘතිය පණ්නාසකයේ මහා චෝර සූත්‍රයේ** සඳහන් පරිදි **මහා හොරුන්ගේ** චර්යා පද්ධතිය අද සමාජය තුළ පැහැදිලිව විද්‍යාමානය. වෙනසකට ඇත්තේ ඒ සියල්ල අද **"නූතන තාක්ෂණය"** ඔස්සේ සිදු වීම පමණි. මොවුන් සතු ශීලයක් නැත. මොවුන්ගේ ප්‍රධානතම ලක්ෂණය වන්නේ **විෂම චර්යා පැවැත්මයි.** විෂම ස්ථාන ඇසුරු කරගෙන බොහෝවිට හුදෙකලාව ජීවත් වීමයි. **විෂම කාය, වාග්, මනෝ කර්මයන්** ගෙන් යුක්තයි. සාමාන්‍ය සමාජයේ මිනිසා අනුගමනය කරන **සිරිත් විරිත්, සාර ධර්ම, නීති රීති** ආදියට මොවුන් අනුගත නොවේ. එම යථා තත්ත්වය වසන් කරන මොවුන් ඇතැම් අවස්ථාවලදී බාහිර ලෝකයා ඉදිරියේ, තර්ක විතර්ක ගෙන හැර පාමින් ඔවුන්ගේ මතය සමාජගත කිරීමට දරන්නා වූ

තැත කෙතරම් අමනෝඥද? අන්ධබාල ජන සමාජයේ ස්වල්ප දෙනෙකු හෝ ඔවුන්ගේ ගොදුරු බවට, අනුගාමිකයින් බවට පත් කරගන්නා මොවුන් **අධර්මය ධර්මය** ලෙසටත්, **ධර්මය අධර්මය** ලෙසටත්, හුවා දක්වමින් ධර්මිෂ්ඨ සමාජය නොමග යැවීමට දරන්නා වූ තැත කෙතරම් පිළිකුල් සහගතද? **මිථ්‍යා දෘෂ්ටික** මොවුහු කර්මය හා කර්ම ඵල විශ්වාස නොකරති. බලවත් පුද්ගලයින්, බලවත් රාජ්‍යයන් ඇසුරු කරති. අනුගාමික පිරිසට හොඳින් සළකති. සියල්ල තාක්ෂණය ඔස්සේ නිසා, බැලූ බැල්මට මොවුන් බොහෝ නිහඬ මිනිසුන්ය. ඔවුන්ගේ අභිමතාර්ථ සියල්ල ඉතාම සූක්ෂම ලෙස තාක්ෂණය ඔස්සේ මෙහෙයවයි. ඇතැම් අය අප්පිච්ඡතා ගුණයෙන් පරිපූර්ණ සේ වඤ්චනික රඟ පෑමක යෙදෙති. සමාජය මුළා කරන ඔවුහු මුළු මහත් සමාජයම අගාධයකට ඇද දැමීමට ඉතා සූක්ෂම ලෙස සැළසුම් කරති. සමාජයට පමණක් නොව තමා තමාට ම පිළිලයක් වී ඇති බව ඔවුහු නොදනිති. **කෙතරම් අභාග්‍යයක්ද?**

බුද්ධිමතුන් මෙවැන්නන්ගේ චර්යාධර්ම පිළිකුලෙන් හෙළා දකිනු ඇත. මෙවැන්නවුන් සමඟ තර්ක කිරීමෙන් තම බුද්ධියට නිගා කර ගැනීමට ඔවුන් සූදානම් නැත. එබැවින් **ආර්ය තුෂ්ණිම්භූත** භාවයෙන් සිටින මොවුහු හැකි සෑම අවස්ථාවකදීම ඒ අසත්පුරුෂ, බාල ඇසුර ප්‍රතික්ෂේප කරති. සමාජ සාර ධර්ම සියල්ල සෝදා පාළුවට ඇද දමන මොවුන් නොමැරෙන මිනිසුන් සේය. මේ භවය ඉතා කෙටි බවත්, යා යුතු සංසාර ගමන ඉතා දීර්ඝ බවත් ඔවුනට අවබෝධ වන්නේ තමා ද **සයන දශකයට** පත්වීමෙන් පසුවය. එවිට කළ හැක්කක් නැත. කළ කී සියල්ල චිත්‍රපටයක් සේ මැවී පෙනෙයි. කළ අපරාධ වලට ලැබෙන දඬුවම ගිනි ජාලා ඔස්සේ භයංකාර ලෙස දෘශ්‍යමාන වෙයි. **කාගේ හව්හරණයක්ද?**

බුදු පියාණන් වහන්සේ **වසල සූත්‍රයේද**, මෙවන් චරිත පිළිබඳවත්, පරලොව සුගතිගාමී වීමට නම් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග පිළිබඳවත්, සසර දුක් විඳින මිනිසා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව දේශනා කර වදාළ සේක.

වයෝවෘද්ධ මව් පියන්ට නොසැළකීම, මව් පියන්ගේ සිත් රිදවන සුළු වචන භාවිතා කිරීම, දැන දැන බොරු කීම, අර්ථය විකෘති කරමින් ඇත්ත, නැත්ත සේ පැවසීම, අනුන්ගේ ගෙවල් වලට ගොසින් හොඳින් අනුභව කර ඔවුන් තමන්ගේ නිවසට ආ විට රස බොජුන් වලින් ඔවුනට නොසැළකීම, බුදුන් වහන්සේට සහ අනුගාමික සංඝයාට අපවාද කිරීම, උසස් කුලයක

ඉපිද, කිලිටි කර්මයන්හි යෙදීම, ආදිය **වසල ගති** ලෙස පෙන්වා දුන් බුදු පියාණන් වහන්සේ කිසිවකු උපතින් වසලයකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ නොවන බවත්, සිදු කරනු ලබන කර්ම අනුව වසලයකු හෝ බ්‍රාහ්මණයෙකු වන බවත් පැහැදිලිව දේශනා කර ඇත.

යහපත් පවුලක උපතක් ලැබුවේ වුවද, ආර්ථිකය යහපත් වුවද, අවම වශයෙන් සයන දශකයේ පසුවන මව් පියන්ට සැළකීමටවත් සිතක් පහළ නොවන්නේ නම්, **ඔහු මිනිසත් භවයට නොගැලපෙන වසලයෙකි.** නැවත මිනිසත් භවයක් ගැන සිතීම පවා උගහටය. බුදු පියාණන් වහන්සේ මෙලොව පරලොව දෙක්හිම යහපත පිණිස දේශනා කළ මෙම "**ධර්මය දැකීම**" ට නෙත් විවර නොවන්නේ නම් **කෙතරම් අවාසනාවක්ද?**

අටලෝ දහමට අකම්පිතව මුහුණ දීමට හැකි ස්ථාවරයකට ජීවිතයේ අවසාන දශකය වන විට මනස හැඩ ගැසී ඇත්තේ නම් පමණක් කායික වශයෙන් කෙතරම් පීඩාවට පත් වුවද, මානසික සංහිඳියාවකින් යුතුව අවසන් හුස්ම හෙළීමේ ශක්තිය මානවයාට උදාකර ගත හැක. ඒ මිනිසා සතු සුවිශේෂී භාග්‍යයකි. ඒ සඳහා ගතවන සෑම මොහොතකම '**ධර්මය දැකීමට**' වෙහෙසිය යුතුමය. **සයන දශකයට** පැමිණීමට පෙර එම වීර්යය නොගන්නේ නම් අපි පමා වූවෝ වෙමු.

දෙමව්පියන්ගේ අපරිමිත කැපවීමෙන් විදෙස් අධ්‍යාපනයට පවා යොමු කළ ඇතැම් දරුවන් වසර ගණනාවකට පසු, සුපිරි ආර්ථික හා අධ්‍යාපනික පසුබිමක් ඇතිව මව් බිමට පැමිණියද, ස්වකීය දෙමාපියන්ගේ අවශ්‍යතාවන්ට අනුව, ඔවුන්ගේ පරිහරණය සඳහා **ඉල්ලා සිටින යමක් ලබාදීම ප්‍රතික්ෂේප කරමින්,** දෙමාපියන්ගේ **ධර්මානුකූල චිත්ත පථය** සහ **ශීල සම්පන්න දින චරියාව** පවා විකෘති කරවීමට සමත් **නූතන තාක්‍ෂණික මෙවලමක්** ස්වේච්ඡාවෙන්ම අතට දෙයි. මෙවැනි පාපතරයින් බුදු පියාණන් වහන්සේ විසින් දේශිත **වසල සූත්‍රයෙහි** පෙන්වා දෙන අන්දමට **වසලයින්** විනා සත්පුරුෂ දරුවන් නොවේ.

සිඟාලෝවාද සූත්‍රයට අනුව, දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු ප්‍රධාන යුතුකමක් වන්නේ **දෙමාපියන්ව වඩ වඩාත් දහමට යොමු කරවීමයි.** විවිධ රූප රාමු ඔස්සේ මනස ඔද්දල් කරවන තාක්ෂණික උපකරණ නොවේ. කුඩා කල තමාට දහම් දැනුම, දහම් පාසැල් අධ්‍යාපනය ලබා දුන් දෙමාපියන්ව අද වක්‍රාකාරව ධර්මයෙන් පිටතට ඇද දැමීමට

වෙර දරන අකෘතඥ දරුවන් අද සමාජයේ නැත්තේ නොවේ. **පරාභව සූත්‍රයට** අනුව මොවුන්ගේ පරිහානිය ඔවුන් පසුපසම හඹා එයි. කෙසේ නම් වළකාලම්ද?

වර්ණ දශකය, බල දශකය තුළදී බොහෝ දෙනෙකුට ජීවිතයේ යථාර්ථය පසක් නොවේ. අවබෝධයක් නොලබාම **සයන දශකයට** පිවිසෙන්නෝ බහුලය. බුදු පියාණන් වහන්සේගේ උපමාවන්ට අනුව, ධර්මයේ සඳහන් පරිදි **යථාර්ථාවබෝධය ලබන පිරිස,** මහ පොළවේ පස්වලට සාපේක්ෂව බලන කල නියසිලට ගත් පස් පිඩ හා සමානය. බහුතරයක් මැරි මැරී නැවත නැවත ඉපදෙමින් දුක උරුම කර ගනිමින් කර්ම රැස් කර ගනිති. සසර කෙළවර වීමක් නැත.

සෑම සත්ත්වයෙකුම, තමා පෙර සසර භවයන්හිදී රැස් කරගත් පින් - පව්, කුසල් - අකුසල් වලට අනුරූපව ඉදිරි භවය නිර්මාණය කර ගනී. මිනිස් භවයක් ලැබුවේ වුවද, පින් පව් පලදෙයි. ඇතැම් පාප කර්ම දිට්ඨ දම්ම වේදනීය ලෙස එම භවයේදීම ගෙවීමට සිදු වෙයි. ඇතැම් පාප කර්ම ඉදිරි භවයේදී ඵලදෙයි. ඇතැම් විට කුමන හෝ භවයකදී පලදෙයි. ඇතැම් පාපකර්ම භවයක් භවයක් පාසා නිවන් දක්නා තුරු ම පලදෙයි. (මුගලන් මහ රහතන් වහන්සේ)

ඇතැම් පින්වත් දරුවෝ තම දෙමව්පියන් ගේ ජීවිතයේ මෙම **"සයන දශකය"** තමාට පින් රැස් කර ගැනීමට හැකි ක්ෂෙමභූමියක් බවට පත් කරගනිති. රජයේ දෙපාර්තමේන්තුවක එක්තරා අධ්‍යක්ෂවරියක් මීට වසර කිහිපයකට උඩදී වයෝ වෘද්ධ සිය මෑණියන් වහන්සේ බලා ගැනීමේ ඒකායන අරමුණෙන් ස්වකීය රැකියාවෙන් සමුගත් අවස්ථාවක් පිළිබඳ සත්‍ය තොරතුරු **"මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** සතුය. තම අසනීප, රෝගාබාධයන් පවා නොසළකා, පූර්ණකාලීනව සිය මෑණියන් වහන්සේ වෙනුවෙන්ම ඇප කැප වූයේ දීර්ඝ කාලීන පළපුරුද්දක් ඇති හෙදියක මෙනි. එතුළින් ඇය ලද අප්‍රමාණ සතුට ඇයව සුගතියට පත් කරවනු නො අනුමානය.

මව් පිය උපස්ථානය කෙතරම් ශ්‍රේෂ්ඨද යන්න **මහා මංගල සූත්‍රයේ** ද **වසල සූත්‍රයේ** ද **පරාභව සූත්‍රයේ** ද පෙන්වා දී ඇති අතර, **සිඟාලෝවාද සූත්‍රයේ** පෙන්වා දී ඇත්තේ දිසා නමස්කාරයත් සමගය. හිරු පායන නැගෙනහිර දිශාවට උපමා කළ දෙමාපියන් හට දරුවන් විසින් ඉටුකළ යුතු යුතුකම් 5 ක්ද පෙන්වා ඇත. බුදුපියාණන් වහන්සේ සෑම ධර්ම

පර්යායක් ඔස්සේම මිනිසා සුගතිගාමී කිරීමට ගත්තා වූ වෙහෙස අපමණය. ගෘහ ජීවිතය ගත කරන ඕනෑම කෙනෙකුට නිවසේදීම කුසල් රැස්කර ගැනීමට හැකි තෝතැන්නක් පෙන්වා වදාළේ, භවගාමීව පරතෙරක් නොපෙනෙන සංසාර ගමනේ වල්මත් වූවන් සේ දුවන සකල ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන්මය.

මව් පියන්ට සැළකීමේ වටිනාකම අපරිමිතය. එයින් ලද හැකි සහනය මාහැඟිය. එයට ප්‍රායෝගිකවම අවතීර්ණ වන්නෙකුට එහි **සත්‍යය** මනා සේ අත්දැකිය හැක. එමගින් දරුවෙකුගේ හදවතට දැනෙනුයේ අප්‍රමාණ සුවයකි. මව් පියන් හට ඉටු කරන යුතුකම් වල ආශිර්වාද බලය, තමා පසු පස අත් නොහැරම සෙවනැල්ලක් සේ එයි. මව් පියන්ගෙන් ලැබෙන ආශිර්වාදයේ ශක්තිය අති ප්‍රබලය.

අද **සයන දශකයේ පසුවන** වයෝ වෘද්ධ දෙමාපියන් හට වදනක් හෝ මුවගින් පිට කර ගැනුමට නොහැකි වුවද, ඔවුන්ගේ හද පත්ලෙන් නැඟී එන උණුසුම් ආශිර්වාද දරුවන්ගේ හද තුලට සම්ප්‍රේෂණය වෙයි. ඔවුන් ගේ දෙනෙතින් රූරා හැලෙන කඳුළු බිඳුවක ඇති ආධ්‍යාත්මික සංයුතිය මැන බැලීමට නිර්ණායකයක් සොයාගත් විද්‍යාඥයෙකු මේ දක්වා ලොව පහළ වී නැත. තුන් ලෝකාග්‍ර බුදු පියාණන් වහන්සේ සර්වඥතා ඥානයෙන් අවබෝධ කරගත් මෙම "**සත්‍යය**" මත ලෝකය පවතී. මෙහි පැවැත්මට ඉවහල් වන මූලික සාධක වන්නේ **කරුණාව, දයාව, මුදිතාව සහ උපේක්ෂාවයි.** වයෝ වෘද්ධ දෙමව්පියන්ගේ දෙනෙතින් ගලා හැලෙන කඳුළු වලින් තොරවන ලෝකයක් නිර්මාණය වන්නේ නම්, එදිනට මෙළොව මිහිබට සුරලොවක් වනු නොඅනුමානය.

"Looking after the elders" should be put into ction immediately in a proper and impressive manner. Whenever it is shown in the society vividly, since that day the world will be free from grief and tears of all the people who live lonely, unloved and helplessly. It itself makes the world flourished and prosperous"

විශේෂ පුණ්‍යානුමෝදනාව

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම සඳහා මූලික සංකල්පයන්
මා වෙත ඉදිරිපත් කරමින්,
මෙම සදහම් ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේදය දක්වාම,
විටින් විට පැන නැගුණා වූ දහම් ගැටළු නිරාකරණය කරගැනීමට
අනුපමේය සහායක් දක්වමින්,

සිය ධර්මඥාණයෙන් සමාජයට සදහම් පරිපෝෂණයක් ලබාදීමට
අප්‍රමාදීව කටයුතු කර,

එම සදහම් මඟ ඔස්සේ ඉදිරියටම පා නැගීමට අවශ්‍ය ජවය
ආදර්ශයෙන්ම මුළු මහත් සමාජයටම පසක් කොට දී,

ජීවිතයේ යථාර්ථයට ප්‍රඥා සම්පන්නව අභීතව මුහුණ දෙමින්,

2021 දෙසැම්බර් මස 28 වන දින අපවත් වී වදාළ

පූජනීය බුද්ධංගල ආනන්ද ස්වාමිපාදයාණන් වහන්සේට

මෙම සදහම් ග්‍රන්ථය සම්පාදනය කර මුද්‍රණය කරවා,

සමාජයට තිළිණ කිරීමෙන්
ලැබෙන සියළුම පින්

අනුමෝදන්කරමි, අනුමෝදන් වේවා !!!

සසර ගෙවන් කර නිවන් සුවය සාක්ෂාත් කර ගැනීමට මේ පින්
හේතු වේවා ! වාසනා වේවා !!!

MOTHER'S LOVE

A mother to a child is - worthy friend so frank
Debt can't be settled - for the milk you drank.

Forgiving us mothers - help & guide
Make our footsteps - far and wide.

In health or sickness - trouble or pain
Nine months carries us - without complain.

Then dawns the day - her babe she holds
Her happiness in words - can't be told.

From infancy - great care she takes
Throughout the Night - she often awakes.

Fond and Nursing - both all right
Bestow her love - with all her might..

Hands clasp tightly - when he walks
Walks he to school - with no other pose.

When at the doorstep - that he has to part
A great cry that - comes from heart.

Happy school life - pass rapidly away
Thanks to mother - who toiled night & day.

To give of her best to - her child in every way
Nothing to lack for him - to make him happy & gay.

Then to the prime - of youth he steps
Happy the mother - who fulfils her test.

With what great hopes - she longed for the day
To see him grown up - properly day by day.

Busy are the children - of the world today
Aged mothers can't be - looked after they say.

Home for elders - their mother they send
And care not for them - up to the end.

In many other ways - mothers do suffer
Grown up children - no help them offer.

Abusing , Threatening - against them rise
The return a mother gets; Oh what a surprise?

Silently she bears - her ups & downs
*The **LOVE** for children - she never frowns.*

Amids her suffering - she wishes them well
Happiness & Prosperity such words foretell.

K. S. N. Goonetilleke

පුණ්‍යානුමෝදනාව

සදහම් රුචි, යහගුණ කැමති, සමාජයකට තිළිණ කිරීම සඳහා සකස් කරන ලද
මෙම සදහම් ග්‍රන්ථය, 2022 ජනවාරි මස 27 දිනට යෙදී ඇති අප දයාබර

මෑණියන් වූ, විශ්‍රාම ලත් විදුහල්පතිනි,

ලෝරා හෙට්ටිආරච්චි මැතිනිය ගේ

28 වන ගුණානුස්මරණ පිංකම වෙනුවෙන් එළි දැක්වෙයි.

සම්පාදනය කර, මුද්‍රණය කරවා සමාජයට තිළිණ කිරීමෙන් සිදුකරනු ලබන මෙම
ධර්ම දානයේ කුසලානිශංස, එතුමියටත්, අප සෙනෙහෙබර පියාණන් වූ

විශ්‍රාමලත් විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව මැති තුමාටත්,

අප දෙපාර්ශවයේ මිය ගිය අනිකුත් සියලුම ඥාති මිත්‍රාදීන්ටත්,
අප ලේලි දියණියන්ගේ දයාබර මෑණියන් දෙපළ වූ

රම්‍යා සහ සුමනා චන්ද්‍රලතා යන සුපින්වතුන්ටත්,

නිර්වාණ සුවය සාක්ෂාත් කර ගැනීමට හේතු වේවා !!!

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේදී නොයෙකුත් අයුරෙන් මට සහාය ලබා දෙමින් ශක්ති
පමණින් මා දිරිමත් කරවනු ලැබූ සත්පුරුෂවූත්, කළ්‍යාණ වූත් සැමදෙනා වෙත ද, මේ
පින් අනුමෝදන් කරවමි. අනුමෝදන් වේවා ! ඔවුන්ගේ සියලු යහපත් බලාපොරොත්තු
එලෙසින්ම ඉෂ්ඨ සිද්ධ වේවා! යි පතමි.

අවසානයේදී, මෙම ධර්මදානයෙන් රැස් කරගන්නාවූ සියලුම පින්,

ඔබ අප සැමටත් මෙම ඝෝර සංසාරයෙන් එතෙර වීම සඳහා,

අති උතුම් වූ පරම රමණීය නිර්වාණ සුවය

සාක්ෂාත් කර ගැනීමට, හේතු වාසනා වේවා !!!

සාධු! සාධු! සාධු!

ආශ්‍රිත මුද්‍රිත ග්‍රන්ථ

- පිරුවානා පොත් වහන්සේ
- ධම්ම පදය
- චතුරාර්යසත්‍ය, අභිධර්මයේ මූලික කරුණු - රේරුකානේ චන්දවිමල මහා නාහිමි
- භය ඇතිවීම සහ භය දුරු කිරීම - බුද්ධංගල ආනන්ද හිමි
- අභිමානවත් තාරුණ්‍ය - මහමිතව පඤ්ඤාරතන හිමි
- ගිහි විනයඃ සිඟාලෝවාද ධර්මය - මාහෝ සුමේධ හිමි
- විශාඛා කුමාරිකාවෝ - නරමානේ බුද්ධරක්ඛිත හිමි
- එන්න, ධර්මය දකින්න - තිස්සමහාරාමයේ චන්ද විමල හිමි
- නිවන් දැකීම, මහා පරිත්‍රාණ ධර්මය - ගෝනදෙණියේ විමලජෝති හිමි
- බුදුන් වදළ රහත් ඵලය සත් දිනකින් - බුද්ධංගල භික්ඛු ආනන්ද හිමි
- Parents and Children - Ven Weragoda Narada Maha There
- Wisdom of Silence - Ven Ajhn Brahma Vansmo
- Education for Mindfulness - Ven. Dr. Mirisse Dhammika
- Buddhist Devotion - Ven. K. Sri Dhammananda
- Singalawada Sutta (Buddhist Cultural Centre) - Ven. K. Wimalajothi
- Towards a better world - Bhikkhu K. Gnanananda
- Dhamma Man and Law - Dr. K.N. Jayatilleke
- Dictionary of the Pali Language - Robert Ceasar Childers

ආශ්‍රිත විද්‍යුත් නාලිකා

බෞද්ධයා නාලිකාව - **Buddhist Channel -** Ven Daranagama Kusala Dhamma

The Destiny of Parents



- උත්තරිතර භූමිකාව යනු කුමක්ද?

  What is the utmost plot of life?

- ශ්‍රේෂ්ඨ පෞරුෂයකින් යුතුව ජීවිතය පවත්වා ගන්නේ කෙසේද?

  How to maintain the life with an advanced personality?

- මිනිසා සතු යුතුකම් සහ වගකීම් කවරේද?

  What are the duties and responsibilities of human beings?

- කර්ම විපාකයන්ගෙන් ගැලවිය හැකිද?

  Is it possible to escape from the evil effect of Kamma?

- ජීවිත කාලය පුරාම යහපත් චර්යාවන් පවත්වා ගන්නේ කෙසේද?

  How to maintain a moral conduct during the life time?

- හේතු-ඵල ධර්මතාවය දෛනික ජීවිතයට බලපාන්නේද?

  Does the cause and effect phenomenon apply in the daily life?

- වාසනාවන්ත, සාමකාමී, ජයග්‍රාහී දිවියකට අවැසි නිසි මග කුමක්ද?

  What is the path to lead a happy, peaceful & progressive life?

- මිථ්‍යා දෘෂ්ඨිකයින් හඳුනාගන්නේ කෙසේද?

  How to identify the people of heretical dogma?

ධර්මානුකූල පිළිතුරු පාලි, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අන්තර්ගතයි.

Answers according to Dhamm are included in Pali, Sinhala and English Languages.

මෙම ග්‍රන්ථයෙහි පාලි පාඨයන්හි ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන්, මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා, කොළඹ - 7, ඩී. එස්. සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාමලත් ප්‍රවීණ ඉංග්‍රීසි ආචාරිණී

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිනිය විසිනි.